

THE MARK OF ATHENA
RICK RIORDAN
ඇතීනාගේ
සලකුණ

THE HEROES OF OLYMPUS

BOOK 3

# THE MARK OF ATHENA

# ඇතීනාගේ සලකුණ

## කර්තෘගේ වෙනත් කෘති

- ලොව මහා ගංගා
- ලෝකය ආ ගමන් මග
- චන්ද්‍රිකා සහ රොකට් තාක්ෂණය
- අපේ විශ්වය
- අසිරිමත් සොබාදහම
- මහ පොළොවේ කතන්දරේ
- වන උයනක සිරි නරඹමු
- සොබාදහමේ දායාද
- මහ පොළොවෙන් වඳවී ගිය දැවැන්තයෝ
- මහ සයුරේ වතගොත
- සත්ත්ව රාජධානිය

## පරිවර්තන

- මළවුන්ගේ හෝරාව
- බහිරව සැරයටිය (මායා පහනේ දරුවෝ කතා මාලාවේ පළමුවැන්න)
- බැබිලෝනියාවේ නිල බහිරවී (මායා පහනේ දරුවෝ කතා මාලාවේ දෙවැන්න)
- කත්මණ්ඩුවේ නාග රාජයා (මායා පහනේ දරුවෝ කතා මාලාවේ තුන්වැන්න)
- බහිරව රණ ශූරයෝ (මායා පහනේ දරුවෝ කතා මාලාවේ සිව්වැන්න)
- ඇමසන් වනයේ ඇස (මායා පහනේ දරුවෝ කතා මාලාවේ පස්වැන්න)
- ෆයිසාබාදයේ පංච සන්න්‍යාසියෝ (මායා පහනේ දරුවෝ කතා මාලාවේ හයවැන්න
- මැදියම් රැයේ ඇවිදින පඹයා
- කුණාටුව
- හොල්මන් ගෙදර

# පෙරවදන

ඇතීනාගේ සලකුණ නමින් ඔබ අතට පත්වන්නේ Rick Riordan විසින් රචිත Heroes of Olympus කතා මාලාවෙහි තුන්වැන්න වූ The Mark of Athena කෘතියේ සිංහල පරිවර්තනයයි. රික් රියෝඩන්ගේ නිර්මාණයක් වූ පර්සි ජැක්සන් චරිතයක් සමඟ ඔහුගේ කණ්ඩායම යෙදෙන තවත් භයානක ගවේෂණයක් මෙම කෘතියෙන් ඉදිරිපත් කෙරේ.

ලෝක ඉතිහාසයේ මහා ශිෂ්ටාචාරයන් දෙකක් ලෙස සැලකෙන ග්‍රීක රෝම ශිෂ්ටාචාරයට අයත් ආගමික සංකල්පයන් තුළ දක්නට ලැබෙන දේව පුරාවෘත්ත නූතන ලෝකය සමඟ එකට ගලපමින් අපූරු ප්‍රබන්ධයක් ඉදිරිපත් කිරීමට කතාවරයා සමත් වී තිබේ. ඔහුගේ කතාවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ ද ඔහු පැරණි ග්‍රීක රෝම පුරාවෘත්ත ඇසුරු කරමින් ඒ අනුසාරයෙන් ගොඩනගා ගත් චරිත තම කෘති තුළ ජීවමාන කිරීමයි.

මිත්‍යා කතාවලින් ජීවය ලද චරිත ඔස්සේ කතාව ගොඩනැගුණත් එය ප්‍රබන්ධයකැයි නොසිතෙන තරමට රසවත් ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කතුවරයා දක්වන කුසලතාව ඔහු ලෝකයේ අතිශය ජනප්‍රිය ලේඛකයකු වශයෙන් ඔසවා තැබීමට හේතු වන්නට ඇත. කෙසේවෙතත් මෙහි මුල් කෘති දෙක කියැවූ පාඨකයන්ට මෙහි භාෂා ශෛලියේ යම් වෙනසක් ඇති බව වැටහී යනු ඇත. මුල් කෘතිවල ශෛලියට වඩා මා හට හුරු වූ ශෛලියෙන් තුන්වැන්න පරිවර්තනය කිරීමට අදහස් කළේ ලේඛකයකුගේ ශෛලිය වෙනස් කිරීමට යාම කෘතියේ අසාර්ථකත්වයට හේතු විය හැකි බැවිණි.

සුපුරුදු ලෙසම මේ කෘතිය පරිවර්තනය කිරීමේදි නත් අයුරින් සහයෝගය දුන් සැමටත්, කෘතිය ප්‍රකාශයට පත් කළ ආශිර්වාද ප්‍රකාශන ආයතනයේ අධිපති චාමින් විජේරත්න මහතාට සහ මෙලනි අමරතුංග මහත්මියටත් විශේෂ ස්තුතිය පිරිනමන අතර සැමදා මගේ ලේඛන දිවියට අත්වැලක් වන බිරිඳ සරෝජිනී සහ ලංකානි දියණියටත් සෙනෙහසින් සිහිපත් කරමි.

# 01
# ඇනබෙත්

පිපිරෙන ප්‍රතිමාව හමුවන තුරුම, තමා සියල්ල සූදානම් කොට ඇතැයි ඇනබෙත් සිතා සිටියාය.

ආගෝ II[1] නමැති ඔවුන්ගේ පියාඹන නැවේ තට්ටුව මත පියවර තබමින්, ඇය වරක් නොව දෙවරක්ම බැලිස්ටායි අවිය පරීක්ෂා කර එය අගුළු දා ඇත්දැයි සැක හැර ගත්තාය. ''අපි පැමිණියේ සාමයටයි.'' යනුවෙන් සඳහන් සුදු පැහැති ධජය ඇණියේ ලෙළ දෙන්නේ දැයි තහවුරු කර ගත්තාය. ඇය අනෙක් පිරිස සමඟ එක්ව සැලැස්ම සමාලෝචනය කළාය. අතිරේක සැලසුමක් සැදුවාය. අතිරේක සැලසුමටත් අතිරේක සැලසුමක් හැදුවාය.

වඩාත් වැදගත් දෙය වූයේ ඇය ඔවුන්ගේ යුදකාමී භාරකරුවා වූ කෝච් ග්ලීසන් හෙජ් පසෙකට කර තැබීමයි. උදෑසන පුරා ඔහුට තම කුටියට වී සිටින ලෙස පැවසූ ඇය ආත්මාරක්ෂක සටන් ශූරතාව නැවත නැරඹීමට ඔහුට දිරි දුන්නාය. ඔවුන්ගේ මායා නෞකාව එදිරිවාදී රෝම කඳවුරකට ඇතුළු වනවිට මැදි වයසේ නරාශ්වයෙක් මුගුරක් වනමින් ''මැරියන්'' යනුවෙන් කෑ ගැසීම ඔවුන්ට වළක්වා ගැනීමට අවශ්‍ය වූ අවසන් දෙය විය.

සියලු දේ පිළිවෙලට සිදුවන බව පෙනිණි. නැව ගුවන්ගත වූ මොහොතේ පටන් දැනෙමින් තිබූ ගුප්ත වෙව්ලීමද මේ වනවිට- අඩුම වශයෙන් දැනටවත් පහව ගොස් තිබිණි.

---

1 ලියෝ විසින් ඉදිකරන ලද අපූරු නෞකාවක් වූ මෙයට මුහුදේ මෙන්ම ගුවනේ ද යාත්‍රා කළ හැකිය.

සුදු නැව වලාකුළු අතරින් පහත බසින්නට වුවත්, ඇනබෙත්ට ඇය තුළ ඇතිවූ දෙවැනි අනුමානය නවත්වාගත නොහැකි විය. මේක තරක අදහසක් නම් මොනව වෙයිද? රෝමවරු පිස්සු වැටිලා අපිව දක්ක ගමන් පහර දුන්නොත්?

පැහැදිලිවම ආගෝ II හි මිත්‍රශීලී පෙනුමක් නොතිබිණි. අඩි දෙසීයක් දිග, ලෝකඩ ඵලක සවිකළ කඳකින් යුත් එහි ඉදිරියේ සිට පිටුපසට යනතෙක් හරස් දුනු සවිකර තිබිණි. ගිනි විහිදුවන ලෝහ මකරෙක් එහි ඉදිරියෙන්ම සවිකර තිබිණි. නැව මැද තිබූ කරකැවෙන බැලිස්ටායි[1] දෙකෙන් පිපිරුම් හී විහිදීමට හැකි වූ අතර ඒවා කොන්ක්‍රීට් පවා පුපුරුවා හැරීමට සමත් ඒවා විය. එහෙයින් එය අසල්වාසීන් හමුවී සුභ පැතීමේ ගමනකට සුදුසු වූවක් නොවීය.

රෝමවරුන්ට අත් එසවීමට අවස්ථාවක් දීමට ඇනබෙත් උත්සාහ කළාය. ලියෝ ඇමතූ ඇය, ඔහුගේ විශේෂිත නිපැයුම් වලින් එකක වූ- හොලොග්‍රැපික ලියැවිල්ල- අනතුරු ඇඟවීමේ සංඥාවක් ලෙස කඳවුර තුළ සිටින ඔවුන්ගේ මිතුරන්ට යවන ලෙස පැවසුවාය. පණිවුඩය ඔවුන්ට ලැබෙතැයි බලාපොරොත්තු වූවාය. සිනා මුහුණක් සමඟ WASSUP? යන යෝධ පණිවුඩය නැව් බඳේ යට පැත්තේ සිතුවම් කිරීමට ලියෝට අවශ්‍ය විය. එහෙත් ඇනබෙත් ඒ අදහස ප්‍රතික්ෂේප කළාය. රෝමවරුන්ගේ විහිලු තේරුම් ගැනීමේ හැකියාව ගැන ඇයට විශ්වාසයක් නොතිබිණි.

දූත් ආපසු හැරීමට ප්‍රමාද වැඩිය.

නැවේ බඳෙන් බිඳී ගිය වලාකුළු අතරින්, ඔවුන්ට පහළින් දිස්වූයේ ඕක්ලන්ඩ් හිල්ස් හි රන් සහ කොළ පැහැති පලසයි. ඇනබෙත් නැව් තට්ටුවේ අත් වැටේ පෙළට තබා තිබූ ලෝකඩ පලිහකින් එකක් අල්ලා ගත්තාය.

ඇගේ සයන් තිදෙනා ඔවුන්ගේ ස්ථානවලට ගියහ.

නැව් අවරයේ ඉහළ තට්ටුවේ, ලියෝ තමාගේ මාපක යන්ත්‍ර හා ලීවර පරීක්‍ෂා කරමින් පිස්සකු වී සිටියේය. බොහෝ සුක්කානම් කරුවන් නියමු රෝදය ගැන සෑහීමකට පත්වනු ඇත. ලියෝ යතුරු පුවරුවක්, මොනිටරයක් සහ ලියර් ජෙට් යානයක ගගන පාලන උපකරණද, ශබ්ද පාලන පුවරුවක් සහ නින්ටෙන්ඩෝ Wii චලන පාලක සංවේදක ද ස්ථාපනය කර තිබුණේය. ත්‍රොටලය ඇදීමෙන් ඔහුට නෞකාව හැරවීමේ හැකියාව තිබිණි. ඔහුගේ Wii පාලක සෙලවීමෙන්

1 ඇත ඉලක්කයකට එල්ල කළ හැකි රෝම මිසයිලයකි.



රුවල් එසවීමේ හැකියාව තිබිණි. උප දෙවියකුගේ තත්ත්වයක සිටියදී පවා ලියෝ, බරපතල ලෙස ADHD[1] වලින් පෙලුණේය.

පිපර් ප්‍රධාන කුඹය සහ බැලිස්ටායි අතර එහාටත් මෙහාටත් ඇවිදිමින් සිටියාය. "ඔයාගෙ ආයුධ පහත දාන්න." ඇය මිමිණුවාය. "අපිට ඕනෙ කතා කරන්න විතරයි."

ඇගේ වශී කරවන කතාව බෙහෙවින් ප්‍රබල විය. එම වදන් ඇනබෙත්ට තුළ ඇගේ කිනිස්ස පහත දැමීමටත්, දීර්ඝ කතාබහක නියැලීමටත් කැමැත්ත ඇති කරවන්නක් විය.

ඇප්‍රොඩයිට්ගේ දරුවකු වුවත්, පිපර් ඇගේ රූපය ගැන දැඩි සැලකිල්ලක් නොදක්වූවාය. අද ඇය හැඳගෙන සිටියේ ඉරුණු ජීන්සයකි. ඇගේ දුඹුරු පැහැති කොණ්ඩය කරලක් ලෙස ගොතා රාජාලි පිහාටුවකින් සරසා තිබිණි.

ඉන්පසු එතැන වූයේ පිපර්ගේ පෙම්වතා- ජේසන්ය. එසවුණු හරස් දුනු වේදිකාවේ දුන්නක් අසල ඔහු සිටගෙන සිටියේය. ඔහු සිටගෙන සිටින්නේ රෝමවරුන්ට පහසුවෙන්ම ඇස ගැසෙන ස්ථානයකය. ඔහුගේ ඇඟිලි පුරුක් රන් අසිපතේ මිට හේතුවෙන් සුදු පැහැ ගෙන තිබිණි. ඔහුගේ කලිසමට සහ අර්ධ ලෝහිත කඳවුරේ[2] තැඹිලි පැහැති ටී ෂර්ටයට උඩින් ටෝගාවක් සහ දම් පැහැති ලෝගුවක් හැඳ සිටියේය. ඒවා ඔහු රෝම විනිසුරුවරයෙකු ලෙස දරූ පැරණි පදවියේ සලකුණු විය. සුළඟට සැලෙන ඔහුගේ දුඹුරු කොණ්ඩය සහ අයිස් වැනි නිල් ඇස් ඔහුගේ කඩවසම් බව වැඩි කළ අතර ජුපිටර්ගේ පුත්‍රයාට තිබිය යුතු පරිද්දෙන්ම හික්මීම පෙන්නුම් කළේය. ඔහු වැඩුණේ ජුපිටර් කඳවුරේදීය. එබැවින් ඔහුගේ හුරුපුරුදු මුහුණ හේතුවෙන් රෝමන්වරු නැව අහසේ දී පුපුරුවා හැරීමට පැකිලෙනු ඇතැයි ඇනබෙත් බලාපොරොත්තු වූවාය.

ඇනබෙත් එය සැඟවීමට උත්සාහ කළත්, ඇය තවමත් මේ හාදයාව මුළුමනින්ම විශ්වාස නොකළාය. ඔහු ඕනාවටත් වඩා පරිපූර්ණ අයකු ලෙස හැසිරුණේය - සැමවිටම නීති අනුගමනය කරමින්, සැමවිටම ගෞරවණීය දේවල් කළේය. ඔහුගේ පෙනුම පවා ඕනෑවට වඩා පරිපූර්ණ විය. ඇගේ යටි සිතේ විවිධ සිතිවිලි ජනිත විය. මේක කපටිකමක් නම් එයා අපිව පාවල දුන්නොත්? ජුපිටර්

1 attention deficit hyperactivity disorder

2 ග්‍රීක උප දෙවිවරුන්ගේ පුහුණු බිම යි. කැලිෆෝනියාවේ ඕක්ලන්ඩ් හිල් සහ බාක්ලේ හිල් අතර පිහිටා ඇත.

කඳවුරට යාත්‍රා කරල එයා කිව්වොත් ඒයි රෝමවරුනේ මම ඔයාලට ගෙනාව මේ අපූරු නැවයි, සිරකරුවොයි පරීක්ෂා කරන්න කියලා?

එවැන්නක් සිදුවෙතැයි ඇනබෙත් තුළ වූයේ සැකයකි. තවමත්, ඇයට අප්‍රිය බවකින් තොරව ඔහු දෙස බැලීමේ හැකියාවක් නොතිබිණි. හේරා[1] විසින් බලහත්කාරයෙන් කඳවුරු දෙකට හඳුන්වා දුන් "හුවමාරු වැඩසටහනේ" ඔහු ද කොටසක් වී සිටියේය. ඇගේ වඩාත් පීඩාකාරී රැජන, ඔලිම්පස් හි රැජින, ඔවුන්ගේ රෝම සහ ග්‍රීක දරුවන් යුගල් දෙක, පෘථිවියෙන් අවදිවෙමින් සිටින දෙවඟන ගයියාගෙන්[2] සහ ඇගේ බියකරු යෝධ දරුවන්ගෙන් ලෝකය බේරා ගැනීම සඳහා එකම පෙරමුණකට එකතු විය යුතු බව අනෙක් දෙවිවරුන්ට ඒත්තු ගැන්වූවාය.

අනතුරු ඇඟවීමක් නොමැතිව, හේරා ඇනබෙත්ගේ පෙම්වතා වූ පර්සිව උදුරා ගත්තාය. ඔහුගේ මතකය සිතින් අතුගා දමූ ඇය ඔහුව රෝම කඳවුරට යැව්වාය. හුවමාරුවේදී, ග්‍රීකයන්ට ජේසන්ව ලැබිණි. ඒ එක්කවත් ජේසන්ගේ වරදක් නොවුණත්, ඇනබෙත් ඔහු දකින සෑම වතාවකම, ඇයට පර්සිව කෙතරම් අහිමි වී තිබෙන්නේද යන්න මතකයට නැගිණි.

පර්සි... දැන් හරියටම ඔවුන්ට පහළ කොහේ හෝ තැනක සිටිනු ඇත. අහ්. දෙවියනි. උමතු හැඟීමක් ඇගේ සිරුර තුළ දිව ගියේය. ඇය බලෙන්ම එය යටපත් කර ගත්තාය. විනාශයට ඉඩ දීමට ඇයට නුපුළුවන.

මම ඇතීනාගේ[3] දරුවෙක්, ඇය තමාටම පවසා ගත්තාය. මම මගෙ සැලසුම ගැන හිතන්න ඕනෙ. අවුල් වෙන්න හොඳ නැහැ. ඇයට නැවත එය දැනුණාය- හුරුපුරුදු වෙව්ලීම - එය හරියට මනෝවිකාරී හිම මිනිසෙක් ඇගේ පිටුපසින් සිට ඇගේ ගෙලට පිඹිනවා වැනි හැඟීමකි. ඇය හැරුණාය. එහෙත් එතැන කිසිවකු නොසිටියේය.

එය ඇගේ ස්නායු ආවේගයක් විය යුතුය. දෙවියන්ගේ සහ රාක්ෂයන්ගේ ලෝකයේදී පවා, අලුත් යුද නැවේ හොල්මන් ඇතැයි ඇනබෙත් විශ්වාස නොකළාය. ආගෝ II හොඳින් ආරක්ෂා කරන

... බිරිඳ සහ සොහොයුරියයි.



ලද්දකි. අත්වැට දිගට තිබූ දිව්‍යමය ලෝකඩ[1] එලකවලට රාක්ෂයන් පළවා හැරීම සඳහා මතුරා තිබිණි. එසේම ඔවුන්ගේ නැව් තට්ටුවේ සිටි නරාශ්වයා වූ කෝච් හෙජ්ට, ඕනෑම ආක්‍රමණිකයෙක් ඉවෙන් හඳුනාගත හැකි විය.

උපදෙස් පතා මවට යාච්ඤා කිරීමට හැකි වූවා නම්, කියා ඇනබෙත්ට සිතිණි. එහෙත් දැන් එය සිදුවිය හැක්කක් නොවේ. ගිය මාසයේදී ඇය තම මව සමඟ භයානක එදිරිවාදිකමක් ඇතිකර ගත්තාය.

සිසිල් තෙරපුම තවත් සමීපව දැනෙන්නට විය. සුළඟ තුළින් තමාට දුබල සිනා හඬක් ඇසුණේ යැයි ඇය සිතුවාය. ඇගේ සිරුරේ සෑම පේශියක්ම දරදඬු විය. යම් භයානක වැරදීමක් සිදුවී තිබේ.

මාර්ගය ආපස්සට ගන්නා ලෙස ඇය ලියෝට නියෝග කළාය. ඉන්පසු, පහළ නිම්නයෙන් නලා හඬ නැගිණි. රෝමවරුන් ඔවුන්ව දැක තිබිණි.

අපේක්ෂා කළ යුත්තේ කුමක් දැයි තමා දන්නා බව ඇනබෙත් සිතුවාය. පූර්ණ විස්තරාත්මකව ජේසන් ජුපිටර් කඳවුර ගැන ඇයට විස්තර කර තිබිණි. තවමත්, ඇයට තම දෑස් විශ්වාස කිරීමේ ගැටලුවක් තිබිණි. ඔක්ලන්ඩ් කඳුවලින් වටවූ නිම්නය අර්ධ ලෝහිත කඳවුර මෙන් දෙගුණයක් පමණ විශාල විය. එක් පැත්තකින් ගලා එන කුඩා ගංගාවක් කැපිටල් G අකුර මෙන් දඟර ගැසී මධ්‍යය දෙසට ගලාවිත් නිල් පැහැති විලකට ඇද වැටුණේය.

නෞකාවට කෙළින්ම පහළින්, විලේ දාරයේ පිහිටි නව රෝම[2] නගරය හිරු එළියෙන් නැහැවී තිබිණි. ජේසන් ඇයට කියා තිබුණු සලකුණු- අශ්ව ක්‍රීඩාංගණය, රංග ශාලාව, දේවස්ථාන සහ උද්‍යාන, යාබද සප්ත කඳු සහ එහි වංගු ගැසුණු මාර්ගද, වර්ණවත් මන්දිර සහ මලින් පිරී ගිය උද්‍යාන ආදිය ඇයට හඳුනා ගත හැකි විය.

රාක්ෂ හමුදාව සමඟ රෝමවරු මෑතකදී සිදුකළ යුද්ධයේ සාධක ඇය දුටුවාය. සෙනෙට් මන්දිරය විය යුතු යැයි ඇය අනුමාන කළ ගොඩනැගිල්ලේ වහලයේ අර්ධ ගෝලය පුපුරා විවෘත වී තිබිණි. විනිශ්චය මණ්ඩලයේ විවෘත චතුරශ්‍රයේ ආවාට හැරී තිබිණි. සමහ ජලමල් සහ ප්‍රතිමා නටඹුන් බවට පත්වී තිබිණි.

1 රාක්ෂයන්ට මාරාන්තික වන දුර්ලභ ලෝහයකි.

වෝගාවලින් සැරසුණු ළමුන් දුසිම් ගණනක් ආගෝ II හොඳින් දක ගැනීම සඳහා එක පොදියට සෙනට් මන්දිරයෙන් පිටතට දිව ආහ. තව තවත් රෝමවරු කඩ සාප්පු සහ අවන්හල් වලින් පිටතට පැමිණෙමින්, පහතට බසින නෞකාව පෙන්වමින් කෑ ගසන්නට වූහ.

සැතපුම් භාගයක් පමණ බටහිරට වන්නට, නළා හඬ ඇසෙන පැත්තේ, කඳුගැටය මත පිහිටා තිබුණේ රෝම බලකොටුවකි. ඇනබෙත්ට එය පෙනුණේ තමා හමුදා ඉතිහාසය පොත් වල දක තිබූ සිතුවමක් ලෙසිණි. එහි ආරක්ෂිත අගල් සමඟ උල්, උසැති ප්‍රාකාර සහ ගෝණුසු බැලිස්ටායි වලින් සන්නද්ධ වූ මුර කුළුණු ද පිහිටා තිබිණි. ඇතුළත, ප්‍රධාන මාර්ගය ඔස්සේ පෙළට වූයේ සුදු පැහැති බැරැක්ක හෙවත් වයා ප්‍රින්සිපාලිස්ය.

ගේට්ටු තුළින් උප දෙවිවරුන් රැසක් පැමිණියහ. ඔවුන් හැල්මේ නගරය දෙසට දිව එන විට ඔවුන්ගේ සන්නාහ හා හෙලි දිලිසෙන්නට විය. ඔවුන්ගේ පදවි අතර මැද, සැබෑ යුද හස්තියකු ද විය.

මේ සේනාංක ළඟාවීමට පෙර ආගෝ II පොළොවට පහත් කිරීමට ඇනබෙත්ට වුවමනා වුවත්, පොළොව තවමත් පිහිටා තිබුණේ අඩි සියගණනක් පහළිණි. පර්සිගේ ජායාවක් හෝ දක ගැනීමේ අටියෙන් ඇය පිරිස දෙස නෙත් යැව්වාය.

එවිටම ඇය පිටුපසින් කන් බිහිරි කරවන හඬක් නැගිණි.

පිපිරුම ඇයව නෞකාවෙන් එළියට විසිකර දැමීමට ආසන්න වන තරම් ප්‍රබල විය. ඇය කරකැවී බලන විට දුටුවේ තමා කෝපයෙන් පිපිරෙන ප්‍රතිමාවක් දෙස බලා සිටින අයුරුය.

"පිළිගත නොහැකියි." ඔහු ගිගිරුවේය. ඔහු ජීවිත කාලය පුරාම පුපුරමින් සිටින බව පෙනී ගියේය. ගෙන්දගම් ගන්ධයෙන් යුත් කහ පැහැති දුමක් ඔහුගේ උරහිස්වලින් නික්මිණි. ඔහුගේ බොකුටු කොණ්ඩයෙන් ගිනි අඟුරු පිටවිණි. ඔහුගේ ඉනෙන් පහළ, කිරිගරුඬ පාදස්තලයක් හැර වෙනත් යමක් නොතිබුණේය. ඉනෙන් ඉහළ කොටසේ ඔහු මාංශ පේශිවලින් යුතු මිනිස් රුවක් ලෙස දිස් වූ අතර එහි ටෝගාවක් ද කැටයම් කර තිබිණි.

"පොමේරියන් රේඛාව' ඇතුළට ආයුධ ගෙනෙන්න ඉඩ දෙන්නෙ නැහැ!" ඔහු අපැහැදිලි හඬකින් පැවසුවේය. "මම නිසැකවම ග්‍රීකයන්ට ඇතුළු වෙන්න දෙන්නෙ නැහැ."

... අතීතයේ දී රෝම නගරයේ සීමාව.



ජේසන් ඇනබෙත් දෙස බැලුවේය. එහි වූයේ 'මම කතා කරන්නම්' කියන්නාක් වැනි බැල්මකි. "ටර්මිනස්[1]" ඔහු පැවසුවේය. "මේ මම, ජේසන් ග්‍රේස්."

ආහ්, මට ඔයාව මතකයි, ජේසන්." ටර්මිනස් ගිගිරුවේය. "මම හිතන්නෙ රෝමයෙ සතුරන්ට හවුල් වුණ එක ගැන ඔයාට හොඳ හැඟීමක් ඇති!"

"ඒත් එයාල සතුරෝ නෙමෙයි."

"ඒක හරි," පිපර් මැදට පැන්නාය. "අපි මිනෙ කතා කරන්න විතරයි. අපිට පුළුවන් නම්-"

"හා!" ප්‍රතිමාව පැවසුවේය. "ඔය වශී කතාවලින්[2] මාව රවට්ටන්න හදන්න එපා, තරුණ නෝනා, ඒ වගේම මම ඔයාගෙ අත්වලින් ඇදල දාන්න කලින් ඔය කිනිස්ස විසි කරන්න."

පිපර් ඇගේ ලෝකඩ කිනිස්ස දෙස බැලුවාය. එය ඇගේ අතේ තිබුණ බව ඇයටද අමතක වූ බවක් පෙනිණි. "ආහ්... හරි ඒත් ඔයා කොහොමද ඒකට පහර දෙන්නේ. ඔයා ළඟ කිසිම ආයුධයක් නැතෙ? "

"නොහික්මුණුකම!" තියුණු 'පොප්' හඬක් සමඟ කහ පැහැති ආලෝකයක් නික්මිණි. පිපර් වේදනාවෙන් කෑ ගසමින් කිනිස්ස අතහැරියාය. එය දන් ගිනි පුපුරු විහිදුවමින්, දුම් දමමින් තිබිණි. "උඹෙ වාසනාවට මම මේ යුද්ධෙකට ගිහින් ආව විතරයි." ටර්මිනස් පැවසුවේය. "මගෙ සම්පූර්ණ ශක්තිය තිබුණානම්, මම දැනටමත් මේ පියාඹන ළදරු පාසල පුපුරුවල අහසින් මකල දාල ඉවරයි."

"කටවහපන්." තම Wii පාලකය වනමින් ලියෝ ඉදිරියට පැමිණියේය. "උඹ මගේ නැවටද ළදරු පාසල කිව්වේ? මම දන්නවා උඹට ඒක කරන්න බැහැ කියලා." තම ක්‍රීඩා උපකරණයෙන් ලියෝ ප්‍රතිමාවට පහර දිය හැකි යැයි යන අදහස ඇනබෙත්ව ඇගේ කම්පනයෙන් මුදවාලීමට සමත් වූවාය.

"අපි හැමෝම සන්සුන් වෙමු." තමා අතේ ආයුධ නැතැයි පෙන්වීමට මෙන් ඇය දැත් විදහා පෑවාය. "මම හිතන්නේ ඔයා

1 දේශසීමා සහ භූමි සලකුණු සඳහා අධිපති දෙවියා.
2 තම කටහඬින් අනුන්ව නම්මා ගැනීමට හැකියාව. ඇෆ්‍රොඩයිට් විසින් ඇගේ දරුවන්ට ප්‍රදානය කරන ලද බලයකි.

දේශසීමාවන්ට අධිපති දෙවියා, ටර්මිනස්. ඔයා නව රෝම නගරය ආරක්ෂා කරනවා කියල ජේසන් මට කිව්වා. මම ඇනබෙත් චේස්..."

"ආහ්, මම දන්නවා ඔයා කවුද කියලා! තම හිස් සුදු දෑස් වලින් ප්‍රතිමාව ඇය දෙස බලා සිටියේය. "ඇතීනාගේ දරුවෙක්. මිනර්වාගේ ග්‍රීක ආකාරය. නින්දිතයි. ග්‍රීක නුඹලාට වැදගත්කම ගැන හැඟීමක් නැහැ. රෝම අපි දන්නවා ඒ දෙවඟනට ගැලපෙනම තැන."

ඇනබෙත් දත්මිටි කෑවාය. උපායශීලී නොවුණ හොත් මේ ප්‍රතිමාව සමඟ කටයුතු කිරීම පහසු නොවනු ඇත. "මොකක්ද ඔයා ඇත්තටම අදහස් කළේ, ඒ දෙවඟන ගැන? ඒ වගේම මොකක්ද ඔච්චර නින්දිත දේ?"

"හරි!" ජේසන් බාධා කළේය. "කොහොම වුණත්, ටර්මිනස්, අපි මෙහෙට ආවේ සාම මෙහෙයුමකට. අපි කැමතියි ගොඩබසින්න අවසර ලැබෙනව නම්. එතකොට අපිට පුළුවන්-"

"ඒක වෙන්නෙ නෑ." දෙවියා ගිගිරුවේය. "නුඹලාගේ ආයුධ බිම දමා යටත් වෙනු! ඉක්මනින් මගේ නගරයෙන් පිටවෙනු."

"දෙකෙන් කෝකද?" ලියෝ විමසුවේය. "යටත්වීමද, නැත්නම් පිටත් වීමද?"

"දෙකම!" ටර්මිනස් පැවසුවේය. "යටත්වෙලා ඊට පස්සේ පිටත් වෙන්න. ඒ වගේ තකතීරු ප්‍රශ්නයක් අහන උඹේ මූණ මම පොඩි කරනවා, විකට කොලුවෝ! උඹට ඒක දැනෙනවද?"

"වාව්, ලියෝ වෘත්තියමය කැමැත්තකින් ටර්මිනස්ව අධ්‍යයනය කළේය. "ටිකක් තදේට රිදිල වගේ. ඔක බුරුල් කරගන්න මොනව හරි ඕනෙද? මට පුළුවන් හොයල බලන්න."

Wii පාලකය ඉනපටියේ දමාගත් ඔහු ඉස්කුරුප්පු නියන ගෙන ඉන් ප්‍රතිමාවේ පාදස්තලයට තට්ටුවක් දැමුවේය.

"ඒක නවත්තන්න." ටර්මිනස් විරෝධය පෑවේය. තවත් කුඩා පිපිරුමකින් ලියෝට තම ඉස්කුරුප්පු නියන අතහැර දැමීමට සිදුවිය. "පොමේරියන් රේඛාව ඇතුළෙ රෝම පසේ ආයුධ වලට ඉඩක් නැහැ."

"මොකක්ද?" පිපර් විමසුවාය.

"නගර සීමා." ජේසන් පරිවර්තනය කළේය.

"ඒ වගේම මේ මුළු නැවම ආයුධයක්!" ටර්මිනස් පැවසුවේය.



"නුඹලාට ගොඩබෑසිය නොහැකියි."

පහළ නිම්නයේ ලෙජියන් සේනාංකය නගරයේ අඩ දුරක් ගෙවා සිටියහ. නගර චතුරශ්‍රයේ සෙනඟ සියගණනින් වැඩි වී තිබිණි. ඇනබෙත් එහි මුහුණු පරීක්ෂා කළාය. එසේම... ආහ්. දෙවියනි. ඇය ඔහුව දුටුවාය. තම හොඳම මිතුරන් යැයි සිතිය හැකි ළමුන් දෙදෙනකු ද පිරිවරා ඔහු තම ආයුධ සමඟ නැව දෙසට එමින් සිටියේය. එකකු තරබාරු පිරිමි ළමයෙකි. අනෙකා රෝම සන්නද්ධ බලකා හිස්වැස්මක් පැළඳි කෙල්ලකි. පර්සි බෙහෙවින් සුව පහසුව මෙන්ම සතුටින් සිටින බව පෙනුණි. ඔහු ජේසන් වැනිම දම් පැහැති කාප්පයක් (අත් කොට කබායක්) හැඳ සිටියේය. එය රෝම විනිසුරුවරුන්ගේ සලකුණක් විය.

ඇනබෙත්ගේ හදවත උඩ පනින්නට විය.

"ලියෝ, නැව නවත්වන්න." ඇය නියෝග කළාය.

"ඔයාට මම කියන දේ ඇහුණනෙ. අපි හිටපු තැනටම අපිව ගෙනියන්න." තම පාලකය අතට ගත් ලියෝ එය ඉහළට එසවිය. හබල් අනූවම එක විට නතර වී නැවේ පහළ බෑසීම නැවතිණි.

"ටර්මිනස්."ඇනබෙත් පැවසුවාය. "නව රෝමයට ඉහළින් පාවෙන්න නීතියක් නැහැ නේද?"

ප්‍රතිමාව රැව්වේය. "නෑ..."

"අපිට නැව පා කරමින් තියන්න පුළුවන්." ඇනබෙත් පැවසුවාය. "විනිශ්චය ශාලාවට ළඟා වෙන්න අපි කඹ ඉණිමගක් පාවිච්චි කරමු. ඒ විදිහට නැව රෝම පසට යන්නෙ නෑ. තාක්ෂණිකව."

ප්‍රතිමාව ඒ ගැන ඕනෑකමින් සිතන බව පෙනිණි.

"තාක්ෂණිකව මම කැමතියි." ඔහු පැවසුවේය. "තවමත්..."

"අපේ ආයුධ සේරම නැවේ තියේවි." ඇනබෙත් පොරොන්දු වූවාය.

"මම හිතනවා රෝමවරු- අපි දිහාට එන සේනාංකය පවා- පොමේරියන් රේඛාව ඇතුළෙ ඔයාගෙ නීතිවලට ගරු කරයි කියලා. ඔයා එයාලට කිව්වොත්?"

"ඇත්ත වශයෙන්ම," ටර්මිනස් පැවසුවේය. "නීති කඩන අයට ඉඩ දෙන කෙනෙක් වගේද මාව පේන්නෙ?"

"ආහ්, ඇනබෙත්..." ලියෝ පැවසුවේය. "ඔයාට විශ්වාසද මේක හොඳ අදහසක් කියලා?"

දැත් වෙව්ලීමෙන් වළක්වා ගැනීමට ඇය අත් මිට මොළවා ගත්තාය. හරියටම ඇය පිටුපසින් පාවෙමින් මෙන් ඒ සීතල හැඟීම තවමත් එහි තිබෙන බව පෙනුණේය. දූත් ටර්මිනස් තවදුරටත් කෑ ගැසීම සහ පිපිරවීම් කිරීම නවතා තිබිණි. සමහරවිට මේ ඇය තේරූ තාරක විකල්පයක් වීමටද පුළුවන.

එහෙත් පර්සි පහළය. බෙහෙවින් සමීපව ය. ඇය ඔහුවෙත ළඟා විය යුතුය.

"ඒක ප්‍රශ්නයක් වෙන එකක් නැහැ." ඇය පැවසුවාය. "කවුරුවත් ආයුධ ගේන එකක් නැහැ. අපිට සාමයෙන් කතා කරන්න පුළුවන්. හැම පක්ෂයක්ම නීතිවලට අවනත වෙන බවට ටර්මිනස් වගබලා ගනී." ඇය කිරිගරුඬ ප්‍රතිමාව දෙස බැලුවාය. "අපිට එකඟතාවයක් තියෙනවද?"

ටර්මිනස් ඉව කළේය. "මම හිතනවා, දූත් ඉඳල. ඔයාට ඔයාගෙ ඉණිමගෙන් නව රෝමයට බහින්න පුළුවන්, ඇතිනාගේ දියණිය. කරුණාකරලා මගෙ නගරය විනාශ කරන්න උත්සාහ කරන්න එපා."

## 02
# ඇනබෙත්

ඇනබෙත් විනිශ්චය ශාලාව හරහා එනවිට උප දෙවිවරු ඉක්මනින්ම එතැනට රැස්වූහ. සමහරුන් තුළ නොරිස්සුම් සහගත පෙනුමක් වූ අතර, සමහරුන් තුළ වූයේ සැකමුසු බැල්මකි. යෝධයන් සමඟ මෑතකදී සිදු වූ යුද්ධය හේතුවෙන්, සමහරුන්ගේ වෙළුම්පටි යොදා තිබුණත්, කිසිවකු ආයුධ සන්නද්ධව නොසිටියහ. කිසිවකු පහර නොදුන්හ.

අලුත් අමුත්තන් දැක ගැනීමට පවුල් පිටින් පැමිණ තිබිණි. ළදරුවන් වඩා ගත් යුවළවල්, මව්පියන්ගේ දෙපාවල එල්ලී සිටි දරුවන්, ඇනබෙත්ට දැක ගැනීමට ලැබිණි. වැඩිහිටි ජනයා පවා රෝම ලෝගුව සමඟ නූතන ඇඳුම් පැළඳුම් මිශ්‍රව හැඳ සිටියහ. ඔවුන් සියල්ලෝම උප දෙවිවරුන්ද? ඇනබෙත් එසේ සැකකළත්, ඇය මෙවැනි තැනක් මින්පෙර කෙදිනකවත් දැක නොතිබිණි. අර්ධ ලෝහිත කඳවුරේ, බොහෝ උපදෙවිවරු තරුණයෝ වූහ. උසස් පාසලින් උපාධිය ලබාගැනීමට ප්‍රමාණවත් තරම් කාලයක් ඔවුන් ජීවත් වුවහොත්, එක්කෝ ඔවුන් උපදේශකයන් ලෙස එහිම නැවතිණි. නැතහොත් මනුෂ්‍ය ලෝකය තුළ ඔවුන්ට හැකි පමණ හොඳින් තම ජීවිත ඇරඹීමට පිටව ගියහ. මෙහි සියලු පරම්පරාවල ප්‍රජාව වෙසෙයි.

පිරිසේ ඈත අන්තයෙන්, එකැස්යෝධ ටයිසන් සහ පර්සිගේ නාරකාදියේ දඩයම් බැල්ල වූ ඕ'ලියරි මහත්මිය දැක ගැනීමට ලැබුණාය අර්ධ ලෝහිත කඳවුරේ සිට ඔත්තු බැලීම සඳහා ජුපිටර් කඳවුරට

පැමිණි පළමුවැන්නා ඇය විය. ඔවුන් සතුටින් සිටින බව පෙනිණි. අතවැනූ ටයිසන් විරිත්තුවේය. ඔහු යෝධ බරෙන්තුවක් මෙන් SPQR* බැනරයක් පැළඳ සිටියේය.

ඇනබෙත්ගේ සිතේ තවත් පැත්තක නගරයේ අලංකාරය පැලපදියම් විය. බේකරිවලින් හමා ආ ගන්ධය, ඉහළට විහිදෙන ජල මල්, උද්‍යානවල පිපුණු මල් එහි අලංකාරයට හේතු විය. එසේම ගෘහ නිර්මාණ ශිල්පය... දෙවිවරු, ලිස්සන කිරිගරුඬ කුලුනු, අතිශය දීප්තිමත් මොසැයික්, උස් ආරුක්කු සහ මාලක මන්දිර ඒ අතර විය. ඇගේ ඉදිරිපිට, උපදෙවිවරු පූර්ණ රෝම සන්නාහයක් සහ දම් පැහැති කාප්පයක් හැඳි කෙල්ලකට ඉඩ ලබා දුන්හ. කළු පැහැති කෙස් වැටිය ඇගේ උරහිස් මත වැටී තිබිණි. ඇගේ දෑස් ඔබ්සීඩියන් පාෂාණ තරමට කළු විය.

"රෙයිනා."

ජේසන් ඇය ගැන හොඳින් විස්තර කර තිබිණි. ඒ නැතත් ඇනබෙත්ට ඇය නායිකාව බව හඳුනාගැනීම අපහසු නොවූවාය. ඇගේ සන්නාහය පදක්කම්වලින් සරසා තිබිණි. අනෙක් උපදෙවිවරුන් අතර ඇය කෙතරම් නිර්භීත බවක් පෙන්නුම් කළේද යත් ඇගේ බැල්මෙන් වැළකීමට ඔවුහු ඉවත බලාගත්හ.

ඇගේ මුහුණේ වූ වෙනත් යමක් ද ඇනබෙත්ට හඳුනාගත හැකි විය. මුව දෘඩිකරගෙන, නිකට ඔසවාගෙන සිටින උදාරම් ලීලාවෙන් ඇය ඕනෑම අභියෝගයක් පිළිගැනීමට සූදානම් අයකු බව පෙනිණි. රෙයිනාගේ නිර්භීත පෙනුම බලෙන් ආරෝපණය කරගත්තක් වූයේය. එහෙත් සැබැවින්ම මහජනයාට පෙන්වීමට නොහැකි වුවත් ඇය තුළ බලාපොරොත්තු කඩවීම සහ කරදර පත්ව සිටීම යන දෙකෙහි එකතුවක් සහ බියක් ඇති වී තිබිණි.

ඇනබෙත් ඒ භාව ප්‍රකාශනය දන සිටියාය. කණ්ණාඩියකින් මුහුණ බලන සෑම වතාවකම ඇයට එය දකගැනීමට ලැබී තිබිණි. ඇනබෙත්ගේ කෙල්ලන් දෙදෙනා එකිනෙකාට සැලකිල්ලක් දක්වූහ. ඇනබෙත්ගේ මිතුරෝ ඇගේ දෙපසින් වූහ. බිය මිශ්‍ර ගෞරවයකින් ජේසන් දෙස බලමින් රෝමවරු ඔහුගේ නම මතුරන්නට වූහ. එවිට තවත් කෙනෙක් සෙනඟ අතරින් පෙනී සිටියේය. ඇනබෙත් ගල් ගැසුණාය.

පර්සි ඇයට සිනාසුණේය- ඒ උපහාසාත්මක, කරදර ඇති කරන සිනහව වසර ගාණක් ඇයට කරදර කළත් අවසානයේ එය ඇගේ සිත්



ගත්තක් බවට පත්විය. ඔහුගේ මුහුදු කොළ පාට දෑස් ඇයගේ මතකයේ රැඳෙන තරමටම අලංකාර විය. ඔහුගේ කළු කොණ්ඩය එක් පැත්තකට ඇලී තිබුණේ ඔහු මුහුදු වෙරළේ ඇවිද මේ දැන් පැමිණියාක් මෙනි. තඹවන් සමින්ද, උසැති, සිහින් සහ හොඳින් මස්පිඬු වැඩුණු සිරුරින්ද යුක්ත වූ ඔහු, මාස හයකට පෙර අවසන් වරට හමුවන විට සිටියාටත් වඩා හොඳින් සිටින බව පෙනුණි.

ඇනබෙත් සෙලවීමට නොහැකි තරමට ගල් ගැසී සිටියාය. තවත් ඔහු සමීපයට ගියහොත්, ඇගේ සිරුරේ වූ සියලු අණු දවී යනැයි හැඟීමක් ඇය තුළ ඇති වූයේය. ඇය ඔහුට රහසිගතව පෙම් කළේ ඔවුන් දොළොස් හැවිරිදි ව සිටියදීය. ගෙවුණු ග්‍රීෂ්මයේදී, ඇය ඔහුට තදින්ම ආලය කරන්නට පටන් ගත්තාය. මාස හතරක් ඔවුහු ප්‍රීතිමත් යුවළක් ලෙස සිටියහ. ඉන්පසු ඔහු අතුරුදහන් විය.

ඔවුන්ගේ වෙන්වීම අතරතුර, ඇනබෙත්ගේ හැඟීම්වලට යමක් සිදු වී තිබුණේය. ජීවිතාරක්ෂක ඖෂධවලින් ඇයව බලෙන් ඉවත් කරන්නාක් මෙන් අධික වේදනාවක් වර්ධනය විය. ඒ බියකරු අහිමිවීම සමඟ ජීවත් වීම හෝ නැවත ඔහුව හිමිවීම යන දෙකෙන් බලවත් පීඩාව කුමක්දැයි යන්න ගැන ඇයට වැටහීමක් නොතිබිණි.

විනිසුරු රෙයිනා සෘජු වූවාය. පැහැදිළිව පෙනුණු අකැමැති බවකින් ඇය ජේසන් දෙසට හැරුණාය.

"ජේසන් ග්‍රේස්, මගේ පරණ සගයා..." ඇය සගයා යන වචනය උච්චාරණය කළේ එය භයානක වචනයක් මෙනි. "මම ඔයාව ගෙදරට සාදරයෙන් පිළිගන්නවා. ඒ වගේම මේ ඔබේ මිතුරන්වත්."

සිතාමතා නොවුණත් ඇනබෙත් ඉදිරියට යැවුණාය. ඒ මොහොතේම පර්සි ද ඉදිරියට පැමිණියේය. සෙනඟ කලබලයට පත්වූහ. සමහරු එතැන නොතිබුණ කඩු සොයන්නට වූහ.

දෑත් විහිදා පර්සි ඇයව වැළඳ ගත්තේය. ඔවුහු සිපගත්හ. එසේම මොහොතක් ගතවන තෙක් කිසිදු ප්‍රශ්නයක් ඇති නොවීය. ග්‍රහකයක් පෘථිවියේ ගැටී මුළු ජීවයම අතුගෑවී ගියත්, ඇනබෙත් එය ගණන් නොගනු ඇත.

පර්සිට මුහුදු සුළඟේ ගන්ධයක් දැනිණි. ඔහුගේ තොල් ලුණු රසැති විය. පාසි මොළයා, ඇය සතුටින් සිතුවාය.

පර්සි ඉවතට තල්ලු වී ඇගේ මුහුණ දෙස බැලුවේය. "දෙවියනේ, මම කවදාවත් හිතුවෙ නෑ-"

ඔහුගේ මැණික් කටුව ඩැහැගත් ඇනබෙත්, ඔහුව උරහිස් වලට ඉහළින් කරකවා හැරියාය. ඔහු ගල් පඩික වේදිකාවක ඇද වැටුණේය. රෝමවරු කෑ ගැසූහ. සමහරු ඉදිරියට පැමිණීමට උත්සාහ කළත් රෙයිනා කෑ ගැසුවාය. "නවතින්න, ඔහොම ඉන්න."

ඇනබෙත් තම දණහිස පර්සිගේ ළයට තැබුවාය. අතින් ඔහුගේ ගෙල සිරගත්තාය. රෝමවරු සිතන දේ ගැන ඇගේ තැකීමක් නොතිබිණි. කෝපාග්නිය ඇගේ ළය පුරා පැතිර ගියේය. ගෙවුණු ගිම්හානයේ සිට ඇය මේ දුක දරා සිටියාය.

"ඔයා ආයෙ මාව දාල ගියොත්." දැසින් ගිනි පිටකරමින් ඇය පැවසුවාය. "සියලු දෙවියන්ගේ නාමයෙන් මම දිවුරනවා." පර්සිට සිනාසීමට ස්නායු තිබුණේය. එක්විටම උණුසුම් හැඟීම් ඇනබෙත්ගේ අභ්‍යන්තරයේම දියවන්නට විය.

"මට කරපු අනතුරු ඇඟවීමක් විදිහට සලකන්නම්." පර්සි පැවසුවේය.

"මටත් ඔයාව නැතිවුණා."

නැගී සිටි ඇනබෙත් ඔහුටත් නැගිටීමට උදව් වූවාය. තවත් දැඩිව නැවත ඔහුව සිපගැනීමට ඇයට වුවමනා වුවත්, ඇය තම හැඟීම් පාලනය කර ගත්තාය.

ජේසන් තම උගුර පෑදුවේය. "ඉතිං, ඔව්... ආපසු ආව එක හොඳයි." ඔහු රෙයිනාව පිපර්ට සහ ලියෝට හඳුන්වා දුන්නේය. "ඒ වගේම මේ ඇනබෙත්." ජේසන් පැවසුවේය. "ආහ්, සාමාන්‍යයෙන් නම් එයා මිනිස්සුන්ට ජූඩෝ පෙන්නන කෙනෙක් නෙමෙයි." රෙයිනාගේ දෑස් දිල්විණි. "ඔයා රෝමන් කෙනෙක් නෙමෙයි කියල ඔයාට විශ්වාසද ඇනබෙත්? එහෙම නැත්නම් ඇමසන්ද?"

එය ප්‍රශංසාවක් දැයි ඇනබෙත් නොදත්තාය, එහෙත් ඇය තම අත දිගු කළාය. "මම ඒ විදිහට මගෙ පෙම්වතාට පොඩි පහරක් දුන්න විතරයි." ඇය පැවසුවාය. "ඔයාව හමුවීම සතුටක්." රෙයිනා මිත්‍රශීලී ලෙස ඇගේ අත අල්ලා ගත්තේය. "අපිට ගොඩක් දේවල් සාකච්ඡා කරන්න තියෙනවා වගේ,

"සෙන්චූරියනස්!"

රෝම කඳවුරුවාසීන් කීපදෙනෙක් ඉදිරියට පැමිණියහ. ඔවුන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බව පෙනිණි. ළමුන් දෙදෙනෙක් පර්සිගේ



පැත්තකින් පෙනී සිටියේය. මීට කළින් ඇනබෙත් ඔහුව දකින විටත්, ඔහු වටා කැරකෙමින් සිටියේ මේ දෙදෙනාමය. තරබාරු ආසියාතු හාදයාට වයස පහළොවක් පමණ වන්නට ඇත. ඔහු ලස්සනය. පමණට වඩා තරබාරුය. ගැහැනු ළමයා ඔහුට වඩා වයසින් අඩු බව පෙනිණි. සමහරවිට ඇගේ වයස දහතුනක් පමණ වන්නට ඇත. ඇයට තිබුණේ දුම්මල පැහැති දෑසක්, චොකලට් පැහැති සමක් සහ දිගු බොකුටු කොණ්ඩයකි. ඇගේ සන්නද්ධ බලකා හිස්වැසුම අතට සිරවී තිබිණි.

ඔවුන්ගේ හැසිරීම අනුව ඔවුන් පර්සිගේ සමීපතමයන් බව ඇනබෙත්ට පෙනී ගියාය. මේ වනවිටත් බොහෝ වික්‍රමයන්ට සහභාගි වී ඇතිවාක් මෙන්, ආරක්ෂක ඉරියව්වකින් ඔවුහු පර්සිගේ දෙපසට වී සිටියහ. ඇය තම සිත තුළ නැගුණු ඊර්ෂ්‍යාව පහ කර ගැනීමට උත්සාහ දැරුවාය. පර්සි සහ මේ කෙල්ල... ඒක වෙන්න පුළුවන්ද... නෑ. ඔවුන් අතර තිබූ දේහ ලක්ෂණ අනුව එය එසේ විය නොහැකිය. 'මිනිසුන්ව කියැවීම' ඉගෙන ගැනීමට ඇනබෙත් ඇගේ මුළු දිවියම වැයකර තිබුණාය. එය ආරක්ෂාවීමේ කුසලතාවයක් විය. ඇයට අනුමාන කළ හැකි වූවා නම්, විශාල ආසියාතු හාදයා ඇගේ පෙම්වතා බව වැටහෙනු ඇත. එහෙත් ඔවුන් දිගු කාලයක් එක්ව සිට නැතැයි ඇය සැක කළාය.

එහි ඇයට තේරුම් ගැනීමට නොහැකි වූ දෙයක් තිබිණි. කෙල්ල බලා සිටියේ කුමක් දෙසද? ඇය පිපර් සහ ලියෝ සිටින දෙස බලා මුහුණ හැකිළුවාය. ඇය ඔවුන්ගෙන් කෙනෙක් හඳුනාගත් බව පෙනී ගිය අතර, එය වේදනාකාරී මතකයක් බව පෙනිණි.

මේ අතර රෙයිනා තම නිලධාරීන්ට නියෝග ලබා දෙමින් සිටියාය. "ලෙජියන් එකට පසු බසින්න කියන්න. ඩැකොටා, කුස්සියේ ඉන්න ආත්මයන්ම දනුම් දෙන්න පිළිගැනීමේ සාදයක් ලැස්ති කරන්න කියල. ඒ වගේම ඔක්ටේවියන්."

"ඔයා මේ ආගන්තුකයන්ට කඳවුරට එන්න දෙනවද?" දුඹුරු පැහැති කෙස් සහිත උසැති හාදයා විමසුවේය. "රෙයිනා, ආරක්ෂක අවදානමක්-"

"අපි ඔවුන්ව කඳවුරට ගෙන යන්නෙ නෑ, ඔක්ටේවියන්." රෙයිනා ඔහු දෙසට දැඩි බැල්මක් යොමු කරමින් පැවසුවාය. "අපි මෙතනදි කෑම ගන්නවා, විනිශ්චය ශාලාව ඇතුළේදි."

"ඔහ්, ඒක වැඩිය හොඳයි." ඔක්ටේවියන් පැවසුවේය. රෙයිනාව තම ප්‍රධානියා ලෙස නොසැලකූ එකම පුද්ගලයා ඔහු පමණක් බව

පෙනිණි. කෙට්ටු, සුදුමැලි අයකු වූ ඔහු යම් හේතුවක් නිසා තම ඉණ පටියේ ටෙඩි බෙයාර්ලා තිදෙනෙකු එල්ලාගෙන සිටියේය.

"අපි එයාලගෙ යුද නැවේ සෙවණැල්ල යට විවේක ගන්නද?"

"මේ අපේ අමුත්තෝ." රෙයිනා අවධාරණයෙන් පැවසුවාය. "අපි එයාලව සාදරයෙන් පිළිගත යුතුයි, වගේම අපි එයාලට කතා කරන්න ඕනෙ. අනාවැකියෙ කියැවුණා වගේම, ජේසන් ආරක්ෂිතව නැවත අප වෙත ගෙන ආ එකට ඔයා දෙවියන්ට ස්තුති කරන්න ඕනෙ."

"හොඳ අදහස." පර්සි පැවසුවේය. "ගිහින් ඔයාගෙ වලසුන්ව පුච්චල දාන්න, ඔක්ටේවියන්."

රෙයිනා සිනා නොවී සිටීමට උත්සාහ දරණ බව පෙනිණි. "ඔයාට මගෙ නියෝගය ලැබුණා. යන්න."

නිලධාරීහු විසිර ගියහ. මුළුමනින්ම පිළිකුල් කරනා බැල්මකින් ඔක්ටේවියන් පර්සි දෙස බැලුවේය. අනතුරුව ඇනබෙත් දෙසට සැකමුසු බැල්මක් හෙලූ ඔහු එතැනින් පිට විය.

පර්සි ඇනබෙත් මත අත තැබුවේය. "ඔක්ටේවියන් ගැන කරදර වෙන්න එපා." ඔහු පැවසුවේය. "රෝමවරු වැඩි දෙනෙක් හොඳ මිනිස්සු- මෙතන ඉන්න ෆ්‍රෑන්ක්, හේසාල් සහ රෙයිනා වගේ අය අපිට කරදරයක් වෙන්නෙ නෑ."

යමෙකු තම ගෙල වටා තෙත රෙද්දක් එතුවාක් වැනි හැඟීමක් ඇනබෙත්ට ඇති විය. නැවේ සිට පැමිණෙද්දී ඇසුණු කෙඳිරීමක් වැනි සිනාව නැවත ඇසිණි.

ඇය ඉහළ තිබූ ආගෝ II දෙස බැලුවාය. එහි දූවැන්ත ලෝකඩ බඳ හිරු එළියේ දිලිසෙමින් තිබිණි. එක් පැත්තකින් ඇයට අවැසි වූයේ පර්සිව පැහැරගෙන, නැවට නැගී පලා යාමටය.

යම්දෙයක් භයානක ලෙස වැරදී ඇතැයි යනුවෙන් දැනෙන හැඟීම ඇයට පලවා හැරීමට නොහැකි විය. පර්සිව නැවත අහිමි කර ගැනීමේ අවදානමක් ගැනීමට ඇයට කිසිදු ඉඩක් නොතිබිණි.

"අපිට කරදරයක් වෙන එකක් නෑ." ඇය එය නැවත පවසමින් එය විශ්වාස කිරීමට උත්සාහ කළාය.

"විශිෂ්ටයි." රෙයිනා පැවසුවාය. ඇය ජේසන් දෙසට හැරුණාය. එහි වූයේ කෑදර පෙනුමකැයි ඇනබෙත්ට සිතිණි. "අපි කතා කරමු. අපිට හොඳ යළි හමුවීමක් තියෙයි."

# 03
# ඇනබෙත්

තමාට ඇපටයිට වන්නට තිබුණා නම් යැයි ඇනබෙත් ප්‍රාර්ථනා කළාය. කෑම ගන්නේ කෙසේදැයි රෝමවරු දන සිටීම එයට හේතුවයි. කච්චි ගණනාවක් සහ මිටි මේස කීපයක් ගෙන ඒමෙන් පසු විනිශ්චය ශාලාව ලී බඩු ප්‍රදර්ශනාගාරයක් මෙන් දිස් විය. දහය විස්ස බැගින් වූ කණ්ඩායම් සෑදී රෝමවරු සිනාසෙමින් සිටින අතර සුළං ආත්ම ඒ මේ අත හමා ගියේය. සෙනඟ අතරින් එසැවෙමින් සිටියේ ටෝගාවලින් සහ ලෙජියන් සන්නාහවලින් සැරසුණු දම්පාට භූතයෝ- ලාරෙස්ලා- ය.

සම්පූර්ණ දර්ශනයම තවමත් හුරුපුරුදු දෙයක් වූ නමුත් සම්පූර්ණයෙන්ම ආගන්තුක වූ බැවින් ඇනබෙත්ට කරකැවිල්ල ඇති කරවීමට සමත් විය.

ඇයට අවශ්‍ය එකම දෙය වූයේ පර්සි සමඟ හුදෙකලා වීමය. ඇයට ඉවසා සිටීමට සිදුවන බව ඇය දන සිටියාය. ඔවුන්ගේ ගවේෂණය සාර්ථක වීමට නම්, ඔවුන්ට මේ රෝමවරු අවශ්‍ය වේ. එහි අර්ථය නම් ඔවුන්ව දැනුවත් කර හොඳ හිත ගොඩ නඟා ගත යුතු වීමය.

රෙයිනා සහ ඇගේ නිලධාරීන් කීපදෙනෙක් (දෙවියන් වෙනුවෙන් තම ටෙඩි බෙයාර්ලා ගිනි තබා මේ දැන් පැමිණි ඔක්ටේවියන්ද ඇතුළුව) ඇනබෙත් සහ ඇගේ පිරිස සමඟ අසුන් ගෙන සිටියහ. අලුත් මිතුරන් දෙදෙනා වූ ෆ්‍රෑන්ක් සහ හේසාල් සමඟ පර්සි ද ඔවුන්ට එකතු විය. ආහාර බඳුන් ටෝනේඩෝවක් මෙන්

මේසය මතට පැමිණෙන අතර පර්සි ඉදිරියට නැවී කෙඳිරුවේය. "මට ඔයාට නව රෝමය පෙන්නන්න ඕනෙ. ඔයයි මමයි විතරයි. එතැන පුදුමාකාරයි." ඇනබෙත් හිරි වැටී ගියාය. ඇයට සැබැවින්ම අවශ්‍යව තිබුණේද 'ඔයයි මමයි විතරයි' යන්නය. ඒ වෙනුවට ඇගේ මුව ගොළු විය. පර්සි කොහොමද මෙහෙ ගැන ඔච්චර සතුටින් කතා කරන්නේ? අර්ධ ලෝහිත කඳවුර ගැන මොනවද කියන්නේ? එයාගෙ කඳවුර, එයාගෙ ගෙදර!

පර්සිගේ අතේ තිබූ අලුත් සලකුණු දෙස නොබලා සිටීමට ඇනබෙත් උත්සාහ කළාය. එහි වූයේ ජේසන්ගේ මෙන් SPQR පච්චයකි. අර්ධ ලෝහිත කඳවුරේදී, වසර ගණනක පුහුණුව සිහිපත් කිරීමට උප දෙවිවරුන්ට පබළු මාලයක් ලැබිණි. මෙහි දී රෝමන්වරු එසේ කරන්නේ පච්චයක් කෙටීමෙනි. ඔබ සදාකාලයටම අපට අයිතියි යන්න එයින් කියැවිණි.

"හරි, සත්තකින්ම."ඇය පැවසුවාය.

"මම හිතමින් ඉන්නෙ." ඔහු කලබලයෙන් පැවසුවේය. "මගෙ ළඟ මේ අදහස තියෙනවා." රෙයිනා කතා කරත්ම ඔහු නිහඬ විය.

සැවොම හඳුන්වා දීමෙන් අනතුරුව. රෝමන්වරු සහ ඇනබෙත්ගේ පිරිස කතා හුවමාරු කර ගැනීමට පටන් ගත්හ. තම මතකය අහිමිව, තමා අර්ධ ලෝහිත කඳවුරට පැමිණියේ කෙසේ දැයි ජේසන් පැහැදිලි කළේය. එසේම තමා පිපර් හා ලියෝ සමඟ උතුරු කැලිෆෝනියාවේ සිරකර සිටි හේරා දෙවඟන (රෝමයේදී ඇය හඳුන්වන්නේ ජූනෝ ලෙසය) ගලවා ගැනීමට යෙදුණු ගවේෂණය ගැනද ඔහු පැවසුවේය.

"විය නොහැකියි!" ඔක්ටේවියන් බෙරිහන් දුන්නේය. "ඒ අපේ උසස්ම පූජනීය ස්ථානය. යෝධයෝ එතන දෙවඟන සිර කළා නම්-"

"ඔවුන් ඇයව විනාශ කර දමයි." පිපර් පැවසුවාය. "ඒ වගේම ඒ වරද ග්‍රීකයන් මත පටවාවි, ඒකෙන් කඳවුරු දෙක අතරෙ යුද්ධයක් ඇවිලෙයි. දැන්, සද්ද නැතුව ජේසන්ට ඉවර කරන්න දෙන්න."

ඔක්ටේවියන් තම කට ඇරියත්, කිසිදු හඬක් පිට වූයේ නැත. ඇනබෙත් සැබැවින්ම පිපර්ගේ වශීකරණ කතාවට ප්‍රිය කළාය. රෙයිනා මාරුවෙන් මාරුවට ජේසන් හා පිපර් දෙස බලනු ඇනබෙත්ගේ දෑසට හසුවිය. ඔවුන් දෙදෙනා පෙම්වතුන් බව අවබෝධ වීමට පටන් ගනිත්ම ඇගේ දෙබැම රැළි වැටිණි.



"ඉතිං." ජේසන් පැවසුවේය. "එහෙම තමයි අපි පෘථිවි දෙවඟන ගයියා ගැන හොයා ගත්තේ. ඇය තවමත් ඉන්නෙ අර්ධ නින්දක. ඒත් එයා තමයි ටාටරස් වෙතින් රාක්ෂයො නිදහස් කළේ. ඒ වගේම යෝධයෝ නැගිට්ටුවේ. වෘක නිවෙසේදී අපි සටන් කරපු ලොකු නායකයා, ප්‍රොපිරියොන් කිව්වා එයා පැරණි භූමිවලට පසු බසිනවා කියලා. ඔහුගේ සැලැස්ම ගයියාගේ නැගිටීමත් එක්ක දෙවියන්ව විනාශ කරන්න... මොකක්ද එයා ඒකට කිව්වේ? මුලින් උදුරා දැමීම.

පර්සි කල්පනාකාරීව හිස සැලුවේය. "ගයියා මෙහෙත් වැඩ පටන් අරන් තියෙන්නෙ. අපිරිසිදු මූණා, රැජින එක්ක අපිටත් එදිරිවාදිකමක් තියෙනවා.."

පර්සි කතාවේ තමාගේ පැත්ත නැවත මතකයට නැංවීය. ඇනබෙත් නම් වූ එක් නමක් හැරෙන්නට අන් සියලු මතකය අහිමිව වෘක මන්දිරයේදී 'අවදි වූ[1] අන්දම ගැන ඔහු කතා කළේය.

එය ඇසෙන විට, ඇනබෙත් නොහඬා සිටීමට දැඩි උත්සාහයක් ගත්තාය. ෆ්‍රෑන්ක් සහ හේසාල් සමඟ ඇලස්කාවේ සැරිසැරූ අන්දම ඔහු ඔවුන්ට පැවසුවේය. යෝධ ඇල්සියෝනිස්[2] පරදවා මරණයේ දෙවියා වූ තනාටොස්ව[3] බේරාගත් අන්දමත්, යෝධයන්ගේ හමුදා ප්‍රහාරය වැළැක්වීමට රෝම කඳවුරේ අතුරුදන්ව තිබූ ස්වර්ණ රාජාලි කණුව නැවත රැගෙන ආ අන්දමත් ඔහු විස්තර කළේය. පර්සි තම කතාව අවසන් කරනවිට, ජේසන් එය පිළිගන්නා අයුරින් විසිල් හඬක් නැඟුවේය. "එයාල ඔයාව විනිසුරුවරයෙක් කරපු එකේ පුදුමයක් නැහැ."

ඔක්ටේවියන් ගෙරවූයේය. "ඒ කියන්නෙ අපිට දැන් විනිසුරුවරු තුන් දෙනෙක් ඉන්නවා. නීතිවල පැහැදිලිව සඳහන් වෙනවා අපිට ඉන්න පුළුවන් දෙන්නෙක් විතරයි කියලා!"

"ඒකෙ හොඳ පැත්ත තමයි." පර්සි පැවසුවේය. "ජේසනුයි මමයි දෙන්නම ඔයාට වඩා උසස් වීම, ඔක්ටේවියන්. ඉතිං අපි දෙන්නටම පුළුවන් ඔයාට කටවහගන්න කියල කියන්න."

ඔක්ටේවියන් රෝම ටී ෂර්ටයක් තරමට දම් පැහැ ගැන්විණි. ජේසන් සහ පර්සි මිට මෙලවූ අත් එකිනෙක හප්පා ගත්හ.

1 නටබුන් වූ මන්දිරයකි. ලූපා විසින් පර්සි ජැක්සන්ව රෝම උපදෙවියෙ ලෙස පුහුණු කරන ලද්දේ එහි සිට ය.
2 ගයියාට ඉපදුණු යෝධයින්ගෙන් වැඩිමහල් යෝධයාය. ප්ලූටෝ සමඟ සටන් කිරීමට නියමිත වූ යෝධයා ය.
3 මරණයට අධිපති ග්‍රීක දෙවියා ය. රෝම ස්වරූපය ලෙටස් ය.

රෙයිනාට පවා සිනාව නවත්වා ගැනීමට නොහැකි වුවත්, ඇගේ දෑස්වල වූයේ කැලඹුණු ගතියකි.

"අමතර විනිසුරුගෙ ප්‍රශ්නෙ අපි පස්සෙ විසඳගනිමු." ඇය පැවසුවාය. "දන් අපිට ගනුදෙනු කරන්න, ඊට වඩා බරපතල ප්‍රශ්න තියෙනවා."

"ජේසන් වෙනුවෙන් මම ඉවත් වෙන්නම්." පර්සි සැහැල්ලුවෙන් පැවසුවේය. "ඒක මහ දෙයක් නෙමෙයි."

"මහ දෙයක් නෙමෙයි?" ඔක්ටේවියන් විමසුවේය. "රෝමයේ විනිශ්චයකාරකම මහ දෙයක් නෙමෙයි ද?"

ඔහුව ගණන් නොගත් පර්සි ජේසන් දෙසට හැරුණේය. "ඔයා තාලියා ග්‍රේස්ගෙ සහෝදරයා නේද? වාව්, ඔය හාදයො දෙන්න එකවගේ නැනෙ."

"ඔව්, මටත් පෙනුණා." ජේසන් පැවසුවේය. කොහොම වුණත්, මම ගිය අතරෙ මගේ කඳවුරට උදව් කිරීම ගැන ස්තුතියි. ඔයා භයානක වැඩක් කළේ."

"ආපහු ඔයාට." පර්සි පැවසුවේය.

ඇනබෙත් ඔහුගේ කකුලට ඇන්නාය. වැදගත් කතාවලට බාධා කිරීම ඇයට පෙනෙන්නට බැරි දෙයකි. රෙයිනා නිවැරදිය. ඔවුන්ට සාකච්ඡා කිරීමට බරපතල දේවල් තිබිණි. "අපි මහා අනාවැකිය ගැන කතා කළ යුතුයි. කතාවෙන් පේන්නේ රෝමවරුනුත් ඒ ගැන දැන සිටින බවයි."

රෙයිනා හිස සැලුවාය. "අපි ඒකට කියන්නෙ සත්දෙනාගේ අනාවැකිය කියලා. ඔක්ටේවියන්, ඔයාට ඒක මතකයෙන් කියන්න පුළුවන්ද?"

"සත්තකින්ම." ඔහු පැවසුවේය. "ඒත්, රෙයිනා."

"කරුණාකරලා හයියෙන් කියන්න. ලතින් වලින් නෙමෙයි. ඉංග්‍රීසියෙන්." ඔක්ටේවියන් සුසුම් හෙලුවේය. "අර්ධ ලෝහිතයෝ සත් දෙනා ඇමතුමට පිළිතුරු දෙනු ඇත. කුණාටුවෙන් හෝ ගින්නෙන් ලෝකය ඇද වැටෙනු ඇත."



"අවසන් හුස්ම දක්වා දිවුරුම තිබෙනු ඇත." ඇනබෙත් පැවසුවේය. "සතුරන්ගේ දෑත් මරණයේ දොරටු' වෙත ගෙනෙනු ඇත."

සියල්ලෝම ඇය දෙස බලාගෙන සිටියහ. ලියෝ පමණක් ඇලුමිනියම් හීරුවකින් දඟර මෝස්තරයක් වියමින් සිටියේය. තමා අනාවැකියේ පේළි ගැන මෙතරම් අවිචාරවත්ව පැවසුවේ ඇයි දැයි ඇනබෙත්ට සිතාගත නොහැකි වූවාය. බලහත්කාරකමක් කළා වැනි හැඟීමක් ඇයට ඇති විය. විශාල කොලුවා, ෆ්‍රෑන්ක්, ඇයට තෙවැනි ඇසක් ලැබී තිබුණාක් මෙන් ඉදිරියට නැවී ඇය දෙස බලාගෙන සිටියේය. "ඔයා මිත් ගේ දරුවෙක් කියන එක ඇත්තක්ද- මම කිව්වෙ... ඇතීනාගෙ?"

"ඔව්." එක්විටම ආරක්ෂිත හැඟීමක් දැනුණු ඇය පැවසුවාය. "ඇයි ඔච්චර පුදුම වෙන්නෙ?' ඔක්ටේවියන් පැවසුවේය. "ඔයා ඇත්තටම නුවණේ දෙවඟනගෙ දරුවෙක් නම්-"

"ඇති." රෙයිනා පැවසුවාය. "ඇනබෙත් එයාට කියන්න ඕනෙ දේ කිව්වා. ඇය මෙහෙට ආවෙ සාමයට. අනෙක් අතට..." ඇය එදිරිවාදියකු සතු ගෞරවයෙන් ඇනබෙත් දෙස බැලුවාය. "පර්සි බොහොම ඉහළින් ඔයා ගැන කතා කරනවා."

රෙයිනාගේ සිහින් හඬ ඇනබෙත්ව මොහොතක සිතිවිල්ලකට යොමු කළේය. තම චීස් බර්ගරයට ඇති වූ හදිසි කැමැත්ත හේතුවෙන් පර්සිගේ හිස පහතට නැඹුරු වනු පෙනිණි.

ඇනබෙත්ට තම මුහුණ උණුසුම් වන්නා සේ දැනිණි. ඒ මොහොතේ දී, ඇනබෙත් තම විකට පෙම්වතා එතෙක් කර තිබූ වැරදි සියල්ලටම සමාව දුන්නාය. ඇයට ඔහු වැළඳ ගැනීමට වුවමනා වුවත්, සන්සුන්ව සිටින ලෙස ඇය තමාටම විධාන කර ගත්තාය.

"ආහ්, ස්තුතියි." ඇය රෙයිනාට පැවසුවාය. "කොයිවිදිහකින් බැලුවත්, අනාවැකියෙ සමහර දේවල් පැහැදිලි වෙමින් තියෙනවා. සතුරන්ගේ දෑත් මරණයේ දොරටු වෙත ගෙනෙනු ඇත.... ඒ කියන්නෙ රෝම සහ ග්‍රීක්වරු ගැන. අපිට ඒ දොරටුව සොයාගන්න ඒකාබද්ධ හමුදාවක් හදන්න වෙනවා."

සන්නද්ධ බලකා හිස්වැස්මක් පැළඳි දිගු බොකුටු කොණ්ඩයක් සහිත හේසාල් ඇගේ පිඟාන අසල තිබූ යමක් අතට ගත්තාය. එය

1 පාතාල ලෝකයේ සිට මනුෂ්‍ය ලෝකයට ආත්මවලට සංචාරය කිරීම සඳහා ඉඩ ලබාදෙන සැඟවුණු මාර්ගයයි.

විශාල පද්මරාගයක් මෙන් පෙනුණත්, එය කුමක්දැයි ඇනබෙත් හඳුනාගැනීමටත් පෙර, ඇය එය තම ඩෙනිම් කමිසයේ සාක්කුවට දමා ගත්තාය.

"මගේ සහෝදරය, නිකෝ, දෙරටු හොයාගෙන ගියා." ඇය පැවසුවාය.

"පොඩ්ඩක් ඉන්න." ඇනබෙත් පැවසුවාය. "නිකෝ ඩි ආන්ජලෝද? එයා ඔයාගෙ සහෝදරයද?"

එය ප්‍රත්‍යක්ෂයයි කියන්නාක් මෙන් හේසාල් හිස සැලුවාය. තවත් ප්‍රශ්න දුසිමක් ඇනබෙත්ගේ හිස තුළ කැරකැවෙන්නට විය. ඇය එම ප්‍රශ්න අතහැර දැමීමට තීරණය කළාය. "හරි, ඔයා කියමින් හිටියේ?"

"එයා අතුරුදහන් වුණා." හේසාල් ඇගේ තොල් සපා ගත්තාය. "මට බයයි, මට හරියටම කියන්න බැහැ, ඒත් මම හිතනවා එයාට මොනවහරි වුණා කියලා."

"අපි එයාව හොයමු." පර්සි පොරොන්දු වූයේය. "කොහොම වුණත් අපිට මරණයේ දොරටුව හොයාගන්න වෙනවා. තනාටෝස් කිව්වෙ අපි උත්තර දෙකම රෝමයෙදි සොයාගත යුතු බවයි- හරියට නියම රෝමයෙ වගේ. ඒක තියෙන්නෙ ග්‍රීසියට යන අතරමඟ නේද?"

"තනාටෝස් මෙක ඔයාට කිව්වද?" ඇනබෙත් ඒ අදහස ගැන සිතීමට උත්සාහ කළාය. "මරණයේ දෙවියා?"

ඇයට බොහෝ දෙවිවරු මුණගැසී තිබිණි. ඇය පාතාල ලෝකයට පවා ගොස් තිබුණාය. එහෙත් මරණයෙන් මාංසගත වීමෙන් නිදහස් වීමේ පර්සිගේ කතාව ඇයව හිරිවට්ටන්නක් විය.

"දැන් ඒ මරණය නිදහස්, රාක්ෂයො කොටස් වලට කැඩිලා, එයාලට පුරුදු විදිහට ආයෙත් ටාටරස් ළඟට ඇවිත්. ඒත් මරණයේ දොරටු විවෘතව තිබෙන තාක්, එයාලට ආපහු එන්න පුළුවන්."

පිපර් තම හිසේ තිබූ පිහිටුව පොඩි කළාය. "හරියට වේල්ලකින් ජලය කාන්දු වෙනව වගේ." ඇය පැවසුවාය.

"ඔව්." පර්සි සිනාසුණේය. "අපි වේල්ලෙ සිදුර හොයාගන්න ඕනෙ."

"මොකක්?" පිපර් විමසුවාය.



"මොකුත් නැහැ." ඔහු පැවසුවේය. "විහිලුවක්- ප්‍රධාන දේ අපිට ඒ දොරටු හොයාගෙන, අපි ග්‍රීසියට යන්න කළින් වහන්න වෙනවා. ඒක තමයි යෝධයින් පරද්දන්න අපිට තියෙන අවස්ථාව වගේම, එයාල පැරදිලා ඉන්නෙ කියල තහවුරු කරගන්න ලැබෙන එකම විදිහ."

රෙයිනා අසල බඳුනකින් ඇපල් ගෙඩියක් ගෙන එය ඇඟිලිවලින් හරවමින් එහි තද රතු මතුපිට පරීක්ෂා කළාය. "ඔයාලගෙ අරමුණ ඔයාලගෙ සුද නැවෙත් ග්‍රීසියට යන්න. ඔයාල පැරණි භූමි - මාරි නොස්ට්‍රම්[1]- ගැන අවබෝධ කරගන්න ඕනෙ. ඒ වගේම ඒව අනතුරුදායක බවත්."

"මාරි කවුද?" ලියෝ විමසුවේය.

"මාරි නොස්ට්‍රම්." ජේසන් පැහැදිලි කළේය. "අපේ මුහුද- මධ්‍යධරණියට පැරණි රෝමවරු කිව්වෙ එහෙමයි."

රෙයිනා හිස සැලුවාය. "කාලයක් රෝම අධිරාජ්‍යයට අයිති වෙලා තිබුණ ඒ භූමිය දෙවියන්ගෙ මාතෘ භූමිය විතරක් නෙමෙයි. ඒක රාක්ෂයන්ගෙ, ටයිටන්ලාගෙ[2] සහ යෝධයන්ගේ වගේ නරකම දේවල් වලත් උපන් බිම වෙනවා. මේ ඉන්න උප දෙවිවරු අමෙරිකාවෙ සංචාරය කරන එක භයානකයි වගේ, එහෙට යන එක ඊට වඩා දස ගුණයක් නරකයි."

"ඔයා කිව්වා ඇලස්කාව නරක වෙන්න පුළුවන් කියලා." පර්සි මතක් කළේය. "අපි එහෙදි බේරුණා."

රෙයිනා හිස සැලුවාය. ඇය ඇපල් ගෙඩිය කරකවන විට ඇගේ නියපොතු වලින් එහි අඩ සඳක කැපුමක් සටහන් විය. "පර්සි, මධ්‍යධරණියේ සංචාරය කිරීම වෙනස් මට්ටමේ අනතුරුදායක තත්ත්වයක්. සියවස් ගණනාවක්ම රෝම උපදෙවිවරු එහෙ යන එක සීමා කරලා තිබුණා. හොඳ සිහියෙන් ඉන්න කිසිම වීරයෙක් එහෙ යන්නෙ නෑ."

1 ලතින් භාෂාවෙන් අපේ මුහුද යන්න හැඟවේ. මධ්‍යධරණිය හැඳින්වීමට රෝමවරු යොදා ගත්තේ මෙම නාමය යි.

2 ගයියාගෙන් සහ යුරේනස්ගෙන් පැවත එන බලසම්පන්න ග්‍රීක දෙවි පරපුරකි. ස්වර්ණමය යුගයේ පාලනය කළේ මොවුන් ය. පසුව ඔලිම්පියානුවන් නම් තරුණ දේව ගෝත්‍රය විසින් ඔවුන්ව පලවා හැරියහ.

"එහෙනම් අපි හොඳයි." ලියෝ සිනාසෙමින් පැවසුවේය. "මොකද අපි සේරටම පිස්සුනෙ නේද? අනෙක් අතට ආගෝ II හොඳම යුධ නැවක්."

"අපි ඉක්මන් කරන්න ඕනෙ." ජේසන් පැවසුවේය. "මම හරියටම දන්නෙ නෑ යෝධයෝ මොනව සැලසුම් කරල තියෙනවද කියලා. ඒත්, ගයියා හැමදාම අඩනින්දෙන් හිටියෙ. එයා සිහින ආක්‍රමණය කරමින්. අමුතු තැන්වල පෙනී සිටිමින් වැඩි වැඩියෙන් රාක්ෂයින්ව කැඳවමින් ඉන්නවා. යෝධයෝ එයාව සම්පූර්ණයෙන් අවදි කරන්න කලින් අපි එයාලව නවත්තන්න ඕනෙ." ඇනබෙත් වෙව්ලා ගියාය. ඒ බියකරු රාත්‍රී සිහින ඇයද දක තිබිණි.

*"අර්ධ ලෝහිතයෝ සත් දෙනා ඇමතුමට පිළිතුරු දිය යුතුය."* ඇය පැවසුවාය. "ඒකට අපේ කඳවුරු දෙකම එකතු වෙන්න වෙනවා. ජේසන්, පිපර්, ලියෝ සහ මම එතකොට හතරයි."

"ඒ වගේම මම." පර්සි පැවසුවේය. "ෆ්‍රෑන්ක් සහ හේසල් එක්ක හතයි."

"මොකක්?" ඔක්ටේවියන් නැගී සිටියේය. "අපි ඒක යෝජනා කරන්න ඕනෙ නැද්ද! සෙනෙට් එකේ ඡන්ද විමසන්නෙ නැද්ද? හරියාකාර විවාදයක් නැතුව?"

"පර්සි." තනි ඇසේ යෝධයා ටයිසන් ඕ'ලෙයිරි මහත්මිය සමඟ ඔවුන් ඉදිරියට පැමිණියේය. දඩයම් බැල්ලගේ පිටමත හිඳගෙන සිටියේ ඉතා කෙසඟ හාපියෙකි[1]. ඒ ඇනබෙත් මෙතෙක් දක තිබූ කෙසඟම හාපියා වූවාය. ඉත්තෑකුරු මෙන් වූ රතු කොණ්ඩයකින් යුත් දුර්වල කෙල්ලක වූ ඇය ගෝනි රෙද්දකින් මැසූ ඇඳුමක් හැඳ සිටි අතර රතු පිහාටුවලින් සැදි පියාපත්වලින් යුක්ත වූවාය.

හාපි කොහේ සිට පැමිණියේ දැයි ඇනෙබෙත් නොදත් නමුත්, සැලෙන ෆැනල් රෙද්ද සහ ඩෙනිම හැඳ ළය හරහා SPQR සටහන් කළ බැනරයක් ගසා සිටි ටයිසන් දකීමෙන් ඇගේ සිත උණුසුම් විය. එකැස් යෝධයන්[2] සම්බන්ධයෙන් ඇයට තිබුණේ තරමක් නරක අත්දකීම් වුවත්, ටයිසන් හොඳ හදවතක් ඇති අයකු විය. එසේම ඔහු පර්සිගේ අර්ධ සොහොයුරකු ( එය දිගු කතාවකි) වූ අතර එයින් ඔහුට මුළුමනින්ම පවුලක් වැනි හැඟීමක් ඇති කරවීය.

1 යම් දේවල් ඩැහැගන්නා පියාපත් සහිත ගැහැනු සත්ත්වයෙකි.



ඔවුන්ගේ කච්චිය අසල නැවතුණු ටයිසන් තම මසින් පිරුණු දෑත් එකට බැඳ ගත්තේය. ඔහුගේ විශාල දුඹුරු ඇස උද්වේගයෙන් පිරී තිබිණි. "එලා බය වෙලා." ඔහු පැවසුවේය.

"න-න- තව දුරටත් බෝට්ටු නැහැ." බියකරු ලෙස තම පිහාටු ගසමින් හාපි තමාටම මුමුණා ගත්තාය. "ටයිටැනික්, ලුසිටානියා, පැක්ස්... හාපිලාට බෝට්ටු ගැලපෙන්නෙ නැහැ."

ලියෝ ඇස් කොණකින් බැලුවේය. ඔහු තමා අසලම හිඳගෙන සිටි හේසල් දෙස බැලුවේය. "කිකිළි කෙල්ල ටයිටනික් එක්කද මගේ බෝට්ටුව සංසන්දනය කළේ?"

"එයා කිකිළියෙක් නෙමෙයි." ලියෝ ඇයව අවුල් කළා සේ ඇය තම දෑස් ඉවතට හරවා ගත්තාය. "එලාගේ හාපි. එය මේ පුංචි..."

"එලා ලස්සනයි."ටයිසන් පැවසුවේය. "ඒ වගේම බයවෙලා. අපි එයාව ඉවතට ගෙනියන්න ඕනෙ. ඒත් එයා නැවේ යන එකක් නැහැ."

"නැව් එපා." එලා නැවත පැවසුවාය. ඇය සෘජුව ඇනබෙත් දෙස බැලුවාය. "අවාසනාව. ඇය මෙතන. ඥුවණේ දියණිය තනිව ඇවිදියි."

"එලා!" එක්විටම ෆ්‍රෑන්ක් නැගී සිටියේය. "සමහරවිට ඒක හොඳම වෙලාව නොවෙන්න පුළුවන්."

"ඇතීනාගේ සලකුණ රෝමය දවාලයි." දෑතින් කන් වසා ගනිමින් එලා තමා හඬ උස් කර පැවසුවාය. "නිවුන්නෝ, නොනිමි මරණයේ යතුර දරා සිටින දෙවඟනගේ සුසුමින් නික්මෙති. යෝධයන්ගේ නපුර දරාසිටින රන් වියැකෙයි. වේදනාව තුළින් වියන ලද සිරගෙයින් ජය ලැබෙයි."

එහි බලපෑම යමකු මේසය මතට අත් බෝම්බයක් අත හැරියට සමාන විය. සියල්ලෝම හාපි දෙස බලා සිටියහ. කිසිවකු කතා නොකළහ. ඇනබෙත්ගේ හදවත ගැහෙන්නට විය. ඇතීනාගේ සලකුණ... ඇය තම සාක්කුව පරීක්ෂා කිරීමට මැලි වූවාය. එහෙත් රිදී කාසිය උණුසුම් වන බව ඇයට දැනිණි- ඒ ඇගේ මවගෙන් ලැබුණු ශාපලත් ත්‍යාගයකි. ඇතීනාගේ සලකුණ අනුගමනය කරන්න. මගේ පළිය ගන්න.

මුළින්ම යථාතත්ත්වයට පත් වූයේ පර්සිය. නැගී සිටි ඔහු ටයිසන්ගේ බාහුවෙන් අල්ලා ගත්තේය.

"මම දන්නවා!" ඔහු බොරු උනන්දුවක් මවා ගනිමින් පැවසුවේය. "ඔයා එලාට ටිකක් නැවුම් හුළං වදින්න එක්ක ගියා නම් හොඳ නැද්ද? ඔයයි, ඕ' ලෙයිරි මහත්මියයි."

"මහොම ඉන්න." ඔක්ටේවියන් තම ටෙඩි බෙයාර් කෙනෙක් මිරිකාගෙන පැවසුවේය. ඔහුගේ දෑස් එක එල්ලේ එලා වෙත යොමු වී තිබිණි. "එයා මොකක්ද ඒ කිව්වේ? ඒ කියපු එක හරියට-"

"එලා ගොඩක් කියවනවා." ෆ්‍රැන්ක් පැවසුවේය. "අපිට එයාව හමුවුණෙත් පුස්තකාලයේදි."

"ඔව්!" හේසාල් පැවසුවාය. "ජේන විදිහට එයා පොතකින් කියවපු දෙයක් වගේ."

"පොත්." එලා පැවසුවාය. "එලා පොත්වලට කැමතියි."

දැන් ඇය ඇගේ කොටස කියා ඇත. එබැවින් හාපි තවත් සන්සුන් වූ බව පෙනිණි. ඇය ඕ'ලෙයිරි මහත්මියගේ පිට මත එරමිනියා ගොතා හිඳ ගත්තාය.

ඇනබෙත් කුතුහලය පිරි බැල්මක් පර්සි දෙසට හෙලුවාය. නිසැකවම ඔහුත්, ෆ්‍රැන්ක් සහ හේසාලුත් යමක් සඟවති. පැහැදිලි ලෙසම, එලා අනාවැකිය හඬ නඟා පවසා ඇත. - ඒ ඇය අපේක්ෂාවෙන් සිටින අනාවැකියයි.

පර්සිගේ මුහුණේ වූ ඉරියව් වලින් කියැවුණේ උදව් කරන්න යන්නයි. "ඒක අනාවැකියක්." ඔක්ටේවියන් විරෝධය පෑවේය. "ජේන විදිහට ඒක අනාවැකියක්."

කිසිවකු පිළිතුරු නොදුන්හ.

සිදුවෙමින් පවතින්නේ කුමක් දැයි ඇනබෙත්ට හරිහැටි පැහැදිලි නොවුණත්, පර්සි විශාල ගැටලුවක් අද්දර සිටින බව ඇය තේරුම් ගත්තාය.

ඇය ආයාසයෙන් සිනාසුණාය. "ඇත්තද, ඔක්ටේවියන්? සමහරවිට මෙහෙ ඉන්න හාපිලා වෙනස් ඇති. මේ රෝමය පැත්තෙ අය. අපට ඉන්න අයට නම් කාමර ශුද්ධ කරන්නයි, කෑම උයන්නයි තරමට යන්තම් බුද්ධියක් තියෙන්නෙ. ඔයාලගෙ අය සාමාන්‍යයෙන් අනාගතය ගැන අනාවැකි කියනවද? එයාලට නිමිති කියන්න ඔයාද උපදෙස් දෙන්නෙ?"



ඇගේ වදන් වලින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලැබිණි. රෝම නිලධාරීන්ට සිනාව නවතාගත නොහැකි විය. සමහරු එලා දෙසත්, අනතුරුව ඔක්ටේවියන් දෙසත් බැලූහ. කිකිළි කතගේ අනාවැකිය ග්‍රීකයන් තරමට රෝමවරුන්ටත් විකාරයක් වී තිබිණි.

"මම, ආහ්..." ඔක්ටේවියන් තම ටෙඩි බෙයාර්ව අත හැරියේය.

"නෑ, ඒත්."

"එයා මේ නිකම් පොතක තිබුණු පේළි ටිකක් දොඩවනවා." ඇනබෙත් පැවසුවාය. " හේසාල් කිව්ව වගේ අනෙක් අතට කරදර වෙන්න ඕනෙ සැබෑ අනාවැකිය මොකක්ද කියල අපි දැනටමත් දන්නවා."

ඇය ටයිසන් දෙසට හැරුණාය. "පර්සි හරි. ඇයි ඔයා එලාවයි, ඕ'ලෙයිරි මහත්මියවයි ටිකක් ඇවිදින්න එක්ක යන්නෙ නැත්තෙ? ඒකෙන් එලාට සනීපයක් දැනෙයි."

"විශාල බල්ලො හොඳයි." එලා පැවසුවාය. "මහලු මොර දෙන්නා. 1957, තිර රචනය ෆ්‍රෙඩ් ගිප්සන් සහ විලියම් ටන්බර්ග්." ඒ පිළිතුරු කෙසේ බාර ගන්නේ දැයි ඇනබෙත්ට සිතාගත නොහැකි විය. එහෙත් ප්‍රශ්නය විසඳූන අයුරින් පර්සි සිනාසුණේය.

"නියමයි." පර්සි පැවසුවේය. "අපේ වැඩේ ඉවර වුණාම අපි අයිරිස් පණිවුඩයකින් ඔයගොල්ලෝ ගෙන්න ගන්නම්." රෙයිනාගේ නිතිය අපේක්ෂාවෙන් රෝමවරු බලා සිටියහ. ඇනබෙත් හුස්ම නොගෙන බලා සිටියාය.

රෙයිනාගේ මුහුණ බැරෑරුම් වී තිබිණි. ඇය එලාව අධ්‍යයනය කරමින් සිටියත්, ඇය කුමක් සිතමින් සිටින්නේද යන්න ඇනබෙත්ට අනුමාන කිරීට නොහැකි විය.

"අපුරුයි." විනිසුරුවරිය අවසානයේ දී පැවසුවාය. "යන්න."

"යේ!" කව්ච්චිය වටා කැරකැවෙමින් ටයිසන් සියල්ලන්ව- ඔක්ටේවියන්ව පවා- වැළඳ ගත්තේය. එහෙත් ඔහු එයින් සතුටු වූ බවක් නොපෙනුණි. ඉන්පසු ඔහු ඕ' ලෙයිරි මහත්මිය සහ එලා සමඟ පිටවී ගියේය.

"හොඳයි." රෙයිනා තම අනුභව නොකළ ඇපල් ගෙඩිය පසෙකින් තැබුවාය. "එක තැනකදි ඔක්ටේවියන් නිවැරදියි. අපේ ඕනෑම ලෙජියන්වරයෙක් ගවේෂණයට යනව නම් ඒකට සෙනෙට් එකේ

අවසරය ගත යුතුයි. විශේෂයෙන්ම ඔයාල කියන තරම් අනතුරුදායක එකකට.''

''මේ හැමදේකම ද්‍රෝහිබවේ ගඳ දැනෙනවා.'' ඔක්ටේවියන් පැවසුවේය. ''ඒ යුද නැව සාමයේ නෞකාවක් නෙමෙයි.''

''නැවට එනව මනුස්සයෝ.'' ලියෝ ආරාධනා කළේය. ''මම ඔයාව එක්ක යන්නම්. ඔයාට ඒක පදවල බලන්න පුළුවන්. ඔයා ඇත්තටම ඒකට හොඳනම් මම ඔයාට පළඳින්න කපිතාන්වරයාගේ පුංචි කඩදාසි තොප්පියකුත් දෙන්නම්.''

ඔක්ටේවියන්ගේ නාස්පුඩු රත් විය. ''උඹ කොහොමද බය නැතිව-''

''ඒක හොඳ අදහසක්.'' රෙයිනා පැවසුවාය. ''ඔක්ටේවියන් එයත් එක්ක යන්න නැව බලන්න. අපි පැයකින් සෙනෙට් රැස්වීමේදී හමුවෙමු.''

''ඒත්...'' ඔටේවියන් නැවතුණේ ය. රෙයිනා සමඟ තවත් වාද කිරීම තම සෞඛ්‍යයට හිතකර නොවන බව ඔහුට පෙනී ගියා විය යුතුය.

''හොඳයි.''

ලියෝ නැගිට්ටේය. ඔහු ඇනබෙත් දෙසට හැරෙද්දී ඔහුගේ සිනාව වෙනස් විය. එය කොතරම් වේගයෙන් සිදු වූවාදැයි කියතොත් ඇනබෙත්ට සිතුණේ එය ඇගේ සිතේ ඇඳි දෙයක් වියහැකි බවයි. එහෙත් මොහොතකට පසු ලියෝ සිටගෙන සිටි තැනින් වෙනත් අයෙකු තුනී සිනාවක්ද, දැසේ වූ කෲර පෙනුමක්ද ඇයට දැකගත හැකිවිය. ඉන්පසු ඇනබෙත් ඇසිපිය ගසා බලන විට සුපුරුදු ලියෝ ඔහුගේ සාමාන්‍ය පෙනුමෙන් නැවත දර්ශනය විය.

''ඉක්මනට එන්නම්.'' ඔහු පොරොන්දු වූයේය. ''මේක වීර කාව්‍යයක් වෙයි.'' බියකරු වෙව්ලීමක් ඇගේ සිරුර පුරා පැතිර ගියේය. ලියෝ සහ ඔක්ටේවියන් කඹ ඉතිමඟ දෙසට යන විට, ඔවුන්ට ආපසු කතා කිරීමට ඇය සිතුවාය. එහෙත් ඇය එය කෙසේ පැහැදිළි කරන්නද? සියල්ලෝම ඇය උමතුවෙන් යැයි කියනු ඇත. සුළං ආත්ම පිඟන් පිරිසුදු කිරීමට පටන් ගත්තේය.

''ආහ්, රෙයිනා.'' ජේසන් පැවසුවේය. ''ඔයා මොකුත් හිතන්නෙ නැත්නම්, සෙනෙට් එක පටන්ගන්න කළින් මම පිපර්ට



ටිකක් අවට පෙන්නන්න කැමතියි. එයා කවදාවත් නව රෝමය දැකල නැහැ.'' රෙයිනාගේ - ඉරියව් දැඩි විය.

ජේසන් එතරම් දැඩි ලෙස කටයුතු කරන්නේ කෙසේ දැයි ඇනබෙත්ට සිතාගත නොහැකි විය. රෙයිනා ඔහුට කෙතරම් කැමති දැයි ඔහු නොදන්නේද? ඇනබෙත්ට නම් එය බෙහෙවින් ප්‍රත්‍යක්ෂ විය. ඔහුගේ අලුත් පෙම්වතියට රෙයිනාගේ නගරය අවට පෙන්වීමට ඇසීම තුවලයට ලුණු දැමීමක් බඳු විය.

පර්සි ඇනබෙත්ගේ අත අල්ලා ගත්තේය. ''ඔව්, මමත්, කැමතියි ඇනබෙත්ට පෙන්වන්න.''

''නෑ.'' රෙයිනා පැවසුවේය.

පර්සිගේ දෙබැම එසැවිණි. ''සමාවෙන්න?''

මම කැමතියි ඇනබෙත්ට එක්ක වචන ටිකක් කතා කරන්න. රෙයිනා පැවසුවේය. ''තනියම. ඔයා මොකුත් හිතන්නෙ නැත්නම් මගේ විනිසුරු සගයාණෙනි.'' ඇගේ ස්වරය අනුව ඇය සැබැවින්ම කළේ එයට අවසර පැතීමක් නොවන බව පෙනිණි.

ඇනබෙත්ගේ කොඳු නාරටිය සීතල විය. රෙයිනා කුමකට සැරසෙන්නේද යන්න ඇයට පුදුමයක් විය. සමහරවිට කොල්ලන් දෙදෙනා ඔවුන්ගේ පෙම්වතියන්ට නගරය පෙන්වීමේ අදහසට ඇය විරුද්ධ වීම ඇගේ අකැමැත්තට හේතුව විය හැකිය. එසේත් නැතිනම් ඇයට පෞද්ගලිකව යමක් පැවසීමට අවැසි වී තිබුණා විය හැකිය. දෙකෙන් කොයික වෙතත් රෝම ප්‍රධානියකු සමඟ නිරායුධව තනිව සිටීම ඇයව දෙගිඩියාවට පත් කරවන්නක් විය.

''ඇතීනාගේ දියණියනි.'' රෙයිනා තම කච්චියෙන් නැගී සිටියාය. ''මාත් එක්ක එන්න.''

# 04
# ඇනබෙත්

නව රෝමයට වෛර කිරීමට වුවමනා වුවත්, ඇනබෙත්ට එසේ කිරීමට නොහැකි විය. මාලක උද්‍යාන, ජල මල් සහ දේවස්ථාන, වංගු ගැසෙමින් දිවෙන බොරලු මාර්ග සහ ධවල පැහැයෙන් දිදුලන මන්දිර ඇයව ආකර්ෂණය කිරීමට සමත් විය. පසුගිය ග්‍රීෂ්මයේ පැවති ටයිටන් යුද්ධයෙන් පසු, ඔලිම්පස් කන්දේ මන්දිර නැවත සැලසුම් කිරීමට ඇය සිහින දක්කාය. දූත්, මේ කුඩා නගරයේ ඇවිදින අතරතුර, ඇය සිතන්නට පටන් ගත්තාය. මම මේ විදිහෙ අර්ධ ගෝල හදන්න ඕනෙ. මේ අංගණයෙ තියෙන කුලුනු වලට මම කැමතියි. නව රෝමය කාගේ සැලසුමක් වුවත් පැහැදිලිවම දිගු කාලයක් ගෙන එම ව්‍යාපෘතිය ගැන සැලකිල්ලෙන් ඉටු කරන ලද්දක් බව පෙනිණි.

"අපි ළඟ ඉන්නෙ ලෝකයෙ හොඳම ගෘහ නිර්මාණ ශිල්පියෝ සහ ඉදිකරන්නෝ." ඇගේ සිත කියවූවාක් මෙන් රෙයිනා පැවසුවාය. "අතීතයෙ ඉඳල, රෝමය හැම විටම එහෙම කළා. උපදෙවිවරු ගොඩක් එයාලගෙ කාලය ලෙජියන්වල ගත කළාට පස්සෙ මෙහෙ නැවතුණා. එයාල අපේ විශ්ව විද්‍යාලයට යනවා. එයාල පවුල්වෙලා මෙහෙ පදිංචි වුණා. මේ කාරණයට පර්සිත් කැමතියි වගේ."

ඇනබෙත්ට එහි අර්ථය වටහා ගැනීමට නොහැකි වූවාය. රෙයිනා සිනාසුණ නිසා ඇය වඩා කේන්තියෙන් දොස් පැවරිය යුතු විය. "ඔයා රණශූරියක්, ඒක හරි." විනිසුරුවරිය පැවසුවාය.



"සමාවෙන්න." ඇනබෙත් හඬ පහත් කර ගැනීමට උත්සාහ දරමින් පැවසුවාය.

"එහෙම ඕනෙ නෑ. මම බෙලෝනාගේ [1]දියණිය."

"යුද්ධයට අධිපති රෝම දෙවඟන?"

රෙයිනා හිස සැලුවාය. ඇය හැරී කුලී රථයක් නැවැත්වීමට මෙන් විසිල් කළාය. මොහොතකට පසු, ලෝහ බල්ලන් දෙදෙනෙක් ඇය දෙසට දිව ආවෝය. ස්වයංක්‍රීය දඩ බල්ලන්. එකෙකු රිදී පැහැති වූ අතර අනෙකා රන්වන් පැහැති විය. රෙයිනාගේ දෙපා අසල දවටෙමින් ඔවුහු තම පුෂ්පරාග මැණික් බඳු දෑස් ඇනබෙත් දෙසට යොමු කළහ.

"මගෙ සුරතල්ලු." රෙයිනා පැහැදිලි කළාය. "අවුරම් සහ ආජෙන්ටම්. එයාල අපි එක්ක ආවට ඔයා මොකුත් හිතන්න එපා."

නැවතත්, එය සැබැවින්ම ඉල්ලීමක් නොවන බව ඇනබෙත්ට හැඟී ගියේය. දඩ බල්ලන්ගේ දත් වානේ ඊ තුඩු තරම් තියුණු බව ඇයට පෙනිණි.

සමහරවිට නගරය තුළ ආයුධවලට ඉඩ නොලැබෙනවා විය හැකි වුවත්, රෙයිනාගේ සුරතලුන්ට තවමත් ඔවුන්ට අවශ්‍ය නම් ඇයව කැලිවලට ඉරා දැමීමට හැකියාව තිබිණි. රෙයිනා ඇයව එළිමහන් අවන්හලකට කැඳවාගෙන ගියාය. එහි වේටර්වරයා ඇයව හොඳින් හඳුනන්නෙකි. සිනාවක් පෑ ඔහු රෙයිනා අතටත්, ඇනබෙත්ටත් කෝප්පය බැගින් දුන්නාය.

"ඔයා මොනව හරි බොන්න කැමතිද?" රෙයිනා විමසුවාය. "එයාල අපූරු උණුසුම් චොකලට් හදනවා. ඇත්තටම රෝම පානයක් නෙමෙයි."

"ඒත් චොකලට් විශ්වීයයි." ඇනබෙත් පැවසුවාය.

"නිසැකවම."

එය ජූනි මාසයේ උණුසුම් සන්ධ්‍යාවක් වුවත්, ඇනබෙත් ස්තූති පූර්වකව කෝප්පය පිළිගත්තාය. ඔවුන් දෙදෙනා ඇවිද යන අතරතුර, රෙයිනාගේ රන් සහ රිදී බල්ලන් දෙදෙනා පිටුපසින් පැමිණියහ.

"අපේ කඳවුරේදී." රෙයිනා පැවසුවාය. "ඇතීනාට කියන්නේ මිනර්වා කියලයි."

1 යුද්ධයට අධිපති රෝම දෙවඟන

''එයාගෙ රෝම ස්වරූපය කොච්චර වෙනස් ද කියන එක ගැන ඔයාට හුරුපුරුදු බවක් තියෙනවද?''

ඇනබෙත් මින්පෙර සැබැවින්ම ඒ ගැන සැලකීමක් දක්වා තිබුණේ නැත. ටර්මිනස් නින්දිත දෙවඟන සේ සලකා ඇතීනාට කතා කළ ආකාරයට ඇගේ මතකයට නැඟිණි. ඔක්ටේවියන් හැසිරුණේ ඇනබෙත්ගේ දර්ශනය පවා නිග්‍රහයක් සේ සලකමිණි.

රෙයිනා දුම් දමන කෝප්පයට පිම්බාය. ''අපි මිනර්වාට ගරු කරනවා. ඇය තමයි අත්කම් වලට සහ නුවණට අධිපති දෙවඟන... ඒත් එයා ඇත්තටම යුද දෙවඟන නෙමෙයි. රෝමන්වරුන්ට එහෙම නෑ. ඒ වගේම එයා කන්‍යාවන්ගේ දෙවඟන. හරියට ඔයාල- ආර්ටිමිස් කියල කියන ඩයනා වගේ. ඔයාට මිනර්වාගේ කිසිම දරුවෙක් මෙහෙන් හොයාගන්න ලැබෙන්නෙ නැහැ. මිනර්වාට දරුවෝ ඇති කියන අදහසම අපිව තරමක් කම්පනයට පත් කරන දෙයක්.''

''ඔහ්.'' ඇනබෙත්ට තම මුහුණ රතු වන බව දැනිණි. ඇයට ඇතීනාගේ දරුවන් පිළිබඳ විස්තර වුවමනා නොවීය. ඇතීනා සියුස්ගේ [1]හිසෙන් නික්මුණාක් මෙන්, දෙවඟනගේ සිතිවිලි වලින් ඇගේ දරුවන් බිහි වූ ආකාරය ඇයට දැනගැනීමට අවශ්‍ය වූයේ නැත. ඒ ගැන කතා කරන සැමවිටම ඇයට ආත්ම විශ්වාසයක් දැනුණි. ඇය ඉන්ද්‍රජාලික ලෙස් උපත ලද තැනැත්තියක බැවින් මිනිසුන් ඇයට පෙකනියක් තිබේ ද හෝ නැද්ද යන්න විමසීමට පුරුදුව සිටියහ. සැබැවින්ම ඇයට පෙකනියක් තිබිණි. එහෙත් ඒ කෙසේද යන්න ඇයට පැහැදිළි කිරීමට නොහැකි විය. සැබැවින්ම ඇයට එය දැනගැනීමේ අවශ්‍යතාවක් ද නොතිබිණි.

''මට තේරෙනවා ග්‍රීක ඔයාලා දෙයක් දිහා බලන්නේ එකම විදිහට නෙමෙයි කියලා.'' රෙයිනා පැවසුවාය. ''ඒත් රෝමවරු කන්‍යාභාවය බෙහොම බරපතල විදිහට බාරගන්නවා. උදාහරණයක් විදිහට පවිත්‍ර කන්‍යාවෝ... එයාල එයාලගෙ පොරොන්දු කඩකරල කවුරුහරි එක්ක ආදරෙන් බැඳුණොත්, එයාව පණ පිටින් වළලන්න පුළුවන්. ඉතිං කන්‍යා දෙවඟනකට දරුවො ඉන්නවයි කියන අදහස...''

''තේරුණා.'' ඇනබෙත්ගේ උණු චොකලට් රසය සැනෙකින් දූවිලි රසයක් ලෙස දැනිණි. එහි පුදුමයක් නොතිබිණි. ''මම පැනල

1 අහසට අධිපති ග්‍රීක දෙවියන් සහ දෙවියන්ගේ රජු ය. රෝම ස්වරූපය ජුපිටර් ය.



යන්න හදන්නෙ නෑ. ඒ වගේම ඔයාලගෙ කඳවුරේ මිනර්වාගේ දරුවොත් ඉන්නවා නම්...''

''එයාල ඔයාවගේ වෙන එකක් නෑ.'' රෙයිනා පැවසුවාය. ''එයාල අත්කම් ශිල්පියො, කලාකාරයො, සමහරවිට උපදේශකයෝ වගේ අය වෙයි. ඒත් රණශූරයෝ වෙන්නෙ නැහැ. භයානක ගවේෂණයක නායකයො වෙන එකක් නැහැ.''

තමා ගවේෂණයේ නායිකාව නොවෙතැයි කියා එයට විරෝධය පළ කිරීමට ඇනබෙත් සැරසුණේය. නිල වශයෙන් ඇය නායිකාව නොවේ. එහෙත් ආගෝ II හි ඇගේ මිතුරන් එයට එකඟ වේවිදයි ඇයට වූයේ සැකයකි. ගෙවුණු දින කීපයේ, ඔවුහු ඇගේ නියෝග බලාපොරොත්තු වූහ. ජුපිටර්ගේ පුත්‍රයා වූ ජේසන් පවා ඒවාට අවනත විය. එපමණක් නොව කිසිවකුගේ නියෝග තුට්ටුවකට මායිම් නොකරන කෝච් හෙජ් පවා ඇයට අවනත විය.

''තවත් තියෙනවා.'' ඇය තම ඇඟිල්ල වැනුවාය. ඇගේ රන් සුනඛයා අවුරම් ඇය වෙත පැමිණියේය. විනිසුරුවරිය උගේ කන් පිරිමැද්දාය. ''හාපි එලා... ඒක ඇය කියපු අනාවැකියක්. අපි දෙන්නම ඒක දන්නවා. එහෙම නේද?''

ඇනබෙත්ගේ හුස්ම හිර විය. අවුරම්ගේ වෛරෝඩි දෙනෙත්වල වූ යමක් ඇයව අපහසුතාවයට පත් කිරීමට සමත් විය. බල්ලන්ට බියෙහි ගන්ධය පමණක් හඳුනාගත හැකි බව ඇය අසා තිබුණාය. එය ඉන්ද්‍රජාලික ලෝහ බල්ලන්ටත් අදාළ වේ දැයි ඇය නොදැන සිටි නමුත්, සත්‍යය පැවසීම වඩාත් යහපත් බව ඇය තීරණය කළාය.

''පෙනෙන විදිහට නම් ඒක අනාවැකියක් තමයි.'' ඇය පැවසුවාය. ''ඒත් මට මීට කළින් කවදාවත් එලා ව හමුවෙලා නැහැ. ඒ වගේම අර වාක්‍ය පෙළ මම කවදාවත් අහලත් නැහැ.''

''මම අහල තියෙනවා.'' රෙයිනා සෙමින් පැවසුවාය. ''අඩුගානෙ එයින් කීපයක්වත්-'' යාර කීපයක් එපිටින් සිටි රිදී බල්ලා බුරන්නට විය. යාබද වීථියකින් පැමිණි ළමුන් පිරිසක් ආගෙන්ටම් වටා රොක් වී බල්ලාව පිරිමදිමින්, සිනාසෙමින් උගේ රේසර් වැනි තියුණු දත් සොලවන්නට වූහ.

''අපි යන්න ඕනෙ.'' රෙයිනා පැවසුවාය.

ඔවුහු කඳු ගැටය දෙසට ගමන් කළහ. දරුවන් හැර දමා දඩයම් බල්ලෝ ඔවුන් පිටුපස පැමිණියහ. ඇනබෙත් රෙයිනාගේ මුහුණ දෙස

බලාගෙන සිටියාය. නොපැහැදිලි මතකයක් ඇගේ සිතට වද දෙන්නට විය. ඒ රෙයිනා ඇගේ කොණ්ඩය පිරිමැද එය ඇගේ කන පිටුපසට කළ ආකාරය නිසාය. ඇගේ රිදී කන් පළඳනාවේ පත්දමක සහ අසිරිමත් සටහනක් විය.

"අපි මීට කළින් හමුවුණා." ඇනබෙත් පැවසුවාය. "මං හිතන්නෙ ඔයා පොඩිකාලෙ."

රෙයිනා ඇයට කර්කශ සිනාවක් පෑවාය. "බොහොම හොඳයි. පර්සි මට මතක් කළේ නැහැ. ඇත්තවශයෙන්ම ඔයා දුන් ඇමසෝනාවල රැජින වෙලා ඉන්න මගේ සහෝදරිය හයිලා ගැන ගොඩක් කතා කළා. ඔයා පිටත් වුණේ අද උදේ ඔයාල එනවත් එක්කම වගේ. කොහොම බැලුවත්, අපි අන්තිමට හමුවෙන කොට, මම සර්සි මන්දිරයේ මෙහෙකාරියක් වෙලා ඉන්න ඇති."

"සර්සි..." ඇනබෙත්ට තමා මන්තර කාරියන්ගේ දූපතට ගිය ගමන සිහිපත් විය. එවකට ඇය දහතුන් හැවිරිදි වියේ පසු වූවාය. මුහුදු රාක්ෂයන් විසින් ඇයත් පර්සිවත් වෙරළට විසි කර දමූහ.

හයිලා ඔවුන්ව සාදරයෙන් පිළිගත්තාය. ඇනබෙත්ට පිරිසිදු වීමට උදව් කළ හයිලා, ඇගේ අලුත්ම ඇඳුමක් ද ඇනබෙත් ට ලබා දුන්නාය. ඉන්පසු සර්සි ඇනබෙත්ට අගනා අවස්ථාවක් ලබා දුන්නේය. ඇනබෙත් දූපතේ නතර වෙන්නෙ නම්, ඇයට ඉන්ද්‍රජාල පුහුණුව සහ අසාමාන්‍ය බලයක් ලබා ගැනීමට හැකිවනු ඇත. සමහරවිට ඇය තරමක් දුරට ඒ කෙරෙහි බැඳී සිටියාය. එහෙත් ඒ පර්සි හාවකු බවට පත් කිරීමත්, ඒ ස්ථානය උගුලක් බව ඇයට අවබෝධ වනතුරුත් පමණි. (පර්සි හාවකු බවට පත්වීමේ කොටස තරමක් විනෝද ජනක බව පෙනුණත්, ඒ කාලයේදී, එහි භයානක බවක් තිබිණි.) රෙයිනා පවසන ලෙසම... ඇනබෙත්ගේ හිස පීරූ අයගෙන් කෙනෙක් වූයේ රෙයිනාය.

"ඔයා..." ඇනබෙත් පුදුමයෙන් පැවසුවාය. " ඒ වගේම ඇමසෝන්වල රැජින හයිලා? ඔය දෙන්න කොහොමද?"

"දිග කතාවක්." රෙයිනා පැවසුවාය. "ඒත් මට ඔයාව හොඳට මතකයි. ඔයා නිර්භීතයි. සර්සිගේ සත්කාර ප්‍රතික්ෂේප කරපු කිසිම කෙනෙක්ව මට හමුවෙලා නැහැ. පර්සි ඔයා ගැන හිතන එකේ පුදුමයක් නැහැ."

1 ග්‍රීක මායාකාරියකි. අතීතයේදී ඇය ඔඩිසියස්ගේ නාවුක පිරිස ඌරන් බවට හැරවූවාය.



ඇගේ හඬෙහි වූයේ උකටලී බවකි. එයට ප්‍රතිචාර නොදැක්වීම ආරක්ෂිත බව ඇනබෙත් සිතුවාය. ඔවුහු කඳු මුදුනට පැමිණි අතර එහි මළුවේ සිට මුළු නිම්නයම දැකගත හැකි විය.

"මේ තමයි මම කැමතිම තැන." රෙයිනා පැවසුවාය. "බැචස්ගේ' උද්‍යානය."

මිදි වැල් එකට එතෙමින් ඔවුන් ඉහළින් වියනක් නිර්මාණය කර තිබිණි. හනිසකල් සහ ජැස්මින් පඳුරු වටා මී මැස්සෝ කැරකෙමින් සිටියහ. සන්ධ්‍යාවේ පුළඟ මිශ්‍ර විලවුන් සුගන්ධයකින් පිරී පැවතිණි. මළුවේ මැද බැලේ නර්තන ඉරියව්වකින් බැචස්ගේ ප්‍රතිමාවක් සිටුවා තිබිණි. කෙටි රෙදි කඩක් හැර ඔහුගේ ගතේ වෙනත් ඇඳුමක් නොතිබිණි. කම්මුල් හැකිලී තොල් උල් වී තිබූ අතර, ඔහුගේ මුවින් ජල පහරක් නිකුත් විය.

තම සිත්තැවුල් පසෙකලූ ඇනබෙත් සිනාසුණාය. ඔහුගේ ග්‍රීක ස්වරූපය වූ ඩියෝනිසස් නැතහොත් ඩී. මහත්මයා ලෙසින් ඇය ඔහුව දැන සිටියාය. ඔවුන් අර්ධ ලෝහිත කඳවුරේදී ඔහුව ඇමතුවේ ඩී. මහත්මයා ලෙසිණි. දුහුල් රෙදිකඩක් හැඳ මුවින් වතුර විදිමින් ශිලා ප්‍රතිමාවක් ලෙසින් අමරණීයව සිටින තම මහලු කඳවුරු අධ්‍යක්ෂකවරයා දකින විට ඇයට තරමක ප්‍රසන්න හැඟීමක් දැනිණි.

රෙයිනා මලුවේ කෙළවරක නැවතුණාය. පෙනෙන දර්ශනය කඳු ගැටය නැගි වෙහෙසට සරිලන වටිනාකමකින් යුක්ත විය. ත්‍රිමාණ මොසැයික රූපයක් මෙන් ඔවුන්ට පහළින් මුළු නගරයම පැතිරී ගොස් තිබිණි. දකුණට වන්නට, විලට එහා, කඳුගැටයක දේවස්ථාන සමූහයකි. උතුරින් වූ වාරි ඇළ මාර්ගය දඟර ගැසෙමින් බාක්ලේ විල දෙසට යොමු වී තිබිණි. කම්කරුවන් පිරිසක් මෑත යුද්ධයේදී හානි වූවායැයි සිතිය හැකි කොටසක් අලුත්වැඩියා කරමින් සිටියහ. "මට ඒක ඔයාගෙන්ම දැනගන්න ඕනෙ වුණා." රෙයිනා පැවසුවාය. ඇනබෙත් ඇය දෙසට හැරුණාය. "මගෙන් මොනවද?"

"ඇත්ත." රෙයිනා පැවසුවාය. "ඔයාව විශ්වාස කරල මම වැරැද්දක් කරගත්තෙ නෑ කියන එය තහවුරු කරගන්න ඕනෙ. ඔයා ගැන මට කියන්න... අර්ධ ලෝහිත කඳවුර ගැන කියන්න. ඔයාගෙ මිතුරිය පිපර්ගෙ වචනවල වශියක් තියෙනවා. මම ඇති තරම් කල් සර්සිවල හිටපු නිසා වශී කතා ඇහෙනකොටම දන්නවා. එයා කියන

1 වයින්වලට සහ ප්‍රීති උත්සවවලට අධිපති රෝම දෙවියාය. ඔහුගේ ග්‍රීක ස්වරූපය ඩියෝනිසස් ය.

දේවල් මට විශ්වාස කරන්න බැහැ. ඒ වගේම ජේසන්... එයා වෙනස් වෙලා. එයා දුරස් වෙලා, තවදුරටත් රෝම කෙනෙක් විදිහට පේන්නෙ නැහැ."

ඇගේ හඬ බිඳුණු වීදුරුවක් තරම් තියුණු ලෙස රිදුම් දීමට සමත් විය. පර්සිව සොයමින් සිටි මාස ගණනාව පුරා තමා කරා කළේත් මේ ආකාරයෙන්ම බව ඇනබෙත්ට සිහිපත් විය. අඩුම ගානේ ඇයට තම පෙම්වතා හමු විය. රෙයිනාට කිසිවකු නොවීය. මුළු කඳවුරම පත්වාගෙන යාමේ සියලු වගකීම් රෙයිනාට තනිව දැරීමට සිදුවූවාය. ජේසන්ගේ ආදරය රෙයිනාට අවශ්‍යව ඇති බව ඇනබෙත්ට දැනුණාය. එහෙත් අතුරුදහන් වූ ඔහු ආපසු පැමිණියේ නව පෙම්වතියක් ද සමඟය. මේ අතර පර්සි විනිසුරුවරයකු ලෙස උසස් කෙරුණත්, ඔහුද රෙයිනාව නොතකා හැරියේය. දැන් ඔහුව රැගෙන යාමට ඇනබෙත් පැමිණ සිටී. රෙයිනා ඔවුන් දෙදෙනාගේම කටයුතු උර මත දරාගෙන නැවත තනිවනු ඇත. ඇනබෙත් ජුපිටර් කඳවුරට පැමිණි විට, ඇය රෙයිනා සමඟ සාකච්ඡා කිරීමට හෝ අවැසි නම් සටන් කිරීමට වුවද සූදානම්ව සිටියාය. ඇය පිළිබඳ කනගාටුවක් ඇතිකර ගැනීමට ඇය සූදානම්ව නොසිටියාය. ඇය ඒ හැඟීම සඟවා ගත්තාය. යමකු අනුකම්පා කළත් රෙයිනා එය බාර ගන්නේ නැත.

ඒ වෙනුවට ඇය රෙයිනාට ඇගේ ජීවිත කතාව පැවසුවාය. ඇය සැන් ෆ්‍රැන්සිස්කෝවල සිටින තම පියා, කුඩම්මා සහ ඥාති සොයුරන් දෙදෙනා ගැන කතා කළාය. තමාගේම පවුල තුළ පිටස්තරයකු ලෙස දැනුණු හැඟීම කෙබඳු වූයේ දැයි ඇය පැවසුවාය. යන්තම් අවුරුදු හතක් පිරෙද්දී ගෙදරින් පළා ගිය සැටිත්, තාලියා සහ ලූක් යන මිතුරන් හමු වූ සැටිත්, ලෝංග් දූපතේ අර්ධ ලෝහිත කඳවුරට පැමිණි සැටිත් ඇය පවසා සිටියාය. කඳවුර ගැනත්, එහි හැදී වැඩුණු අයුරුත් ඇය විස්තර කළාය. පර්සිගේ හමුවීම සහ ඔහු සමඟ කළ වීර චාරිකා ගැනත් ඇය පැවසුවාය.

රෙයිනා හොඳ සවන්දෙන්නියක වූවාය.

ඇනබෙත් ඇයට මෑත කාලයේ ඇති වූ ගැටලු ද පැවසුවාය. තම මව සමඟ ඇති වූ ආරවුල, රිදී කාසිය තෑගි ලැබීම, ඇය නින්දේ දී දුටු බියකරු සිහින ගැන ඇය රෙයිනාට පැවසුවාය. ඇයට මේ ගවේෂණයට යා නොහැකි බව ඇය තීරණය කර තිබුණාය. එහෙත් ඇයට එතරම් දුරට ඒ ගැන පැවසීමට නොහැකි විය.



ඇනබෙත් කතා කරමින් සිටින අතර, රෙයිනා නව රෝමය දෙස බලාගෙන සිටියාය. ඇගේ ලෝහ බල්ලන් දෙදෙනා උද්‍යානය ඉව කරමින් සිටියාය. අවසානයේ රෙයිනා ඈත කඳුගැටයේ දිස්වන දේවස්ථානය රාශිය පෙන්වූවාය.

"රතු පුංචි ගොඩනැඟිල්ල." ඇය පැවසුවාය. "ඒක උතුරු පැත්තෙද තියෙන්නෙ? ඒ මගේ අම්මා, බෙලෝනාගේ දේවස්ථානය," රෙයිනා ඇනබෙත් දෙසට හැරුණාය. "ඔයාගේ අම්මට වගේ නෙමෙයි, බෙලෝනාට ග්‍රීක ස්වරූපයක් නැහැ. එයා සම්පූර්ණයෙන්ම, සැබෑ රෝමානුවෙක්. එයා තමයි මාතෘ භූමිය සුරකීමේ දෙවඟන."

ඇනබෙත් කිසිවක් නොපවසා සිටියාය. ඇය රෝම දෙවඟනන් ගැන දැන සිටියේ බොහෝ ස්වල්පයකි. ඇය ඒ ගැන අධ්‍යයනය කළා නම් හොඳ බව ඇයට සිතුණත්, ග්‍රීක තරම් ඇයට කොහෙත්ම ලතින් බස පහසු වූයේ නැත. පහළ විනිශ්චය ශාලාවට ඉහළින් විශාල ලෝකඩ බැලුමක් සේ ආගෝ II හි බඳ දිලිසෙමින් තිබිණි.

"රෝමවරු යුද්දෙට යනකොට." රෙයිනා කතාව ඇරඹුවාය. "අපි මුළින්ම බෙලෝනාගේ දේවස්ථානයට යනවා. ඇතුළෙ තියෙනවා පොඩි බිම් කැබැල්ලක්. ඒකෙන් නිරූපණය වෙන්නෙ සතුරාගේ භූමියයි. අපි දැන් යුද්දය ප්‍රකාශ කළා කියල පෙන්වන්න ඒකට හෙල්ලක් විසි කරනවා. ඔයා දන්නවනෙ, රෝමවරු නිතරම විශ්වාස කරන්නේ හොඳම ආරක්ෂාව ආක්‍රමණය කියලයි. අතීතයේදී, අපේ මුතුන්මිත්තන්ට එයාලගෙ අසල්වැසියන්ගෙ තර්ජනයක් එල්ල වුණ හැම වෙලාවෙම. එයාලගෙ ආරක්ෂාව සඳහා ඔවුන්ව ආක්‍රමණය කළා."

"එයාල ඔවුන් වටා සිටි හැමෝවම යටත් කළා." ඇනබෙත් පැවසුවාය.

"කාතේජය, ගෝල් දේශය."

"ඒ වගේම ග්‍රීසිය." රෙයිනා එය ප්‍රකාශ කිරීමෙන් වැළකුණාය. "මගේ තර්කය මේකයි ඇනබෙත්, අනෙක් බලවතුන් සමඟ සහයෝගයෙන් සිටීමේ රෝම ස්වභාවය ඒක නෙමෙයිද? රෝම සහ ග්‍රීක උප දෙවිවරු හමුවුණ හැම වතාවකදීම අපි සටන් වැදුණා. අපේ දෙපක්ෂය අතරෙ ඇතිවුණ එදිරිවාදිකම්වලින් මානව ඉතිහාසයේ බොහොම බියකරු යුද්ධ ආරම්භ වුණා- විශේෂයෙන් සිවිල් යුද්ධ."

"ඒක ඒ විදිහටම කියන්න බැහැ." ඇනබෙත් පැවසුවාය. "අපිට එකතු වෙලා වැඩ කරන්න වෙනවා. නැත්නම් ගයියා අපි දෙගොල්ලොම විනාශ කරයි.

"මම එකඟයි." රෙයිනා පැවසුවාය. "ඒත් සහයෝගය වෙන්න පුළුවන් දෙයක් ද? ජුනෝගෙ සැලැස්ම වැරදි නම් මොකද වෙන්නෙ? දෙවඟනන්ට පවා වැරදීම් වෙන්න පුළුවන්." රෙයිනාට අකුණක් වදින තුරු-හෝ මොණරියක් බවට පත්වන තුරු ඇනබෙත් මොහොතක් බලා සිටියාය. කිසිවක් සිදු නොවිණි.

අවාසානාවකට රෙයිනාගේ සැකය ඇනබෙත් තුළ ද ඇති විය. හේරා වැරදි කර තිබුණාය. ඇනබෙත්ට මේ අහංකාර දෙවඟන පෙන්නන්නට බැරි අත් කිසිවක් නිසා නොව පර්සිව වෙනතක රැගෙන යාම නිසාය. ඇය කිසිවිටෙකත් එයට සමාව නොදෙනු ඇත. අනෙක් අතට එම ක්‍රියාව උදාර හේතුවක් නිසා කළ දෙයක්ද නොවීය.

"මම දෙවඟනව විශ්වාස කරන්නෙ නැහැ." ඇනබෙත් පැවසුවාය. "ඒත් මම මගේ මිත්‍රයන්ව විශ්වාස කරනවා. මේක උපායක් නෙමෙයි, රෙයිනා. අපිට එකතුවෙලා වැඩ කරන්න පුළුවන්."

රෙයිනා ඇගේ චොකලට් කෝප්පය තිම කළාය. කෝප්පය මලලුව් වැට මත තැබූ ඇය, යුද රේඛා සිතින් මවා ගැනීමට මෙන් තිම්නය දෙස බලා සිටියාය.

"ඔයා කියන දේ මම විශ්වාස කරනවා." ඇය පැවසුවාය. "ඒත් ඔයා පැරණි භූමිවලට යනව නම්, විශේෂයෙන්ම රෝමයට, ඔයාට ඔයාගෙ අම්ම ගැන දැනගන්න ඕනෙ දෙයක් තියෙනවා."

ඇනබෙත්ගෙ උරහිස් ගැස්සිණි. "ම- මගේ අම්මා?"

"මම සර්සිගේ දූපගේ ජීවත් වෙද්දි." රෙයිනා පැවසුවාය. "අපිට ගොඩක් අමුත්තො ලැබුණා. එක සැරයක්, සමහරවිට ඔයයි පර්සියි එන්න අවුරුද්දකට විතර කළින් වෙන්න ඇති. තරුණ මිනිහෙක්ව වෙරළට ගොඩ ගහල තිබුණා. පිපාසයත්, උණුසුමත් නිසා එය බාගෙට පිස්සු වැටිල හිටියෙ. දවස් ගාණක් එයාව මුහුදෙ පා වෙමින් ඉඳල තියෙනවා. එයාගෙ වචන එච්චරම තේරුම් ගන්න බැරි වුණත්, එයා කිව්වා එයා ඇතීනාගේ පුත්‍රයෙක් කියලා."

ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් රෙයිනා මඳත් නිහඬව සිටියාය. ඒ කොලුවා කවුරු විය හැකිදැයි යන්න ගැන ඇනබෙත්ට අදහසක් නොතිබිණි. රාක්ෂයන්ගේ මුහුද සොයා ගිය වෙනත් කිසිදු



ඇතීනාගේ දරුවකු ගැන ඇය දැන නොසිටියාය. එහෙත් තවමත් ඇයට දැනෙමින් තිබුණේ නැති ගැත්මකි.

"මේ උප දෙවියාට මොනවද වුණේ?" ඇය විමසුවාය.

ප්‍රශ්නය නොවැදගත් එකක් බව පෙන්වීමට මෙන් රෙයිනා තම අත වැනුවාය. "ඇත්තටම, සර්සි එයාව ගිනියා ඌරෙක් බවට පත් කළා. ඒත් ඊට කළින්, එයා තමන්ගෙ අසාර්ථක ගවේෂණය ගැන වල්පල් කතා කළා. ඇතීනාගේ සලකුණ සොයාගෙන රෝමයට ගියා කියලත් එයා කිව්වා." තම සමබරතාවය රඳවා ගැනීමට ඇනබෙත් අත්වැටට වාරු වූවාය.

"ඔව්." ඇනබෙත් අපහසුතාවට පත් වූ අයුරු දැක රෙයිනා පැවසුවාය. "එයා නුවණේ දරුවා, ඇතීනාගේ සලකුණ, වියැකී යන යෝධයන්ගේ නපුර සහ රත් ගැන දෙඩෙව්වා. ටිකකට කළින් එලා කියපු පේලි ටිකමයි. ඒත් ඔයා කියනවා අද වෙනකම් ඔයා ඒව ගැන අහල නෑ කියලා."

"නෑ- එලා ඒව කියපු විදිහට නෙමෙයි." ඇනබෙත්ගේ හඬ බිඳී ගොස් තිබිණි. ඇය බොරුවක් නොපැවසුවේය. ඇය කිසිදිනෙක ඒ අනාවැකිය අසා නොතිබුණත්, ඇගේ මව ඇතීනාගේ සලකුණ සොයා යන ලෙස උපදෙස් දුන්නාය. තම සාක්කුවේ ඇති කාසිය ගැන සිතන්ම, බියකරු සැකයක සේයාවක් ඇගේ සිතට නැගී එන්නට විය. ඇයට තම මවගේ රුදුරු වදන් සිහියට නැගිණි. ඇය ඊට පසුව තමාට දක්නට ලැබුණු බියකරු සිහින ගැන සිතුවාය. "මේ උපදෙවියා- එයාගෙ ගවේෂණය ගැන පැහැදිලි කළාද?"

රෙයිනා හිස වැනුවාය. "ඒ කාලෙ, ඒ කතා කරපු දේවල් ගැන මට වැටහීමක් තිබුණේ නැහැ. පස්සෙ කාලෙක, මම ජුපිටර් කඳවුරේ විනිසුරුවරිය වුණාම, මම සැකකරන්න පටන් ගත්තා."

"සැක කරන්න... මොනවද?"

"ශත වර්ෂ ගණනාවක් පුරා ජුපිටර් කඳවුරේ විනිසුරුවරු අතරේ ප්‍රචාරය වුණ පුරාවෘත්තයක් තියෙනවා. ඒක, ඇත්ත නම්, ඒකෙන් පැහැදිලි වෙනවා අපේ උප දෙවිවරු කණ්ඩායම් දෙකට කවදාවත් එකතු වෙලා වැඩ කරන්න බැරි ඇයි කියන එක. ඒ අපේ එදිරිවාදිකමට හේතුව නිසා වෙන්න පුළුවන්. පුරාවෘත්තයේ කියන විදිහට අවසානයේ මේ එදිරිවාදිකම සමථයකට පත් නොවන තාක්, ඒ රෝමවරු සහ ග්‍රීකයෝ කවදාවත් සාමයෙන් ඉන්න එකක් නැහැ. ඒ

වගේම පුරාවෘත්තයේ ප්‍රධාන චරිතය තමයි ඇතීනා." වෙව්ළුම හඬින් වාතය විනිවිද ගියේය.

විනිශ්චය ශාලාවේ අලුත් ආවාටයක් සාදමින් ඇති වූ පිපිරුම බැලීමට ඇනබෙත් ආපසු හැරුණාය. ගිනි ගන්නා කච්චි ගුවනට විසි විය. උප දෙවිවරු උමතුවෙන් සී සීකඩ දිව ගියහ. "යෝධයෝද!"

"මම හිතුවේ ඔවුන්ගේ හමුදාව පරාජය වුණා කියලයි."

"ඒ යෝධයෝ නෙමෙයි." රෙයිනාගේ දෑස් කෝපයෙන් ගිනි ගෙන තිබිණි."ඔයාල අපේ විශ්වාසය පාවල දුන්නා."

"මොකක්? නැහැ!"

ඇය එසේ පැවසූ සැනින්ම, ආගෝ II න් දෙවැනි වෙඩි මුරය මුදා හැරිණි. එහි බැලිස්ටාවෙන් ග්‍රීක අග්නිය දවටන ලද දැවැන්ත හෙල්ලයක් මුදා හැරිණි. කෙළින්ම ඇදී ගිය එය කැඩුණු අර්ධ ගෝලය තුළින් සෙනෙට් මන්දිරය තුළට ඇදී ගොස් පුපුරා ගියේය. එතුළත යමෙකු සිටියේ නම්...

"දෙවියනේ, එපා." ඇනබෙත්ගේ දෙපා වෙව්ලන්නට විය. "රෙයිනා, මේක වෙන්න බැහැ. අපි කවදාවත් මේක කරන්නෙ නෑ."

ලෝහ බල්ලන් දෙදෙනා ඔවුන්ගේ ස්වාමි දූවගේ පැත්තට දිව ගියහ. පහර දීමට සූදානමින් ඔවුහු ගොරවමින් ඇනබෙත් දෙස බලා සිටියහ.

"ඔයා කියන්නෙ ඇත්ත." රෙයිනා පැවසුවාය. "සමහරවිට ඔයා මේ ද්‍රෝහිකම ගැන දැනුවත් නැතුව ඇති. ඒත් කාටහරි මේ වෙනුවෙන් ගෙවන්න වෙනවා."

විනිශ්චය ශාලාවෙන්, විලාප හඬ නැගී ආවේය. පිරිස එකිනෙකා පෙරලාගෙන දිවයන්නට වූහ. "ලේ වැගිරීමක් ." රෙයිනා පැවසුවාය. "අපි ඒක නවක්තන්න ඕනෙ."

රෙයිනා තමා සමඟ එකඟ වන අවසන් අවස්ථාව මෙය විය යුතුය යන බියකරු හැඟීමක් ඇනබෙත් තුළ ඇති විය. එහෙත් ඔවුහු දෙදෙනාම කන්ද පහළට දිව ගියහ.

නගරය තුළට ආයුධ ගෙන ඒමට අවසර ලැබී තිබුණේ නම්, ඇනබෙත්ගේ මිතුරන් මේ වනවිටත් මළවුන් අතරට ගොස් හමාරය. විනිශ්චය ශාලාව තුළ සිටි රෝම උප දෙවිවරු කෝපයෙන් වියරුව එකට එක් වී සිටියහ. සමහර පිඟන්, ආහාර සහ ගල්වලින් ආගෝ II



වෙත දමා ගැසූහ. ඒවායේ ඉලක්කයක් නොතිබුණු අතර බොහෝමයක් ඒවා නැවත පිරිස අතරට පතිත විය.

තවත් පිරිසක්, කලබල වූ ජනයා සන්සුන් කිරීමට උත්සාහ දරණ ජේසන් හා පිපර් වටකරගෙන සිටියහ. ඔවුන්ගේ උත්සාහය සාර්ථක නොවන බව පෙනිණි. පිපර්ගේ වශී කතාව විලාප නගමින්, කෝපයෙන් හැසිරෙන පිරිස සන්සුන් කිරීමට ප්‍රමාණවත් නොවීය. ජේසන්ගේ නළලින් ලේ වැගිරෙමින් තිබිණි. ඔහුගේ දම් පැහැති ලෝගුව ඉරී ගොස් තිබිණි. ඔහු දිගටම ආයාචනා කරන්නට විය. "මම ඔයාලගෙ පැත්තේ." එහෙත් ඔහු පැළඳ සිටි අර්ධ ලෝහිත කදවුරේ ටී ෂර්ටය ප්‍රශ්නය විසඳීමට බාධාවක් විය. එසේම ඉහළින් නවතාගෙන අග්නි හෙලි පහර විදින යුද නැවද පිරිස සන්සුන් කිරීමට බාධකයක් විය. එක් හෙල්ලයක් වෝගා සාප්පුවක් අසල පතිත වී පුපුරා ගියේය.

"බලාගෙන." රෙයිනා කෑ ගැසුවාය.

ආයුධ සන්නද්ධ ලෙජියන්වරු ඉක්මනින්ම විනිශ්චය ශාලාව දෙසට පැමිණියහ. පොමේරියානු රේඛාවට පිටතින් සේනාංක දෙකක් ආගෝ II වෙත කැටපෝල ප්‍රහාර එල්ල කිරීමට සූදානමින් පසුවූහ.

"ඒකෙන් තත්ත්වය තවත් නරක වෙයි." ඇනබෙත් පැවසුවාය.

"මම මගෙ රස්සාවට වෛර කරනවා." රෙයිනා ගෙරවූවාය. ඇය ලෙජියන් සෙබලුන් දෙසට හැල්මේ දිව යද්දී ඇගේ බල්ලන් දෙදෙනාද දෙපසින් දිව ගියහ.

පර්සි, බලාපොරොත්තු සුන් වූ අයුරින් විනිශ්චය ශාලාව දෙස බලමින් ඇනබෙත් සිතුවාය. ඔයා කොහෙද?

රෝමවරු ඇයව අල්ලා ගැනීමට උත්සාහ කළහ. පහත් වී ඔවුන්ගෙන් ගැලවුණු ඇය දිවගොස් සෙනඟ අතරට වැදුණාය. කෝපයට පත් රෝමවරු, ගිනි ගන්නා කච්චි සහ පුපුරාගිය ගොඩනැගිලි පමණක් නොව, දම් පැහැති භූතයන් සිය ගණනක් ද උප දෙවිවරුන්ගේ සිරුරු තුළින් ගමන් කරමින් වැලපෙන්නට වීම තත්ත්වය තව තවත් ව්‍යාකූල කළේය. ෆවුන්[1] දෙවිවරුද විලාපයේ වාසිය ගත්හ. කෑම මේසයට ඇදී ගිය ඔවුහු කෑම, පිඟාන සහ කුසලාන ඩැහැ ගත්හ.

1 රෝම වන දෙවියා. අර්ධයක් එළු සහ අර්ධයක් මිනිස් සිරුරක් සහිතය. ග්‍රීක ආකාරය නරාශ්වයාය.(satyr)

වර්මිනස්ගේ ප්‍රතිමාව ඇනබෙත් ඉදිරිපිටම සුපුරා හැලෙන්නට විය. සැකයක් නොමැතිව ඔහු ලතින් බසින් මොර දුන්නේ ඇය බොරුකාරියක සහ නීති කඩන්නියක බව පවසමිනි. එහෙත් ප්‍රතිමාව තල්ලු කර දමූ ඇය ඉදිරියටම දිව ගියාය.

අවසානයේ ඇයට පර්සි දක ගැනීමට ලැබිණි. ඔහුත් ඔහුගේ මිතුරන් වූ හේසාල් සහ ෆ්‍රැන්ක් ද ජල මලක් මැද සිටගෙන සිටියහ. ඔහු රෝමන්වරුන්ට අසලට ඒමට ඉඩනොදී ජල පහර විදිමින් සිටියේය. විනිශ්චය ශාලාවේ තවත් පිපිරීමක් සිදුවෙද්දී, ඇනබෙත් ඔහුට කෑ ගැසුවාය. මේ වතාවේ ආලෝක දහරාව ඇති වූයේ කෙළින්ම ඔවුන්ට ඉහළිනි. එක් රෝම කැටපලයක් ක්‍රියාත්මක වී තිබිණි. ආගෝ II දෙදරා ගොස් පැත්තකට ඇල විය. ලෝකඩ තහඩු සහිත බඳෙන් ගිනිදළු නැගිණි.

ලණු ඉනිමඟ දිගේ පහළට බැසීමට උත්සාහ කරන රුවක් බලාපොරොත්තු සුන් වූ අයුරින් කෑ ගසන අයුරු ඇනබෙත්ට දක ගැනීමට ලැබිණි. ඒ ඔක්ටේවියන්ය. ඔහුගේ ලෝගුවෙන් දුම් දමමින් තිබූ අතර, මුහුණ දූලි වලින් කළු වී තිබිණි.

ජල මල මැද සිට පර්සි කලහකාරී ජනයාට තව තවත් ජල ප්‍රහාර එල්ල කළේය. ඇනබෙත් ඔහු වෙත දිව ගියාය.

"ඇනබෙත්." පර්සි කෑ ගැසුවේය. "මොකක්ද?"

"මම දන්නෙ නෑ!" ඇය කෑ ගසා පැවසුවාය.

"මම කියන්නම් මොකද කියලා." ඉහළින් නැඟුණු හඬක් බෙරිහන් දුන්නේය. ඔක්ටේවියන් ඉනිමගේ කෙළවරට ළඟාවී සිටියේය. "ග්‍රීකයෝ අපිට පහර දුන්නා. උඹලාගේ ලියෝ කොලුවා උගේ ආයුධ අත්හදා බලන්නෙ රෝමයෙන්."

ඇනබෙත්ගේ ළය ද්‍රව හයිඩ්‍රජන් වලින් පිරී ගියේය. තමා කැබලි සිය දහස් ගණනකට කැඩී ගියා වැනි හැඟීමක් ඇයට ඇති විය.

"ඔයා බොරු කියනවා." ඇය පැවසුවාය. "ලියෝ කවදාවත්."

"මම එතන හිටියා!" ඔක්ටේවියන් පැවසුවේය. "මම ඒක මගෙ ඇස් දෙකෙන්ම දැක්කා."

ආගෝ II නැවත පහර දුන්නේය. භූමියේ තිබූ රෝම කැටපලයක් සුණු විසුණු වී යද්දී ලෙජියන් සෙබලු සී සීකඩ විසිවූහ.



"දැක්කනෙ?" ඔක්ටේවියන් බෙරිහන් දුන්නේය. "රෝමවරුනි, ආක්‍රමණිකයන් මරා දමනු!"

ඇනබෙත් කෝපයෙන් රතු වූවාය. කිසිවකුටත් සත්‍යය පහදා දීමට කාලයක් නැත. අර්ධ ලෝහිත කඳවුරේ එකකුට රෝමවරු සිය ගණනකි. යම් උපක්‍රමයකින් ඔක්ටේවියන්ව පාලනය කර ගැනීමට නොහැකි වුවහොත්, රෝමවරුන්ට ඒත්තු ගැන්වීමටත් පෙර ඔවුන්ව මරා දමනු ඇත.

"අපි පැනගන්න ඕනෙ." ඇය පර්සිට පැවසුවාය. "දැන්ම."

ඔහු හිස වැනුවේය. "හේසාල්, ෆ්‍රැන්ක්, ඔය දෙන්න විකල්පයක් තෝර ගන්න. ඔයාල එනවද?"

හේසාල් බියපත් වූ බවක් පෙනුණත්, ඇය තම සන්නද්ධ බලකා හිස් වැසුම ගැලවූවාය. "ඇත්තවශයෙන්ම අපි එනවා. ඒත් අපි ඔයාට යම් කාලයක් නොදුන්නොත් ඔයාට කවදාවත් නැවට යන්න බැරි වෙයි."

"කොහොමද?" ඇනබෙත් විමසුවාය.

හේසාල් විසිල් හඬක් නැගුවාය. සැනෙකින් ලා දුඹුරු පැහැති මහේශාක්‍ය පෙනුමැති අශ්වයෙක් ජල මල අසලට ඇදී ආවේය. අසු පිට යාමටම උපන් අයකු මෙන් හේසාල් අසු පිට නැඟුණාය. අශ්වයාගේ සැදලයේ ගැටගසා තිබුණේ සන්නද්ධ බලකා කඩුවකි. හේසාල් තම රන් අට්පත අතට ගත්තාය. "ඔයාල ආරක්ෂිතව ඉවත් වුණාම මට අයිරිස්- පණිවුඩයක් එවන්න. ඒ වගේම අපි රහසේ හමුවෙමු." ඇය පැවසුවාය. "ඒරියන්, යමු!" රෝමවරු දෙපසට විසිකර දමමින් ඇදහිය නොහැකි වේගයකින් අශ්වයා පිරිස අතරින් දිව ගියේය.

ඇනබෙත් තුළ බලාපොරොත්තුවක සේයාවක් දැල්විණි. සමහරවිට ඔවුන්ට මෙතනින් පණ පිටින් පැන ගන්නට ලැබෙනු ඇත. එවිට, විනිශ්චය ශාලාවට අඩක් පමණ දුරින් ජේසන් කෑ ගසන හඬ ඇසිණි. "රෝමවරුනි!" ඔහු කෑ ගැසුවේය. "කරුණාකරලා."

ඔහුටත්, පිපර්ටත් පිඟන් වලින් සහ ගල්වලින් පහර එල්ල වෙමින් තිබිණි. ඔහු පලිහක් සේ පිපර්ව ආවරණය කර ගැනීමට උත්සාහ කළේය. එහෙත් ගඩොල් පහරක් ඔහුගේ ඇසේ ඉහළට වැදිණි. ඔහු බිම ඇද වැටුණේය. පිරිස ඉදිරියට පැමිණියහ. "පස්සට වෙයල්ලා!" පිපර් කෑ ගැසුවාය. ඇගේ වශීකතාව කලහකාරී පිරිස පැකිලීමට පත් කිරීමට සමත් වුවත්, එහි බලපෑම එතරම් කාලයක් නොපවතින බව

ඇනබෙත් දන සිටියාය. පර්සිටත් ඇයටත් නියම වේලාවට ඔවුන්ගේ උදව් පිණිස ළඟා විය නොහැකිය.

''ෆ්‍රෑන්ක්.'' පර්සි පැවසුවේය. ''ඒක ඔයාට බාරයි. ඔයාට පුළුවන් ද එයාලට උදව් කරන්න?'' ඔහු තනිවම එය කෙසේ කරන්නේ දැයි ඇනබෙත්ට වටහා ගැනීමට නොහැකි වුවත්, ඔහු අපහසුවෙන් දෙවුර සැලුවේය.

''ආහෝ, දෙවියනි.'' ඔහු මිමිණුවේය. ''හරි, සත්තකින්ම. ලණු ඉනිමඟට යන්න. දැන්මම.''

පර්සි සහ ඇනබෙත් ලණු ඉනිමඟ වෙත දිව ගියහ. ඔක්ටේවියන් තවමත් එතැන රැඳී සිටියත්, පර්සි ඔහුව ඔසවා සෙනඟ අතරට විසි කළේය.

අවිගත් ලෙජියන් සෙබලු විනිශ්චය ශාලාවට ඇදී එද්දී ඔවුහු ඉහළ නැගීමට පටන් ගත්හ. ඊතල ඇනබෙත්ගේ හිස අසලින් ඇදී ගියේය. පිපිරුමෙන් ඇය ඉනිමඟෙන් වැටෙන්නට ගියේය. අඩක් ඉහළ නගින විට, ඇයට ඇසුණු ගෙරවීමක් නිසා ඇය පහළ බැලුවාය.

විනිශ්චය ශාලාවෙන් මකරකු ඇදී එන විට පිරිස හිස්ලූ අත පළා යමින් සිටියහ. මේ මෘගයා ආගෝ II හි සිතුවම් කර තිබූ මකර රුවටත් වඩා බියකරු විය. ඌට කොමඩෝ කටුස්සකු මෙන් අළු පැහැති සමක් තිබූ අතර, පියාපත් වවුලකුගේ මෙන් සමින් සැදී තිබිණි. ඌ වෙත එල්ල වූ ඊ ප්‍රහාර සහ ගල් ප්‍රහාර වලින් කිසිදු හානියක් නොවූ අතර, පිපර් සහ ජේසන් වෙත හඹා ආ මකරා තම ඉදිරි නිය වලින් ඔවුන් දෙදෙනාව ඩැහැගෙන අහසට නැගුණේය.

''ඒ අර...?'' ඇනබෙත්ට එය වචනයට නැගීමට පවා නොහැකි විය.

''ෆ්‍රෑන්ක්.'' ඇයට අඩි කීපයක් ඉහළින් සිටි පර්සි තහවුරු කළේය. ''එයාට විශේෂිත දක්‍ෂතා කීපයක් තියෙනවා.''

''ඌන ප්‍රකාශයක්.'' ඇනබෙත් මිමිණුවාය. ''දිගටම නගින්න!''

මකරා සහ, දුණුවායන්ගේ අවධානය වෙනතකට යොමු කළ හේසාල්ගේ අශ්වයා නොමැති වුවා නම්, ඔවුන්ට කිසිදාක ඉනිමඟ වෙත පිවිසීමට නොහැකි වනු ඇත. එහෙත් අවසානයේ ඔවුහු කැඩී ගිය ගගන හබල් පෙළ පසුකර නැව් තට්ටුව මතට පැමිණියහ. නැවේ බඩු බාහිරාදිය ගිනිගෙන තිබිණි. ප්‍රධාන රුවල ඉරී ගොසිනි. නැව භයානක ලෙස දකුණු පසට ඇලවී තිබුණේය. කෝච් හෙජ්ගේ සලකුණක්වත්



නොවුවත්, ලියෝ නැවේ මැද සිටගෙන සන්සුන් ලෙස බැලිස්ටාව නැවත පුරවමින් සිටියේය. ඇනබෙත් බියෙන් හැකිළී ගියාය.

''ලියෝ!'' ඇය කෑ ගැසුවාය. ''මොනවද ඔයා කරන්නෙ?''

''උන්ව විනාශ කරනවා...'' ඔහු ඇනබෙත් දෙසට හැරුණේය. ඔහුගේ දෑස් දිලිසෙමින් තිබිණි. ඔහුගේ චලනය රොබෝ කෙනෙකු මෙන් විය. ''උන් සේරම විනාශ කරනවා.''

ඔහු බැලිස්ටාව දෙසට හැරුණත් පර්සි ඔහුව බිම පෙරලා දැමුවේය. ඔහුගේ හිස තදින් නැව් තට්ටුව මත ගැටිණි. ඔහුගේ දෙනෙත් උඩ ගිය අතර ඒවායේ නැවත සුදු පැහැය දකගත හැකි විය. අළු මකරා පෙනී සිටියේය. ඌ නැව වටා වටයක් ගසා ඇණිය මත වසා පිපර් සහ ජේසන් නැවට අතහැරියේය. දෙදෙනාම සිහිසුන්ව සිටියහ.

''යන්න!'' පර්සි කෑ ගැසුවේය. ''අපිව මෙහෙන් අරන් යන්න!''

කම්පනයක් සමඟ ඔහු කතා කරන්නේ තමාට බව ඇනබෙත් වටහා ගත්තාය. ඇය සුක්කානම වෙත දිව ගියාය. වැරදීමකින් පහළ බලන විට ඇය දුටුවේ රෝම ලෙජියන්වරු ගිනි ඊතල එවීමට සූදානම් වන ආකාරයයි. පොමේරියන් රේඛාව දිගට ටර්මිනස්ගේ ප්‍රතිමා දම් පැහැයෙන් දිලිසෙමින් තිබුණේ යම් ආකාරයක ප්‍රහාරයකට අවශ්‍ය ශක්තිය ලබා ගැනීමට මෙනි.

ඇනබෙත් පාලන පුවරුව දෙස බැලුවාය. ලියෝ ඒවා මෙතරම් සංකීර්ණ ලෙස නිර්මාණය කිරීම ගැන ඇය සාප කළාය. එහෙත් ඇය මූලික නියෝගයක් දන සිටියාය. ඉහළට.

ඇය එසවීමේ ලීවරය ගෙන එය කෙළින්ම පහළට ඇද්දාය. නැව දෙදරුවේය. නැව් බඳ බියකරු ලෙස ඇල වී ගියේය. ඒ සමඟම ආගෝ II අහසට නැගිණි.

ඔහු සෝ බර මුහුණෙන් හිද ගත්තේය. ''මම දන්නෙ නෑ. ඒක අපැහැදිලියි.''

ඕනෑවටත් වඩා මිනිසුන් ඔහු දෙස බලා සිටියහ. ඇනබෙත් (ලියෝ ඇයව කේන්ති ගැන්වීමට ප්‍රිය නොකළේය. ඒ කෙල්ල ඔහුව බියපත් කළේය) කෝච් හෙජ් සහ ඔහුගේ රෝම පිරුණු එළු පාද, ඔහුගේ තැඹිලි පැහැති කමිසය සහ ඔහුගේ බේස් බෝල පිත්ත (එයා හැම තැනම ඒක අරගෙන යනවද?) සහ අලුතින් පැමිණි ෆ්‍රෑන්ක්.

ෆ්‍රෑන්ක්ගෙන් මොනවා කරන්න දැයි ලියෝ නොදත්තේය. ඔහු හරියට ළදරු සුමෝ මල්ලවපොර ශූරයකු මෙන් විය. එහෙත් එය හඬ නගා පැවසීමට තරම් ලියෝ මෝඩයකු නොවීය. ලියෝගේ මතකය අපැහැදිලි වුවත්, ඔහු අඩසිහියෙන් සිටින අතරතුර, මකරකු නැවට ගොඩබැසි බව ඔහුට විශ්වාසය. මකරා ෆ්‍රෑන්ක් බවට හැරී තිබේ.

ඇනබෙත් දෑත් බැඳ ගත්තාය. ''ඔයා කියන්නෙ, ඔයාට මතක නෑ කියලද?''

''මට...'' තමා කිරිගරුඬයක ගිලී යන්නා සේ ලියෝට දැනිණි. ''මට මතකයි, ඒත් ඒක හරියට මම- මම කරන දේවල් බලාගෙන හිටිය වගේ. මට ඒක පාලනය කරන්න බැරිවුණා.''

කෝච් හෙජ් තම පිත්තෙන් නැව් තට්ටුවට ඇන්නේය. ඔහුගේ ව්‍යායාම ඇඳුමත්, අං වසා දමා සිටි කැප් තොප්පියත් නිසා ඔහු හරියටම වයිල්ඩර්නස් පාසලේ P.E ගුරුවරයා ලෙස පෙනී ගියේය. ඔහු වසරක්ම හොර රහසේ ජේසන්, පිපර් සහ ලියෝගේ P.E ගුරුවරයා ලෙස කටයුතු කළේය. මහලු නරාශ්වයා පිපිරෙමින් සිටි ආකාරයට ලියෝ සිතුවේ තමාට පුෂ් අප් කිරීමට නියෝග කරනු ඇති බවයි.

''බලන්න, දරුවා.'' හෙජ් පැවසුවේය. ''ඔයා සමහර ඒවා පුපුරවල දැම්මා. රෝමන්වරුන්ට පහර දුන්නා. භයානකයි. විශිෂ්ටයි. ඒත් ඔයා චන්ද්‍රිකා නාලිකාවත් ඉවර කරල දැම්මද? මම තරගෙ නරඹමින් හිටියෙ. හරියට මැදහරියෙ.''

''කෝච්.'' ඇනබෙත් පැවසුවාය. ''ගින්දර සේරම නිවිලද කියලා ඇයි ඔයා ගිහින් බලන්නෙ නැත්තෙ?''

''ඒත් මම දැනටමත් ඒක කරල තියෙන්නෙ.''

''ආයෙත් කරන්න.''

# 05

# ලියෝ

තමාට කාල යන්ත්‍රය නිපැයීමට හැකි වූවා නම් යැයි ලියෝ සිතුවේය. එසේ වූවානම් ඔහුට පැය දෙකක් ආපස්සට ගොස් සිදු වූ දේ නිවැරදි කිරීමට තිබිණි. එසේත් නැතිනම් ඔහුට තමාගේ මුහුණ පොඩිකර දමන යන්ත්‍රයක් නිපදවීමට හැකියාව තිබුණා නම් තමාටම දඬුවම් කර ගැනීමට හැකි වනු ඇත. එහෙත් ඇනබෙත්ගේ බැල්මෙන් තරම් ඒ එකකින්වත් රිදීමක් ඇති වේදැයි ඔහුට ඇති වූයේ සැකයකි.

''තව එක වතාවක්.'' ඇනබෙත් පැවසුවාය. ''ඇත්තටම මොකද වුණේ?''

ලියෝ ඇණියේ වකුටු වී සිටියේය. නැව් තට්ටුවේ වැදීමෙන් ඔහුගේ හිස තවමත් රිදුම් දෙමින් තිබිණි. ඔහු අවට සියල්ලම, ඔහුගේ අලංකාර අලුත් නැව අබලන් වී තිබිණි. ප්‍රධාන රුවල ඉරී ගොසිනි. අන්තර්ජාලයට, රූපවාහිනියට බලය සපයන චන්ද්‍රිකා ඇන්ටනාව කුඩු වී ගොස් තිබිණි. එය සැබැවින්ම කෝච් හෙජ් පිස්සු වට්ටවන්නක් විය. ඔවුන්ගේ ලෝකඩ මකර ප්‍රධානියා, ෆෙස්ටස්, දුමාරය නිසා කහිමින් සිටියේය. කොටුව පැත්තෙන් නැගෙන ගෙරවිලි හඬින්, ගගන හබල්වලින් කොටසක පෙළ අවුල් වී හෝ සම්පූර්ණයෙන්ම බිඳී ගොස් ඇති බව ලියෝට වටහාගත හැකි විය. නැව ඇලවී, දෙදරමින් ගමන් කරන්නේ ඇයි ද යන්න එයින් පැහැදිලි විය. එන්ජිම කබල් වාෂ්ප දුම්රියක් මෙන් හති දමන්නට විය.

ඇසෙන නෑසෙන ගාණට කොඳුරමින් තරාශ්වයා එතැ ඉවත් විය. හෙජ් පවා ඇනබෙත්ට අකීකරු වීමට තරම් මෝඩ නොවීය. ඇය ලියෝ අසලින් දණ ගසා ගත්තාය. බෝල බෙයා ලෙස ඇගේ අළු පැහැති ඇස් දෘඩ වී තිබිණි. ඇගේ දුඹුරු කොණ් ලිහී උරහිස් මතින් වැටී තිබිණි. එහෙත් ලියෝට එහි ආකර්ෂණයක් ඇ බවක් නොපෙනුණි. ඔහුට මේ දුඹුරු කොණ්ඩය පැමිණියේ කොහිසිටද හරි අදහසක් නොතිබිණි. පසුගිය සිසිරයේ ග්‍රෑන්ඩ් කැනියමේදී ඔ ඇනබෙත් හමුවිය. මට පර්සි ජැක්සන් දීපන් නැත්නම් මැරියන් වැ ඉරියව්වක් මුහුණේ රඳවාගෙන ඇය ඔහු දෙසට පැමිණෙනු දුටු ලියෝ සිතුවේ දුඹුරු කොණ්ඩකාරියන් දක්ෂ තරමටම භයානකද වන බවයි.

"ලියෝ." ඇය සන්සුන් ලෙස පැවසුවාය. ඔක්ටේවියන් ඔයාට මොනවහරි ප්‍රයෝගයක් කළාද? එයා ඔයාව ගොලු කළාද, නැත්නම්."

"නෑ." ලියෝට බොරුවක් කියා මෝඩ රෝමන්වරුන් වෙත වරද පැටවීමේ හැකියාව තිබුණේය, එහෙත් "ඒ හාදයා විකාරයක් තමයි. ඒත් කඳවුරට පහර දුන්නෙ එයා නෙමෙයි. මමයි ඒක කළේ."

අලුත් දරුවා, ෆ්‍රෑන්ක්, රැව්වේය. "අරමුණක් ඇතුවද?"

"නෑ!" ලියෝ තම දෑස් වසා ගත්තේය. "හොඳයි, ඔව්_ මම අදහස් කළේ, මට එහෙම කරන්න ඕනෙ වුණේ නෑ. ඒත් ඒ මෙහොතෙදිම, මට ඒක ඕනෙ වගේ හැඟීමක් ඇතිවුණා. යම්දෙයක් ඒක කරන්න මාව මොහෙයෙව්වා වගේ. මේ සීතල හැඟීම මගේ ඇතුළෙන්-"

"සීතල හැඟීම." ඇනබෙත්ගේ කටහඬ වෙනස් විය. ඇගේ හඬෙහි වූයේ බියපත් බවකි.

"ඔව්." ලියෝ පැවසුවේය.

"ඇයි?" නැව් තට්ටුවේ පිටුපස සිට පර්සි හඬ ගැසුවේය. "ඇනබෙත්, අපිට ඔයාව අවශ්‍යයි."

අහෝ, දෙවියනේ, ලියෝ සිතුවේය. ජේසන්ව හොඳ කරන්න. ඔවුහු නැව් තට්ටුව මත පතිත වූ සැනින්ම, පිපර් ජේසන්ව පහළට ගෙන ගියාය. ඔහුගේ හිසේ කැපුම තරමක් අයහපත් බව පෙනිණි. අර්ධ ලෝහිත කඳවුරේ සිටි අන් කාටත් වඩා දීර්ඝ කාලයක සිට ලියෝ ජේසන්ව දැන සිටියේය. ඔවුහු හොඳම යහළුවෝ වූහ. ජේසන්ට සනීප නොවුණොත්...



"එයාට හොඳ වෙයි."ඇනබෙත් මෘදු ලෙස පැවසුවාය. "ෆ්‍රෑන්ක්, මම ආපහු එන්නම්. එතකම්... ලියෝ ගැන ටිකක් බලන්න. කරුණාකරලා." ෆ්‍රෑන්ක් හිස සැලුවේය.

ලියෝට නරක ආකාරයේ හැඟීමක් දැනුණේ නම්, ඔහු එය කරන්නට ඇති. ඇය දැන් ලියෝට වඩා රෝම උප දෙවිවරුන් විශ්වාස කළාය.

ඇය පිටව ගිය පසු ෆ්‍රෑන්ක් සහ ලියෝ එකිනෙකා දෙස බලාගෙන සිටියහ. මහත හාදයාගේ ඇඳ ඇතිරිලි ටෝගාවත්, අළු පැහැති ජීන්සයත්, උරහිසේ එල්ලාගෙන සිටි දුන්න සහ හී කොපුවත් නිසා ඔහු තරමක අමුතු පෙනුමකින් යුක්ත විය. ලියෝට ආටිමිස්ගේ දඩයක්කාරියන් - රිදී ඇඳුමින් සැරසී, දුනුවලින් සන්නද්ධ වූ ලස්සන කුඩා කෙල්ලන් පිරිස- මතකයට නැගුණේය. ෆ්‍රෑන්ක් ඔවුන් සමඟ උසුළු විසුළු කරන අන්දම ලියෝට මැවී පෙනුණේය. ඒ අදහස කෙතරම් විකාරයක් වුවත්, එයින් ඔහුට සම්පූර්ණ යහපත් හැඟීමක් ඇති විය.

"ඉතිං." ෆ්‍රෑන්ක් පැවසුවේය. "ඔයාගෙ නම සැමී නෙමෙයිද?"

ලියෝ මුහුණ හැකිලුවේය. "මොන විදිහෙ ප්‍රශ්නයක්ද ඒක?"

"මොකුත් නැහැ." ෆ්‍රෑන්ක් ක්ෂණිකව පැවසුවේය. "මම මේ-මොකුත් නෑ. කඳවුරේ ප්‍රහාරය ගැන හිතුවේ... ඉන්ද්‍රජාලිකව හෝ යම් විදිහකින් ඔක්ටේවියන් ඒක පිටිපස්සෙ ඉන්න පුළුවන්. රෝමවරු ඔයාලගෙ අය එක්ක යනවට එයා කැමති වුණේ නැහැ"

ලියෝට එය විශ්වාස කිරීමට වුවමනා විය. තමාට වෛර නොකරන මේ කොලුවා ගැන ඔහුට කැමැත්තක් ඇති විය. එහෙත් ඒ ඔක්ටේවියන් නොවන බව ඔහු දැන සිටියේය. බැලිස්ටාව වෙත ගොස් ප්‍රහාරය ඇරඹුවේ ලියෝමය. ඔහුගේ සිතේ අර්ධයක් එය වැරදි බව දැන සිටියේය. ඔහු තමාගෙන්ම විමසුවේය. මොන මගුලක්ද මම කළේ? කෙසේ වුවත් ඔහු එය කර තිබිණි.

සමහරවිට ඔහු උමතුවන්නට ඇත. ආගෝ II ඉදි කරමින් ඒ මාස ගණනාව පුරාම වැඩකිරීම හේතුවෙන් පැවති ආතතිය, අවසානයේ ඔහුව උමතු කරවන්නට ඇත.

එහෙත් ඔහුට ඒ ගැන සිතීමට නොහැකි විය. ඔහු යම් ඵලදායක දෙයක් කිරීමට අවශ්‍යව තිබිණි. ඔහුගේ දෑත් කාර්යබහුල විය යුතුව තිබිණි. "බලන්න." ඔහු පැවසුවේය. "මම ෆෙස්ටස්ට කතා කරල හානිය ගැන වාර්තාවක් ගන්න ඕනෙ."

ෆ්‍රෑන්ක් ඔහුට නැගිටීමට උදව් කළේය. ''කවුද ෆෙස්ටස්?''

''මගේ මිත්‍රය.''ලියෝ පැවසුවේය. ''කොහොමත් එයාගෙ නම සැම් නම් නෙමෙයි. එත්ත. මම ඔයාව අඳුන්වල දෙන්නම්.''

වාසනාවකට ලෝකඩ මකරාට හානියක් වී නොතිබිණි. පසුගිය සිසිර සෘතුවේදී උගේ හිස හැර අන් සියල්ල ඔහුට අහිමි විය. එහෙත් ලියෝ එය ගණන් ගත්තේ නැත.

ඔහු නැවේ ඇණිය වෙත ළඟාවන විට, නායකයා අංශක එකසිය අසූවකින් කරකැවී ඔවුන් දෙස බැලුවේය. ගැස්සුණු ෆ්‍රෑන්ක් පස්සට පැන්නේය.

''ඌට පණ තියෙනවා.''

ලියෝගේ තත්ත්වය එතරම් නරක වී නොතිබ්ණේ නම් ඔහු සිනා නගනු ඇත. ''ඔව්, ෆ්‍රෑන්ක්, මේ තමයි ෆෙස්ටස්. එය සම්පූර්ණ ලෝකඩ මකරෙක් වෙලා හිටියා. ඒත් අපිට අනතුරක් වුණා.''

''ඔයාට අනතුරු ගොඩක් වෙලා තියෙනවනෙ.'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

''හොඳයි, අපි සමහරුන්ට මකරුන් බවට පත් වෙන්න බැහැ, ඉතිං අපිටම එකක් නිර්මාණය කරගන්න වෙනවා.'' ලියෝ ෆ්‍රෑන්ක් දෙස බලා ඇහිබැම පහත් කළේය. ''කොහොම වුණත්, මම එයාට දෙස බලා ඇහිබැම පහත් කළේය. ''කොහොම වුණත්, මම එයාට නායකයෙක් විදිහට නැවත පණ දුන්නා. දැන් එය තමයි නැවේ ප්‍රධාන අතුරුමුහුණත. වැඩකටයුතු කොහොමද, ෆෙස්ටස්?''

දුම් කඳක් නිකුත් කළ ෆෙස්ටස්, පිහින් හඬවල් මාලාවක් නිකුත් කළේය. පසුගිය මාස කීපය පුරා, ලියෝ මේ යාන්ත්‍රික භාෂාවේ අර්ථය පහදා ගැනීමට ඉගෙන ගෙන තිබුණේය. අනෙක් උපදේවිවරුන්ට ලතින් සහ ග්‍රීක භාෂා තේරුම් ගත හැකිය. ෆෙස්ටස්ට කතා කිරීමට හැකි වූයේ කිරි කිරි හා විසිල් හඬ පමණකි.

''ඌග්.'' ලියෝ පැවසුවේය. ''ඊටත් අන්ත වෙන්න පුළුවන්, ඒත් නැව් බඳ තැන් කීපයකින්බිඳිලා. අපි ආපහු සම්පූර්ණ වේගයෙන් යන්නට කළින් ගගන හබල් හදාගන්න වෙනවා. දිව්‍යමය ලෝකඩ, තාර, ලයිම්වගේ අලුත්වැඩියා ද්‍රව්‍ය කීපයක් අපට ඕනෙ වෙනවා.

''දෙහි ඕනෙ කරන්නෙ මොනවටද?''

''පිස්සෝ, ඒ හුණු. කැල්සියම් කාබනේට්, සිමෙන්ති සහ ඒ වගේ තවත් ගොඩක් දේවල් හදන්න යොදා ගන්නවා- ආහ්, ඒ ගැන හිතන්න



එපා. ප්‍රධානම දේ තමයි, අලුත්වැඩියා කරන්නෙ නැත්නම් නැවට වැඩි දුරක් යන්න බැහැ කියන එක.'' ෆෙස්ටස් ලියෝට හඳුනාගත නොහැකි තවත් හඬවල් කීපයක් නැගුවේය. එහි හඬ අයි- පුල් වැන්නක් විය.

''ඔහ්... හේසාල්.'' ඔහු එය වටහාගත්තේය. ''අර බොකුටු කොණ්ඩයක් තියෙන කෙල්ල නේද?''

ෆ්‍රෑන්ක් ගල්ගැස්සුණේය. ''එයා හොඳින්ද?''

''ඔව්, එයා හොඳින්.'' ලියෝ පැවසුවේය. ''ෆෙස්ටස් කියන විදිහට, එයාගේ අශ්වයා පහළින් දුවගෙන එනවා. එයා අපි පස්සෙන් එනවා.''

''එහෙනම්, අපි බිමට පහත් කරන්න ඕනෙ.'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

ලියෝ ඔහුව අධ්‍යයනය කළේය. ''එයා ඔයාගෙ පෙම්වතියද?''

ෆ්‍රෑනක් තොල් සපා ගත්තේය. ''ඔව්.''

''ඔයා කියපු දේ ගැන විශ්වාසයක් නැහැ වගේ.''

''ඔව්, ඔව්. නිසැකවම. මට විශ්වාසයි.''

ලියෝ තම දැත් එසවූයේය. ''හරි අපූරුයි. ප්‍රශ්නෙ වෙලා තියෙන්නෙ අපිට ගොඩබාන්න හැකියාව තියෙන්නෙ එක පාරයි. නැව් බඳයි, හබලුයි තියෙන තත්ත්වෙ අනුව, ඒවා අලුත්වැඩියා කරනකම් අපිට ආයෙත් ගුවන්ගත වීමේ හැකියාවක් නැති වෙයි. ඒ නිසා නිවැරදි සැපයුම් සේරම ලබාගන්න පුළුවන් තැනක ගොඩ බාන්න වග බලා ගමු.''

ෆ්‍රෑන්ක් තම හිස කැසුවේය. ''ඔයා කොහෙන්ද දිව්‍යමය ලෝකඩ හොයා ගන්නෙ? ඔයාට ඒව නිකම් ගෙදර ගබඩාවේ ගබඩා කරලා තියෙන්න බැනේ..''

''ෆෙස්ටස්, පරීක්ෂා කරන්න.''

''එයාට ඉන්ද්‍රජාලික ලෝකඩ පරීක්ෂා කරන්න පුළුවන්ද?''

ෆ්‍රෑන්ක් පුදුම විය. ''එයාට බැරි මොනවහරි දෙයක් තියෙනවද?''

ලියෝ කල්පනා කළේය. ඔයා එයාව දකින්න තිබුණෙ එයාට සිරුරක් තියෙද්දියි. එහෙත් ඔහු එසේ කීවේ නැත. ෆෙස්ටස් බවට පත්වීමේ මතකය බෙහෙවින් වේදනාකාරී වූවකි.

ලියෝ නැවේ ඇණියෙන් එබී බැලුවේය. පහතින් මධ්‍යම කැලිෆෝනියානු නිම්නය පසුවෙමින් තිබිණි. තමන්ට අවශ්‍ය සියල්ල එකම තැනකින් ලබාගත හැකිවේ යැයි ලියෝ එතරම් විශාල බලාපොරොත්තු රඳවාගෙන නොසිටියේය. එහෙත් ඔවුන් උත්සාහ කළ යුතුය. එසේම ලියෝට හැකි ඉක්මනට තමාත්, නව රෝමයත් අතර වූ පරතරය වැඩි කර ගැනීමට අවශ්‍ය විය. ඉන්ද්‍රජාලික එන්ජිමට පින්සිදු වන්නට ආගෝ II ට විශාල දුරක් ඉතා ඉක්මනින් ගමන් කිරීමේ හැකියාව තිබිණි. එහෙත් රෝමවරුන්ටත් ඔවුන්ගේම ඉන්ද්‍රජාලික ප්‍රතිචාර ක්‍රම තිබෙන බව ලියෝ දන සිටියේය. ඔහුට පිටුපසින්, පියගැටපෙළ දෙසින් හඬක් නැගිණි. පර්සි සහ ඇනබෙත් ඉහළට නැගුණහ. ඔවුන්ගේ මුහුණුවල කේන්තිය සටහන්ව තිබිණි. ලියෝගේ හදවත ගැහෙන්නට විය.

"ජේසන්?"

"එයා විවේක ගන්නවා." ඇනබෙත් පැවසුවාය. "පිපර් එයා දිහා ඇහැ ගහගෙන ඉන්නෙ. ඒත් එයාට හොඳ වෙයි."

පර්සි ඔහු දෙසට දැඩි බැල්මක් හෙලුවේය. "ඇනබෙත් කිව්වා ඔයා බැලිස්ටාව ක්‍රියාත්මක කළා කියලා."

මනුස්සයෝ, ම- මට තේරෙන්නෙ නෑ ඒක කොහොම සිද්ධ වුණාද කියලා. මට සමාවෙන්න."

"සමාවෙන්න?" පර්සි ගිගිරුවේය.

ඇනබෙත් තම පෙම්වතාගේ ළය මත අත තැබුවේය. "අපි ඒක පස්සෙ හොයාගමු. දැන් අපි නැවත එකතුවෙලා සැලසුමක් හදන්න ඕනෙ. නැවේ තත්ත්වය මොකද?"

ලියෝගේ දෙපා ගැහෙන්නට විය. පර්සි ඔහු දෙස බලද්දී ඔහුට දැණුනු හැඟීමත්, ජේසන් අකුණු කැඳවන විට දැනෙන හැඟීමත් එක සමාන විය.

සිදුවුණු හානිය සහ ඔවුන්ට අවශ්‍ය සැපයුම් ගැන ඔහු ඇනබෙත්ව දැනුවත් කළේය. යම් නම්‍යශීලී දෙයක් ගැන කථා කිරීමට ලැබීමත් සැබැවින්ම ඔහුට අස්වැසිල්ලක් විය. ෆෙස්ටස් සිහින් හඬ නැගීමට පටන් ගන්නා විට දිව්‍යමය ලෝකඩ හිඟ වීම ගැන ඔහු වැලපෙමින් සිටියේය.

"නියමයි." ලියෝ අස්වැසිල්ලට පත් විය.



"මොකක්ද නියම?" ඇනබෙත් පැවසුවාය. "මට දැන් අපූරු දේවල් ගැන යම් දේවල් කතා කරන්න පුළුවන්."

ලියෝ සිනාවක් නඟා ගැනීමට උත්සාහ කළේය. "අපට අවශ්‍ය හැම දෙයක්ම එක තැනක තියෙනවා. ෆ්‍රෑන්ක්, ඇයි ඔයා කුරුල්ලෙක් හෝ මොකෙක් හරි වෙන්නෙ නැත්තේ? පහළට ගිහින්, ඔයාගෙ පෙම්වතියට කියන්න ඌටාවල මහා ලවණ විල ළඟදි අපිව හමුවෙන්න කියලා."

ඔවුන් එතැනට ගියත්, එය හොඳ ගොඩ බැසීමක් නොවීය. හබල් අබලන් වී තිබූ අතර ප්‍රධාන රුවල ඉරී ගොස් තිබිණි. එබැවින් ලියෝට ගොඩ බෑම පාලනය කර ගැනීමට පහසු වූයේ නැත. කෝච් හෙජ් හැර අන් සියල්ලෝම පහළට වී පටි තද කර ගෙන සිටියහ. කෝච් අත්වැටට ඇලී බෙරිහන් දෙමින් සිටියේය. "ඔව්, හරි! පහළට! විලට!" ලියෝ නැවේ අවරේ සිටගෙන, සුක්කානම හසුරුවමින් තමාට හැකි උපරිමයෙන් ඉලක්කය ගත්තේය.

ෆෙස්ටස් නිරතුරුව අනතුරු ඇඟවීමේ සංඥා එවූ අතර අභ්‍යන්තර ඇමතුම මඟින් ලියෝ ඒවා ලබා ගත්තේය. "මම දන්නවා, මම දන්නවා." ඔහු දත් ඇදි තද කරගෙන පැවසුවේය.

ඔහුට අවට දර්ශනය නැරඹීමට එතරම් කාලයක් ලැබී නොතිබිණි. ගිනිකොණ දිශාවට වන්නට, කඳුකරයේ පාමුල නගරයක් පිහිටා තිබිණි. සන්ධ්‍යා හිරු රැසින් එය නිල් සහ දම් පැහැයෙන් වර්ණ ගැන්වී තිබිණි. දකුණු දෙසට වන්නට සමතලා කාන්තාර භූ දර්ශනය පැතිරී ගොස් තිබුණේය. කෙළින්ම ඔවුන්ට පහළින් වූ මහා ලවණ විල තිබුණේ ඇලුමිනියම් තහඩුවක් සේ දිලිසෙමිනි. සුදු පැහැති ලවණ ගොහොරුවක් ලෙසින් වෙරළ තීරය සටහන් විය. එයින් ලියෝට අඟහරුගේ ගුවන් ඡායාරූප සිහිපත් කරවීය.

"අල්ලගන්න, කෝච්!" ඔහු කෑ ගැසුවේය. "මේ වැඩෙන් තුවාල වෙන්නයි යන්නෙ."

"මම ඉපදුනේම තුවාල වෙන්න."

ඉතිරී ගිය ලවණ ජලය ඇණිය පුරා විසිරි ගියේ කෝච් හෙජ්ව නහවා දමමිනි. ආගෝ II භයානක ලෙස දකුණු පැත්තට ඇල විය. ඉන්පසුව නැවත නියම ආකාරයට සැකසී විල් ජලය මත නැවතිණි. බමණ තල තවමත් ක්‍රියාත්මක වීම නිසා ඒවායින් යාන්ත්‍රික හඬක් නැගී ආවේය. රොබෝමය හබල් ජේළි තුනක් ජලයට නික්මී චලනය වන්නට පටන් ගැනීමක් සමඟ ඔවුන් ඉදිරියට ඇදිණි.

"නියමයි, ෆෙස්ටස්." ලියෝ පැවසුවේය. "අපිව දකුණු ඉවුර දිහාට අරන් යන්න."

"යෝ" කෝච් හෙජ් වාතයට දැත් දිගු කරමින් කෑ ගැසුවේය. ඔහුගේ අංවල සිට කුර දක්වාම දියෙන් පෙඟී තිබිණි. එහෙත් පිස්සු වැටුණු එළුවකු මෙන් ඔහු දඟලන්නට විය. "ඒක ආයෙ කරන්න."

"ආහ්, සමහරවිට පස්සෙ." ලියෝ පැවසුවේය. "නැව් තට්ටුව උඩට වෙලාම ඉන්න. හරිද? ඔයාට පුළුවන් ඇහැ ගහගෙන ඉන්න. දන්නවනෙ විල තීරණය කරන්න පුළුවන් අපිට පහර දෙන්න හෝ ඒ වගේ දේකට."

"හරි." හෙජ් පොරොන්දු විය.

ලියෝ සියල්ල පැහැදිලි බව අඟවන සීනුව නාද කර පියගැට පෙළ දෙසට ගියේය. ඔහු ඒ වෙත යාමට පෙර, නැව් බඳෙන් ක්ලම්ප්, ක්ලම්ප් ක්ලම්ප් හඬක් නැගිණි. හේසාල්ව පිට තබාගත් දුඹුරු අශ්වයා නැව් තට්ටුව මත පෙනී සිටියේය.

"කොහොමද?" ලියෝගේ ප්‍රශ්නය ඔහුගේ උගුරේම සිරවිය. "අපි ඉන්නෙ විල මැද්දෙ! මෙයාට පියාඹන්න පුළුවන්ද?" අශ්වයා කේන්තියෙන් හිස සැලුවේය.

"ඒරියන්ට පියාඹන්න බැහැ." හේසාල් පැවසුවාය. "ඒත් එයාට ඕනෙම දෙයක් හරහා යන්න පුළුවන්. ජලය, සිරස් මතුපිට, කුඩා කඳු-ඔය එකක්වත් එයාට බාධාවක් නෙමෙයි."

"ඕහ්."

විනිශ්වල ශාලාවේ භෝජන සංග්‍රහය අතර තුර බැලූ ආකාරයටම හේසාල් අමුතු ලෙස ලියෝ දෙස බැලුවාය. හරියට ඇය ඔහුගේ මුහුණේ යමක් සොයන්නාක් මෙනි. ඔවුන් මීට පෙර මුණ ගැසී තිබුණේ දැයි ඇසීමට ඔහුට පෙළඹවීමක් ඇති වුවත්, ඔවුන් මුණ ගැසී නැති බව ඔහුට විශ්වාසය. ඔහුට එවැනි සමීප ආකර්ෂණයක් දක්වන රූමත් කෙල්ලක් ඔහුට මතකය. එයින් වැඩිදෙයක් සිදුනොවනු ඇත. ඇය ෆ්‍රැන්ක්ගේ පෙම්වතිය බව ඔහුට සිහිපත් විය.

ෆ්‍රැන්ක් තවමත් සිටියේ පහළය. එහෙත් ලොකු හාදයා පියගැට පෙළින් උඩට පැමිණෙන්නේ නම් හොඳ යැයි ඔහුට සිතිණි. හේසාල් ලියෝව අධ්‍යයනය කරන ආකාරය ඔහු තුළ අපහසුවක් සහ ස්වයං වෛඥානික බවක් ඇති කිරීමට සමත් විය. ඉන්ද්‍රජාලික අශ්වයා දෙස සැකමුසුව බලමින් කෝච් හෙජ් තම බේස්බෝල් පිත්තද අතැතිව



ඉදිරියට පැමිණියේය. "වැල්ඩේස්, මේක ආක්‍රමණයක් විදිහට ගණන් ගන්න පුළුවන්ද?"

"නෑ!" ලියෝ පැවසුවේය. "ම... හේසාල්, වැඩිය හොඳයි ඔයා මාත් එක්ක එනව නම්. මම පහළ තට්ටුවේ ඉස්තාලයක් හදල තියෙනවා. ඒරියන්ට ඕනෙ නම්-"

"එයා බෙහොම නිදහස් ආත්මයක්." හේසාල් සැදලයෙන් බසිමින් පැවසුවාය. "මම කතා කරනකම් විල අවට ඇවිදිමින් ඉඳියි. ඒත් මට නැව බලන්න ඕනෙ. පාර පෙන්නන්න."

ආගෝ II සැලසුම් කර තිබුණේ පැරණි යුද නෞකාවක් මෙනි. එහෙත් එවැන්නකට වඩා දෙගුණයක් විශාල විය. පළමු තට්ටුවේ එක් මධ්‍ය කොරිඩෝවක් තිබූ අතර එහි දෙපස නැවේ ගමන් කළ පිරිසට අයත් කැබින් පිහිටා තිබිණි. සාමාන්‍ය යුද නැවක ඉඩෙන් වැඩි ප්‍රමාණයක් අත්කරගෙන තිබුණේ බංකු පේළි තුනක් සඳහාය. ඒවායේ දහඩියෙන් නැහැවුණු කම්කරුවන් සිය ගණනක් වැඩ කරමින් සිටි නමුත් ලියෝගේ හබල් ස්වයංක්‍රීය සහ නැවත ඇතුළට ඇදගත හැකි ඒවා විය. එබැවින් නැව් බඳ තුළ වූයේ ඉතා කුඩා කාමරයකි. නැවට බලය සැපයුණේ එන්ජින් කාමරයෙනි. එය දෙවැනි පහළ තට්ටුවේ පිහිටා තිබිණි. ආරෝග්‍ය ශාලාව, ගබඩාව සහ ඉස්තාල පිහිටා තිබුණේත් එම තට්ටුවේමය.

ලියෝ හේසාල්ව පහළ තිබූ ශාලාවට කැඳවාගෙන ගියේය. ඔහු නැව ඉදි කළේ කාමර අටක් සහිතවය- හතක් අනාවැකියේ උප දෙවිවරුන් සඳහාය. අනෙක කෝච් හෙජ් සඳහාය. (වගකීම් සහගත වැඩිහිටි භාරකරුවකු ලෙස චිරොන් බැරෑරුම්ව ඔහු ගැන සිතුවාද?) නැව් බඳේ විශාල භෝජන ශාලාව පිහිටා තිබුණි.

අතර මඟදී ඔවුහු ජේසන්ගේ කාමරය පසු කළහ. දොර විවෘත වී තිබිණි. පිපර් ඔහුගේ යහනේ පසෙක හිඳගෙන, ජේසන්ගේ අත අල්ලාගෙන සිටියාය. ඔහුගේ හිස මත අයිස් බෑගයක් වූ අතර ඔහු ගොරවමින් සිටියේය. පිපර් ලියෝ දෙසට හිස හැරවූවාය. ඇය තම දෙතොලට ඇඟිල්ල තබා නිහඬ වන ලෙස සංඥා කළත් එහි කෝපයක් දක්නට නොතිබිණි. ලියෝ තම වරදකාරී හැඟීම යටපත් කර ගැනීමට උත්සාහ කළේය. ඔවුහු දිගටම ඇවිද ගියහ. ඔවුහු භෝජන ශාලාවට ළඟා වූ විට ඔවුන්ට අනෙක් පිරිස- පර්සි, ඇනබෙත් සහ ෆ්‍රැන්ක්- කෑම මේසය වටා හිඳගෙන සිටිනු දැක ගත හැකි විය.

ලියෝ විවේකාගාරය හැකි උපරිම ආකාරයෙන් අපූරු… තනා තිබුණේ ඔවුන්ට වැඩි කාලයක් එතන ගත කිරීමට සිදු වන බ… දන සිටි නිසාය. කබඩ්වල අර්ධ ලෝහිත කඳවුරෙන් ගෙනා මැ… කුසලාන සහ පිඟන් පෙලට තබා තිබිණි. නියෝගයක් දුන් විට යමෙකු… අවශ්‍ය ඕනෑම දෙයකින් ඒවා පිරී යයි. එසේම එහි වීත්වල අයිරූ, බී… සහිත අයිස් පෙට්ටියක්ද විය. ආසන විල්ලුද වලින් නිමකර තිබිණි. සෑම උපදේවියෙකුටම අවශ්‍ය වන හෙඩ්ෆෝනයක්, කඩුවක් සහ බූ… රඳවනයක් ආසන වලට සවි කර තිබිණි. එහි ජනෙල් නොතිබුණේ, ඒවායේ බිත්තිවලින් අර්ධ ලෝහිත කඳවුරේ- වෙරළ, වනාන්තරය, ස්ට්‍රෝබෙරි වතු ආදියේ තත්කාලීන දර්ශන දැක ගත හැකි විය. එහෙත් මේ දර්ශනවලින් සතුටක් ලැබෙනවාට වඩා ගෙදර යාමට ආශාව වැඩි වන බව ලියෝට සිතිණි. පර්සි අර්ධ ලෝහිත කඳවුරේ හිරු බැස යාම… දෙස බලාගෙන සිටියේය.

"එහෙනම් අපි ගොඩ බැස්සා." පර්සි පැවසුවේය. "දැන් මොකද කරන්නේ?" ෆ්‍රැන්ක් ඔහුගේ දුණු දිය ඇද්දේය. "අනාවැකිය විසඳනවාද මම කිව්වේ... අර එලා කියපු අනාවැකිය හරිද? සිබිලයින් පොතෙන් ගත්ත එකක් නේද?"

"මොකෙන්." ලියෝ විමසුවේය.

ඔවුන්ගේ හාපි මිතුරන්ට පොත් මතක තබා ගැනීමේ අත්භූත හැකියාවක් තිබෙන්නේ කෙසේ දැයි ෆ්‍රැන්ක් පැහැදිලි කළේය. අතීතයේ සමහර තැන වලදී, ඇය රෝමයේ ඇදවැටීම ගැන අනාවැකි සමූහයක් දරාගෙන සිටියාය.

"එහෙනම් ඒකයි ඔයා රෝමවරුන්ට කිව්වේ නැත්තේ." ලියෝ අනුමාන කළේය. පර්සි දිගටම අර්ධ ලෝහිත කඳු ගැටය දෙස බලාගෙන සිටියේය. "එලා සංවේදීයි. අපිට එයාව හමුවෙන කොටත් එයා අල්ලගෙන හිටිය කෙනෙක්. මට ඕනකමක් තිබුණෙ නෑ..." ඔහු අත මිට මෙලෙව්වේය. "දැන් ඒක ප්‍රශ්නයක් නෙමෙයි. මම ටයිසන්ට අයිරිස්- පණිවුඩයක් යවල කිව්වා එලාව අර්ධ ලෝහිත කඳවුරට අරන් යන්න කියලා. එහෙදි එයාල ආරක්ෂිතයි."

ඔවුන් අතරින් කිසිවකුත් ආරක්ෂිත දැයි ලියෝ තුළ වූයේ සැකයකි. කෝපයෙන් පසුවන රෝමවරුන්ගේ කඳවුරට ඔහු කළ පහර

1 ග්‍රීසියේ කාව්‍යයෙන් ලියැවුණු අනාවැකි එකතුවකි. රෝමයේ රජු වූ ටාකුයිනියස් සුපර්බස් අනාවැකි කියවන්නියක වූ සිබිල් වෙතින් ඊගෙන වින් එකල සිදුවූ අනතුරු සඳහා උපදෙස් ලබාගත්තේය.



දිම දැනටමත් ගයියා සහ යෝධයන් සමඟ තිබෙන ප්‍රශ්නයට උඩින් තිබෙන්නෙකි. එහෙත් ඔහු නිහඬව සිටියේය.

ඇනබෙත් ඇගේ ඇඟිලි නැටවූවාය. "මට අනාවැකිය ගැන හිතන්න ඉඩ දෙන්න- ඒත් දැන් අපිට ඊට වඩා ඉක්මනින් විසඳගන්න ඕනෙ ප්‍රශ්න තියෙනවා. අපිට නැව හදාගන්න වෙනවා. ලියෝ, අපිට මොනවද ඕනෙ කරන්නෙ?"

"ලේසිම දේ තමයි තාර." මාතෘකාව වෙනස් වීම ගැන ලියෝ සතුටට පත් විය. "අපිට ඒව නිවාස සැපයුම් කඩයකින් හරි ඒවගේ මොකකින් හරි ගන්න පුළුවන්. ඒ වගේම දිව්‍යමය ලෝකඩ සහ හුණු-ෆෙස්ටස්ට අනුව, අපිට මේ දෙකම විලේ මෙතන ඉඳල බටහිර පැත්තෙ තියෙන දූපතෙන් හොයා ගන්න පුළුවන්."

"අපිට ඉක්මන් කරන්න වෙනවා." හේසල් අනතුරු ඇඟවූවාය. "මම ඔක්ටේවියන් ගැන දන්නවා. එයා එයාගෙ නිමිති කියන්නො එක්ක අපිව හොයනවා. රෝමවරු ප්‍රහාරක සේනාංකයක් අපි පස්සෙ එවයි. ඒක ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක්." සැමගේම දෑස් තමාට යොමු වී ඇති බවක් ලියෝට හැඟුණේය. "හාදයිනේ, මම දන්නෙ නෑ මොකක්ද වුණේ කියලා. පත්තකින්ම, මම-"

ඇනබෙත් තම අත එසවූවාය. "අපි ඒක කතා කරමින් හිටියෙ. අපිත් එකඟයි ඒක ඔයාගෙන් වුණ දෙයක් නොවන බවට, ලියෝ. අර ඔයා කියපු සීතල හැඟීම... මටත් දැනිල තියෙනවා. ඒක යම් ආකාරයක මායාවක්. එක්කෝ ඔක්ටේවියන් නැත්නම් ගයියා හෝ ඇගේ වල්ලභයෙක්ගෙ. ඒත් මොකක්ද වුණේ කියල අපි තේරුම් ගන්නකම්...."

ෆ්‍රැන්ක් ගෙරවූයේය. "ඒක ආයෙත් සිදුවෙන එකක් නෑ කියල අපි කොහොමද සහතික වෙන්නෙ?"

ගින්නට අසු වූ කලෙක මෙන් ලියෝගේ ඇඟිලි උණුසුම් විය. හෙපියාස්ටස්ගේ[1] පුත්‍රයා ලෙස ඔහු තුළ වූ බලයන්ගෙන් එකක් වූයේ ඔහු කැමති අවස්ථාවක ගින්දර කැඳවීමට තිබූ හැකියාවයි. එහෙත් හදිසියෙන් එය නොකිරීමට ඔහු ප්‍රවේසම් විය. විශේෂයෙන්ම නැවේ පුපුරණ සුළු හා ගිනිගන්නා සුළු සැපයුම් ගබඩා කර තිබීම එයට හේතුවයි.

1 ගින්නට, අත්කම්වලට සහ කම්මල්කරුවන්ට අධිපති ග්‍රීක දෙවියා ය. සියුස්ගේ සහ හේරාගේ පුත්‍රයෙකි. ඇප්‍රොඩයිට් හා විවාහ විය. රෝම ස්වරූපය වුල්කන් ය.

"මට දන් හොඳයි." ඔහු පැවසුවත්, ඔහුට ඒ ගැන විශ්වාසයක් නොතිබිණි. "සමහරවිට අපිට සහයෝගිතා ක්‍රමයක් පාවිච්චි කරන්න පුළුවන්. කවුරුවත්, කොහේවත් තනියම යන්නෙ නෑ. අපිට [illegible] හෙජ්වයි, පිපර්වයි, ජේසන් එක්ක නැවේ දාල යන්න පුළුවන්. තාර ගේන්න සහ හුණු හොයන්න යන්න පුළුවන්."

"බෙදිල යන්න?" පර්සි පැවසුවේය. "ඒක නම් අන්තිම තර[illegible] අදහසක්."

"ඒක ඉක්මන්." හේසාල් පැවසුවාය. "අනෙක් අතට, සාමාන්‍යයෙන් ගවේෂණයක් උප දෙවිවරු තුන්දෙනෙකුට සීමා කරල තියෙන්නෙ හේතුවක් ඇතිව නේද?"

හේසාල්ගේ කුසලතාව අගය කිරීමට මෙන් ඇනබෙත් දෙබැම එසවූවාය. "ඔයා හරි... අපිට ආගෝ II අවශ්‍ය වුණ එකම හේතුව.. පිටත කඳවුර, උප දෙවිවරු හත් දෙනෙක් එක තැනක ඉන්න එක රාක්ෂයන්ව ඕනෑවට වඩා ආකර්ෂණය කිරීමක් වෙන්න පුළුවන්. නැව සැලසුම් කරල තියෙන්නෙ අපිව සඟවලා ආරක්ෂා කරන්න. නැවේදී අපි ආරක්ෂිතයි. ඒත් අපි ගවේෂණවලට යනවනම්, අපි තුන් දෙනෙකුට වඩා වැඩි කණ්ඩායමක් විදිහට නොයා යුතුයි. අපි ගයියාගේ ස්වාමියන්ගෙ අවධානය යොමු කරවගන්න ඕනෙ නැහැ."

තවමත් පර්සිගේ සිත තුළ ඒ ගැන කැමැත්තක් ඇති බවක් නොපෙනුණි. එහෙත් ඔහු ඇනබෙත්ගේ අත අල්ලා ගත්තේය. "ඔයා මගෙ සහයිකාව වන තාක්, මට හොඳයි."

හේසාල් සිනාසුණාය. "ආ... ඒක ලේසියි. ෆ්‍රෑන්ක් ඔයා පුදුමාකාරයි. මකරෙක් බවට පත්වුණා. ඔයාට පුළුවන්ද ආයෙත් එහෙම වෙලා තාර ගේන්න ඇනබෙත්වයි පර්සිවයි නගරයට අරන් යන්න?"

"මට පුළුවන්. ඒත් ඔයා?"

"මම ඒරියන් පිටේ සැ- ලියෝ එක්ක එන්නම්." ඇය කඩු මිටට තට්ටු කළාය. එය ලියෝ තුළ අපහසුවක් ඇති කිරීමට සමත් විය. "අපි ලෝකඩ සහ හුණු අරන් එන්නම්. අඳුර වැටෙන කොට අපි හැමෝම මෙතෙන්ට එකතු වෙමු."

ෆ්‍රෑන්ක් රැව්වේය. නිසැකවම, ලියෝ හේසාල් සමඟ යන අදහසට ඔහු අකැමැති විය. යම් හේතුවක් නිසා, ෆ්‍රෑන්ක්ගේ අකැමැත්ත ලියෝට යාමට පෙළඹවීමක් ඇති කළේය. ඔහු තම විශ්වසනීය බව



තහවුරු කර තිබුණේය. නැවත ඔහු බැලස්ටායි ක්‍රියාත්මක කිරීමට නොයතු ඇත.

"ලියෝ." ඇනබෙත් පැවසුවාය. "අපි සැපයුම් ගෙනාවොත්, නැව හදන්න කොච්චර වෙලා යයිද?"

"වාසනාව තිබුණොත්, පැය කීපයක් විතරයි."

"අපූරුයි." ඇය පැවසුවාය. "අපි හැකි ඉක්මනින් මෙහෙදී ඔයාලව හමු වෙන්නම්, ඒත් පරෙස්සමින් ඉන්න. අපිට යම් වාසනාවක් පාවිච්චි කරන්නත් පුළුවන්. ඒකෙන් කියවෙන්නෙ නෑ අපි ඒක ගන්නවයි කියලා."

## 06
# ලියෝ

දවස තුළ ලියෝ කළ හොඳම දේ වූයේ ඒරියන් ගේ පිටමත යාමයි. අශ්වයාගේ කුරවලින් විලේ මතුපිට ලවණමය මීදුමක් සැදිණි. ලියෝ අශ්වයාගේ එක පැත්තකට අත තබාගෙන සිටි අතර උගේ මාංශ පේශිවල ක්‍රියාකාරිත්වය ඔහුට දැනුණේ හොඳින් තෙල් දැමූ යන්ත්‍රයක් මෙනි. මෝටර් රථ එන්ජින් අශ්ව බලවලින් මනින්නේ ඇයි දැයි පළමු වතාවට ඔහු තේරුම් ගත්තේය. ඒරියන් යනු කකුල් හතරේ මෙසරාටියකි.

ඔවුන්ගේ ඉදිරියෙන් දූපත දර්ශනය විය. වැ[illegible]රය අධික සුදු පැහැයෙන් යුක්ත වූ අතර, ඒවා ශුද්ධ මේස ලුණු විය හැකිය. ඒවාට පිටුපසින් වූයේ තෘණවලින් වැසී ගිය වැලි කඳු සහ ඛාදනයට ලක් වූ ගල්පරය.

ලියෝ එක් අතක් හේසාල්ගේ බඳ වටා දමාගෙන ඇය පිටුපසින් හිඳගෙන සිටියේය. මේ සමීප සම්බන්ධතාවය ඔහුව තරමක් අපහසුතාවයට පත් කිරීමට හේතු විය. එහෙත් අසු පිටින් නොවැටී සිටීමට ඔහුට තිබූ එකම ක්‍රමයද එය පමණක් විය.

ඔවුන් පිටත්වීමට පෙර, පර්සි ඔහුව පසෙකට ඇදගෙන ගොස් ඔහුට හේසාල්ගේ කතාව පැවසුවේය. පර්සි එය පැවසුවේ ලියෝව විශේෂ කොට සලකා බව ඔහුගේ කතාවෙන් ඇඟවුණත්, තම මිතුරිය අවුල් කළොත් මම උඹව සුදු මෝරුන්ට කන්න දානවා වැනි යටි අරුතක්ද එහි ගැබ්ව තිබිණි.



පර්සිට අනුව, හේසාල් යනු ප්ලූටෝගේ[1] දියණියයි. 1940 ගණන්වලදී ඇය මියගිය අතර, ඇයට නැවත ප්‍රාණය ලැබුණේ මාස කීපයකට පෙරදීය. ලියෝට එය විශ්වාස කිරීමට අපහසු විය. හේසාල් භූතයන් හෝ ලියෝ දැක තිබූ පුනර්ජන්මය ලත් අනෙක් මනුෂ්‍යයන් මෙන් නොව උණුසුම් හා ප්‍රාණවත් එකියක වූවාය.

ලියෝ මෙන් නොව, ඇය මිනිසුන් සමගත් හොඳ සම්බන්ධයක් පවත්වා ගත්තාය. ලියෝ වඩාත් සමීප වූයේ යන්ත්‍රවලට ය. *අශ්වයොයි බල්ලොයි වගේ ජීවී දේවල්?* ඔවුන්ව වැඩ කිරීමට කුමක් කළ යුතු දැයි ඔහු නොදැන සිටියේය. හේසාල් ෆ්‍රෑන්ක්ගේ පෙම්වතිය වූවාය. එබැවින් තමා තරමක් ඈතින් සිටිය යුතු බව ලියෝ දැන සිටියේය. තවමත් ඇගේ කෙස්වැටියේ සුගන්ධය, ඇය සමඟ අසුපිට යාම ඔහුගේ හදවතේ වේගය වැඩි කරවීමට හේතු විය. එය අශ්වයාගේ වේගය විය යුතුය. ඒරියන් අකුණක් සේ වෙරළට පතිත විය. කෝච් හෙජ් සටනකදී කෑ ගසන අයුරින් ඔහු තම කුරවලින් පොළොවට අනින්නට වූයේය. හේසාල් සහ ලියෝ අසු පිටින් බැස්සාහ. ඒරියන් වැල්ලේ වැතිරුණේය. "එයාට කෑම ඕනෙ." හේසාල් පැහැදිළි කළාය. "එයා කැමති රත්‍රන්වලට. ඒත්-"

"රත්‍රන්?" ලියෝ විමසුවේය.

"එයා තණකොළ කයි. යන්න ඒරියන්. අපිව ගෙනාවට ස්තූතියි. මම ඔයාට කතා කරන්නම්."

ඒ ආක[illegible]යටම අසු ගිය විට විල හරහා දුමක් වැනි මාර්ගයක් හැර වෙනත් කිසිවක් දැක ගැනීමට නොලැබිණි.

"වේගවත් අශ්වයෙක්." ලියෝ පැවසුවේය. "ඒ වගේම මිල අධික ආහාරයක්."

"ඇත්තටම නෑ," හේසාල් පැවසුවාය. "මට රත්‍රන් ලබාගන්න ලේසියි."

ලියෝ දෙබැම රැළි කළේය. "රත්‍රන් කොහොමද ලේසි වෙන්නේ? ඔයා මිඩාස් රජුගේ නෑදෑයෙක් කියල නම් කියන්න එපා. මම ඒ හාදයට කැමතිම නෑ."

එම විෂය මතුවීම ගැන පසුතැවිලි වන්නාක් මෙන් හේසාල් දෙතොල් සපා ගත්තාය. "ඒ ගැන එච්චර හිතන්න එපා."

1 මරණයට සහ ධනවත්බවට අධිපති රෝම දෙවියා ය.

එයින් ලියෝ තවත් කුතුහලයට පත්වුණත්, ඇයව තවදු පීඩනයට ලක් නොකර සිටීමට ඔහු තීරණය කළේය. ඇය දණ ගසා දෑත් පුරවා සුදු වැලි මිටක් ගත්තාය. "හොඳයි, කොහොමවුණත්, එක ප්‍රශ්නයක් විසඳුණා." හේසාල් මුහුණ හැකිළුවාය. "මේ මුළු වෙරළමද? "

"ඔව් දැක්කද? කැටිති වල නියම රවුම් හැඩයක් තියෙනවා. ඒවා ඇත්තම වැලි නෙමෙයි. ඒ කැල්සියම් කාබනේට්." තම උපකරණ පටියෙන් මල්ලක් ගත් ලියෝ අත හුණු ගොඩට ඇතුළු කළේය. එසැනින් ඔහු ගල් ගැසුණේය. භූමිය මතදී සෑම විටකදීම පෘථිවි දෙවඟන ගයියා තමා හමුවේ පෙනී සිටි බව ඔහුගේ මතකයට නැගිණි. ඇගේ නිදිබර මුහුණ සෑදී තිබුණේ දූවිලි හෝ වැලි හෝ කුණු වලිනි. ඔහුට සරදම් කිරීමට ඇය ප්‍රිය කළාය. ඇගේ වැසුණු දෑස් සහ සිහින දකින සිනහව ඔහුට සුදු කැල්සියම් වැල්ල අතරින් මැවී පෙනිණි. අහකට පලයන්, පුංචි වීරයෝ, ගයියා පැවසුවාය. උඹ නැතිව නැව හදන්න බැහැ.

"ලියෝ?" හේසාල් විමසුවාය. "මොකුත් අවුලක් නෙමෙයි නේද?"

ඔහු දිගු හුස්මක් ගත්තේය. ගයියා මෙහි නොසිටියේය. ඔහු නිකරුණේ කලබල වී තිබේ. "ඔව්," ඔහු පැවසුවේය. "ඔව්, අවුලක් නැහැ." ඔහු මල්ල පිරවීමට පටන් ගත්තේය.

ඔහු අසල දණ ගසාගත් හේසාල් ඔහුට උදව් වූවාය. "අපිට පොඩි බාල්දියකුයි, සවලකුයි අරගෙන එන්න තිබුණේ."

ඒ අදහස ලියෝ තුළ උනන්දුවක් ඇති කළේය. ඔහුට සිනා නැඟුණේය. "අපිට වැලි මාලිගාවක් හදන්න තිබුණා."

"හුණු මාලිගාවක්."

තත්පරයකට වැඩි කාලයක් ඔවුනොවුන්ගේ දෑස් අගුලු වැටී තිබිණි. හේසාල් ඉවත බලා ගත්තාය. "ඔයා හරියට කවුරු වගේද -?"

"සැමී වගේද?" ලියෝ අනුමාන කළේය.

ඇය පිටුපසට විසිවූවාය. "ඔයා දන්නවද?"

"සැමී කියන්නෙ කවුද කියල මට කිසිම අදහසක් නැහැ. ඒක මගෙ නම නෙමෙයි කියල මට විශ්වාස බව නම් ෆ්‍රෑන්ක්ටත් කිව්වා."

"ඉතිං එහෙම නෙමෙයිද?"

"නැහැ!"



"ඔයාට නිවුන් සහෝදරයෙක් නැද්ද? එහෙම නැත්නම්..." හේසාල් නැවතුණාය.

"ඔයාගෙ පවුලෙ අය නිව් ඕර්ලියන්ස්වලද?"

"නෑ, හුස්ටන්වල.ඇයි? සැමී කියන හාදයව ඔයා දන්නවද?"

"මම...නෑ මොකුත් නැහැ. ඔයා හරියට එයා වගේමයි."

වැඩි යමක් පැවසීමට හේසාල් ලැජ්ජා වන බව පෙනිණි. එහෙත් හේසාල් අතීතයෙන් පැමිණි දැරියක් නම් එයින් කියැවෙන්නේ සැමී යනු 1940 ගණන්වල සිටි අයෙක් බවද? එසේනම්, ඒ හාදයාව ෆ්‍රෑන්ක් දැන සිටින්නේ කෙසේද? දශක ගණනාවක් ගතවීමෙන් පසු, ලියෝ සැමීයැයි හේසාල් සිතන්නේ ඇයි?

ඔවුහු නිහඬවම මල්ල පුරවා නිම කළහ. ලියෝ එය තම ඉන පටිය තුළ තැන්පත් කළ සැනින් මල්ල අතුරුදහන් විය - බරක් නැත, ස්කන්ධයක් නැත, පරිමාවක් නැත,- එහෙත් තමා එතැනට අත පොවන සැනින් එය එතැන තිබෙන බව ලියෝ දැන සිටියේය. ඕනෑම දෙයක් එහි සාක්කු තුළට දැමිය හැකි බවට ලියෝ ඔට්ටු ඇල්লුවේය. ඔහු තම උපකරණ පටියට ප්‍රිය කළේය.

නැගී සිටි ඔහු දූපත විපරම් කළේය - විරංජනය වූ සුදු පැහැති වැලි කඳු, තෘණ ඇතිරිල්ල, හිම මෙන් ලුණු මිදී ගිය ගල් කුට්ටි ඔහුගේ දෑසට හසුවිය.

"ෆෙස්ටස් කිව්ව විදිහට නම් දිව්‍යමය ලෝකඩ කිට්ටුවම තියෙන්න ඕනෙ. කොහෙද කියල මට හරියටම කියන්න බැහැ."

"අර පැත්තේ," හේසාල් වෙරළ දෙසට අත දිගු කළාය. "යාර පන්සීයක් විතර ඈතින්."

"ඔයා කොහොමද -?"

"වටිනා ලෝහ," ඇය පැවසුවාය. "ඒව ප්ලූටෝගෙ දේවල්."

රත්‍රන් ඉතා පහසු දෙයකැයි ඇය පැවසූ බව ලියෝගේ මතකයට නැගිණි.

"අපූරු දක්ෂකමක්. පෙරමුණ ගනු මැනව ලෝහ හඳුනාග න්නා මෙනවිය."

හිරු බැස යාමට පටන් ගෙන තිබිණි. අහස දම් සහ කහ පැහැයෙන් වර්ණවත් විය. වෙරලේ රූමත් කෙල්ලක් සමඟ ඇවිද යාම

විනෝදයක් වුවත්, තවත් දුරට යනවිට ලියෝ තුළ නොරිස්සුමක් ඇති විය. අවසානයේ හේසාල් ගොඩබිම දෙසට හැරුණාය.

"ඔයාට විශ්වාසද මේක හොඳ අදහසක් කියලා?" ඔහු විමසුවේය.

"අපි ළඟම ඉන්නේ," ඈය සහතික වූවාය. "එන්න." වැලිකඳු වලට එපිටින් ඔවුන්ට කාන්තාවක් දැක ගැනීමට ලැබිණි.

තෘණ පිටියක මැද තිබූ ගල් පරයක් මත ඈය හිඳගෙන සිටියාය. කළු සහ රිදී පැහැති යතුරු පැදියක් අසල නවතා තිබුණත්, රෝද දෙකෙහි චාපයක කොටසක් ඉවත් කර තිබිණි. ඒ තත්ත්වයෙන් නම් එය කොහෙත්ම ධාවනය කළ නොහැකිය.

කාන්තාවට තිබුණේ බොකුටු කළු කොණ්ඩයක් සහ කෙසඟ සිරුරකි. යතුරු පැදි ධාවයන්ගේ කළු පම් කලිසමක් හැඳ, උසැති සම බූට්ස් පැළඳ සිටි ඇය, ලේ රත් පැහැති සම් ජැකට්ටුවක් දමාගෙන සිටියාය. ඇගේ දෙපා අවට කැඩුණු සිප්පි කටු විසරී තිබිණි. ඈය මල්ලකින් එකින් එක ගෙන, ඒවා විවර කළාය. බෙල්ලන්ව උරනවද? මහා ලවණ විලේ බෙල්ලන් ඇත්දැයි ලියෝට සැකයක් ඇතිවිය.

ලියෝ ඇය සමීපයට යාමට ඉක්මන් වූයේ නැත. අත්භූත කාන්තාවන් සම්බන්ධයෙන් ඔහුට තිබූ අත්දැකීම් යහපත් ඒවා නොවීම එයට හේතුවයි. ඔහුව රැකබලා ගත් ආයම්මා වූ ටියා කැලීඩා, හේරා විසින් වෙනස් කරනු ලැබූ අතර, ඔහුව ගිනි උඳුන අසල නිදි කරවීමේ නරක පුරුද්දක් ඇයට තිබිණි. ලියෝ අට හැවිරිදිව සිටියදී ගයියා විසින් ඇගේ මව මරා දැමූවාය.

එහෙත් හේසාල් ඉදිරියට ගිය බැවින් ඈය අනුගමනය කිරීම විනා ඔහුට වෙනත් විකල්පයක් නොතිබිණි.

ඔවුන් සමීපයට යත්ම, ලියෝට සිත කරදරයකට පත් කරන විස්තර දැක ගැනීමට ලැබිණි. ගැහැනියගේ බඳ පටියට සවි වී තිබුණේ ඔතනු ලැබූ කසයකි. ඇගේ රතු ජැකට්ටුවේ තේරුම් ගැනීමට අපහසු සටහනක් විය. ඇපල් ගසක ඇඹරුණු අතුවල ඇටසැකිලි පක්ෂීහු වසා සිටිහය. ඈය උරමින් සිටි මට්ටයන් සැබැවින්ම වාසනාවේ විස්කෝතු ය.

කඩා දැමනු ලැබූ විස්කෝතු කන්දක් ඇගේ වළලුකර වැසෙන තරමට අවට ගොඩ ගැසී තිබිණි. අලුත් එකක් මල්ලෙන් පිටතට ගත් ඇය, ඒවා කඩා විවෘත කර වාසනාව කියැවූවාය. බොහෝ ඒවා ඇය



ඉවතට විසිකර දැමූවාය. සීපයක ඇති දේ ඇය නොසතුටින් කියැවූවාය. ඇය එතුළ වූ කඩදාසි කැබලි ඇඟිල්ලෙන් පිරි මැද්දේ ඒවායේ ඇති කුණු ඉවත් කරන්නාක් මෙනි. ඉන්පසු ඉන්ද්‍රාලික ලෙස විස්කොතුව නැවත ඇලවුණු අතර එය අසල තිබූ බඳුනකට විසි කෙරිණි.

"ඔයා මොනවද කරන්නේ?" නැවතීමටත් පෙර ලියෝ විසුවේය.

ගැහැනිය හිස එසැවූවාය. ලියෝගේ පෙනහලු පුපුරා යාමට ආසන්න විය.

"රෝසා නැන්දා?" ඔහු පැවසුවේය.

එයින් කිසිදු වෙනසක් ඇති නොවුණත්, මේ ගැහැනිය පෙනුණේ හරියටම ඔහුගේ නැන්දා ලෙසිණි. ඇයට තිබුණේද පැත්තක ඉන්නෙක් සහිත එවැනි පුළුල් නාසයකි. ඒ අප්‍රසන්න කටමය. ඒ දැඩි දෑස්ම ය. එහෙත් ඒ රෝසා වෙන්නට බැරිය. ඇය කිසිවිටකත් මෙවැනි ඇඳුම් ඇන්දේ නැත. එසේම ලියෝ දන්නා තරමින් ඇය තවමත් වෙසෙන්නේ හූස්ටන්වලය. මහා ලවණ විල මැද විස්කෝතු කඩා දමන්නේ ඇය වෙන්නට නොහැකිය.

"එහෙමද ඔයාට පේන්නේ?" ගැහැනිය විමසුවාය. "ආකර්ෂණීයයි. ඒ වගේම ඔයාටත්, හේසාල් පැවියෝ."

"ඔයා කොහොමද - ?" හේසාල් පිටුපසට විසිවූවාය. "ඔයා - ඔයා හරියට ලියර් මහත්මිය වගේ. මගෙ තුන්වැනි පන්තියෙ ගුරුතුමිය. මට ඔයාව පේන්න බැහැ."

ගැහැනිය හඬ නගා සිනාසුණාය. "විශිෂ්ටයි. ඔයාට එයාව අප්‍රියයි ද? එයා ඔයාට සැලකුවෙ අසාධාරණ විදිහටද?"

"ඔයා - ඇය වැරදි වැඩට මගේ අත් මේසෙට තියල බැන්දා." හේසාල් පැවසුවාය. "එයා මගේ අම්ම යක් දෙස්සියක් කිව්වා. මම නොකරපු හැමදේකටම එයා මට වරද පැටෙව්වා - නෑ. එයා මැරෙන්න ඕනෙ. ඔයා කවුද?"

"ඕහ්, ලියෝ දන්නවා," ගැහැනිය පැවසුවාය. "ඔයාට රෝසා නැන්දා ගැන කොහොමද දැනෙන්නෙ, මිජෝ?"

මිජෝ. ලියෝගේ මව නිතරම ඔහුව ඇමතුවේ ඒ ආකාරයටය. ඔහුගේ මව මියගිය පසු, රෝසා ලියෝව ප්‍රතික්ෂේප කළාය. ඇය ඔහුට කතා කළේ යක්ෂ දරුවා කියාය. තම සහෝදරිය මරා දැමූ ගින්න

ගැන ඇය ඔහුට වරද පැවරුවාය. රෝසා ඔහුගේ පවුල ඔහුට එරෙහි කළ අතර ඔහුව අතහැර දැමුවාය. අට හැවිරිදි වියේදී අනාථයකු වූ ඔහුට සමාජ සේවාවල අනුකම්පාව හිමි විය. අර්ධ ලෝහිත කඳවුර හමුවනතුරු ලියෝට අනාථ නිවාසයෙන් නිවාසයට මාරු වීමට සිදුවිය. ලියෝ බොහෝ මිනිසුන්ට වෛර නොකළේය. එහෙත් ගෙවුණු වසර ගණනාව පුරාම රෝසා නැන්දාගේ මුහුණ ඔහුගේ ලේ කකියවීමට සමත් විය.

කොහොමද ඔහුට දැනෙන්නේ? ඔහුට සමානයකු වීමට අවශ්‍ය විය. ඔහුට පළිගැනීමට අවශ්‍ය විය.

පැක්-මැන් රෝද සහිත යතුරු පැදියට ඔහුගේ දෙනෙත් යොමු විය. මෙවැනි යමක් කොහේදී හෝ ඔහු මින් පෙර දැක තිබේද? අර්ධ ලෝහිත කඳවුරේ 16 කුටිය - එහි දොරට උඩින් තිබු කැඩුණු රෝදයේ සලකුණ.

"නෙමිසිස්." ඔහු පැවසුවේය. "ඔබ පළිගැනීමේ දෙවඟන."

"ඔයා දැක්කනේ?" දෙවඟන හේසාල්ට සිනාවක් පෑවාය. "එයා මාව අඳුනගත්තා."

නැවත විස්කෝතුවක් කඩා දැමූ නෙමිසිස් නහය රැළි කළාය. ඔබ අඩුවෙන්ම අපේක්ෂා කරන විට, ඔබට විශාල වාසනාවක් ලැබෙනු ඇත. ඇය කියවූවාය. "ඒක නිසැකවම මට පේන්න බැරි විකාර එකක්. කවුරු හරි විස්කෝතුවක් විවෘත කළාම එකපාරටම එයාලට අනාවැකියක් කියනවා. එයාල ධනවත් වෙයි කියලා. මම වරද පටවන්නෙ ඉබාගාතෙ ඇවිදින ටයිචිට[2]. හැමවෙලාවෙම වාසනාව ලබා දෙන්නෙ ඒකට සුදුසු නැති මිනිස්සුන්ට."

ලියෝ කැඩුණු විස්කෝතු ගොඩ දෙස බැලුවේය. "ආහ්...ඔයා දන්නවා නේද මේවා සැබෑ අනාවැකි නෙමෙයි කියලා! මේවා මේ නිකම් කර්මාන්ත ශාලාවක විස්කෝතු විතරයි."

"ඒකට නිදහසට කරුණු දක්වන්න එපා," නෙමිසිස් ගිගිරුවාය. "ඒක හරියට ටයිචි, මිනිස්සුන්ගෙ බලාපොරොත්තු දල්වනවා වගේ දෙයක්. නෑ...නෑ.. මම ඇයට බාධා කරන්න ඕනෙ." නෙමිසිස් කඩදාසි කැබැල්ල මත ඇඟිල්ල ගෙන ගියාය. එහි අක්ෂර රතු පැහැයට වෙනස්

1 පළිගැනීමට අධිපති ග්‍රීක දෙවඟන යි. රෝම ස්වරූපය ඉන්විඩියා ය.

2 වාසනාවට අධිපති ග්‍රීක දෙවඟන. හර්මිස්ගේ සහ ඇප්‍රොඩයිටිගේ දියණියයි. රෝම ස්වරූපය ෆෝටූනා ය.



විය. ඔබ මරණය අපේක්ෂා කරන විට , ඔබ වේදනාවෙන් මිය යනු ඇත. "අන්න ඒක හොඳයි."

"ඒක භයානකයි!" හේසාල් පැවසුවාය. "ඔයා ඒක කාගෙ හරි වාසනාවේ විස්කොතුවක් ඇතුළෙ දාල කියවන්න අරිනවද? ඒක ඇත්තක් වෙනවද?"

නෙමිසිස් විරිත්තුවාය. එහි රෝසා නැන්දාගේ මුහුණේ ඉරියව් මෙන් සැබෑ අප්‍රසන්න බවක් තිබණි, "මගේ හේසාල් පැටියෝ, ඔයා කවදාවත් ප්‍රාර්ථනා කරල තියෙනවද එයා ඔයාට සලකපු විදිහ වෙනුවෙන් ලියර් මහත්මියට භයානක දෙයක් වෙන්න කියලා."

"ඒකෙත් අදහස් කළේ නෑ , මට ඒවා සැබෑ වෙන්න ඕනෙ කියලා."

"ආහ්," විස්කෝතුව නැවත ඇලවූ දෙවඟන එය බඳුනට විසි කළාය. "ටයිචි ඔයාට වාසනාවක් වෙයි, මම හිතනවා, රෝමන්වරයකු වීම නිසා අනෙක් අය වගේම, ඇයත් දැන් ඉන්නෙ භයානක විදිහක. මට? මට බලපෑමක් නැහැ. රෝමයෙයි ග්‍රීසියෙයි දෙකේම මට කියන්නේ නෙමිසිස්ම තමයි. මම වෙනස් වෙන්නෙ නෑ. මොකද පළිගැනීම කියන්නේ විශ්විය දෙයක් නිසා."

"ඔයා මොනාව ගැනද කියන්නේ?" ලියෝ විමසුවේය. "ඔයා මොනාවද මෙතන කරන්නේ?"

නෙමිසිස් තවත් විස්කෝතුවක් විවෘත කළාය. "වාසනාවන්ත අංක, විකාරයක්! ඒක නියම වාසනාවක් නෙමෙයි." විස්කෝතුව පොඩිකර දැමූ ඇය එය ඇගේ දෙපා අවට විසුරුවා දැමුවාය.

"ඔයාගෙ ප්‍රශ්නෙට උත්තරේ, ලියෝ වැල්ඩෙස්, දෙවියො භයානක හැඩයෙන් ඉන්නවා. රෝමවරු සහ ග්‍රීක්වරු අතර සිවිල් යුද්ධයක් ඇතිවුණ හැම වෙලාවකම එහෙම වෙනවා. ඔලිම්පියානුවො , දෙපක්ෂය කියල කියන එයාලගෙ ස්වභාවයන් දෙකට බෙදෙනවා. එයාල ටිකක් හින්නොන්මාදී තත්ත්වයට පත් වෙනවා. ඔලුවෙ කැක්කුම හැදෙනවා. මංමුළා වෙනවා."

"ඒත් අපි ඉන්නෙ යුද්ධයක නෙමෙයි." ලියෝ විරෝධය පෑවේය.

"ම්..ලියෝ...." හේසාල් ඇසක් ගැසුවාය. " ඔයා නව රෝමයෙන් විශාල කොටසක් විනාශ කරපු කාරණේ හැරුණම."

හේසාල් කාලේ පැත්තේදැයි සිතා ගත නොහැකිව ලියෝ ඇය දෙස පුදුමයෙන් බැලුවේය. "ඒක හිතල කළේ නෑ."

"මම දන්නවා..." හේසාල් පැවසුවාය. "ඒත් රෝමවරු ඒක අවබෝධ කරගන්නෙ නෑ. එකට එක කරන්න එයාල අපි පස්සෙන් එනවා."

නෙමිසිස් සිනාසුණාය. "ලියෝ, කෙල්ල කියන දේ අහන්න. යුද්ධය පැමිණෙනවා. ඔයාගෙ උදව්වෙන් ගයියා ඒක දැක්කා. ඒ වගේම ඔයාල පත්වෙලා ඉන්න අසීරු තත්ත්වයට මොන දෙවියන්ටද වරද පැටවෙන්නෙ කියල ඔයාට අනුමාන කරන්න පුළුවන්ද?"

ලියෝගේ මුවට කැල්සියම් කාබනේට් රස දැනිණි. "මට..."

දෙවඟන හඬ නැගෙන සේ හුස්මක් පිට කළාය. "හොඳයි, ඔයාටම කියල ලොකු අවස්ථාවක් නැහැ. ඔයා වෙස් පුවරුවක ඉත්තෙක් විතරයි, ලියෝ වැල්ඩේස්. ග්‍රීකයන් සහ රෝමවරු එකතු කරන මේ විකාර ගවේෂණයට ගැලපෙන ක්‍රීඩකයා මම නියම කරල තියෙන්නෙ. දෙවිවරු හේරා - නැත්නම් ජූනෝ- ස්වර්ගයේ දෙවඟන හා ඇගේ පවුලේ උදහස නිසා ඔලිම්පස්වලින් පළා ගියා. ඔයාගෙ අනුග්‍රාහකයාගෙන් තවදුරටත් උදව් බලාපොරොත්තු වෙන්න බෑ."

ලියෝගේ හිස කරකැවෙන්නට විය. ඔහුට හේරා ගැන ඇති වූයේ මිශ්‍ර හැඟීමකි. ඔහු ළදරුවකුව සිටි අවධියේ සිට ඇය ඔහුගේ ජීවිතයට ඇඟිලි ගැසුවාය. මේ විශාල අනාවැකියේදී ඇගේ අරමුණට සේවය කිරීම සඳහා ඔහුව හැඩ ගැස්සුවාය. එහෙත් අවම වශයෙන් අඩු වැඩි වශයෙන් ඇය ඔවුන්ගේ පැත්තේ නොසිටියාය. ඇය දැන් සිටින්නේ දර්ශනයෙන් පිට නම්...

"ඉතිං ඇයි ඔයා මෙතන?" ඔහු විමසුවේය.

"ඇයි? මගෙ උදව් පිරිනමන්නනෙ." නෙමිසිස් දුෂ්ට සිනාවක් පෑවාය. .

ලියෝ හේසාල් දෙස බැලුවේය. නොමිලේ සර්පයෙක් ලැබුණු පෙනුමක් ඇගෙන් දිස් විය.

"ඔයාගෙ උදව්?" ලියෝ පැවසුවේය.

"ඇත්ත වශයෙන්ම," දෙවඟන පැවසුවාය. "අහංකාරය සහ බලය බිඳ දැමීමෙන් මම විනෝදයක් ලබනවා. ගයියායි, එයාගෙ යෝධයනුයි තරම් ඒකට සුදුසු අය නැහැ. තවමත්, මම ඔබලාට අනතුරු ඇඟවිය යුතුයි. මම නුසුදුසු සාර්ථකත්වයට ඉඩ නොදෙයි කියලා.



වාසනාව කියන්නේ රැවටිල්ලක්. නියම සාර්ථකත්වයට පරිත්‍යාගය අවශ්‍යයි."

"පරිත්‍යාගය?" හේසාල්ගේ හඬ දැඩි විය. "මට මගෙ අම්මව නැති වුණා. මාව මැරිල ආයෙත් ජීවිතය ලැබුණා. දැන් මගෙ සහෝදරය අතුරුදහන් වෙලා. ඒ පරිත්‍යාගය ඔයාට මදිද?"

ලියෝටත් එය සම්පූර්ණයෙන් අදාළ විය. තමාට මව අහිමි වූ බව පැවසීමට ඔහුට අවශ්‍ය විය. ඔහුගේ මුළු ජීවිතයම එකකට පසු එකක් ලෙස ආපදාවන් පැමිණියේය. ඔහුට තම මකරා වූ ෆෙස්ටස් අහිමි විය. ආගෝ II නිම කිරීමට උත්සාහ දරද්දී ඔහු මරණයට ආසන්නව සිටියේය. දැන් රෝම කඳවුරට පහර දීමෙන් ඔහු යුද්ධය ආරම්භ කර ඇති බව පෙනෙන අතරම සමහර විට තම මිතුරන්ගේ විශ්වාසය ද අහිමි කරගෙන සිටිනවා විය හැකිය.

"මෙ දැන්," ඔහු කෝපය පාලනය කර ගැනීමට උත්සාහ දරමින් පැවසුවේය. "මට ඕනෙ කරල තියෙන්නෙ දිව්‍යමය ලෝකඩ ටිකක් විතරයි."

"ආහ්, ඒක ලේසියි," නෙමසිස් පැවසුවාය. "ටිකක් ඉහළට යද්දි ඒවා තියෙනවා. පෙම්වතිය එක්ක ඔයාට ඒවා හොයාගන්න පුළුවන් වෙයි.."

"ටිකක් ඉන්න." හේසාල් පැවසුවාය. "මොන පෙම්වතියද?"

විස්කෝතුවක් කටේ ඔබාගත් නෙමිසිස් එය ගිල දැමුවාය. "ඔයාටම බලාගන්න පුළුවන්. සමහර විට එයාල ඔයාට පාඩමක් උගන්වයි, හේසාල් ලෙවිස්කි. ගොඩක් වීරයන්ට එයාලගෙ ස්වභාවයෙන් පැනල යන්න බැහැ. එයාලගෙ ජීවතයට දෙවැනි අවස්ථාවක් ලැබෙන විටදි වුණත්..." ඇය සිනාසුණාය. "ඒ වගේම, ඔයාගෙ සහෝදරයා, නිකෝ ගැන කියනවනම්, ඔයාට වැඩි කාලයක් නැහැ. අපි බලමු, ඒ ජූනි විසි පහද? ඔව් අදින් පස්සෙ තව දවස් හයයි. ඊට පස්සෙ මේ මුළු රෝම නගරයත් එක්කම එයත් මැරෙයි."

හේසාල්ගේ දෑස් විසල් විය. "කොහොමද? මොකක්?"

"ඒ වගේම , ගින්නේ දරුවා, ඔයා," ඇය ලියො දෙසට හැරුණාය. "ඔයාගෙ නරකම පීඩාවන් තවම පැමිණියේ නැහැ. ඔයා නිතරම පිටස්තරයෙක් වෙයි, හත්වෙනි රෝදය, ඔයාට ඔයාගේ සගයෝ අතරෙ තැනක් ලැබෙන එකක් නැහැ. ඉක්මනින්ම ඔයාට විසඳගන්න

බැරි, ඒත් මට උදව්කරන්න පුළුවන් ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්
වෙයි. හැබැයි ඒ මිලකට."

ලියෝට දුමක ගන්ධය දැනිණි. තම වම් අතේ ඇඟිලි දැවෙ
බව ඔහුට අවබෝධ විය. හේසාල් බියපත්ව ඔහු දෙස බලා සිටියාය.

ගිනි දලු නිවා දැමීමට ඔහු තම අත සාක්කුවේ පිස දැමුවේය.
"මගේ ප්‍රශ්න මමම විසඳගන්න කැමතියි."

"බොහොම හොඳයි," නෙම්සිස් තම ජැකට්ටුවේ සිදු
විස්කෝතු කැබලි පිස දැමුවාය.

"ඒත්, ම්.. මොන විදිහෙ මිලක් ගැනද අපි කතාකරන්නේ?"

දෙව්ගත දෙවුර සැලුවාය. "මෑතකදි මගේ දරුවෙක් ලෝකයේ
සැබෑ වෙනසක් ඇති කිරීමේ හැකියාව වෙනුවෙන් ඇසක් අලෙ
කළා."

ලියෝ වෙව්ලා ගියේය. "ඔයාට ඕනෙ ඇහැක්ද?"

"ඔයාගෙ ප්‍රශ්නෙදි, සමහරවිට වෙනත් පරිත්‍යාගයක්
වෙන්නත් පුළුවන්. ඒත් වේදනාකාරී දෙයක්. මෙන්න..." ඇය නොකැඩු
විස්කෝතුවක් ඔහු අත තැබුවාය. "ඔයාට පිළිතුර අවශ්‍ය වුණොත්
මේක කඩන්න. ඒකෙන් ඔයාගෙ ප්‍රශ්නය විසඳෙයි."

ඔහු වාසනාවේ විස්කෝතුව අල්ලා ගත්තා විට, ඔහුගේ අත
වෙව්ලන්නට විය. "මොන ප්‍රශ්නයද?"

"වෙලාව ආවම ඔයා දැනගනියි."

"එපා, ස්තුතියි." ලියෝ කාරුණිකව පැවසුවේය. එහෙත්
විස්කෝතුව ස්ව කැමැත්තෙන් මෙන්, ඔහුගේ අතින් ගිලිහී, ඔහුගේ
ඉනෙහි බැඳි උපකරණ පටිය තුළට වැදිණි.

තම බෑගයෙන් තවත් විස්කෝතුවක් ගත් නෙම්සිස්, එය කඩා
විවෘත කළාය. ඔබේ තේරීම ගැන නැවත සලකා බැලීමට ඉක්මනින්
ඔබට හේතුවක් ලැබෙනු ඇත. "ඕහ් මම මේකට කැමතියි. මේකට
වෙනස්කම් අවශ්‍ය නැහැ."

විස්කෝතුව නැවත ඇල වූ ඇය එය බඳුනට විසි කළාය.
"ගවේෂණයේදී ඔයාලට උදව් කිරීමේ හැකියාව තිබෙන්නෙ දෙවිවරු
කීපදෙනෙකුට විතරයි. බොහෝ දෙනෙක් දැනටමත් දුබල වෙලා
එයාලගෙ ව්‍යාකූලත්වය විතරක් නරක විදිහට වැඩිවෙලා. ඔලිම්පස්වලට
ආයේ එක්සත්කම ගේන්න පුළුවන් එක දෙයකට විතරයි. පරණ වැ



ද්දට අවසානයේ පළිගැනීම. ආහ්. ඒක හරිම මිහිරි වෙයි. අවසානයේ
තරාදිය සම වෙයි. ඒත් ඔයා මගෙ උපකාරය පිළි නොගත්තොත් ඒක
වෙන එකක් නැහැ."

"මම හිතනවා, ඔයා කතාකරන දේ ගැන නෙමෙයි ඔයාට
අපිට කියන්න ඕනෙවෙලා තියෙන්නෙ කියලා." හේසාල් මිමිණුවාය.
"එහෙම නැත්නම් ඇයි මගේ සහෝදරයා, නිකෝ, ජීවත් වෙන්න
දවස් හයක් විතරක් තියෙන්නේ. නැත්නම් ඇයි රෝමය විනාශ
වෙන්න යන්නේ කියන එක ගැන නෙමෙයි නේද ඔයාට කියන්න
ඕනෙ වෙලා තියෙන්නේ."

නෙම්සිස් කොක්හඬලා සිනාසුණාය. "ඔහ්, ඒ සේරම එකට
බැඳිල තියෙන්නෙ, හේසාල් ලෙවිස්කි. ලියෝ වැල්ඩෙස් , මගේ
පිරිනැමීම විදිහට , ඒකට යම් සිතුවිල්ලක් දෙන්න. ඔයා හොඳ
දරුවෙක්. මහන්සිවෙලා වැඩ කරන කෙනෙක්. අපිට ගනුදෙනුවක්
කරන්න පුළුවන්. ඒත් මම ඔයාලව වැඩිවෙලාවක් රඳව ගන්නෙ නැහැ.
ආලෝකය වියැකෙන්න කලින් ඔයාලා පරාවර්තනය වෙන පොකුණට
යන්න ඕනෙ. මගේ අසරණ සාපලත් කොල්ලා ... අඳුර වැටෙන කොට
ටිකක් කැළඹෙනවා."

ඇය එය පැවසූ ආකාරය ගැන ලියෝට එතරම් පැහැදීමක් ඇති
නොවුණත් , දෙව්ගත ඇගේ යතුරු පැදියට ගොඩ වූවාය. රෝදවල
කොටසක් නැති වුවත් එය ධාවනය කළ හැකි බව පෙනිණි. මත්නිසාද
යත් හත්තක් මෙන් වූ කළු දුමාරයක් තුළ නෙම්සිස් අතුරුදහන් වූ
බැවිණි.

හේසාල් පහතට නැවුණාය. එක් කඩදාසි කැබැල්ලක් හැර
කැඩුණු විස්කෝතු සියල්ලම අතුරුදහන් වී තිබිණි. එය අහුලා ගත්
හේසාල් එය කියැවූවාය. "ඔබ ඔබගේ ප්‍රතිබිම්භය දකිනු ඇත. අපේක්ෂා
භංගත්වයට ඔබට හේතුවක් ලැබෙනු ඇත."

# 07
# ලියෝ

''රෝසා නැන්දා කවුද?'' හේසාල් විමසුවාය.

ලියෝට ඇය ගැන කතා කිරීමට වුවමනාවක් නොතිබිණි. නෙම්සිස්ගේ වදන් තවමත් ඔහුගේ දෙකන් තුළ රැව් දෙමින් පැවතියේය. විය හැකි දෙයක් නොවූ නමුත් වාසනාවේ විස්කෝතුව නිසා ඔහුගේ ඉන පටියේ බර වැඩිවී ඇති බවක් දැනිණි. එහි වූ සාක්කුවලට අමතර බරක් නොමැතිව ඕනෑම දෙයක් ගෙන යාමේ හැකියාවක් තිබිණි. පහසුවෙන් කැඩෙන දේවල් පවා හානියකින් තොරව එහි රඳවා තබා ගත හැකිවිය.

''දිග කතාවක්,'' ඔහු පැවසුවේය. ''මගේ අම්ම මැරුණට පස්සෙ එයා මාව අතහැරල දැම්මා. මාව අනාථ නිවාසෙකට බාර දුන්නා.''

''මට සමාවෙන්න.''

''ඔව්, හොඳයි...'' මාතෘකාව වෙනස් කිරීම ලියෝට අස්වැසිල්ලක් ගෙන දුන්නේය.

''ඔයා ගැන කොහොමද? ඔයාගෙ සහෝදරයා ගැන නෙම්සිස් මොනවද කිව්වේ?''

තම ඇස්වලට මුහුදු ජලය වැදුණාක් මෙන් ඇය ඇසිපිය ගැසුවාය. ''නිකෝ ... එයා මට හමුවුණේ පාතාල ලෝකයෙදි. එයා මාව ආපහු මනුෂ්‍ය ලෝකයට අරන් ආවා. ජුපිටර් කඳවුරේ රෝමවරුන්ට



මාව පිළිගන්න විදිහට ඒත්තු ගැන්වුවා. මගේ ජීවිතයේ දෙවැනි අවස්ථාව වෙනුවෙන් මම එයාට ණය ගැතියි. නෙම්සිස් කියපු දේ හරිනම් නිකෝ ඉන්නෙ අනතුරක. මම එයාට උදව් කරන්න ඕනෙ.''

''සත්තකින්ම,'' ලියෝ පැවසුවත්, එම අදහස ඔහුව අපහසුවට පත් කළේය. පළිගැනීමේ දෙවඟන කිසිදාක ඇගේ හදවතට එකඟව උපදෙසක් දුන්නේද යන්න ගැන ඔහුට වූයේ සැකයකි. ''ඒ වගේම නෙම්සිස් කිව්වා ඔයාගෙ සහෝදරයට ජීවත් වෙන්න තියෙන්නෙ දවස් හයයි කියලා. ඒ වගේම රෝමය විනාශ වෙන බවකුත් කිව්වා. ඒ ගැන මොනවහරි අදහසක් තියෙනවද?''

''නැහැ,'' හේසාල් පැවසුවාය. ''ඒත් මට බයයි...''

ඇය කුමක් සිතමින් සිටියත් , එය හෙළි නොකිරීමට ඇය තීරණය කළාය. හොඳ දර්ශනයක් ලබා ගැනීමට ඇය අසල වූ ගල් කුළක් මතට නැගුණාය. ලියෝ ඇයව අනුගමනය කිරීමට උත්සාහ කළත්, ඔහුගේ සමබරතාවය ගිලිහී ගියේය. හේසාල් ඔහුගේ අතකින් අල්ලා ගත්තාය. ඇය ඔහුව ඉහළට ඇද ගත් අතර ගල් කුළ මත මවුනු අත් අල්ලාගෙන මුහුණට මුහුණ බලා සිටියහ.

හේසාල්ගේ දෑස් රත් මෙන් දිලිසෙන්නට විය.

රත්‍රන් ලේසියි, ඇය වරෙක පැවසුවාය. ඇය දෙස බලා සිටින විට ලියෝට පෙනුණේ ඒ ආකාරයට නොවේ. සැම් යනු කවුරෙක්දැයි ඔහු පුදුමයට පත් විය තමා එය දැනගත යුතුයැයි කුහුලක් ඔහුට ඇති වුවත් මේ එයට සුදුසු තැන නොවන බව ඔහුට වැටහිණි. ඔහු කවුරුන් වුවත්, හේසාල් ඔහු ගැන සැලකිල්ලක් දක්වන්නේ නම් ඔහු වාසනාවන්තයෙකි.

''ම...ස්තුතියි'' ඔහු ඇගේ අත අතහැරියේය. එහෙත් ඔවුන් තවමත් එකිනෙකාට සමීපව සිටි බැවින් ඔහුට ඇගේ සුසුමේ උණුසුම දැනුණේය. ඇය කිසිවිටෙකත් මිය ගිය අයකු ලෙස පෙනෙන්නේ නැත.

''අපි නෙම්සිස් එක්ක කතා කරන කොට,'' හේසාල් අපහසුවෙන් පැවසුවාය, ''මම දැක්ක ඔයාගෙ අත්වලින් ගිනිදලු පිටවෙනවා.''

''ඔව්,'' ඔහු පැවසුවේය. ''ඒ හෙපියාස්ටස්ගෙ බලය. සාමාන්‍යයෙන් මට ඒක පාලනයෙ තියාගන්න පුළුවන්.''

''ඕහ්.''

ආරක්ෂාවට මෙන් හේසාල් තම දෑත් ඩෙනිමේ සාක්කු තුළ දමා ගත්තාය. ඇයට තමා වෙතින් ඉවත්ව යාමට අවශ්‍යව ඇතැයි යන හැඟීමක් ලියෝ තුළ ඇති විය. එහෙත් ගල් තුළ බෙහෙවින් ... එකක් විය.

නියමයි, ඔහු සිතුවේය. මම භයානක විකෘතියක් කියල හිතන තවත් කෙනෙක්.

ඔහු දූපත වටා නෙත් යැව්වේය. ප්‍රතිවිරුද්ධ පැත්තේ වෙරළ තීරය තිබුණේ ඔවුන්ට යාර සියයක් පමණ ඇතිනි. ඔවුන් සිටි තැන ඒ වෙරළත් අතර වැලි කඳු සහ ගල් කුළු හැර පරාවර්තිත තටාකයක් දක්නට නොලැබිණි.

ඔබ නිතරම පිටස්තරයෙක් වේවි, නෙම්සිස් ඔහුට පැවසුවාය. සත්වෙනි රෝදය. ඔබගේ සගයන් අතර ඔබට තැනක් නොලැබෙනු ඇත.

ඇය ඔහුගේ කන්වලට අම්ල දැමුවා මෙනි. තමා අමුතු මිනිසෙකැයි කිසිවකු පවසනු ඇසීමට ලියෝට අවශ්‍ය වූයේ නැත. ඔහු අර්ධ ලෝහිත කඳවුරේ 9 බංකරයේ මාස ගණන් වැය කරමින් නැව තැනීමේ කටයුතුවල නිරත වූ අතර ඔහුගේ මිතුරෝ එකට පුහුණු වෙමින් , ආහාර බෙදා ගනිමින්, ක්‍රීඩාකරමින් කල් ගෙවූහ. ඔහුගේ හොඳම මිතුරන් දෙදෙනා වූ පිපර් හා ජේසන් පවා, නිතරම ඔහුට සැලකුවේ පිටස්තරයකු ලෙසිණි. ඔහුගේ අනෙක් එකම මිතුරා වූ ෆෙස්ටස් මකරා ඔවුන්ගේ අවසන් වික්‍රමයේදී ඔහුගේ පාලන තැටිය විනාශ වීම නිසා හිස පමණක් ඉතිරි වන ලෙස විනාශ විය. එය නැවත අලුත්වැඩියා කිරීමට තරම් තාක්ෂණ දැනුමක් ලියෝට නොතිබිණි.

සත්වෙනි රෝදය. ලියෝ පස්වෙනි රෝදයක් ගැන අසා තිබුණේය. එය උපකරණයක, වැඩකට නැති අමතර රෝදයකි. සත්වෙනි රෝදය එයටත් වඩා නරක ඇතැයි ඔහු සිතුවේය.

මේ ගවේෂණය සමහරවිට තමාට නැවුම් ආරම්භයක් වනු ඇතැයි ඔහු සිතා සිටියේය. ආගෝ II නිපදවීමේ ඔහුගේ අසීරු කාර්යය සඵල විය. තමාව අගය කරන, තමාව පිළිගන්නා හොඳ මිතුරන් හය දෙනෙකු ඔහුට ලැබී තිබෙන අතර, ඔවුන් යෝධයන් සමඟ සටන් කිරීමට යාත්‍රා කරති. තමාට පෙම්වතියක් වුවත් ලැබෙනු ඇතැයි ලියෝ රහසිගතව බලාපොරොත්තු විය.



නෙම්සිස් නිවැරදිය. ඔහු සත්දෙනෙකුගේ කණ්ඩායමේ කොටසක් විය හැකි නමුත්, ඔහු තවමත් සිටියේ හුදෙකලාවය. ඔහු රෝමවරුන්ට පහර දීමෙන් තම මිතුරන්ට ප්‍රශ්නයක් හැර අන් කිසිවක් ලබා දුන්නේ නැත. ඔබේ මිතුරන් අතර ඔබට තැනක් නොලැබෙනු ඇත.

"ලියෝ?" හේසාල් මෘදුව විමසුවාය. "නෙම්සිස් කියපු දේවල් ගැන ඔයා එච්චර හිතන්න එපා."

ඔහු මුහුණ හැකිළුවේය. "ඒක ඇත්තක් නම් මොනව වෙයිද?"

"ඇය පළිගැනීමේ දෙවඟන," හේසාල් ඔහුට සිහිපත් කළාය. සමහරවිට එයා අපේ පැත්තෙ ඉන්නව වෙන්නත් පුළුවන්. එහෙම නොවෙන්නත් පුළුවන්. ඒත් ඔයාගෙ දර්ශනයෙන් නොරිස්සුම වැඩිවුණා.

එතරම් පහසුවෙන් තම හැඟීම් බැහැර කළ හැකිනම් කොතරම් අගනේදැයි ලියෝ සිතුවේය. ඔහුට එය කළ නොහැකිය. තවමත්, එය හේසාල්ගේ වරදක් නොවේ.

"අපි දිගටම යන්න ඕනෙ," ඔහු පැවසුවේය. "අඳුර වැටෙන්න කළින් අවසන් කරන්න කියල නෙම්සිස් කියපු දේ මට හිතාගන්න බැහැ."

හේසාල් හිරු දෙස බැලුවාය. මේ වන විට එය ක්ෂිතිජයට සමීප වී තිබිණි.

"ඒ වගේම එයා සඳහන් කරපු සාපලත් කොලුවා කවුද?"

ඔවුන්ට පහළින් හඬක් ඇසිණි. "එයා සඳහන් කළ සාපලත් කොලුවා."

මුලදී ලියෝට කිසිවකු දක්නට නොලැබුණේය. ඉන්පසු ඔහුගේ දෑස් පැහැදිලි විය. ගල්කුළ පාමුලට, අඩි දහයක් පමණ දුරින් තරුණ ගැහැනියක් සිටගෙන සිටියාය. ඇය හැඳගෙන සිටියේ පර්වතයේ පැහැයටම සමාන පැහැයෙන් යුත් ග්‍රීක කබායකි. ඇගේ කෙස්වැටිය දුඹුරු, තඹ සහ අළුයන පැහැයන්ගේ මිශ්‍රණයක් විය. එබැවින් ඒවා වියළි තණකොළ මෙන් පෙනී ගියේය. ඇය නිසැකවම අදෘශ්‍යමාන අයකු නොවුණත්, චලනය වන තුරුම ඇය සිටින බව සොයාගැනීමට නොහැකි තරමට කදිමට වේෂාන්තරණය' වී සිටියාය. එවිට පවා, ලියෝට ඇයව හඳුනා ගැනීම අපහසු විය. ඇගේ වත රූමත් වූ නමුත්,

1 අවට පරිසරයට ගැලපෙන ලෙස සිරුරේ පැහැය වෙනස් කර ගැනීම

මතක හිටින රුමත් බවක් එහි නොතිබිණි. ඇසිපිය හෙළන වාරයක් පාසා ලියෝට මතුවූ ගැටලුව වූයේ ඇය සිටින තැන හඳුනා ගැනීමයි.

"හෙලෝ," හේසාල් පැවසුවාය. "ඔයා කවුද?"

"ඔයා කවුද?" කෙල්ල පැනයකින්ම පිළිතුරු දුන්නාය. ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම වෙහෙසකර එකක් වූවා සේ ඇගේ හඬ ද විඩාපත් විය.

හේසාල් සහ ලියෝ එකිනෙකාගේ මුහුණ බලා ගත්හ.

"නෙමසිස් කියපු සාපලත් දරුවා මෙයාද?" ලියෝ විමසුවේය. "ඒත් එයා කෙල්ලෙක්නෙ."

"එයා කෙල්ලෙක්," කෙල්ල පැවසුවාය.

"සමාවෙන්න." ලියෝ පැවසුවේය.

"සමාවෙන්න." කෙල්ල දුක්මුසු ලෙස පැවසුවාය.

"ඔයා ඒකම කියවනවා..." ලියෝ නැවතිණි. "ඕහ්, ඔහොම ඉන්න, හේසාල්, කෙල්ලත් හැමවෙලාවෙම පුනරුච්ඡාරණය කරන එක ගැන මිත්‍යා කතා එහෙම නැද්ද?"

"එකෝ," හේසාල් පැවසුවාය.

"එකෝ," කෙල්ල එකඟ වූවාය. ඇය එසැවුණාය. ඇගේ ඇඳුම තු දර්ශනයට ගැලපෙන සේ වෙනස් විය. ඇගේ ඇස් ලවණ ජලයේ පැහැය ගත්තේය. ලියෝ ඇගේ දේහ ලක්ෂණ හඳුනා ගැනීමට උත්සාහ කළත් ඔහුට එය කළ නොහැක්කක් විය.

"මට එහෙම මිත්‍යා කතාවක් මතක නෑ," ඔහු පැවසුවේය. "ඔයාට ඇහෙන අවසන් දේ නැවත කියන විදිහට ඔයාව සාපයට ලක්වෙලාද?"

"ඔයාට ඇහුණ." එකෝ පැවසුවාය.

"අසරණී, " හේසාල් දුක් වූවාය. "මගේ මතකය නිවැරදිනම් මේක කළේ දෙවඟන."

"මේක කළේ දෙවඟන." එකෝ තහවුරු කළාය.

ලියෝ හිස කැසුවේය. "ඒත් ඒකට අවුරුදු දහස් ගණනක් වෙන්න බැහැ. ඔයා මරණයේ දොරටු අතරින් ආව කෙනෙක් වෙන්න ඕනෙ. මම ඇත්තටම ප්‍රාර්ථනා කරනවා මියගිය මිනිසුන් අතරින් යන එක නවත්තන්න ඕනෙ කියලා."



"මැරුණු මිනිසුන්." එකෝ පැවසුවාය.

හේසාල් බිම බලාගෙන සිටින බව ලියෝ දුටුවේය.

"ආහ්... සමාවෙන්න-" ඔහු මිමිණුවේය. "මම ඒ විදිහට හිතුවෙ නෑ."

"ඒ විදිහට," එකෝ දූපතේ ඈත අන්තයට අත දිගු කළාය.

"ඔයාට ඕනෙ අපිට මොනවහරි පෙන්වන්නද?" හේසාල් විමසුවාය. ඇය ගල්කුළෙන් පහළට බැස්සාය. ලියෝ ද ඇය අනුව පහළට බැස්සේය.

සමීපයේදී පවා එකෝ ව දැක ගැනීම අසීරු දෙයක් විය. ඔහු ඇය දෙස බලා සිටින තරමට, ඇය අදෘශ්‍යමාන වන බව පෙනිණි.

"ඔයා සැබෑ කෙනෙක් කියල විශ්වාසද?" ඔහු විමසුවේය. "මම අදහස් කළේ මස් ලේ වලින් හැදුණු කෙනෙක්ද?"

"මස් ලේ." ඇය ලියෝගේ මුහුණ ඇඟිලි වලින් ස්පර්ශ කළාය. ඇගේ ඇඟිලිවල උණුසුමක් රැඳී තිබිණි.

"ඉතිං... ඔයාට හැමදෙයක්ම නැවත කියන්න සිද්ධ වෙනවා ද?" ඔහු විමසුවේය.

"හැම දෙයක්ම."

ලියෝට සිනාව නවතාගත නොහැකිවිය. "ඒක හරි අපූරුයි."

"අපූරුයි." ඇය නොසතුටින් පැවසුවාය.

"නිල් අලියා."

"නිල් අලියා."

"මාව ඉඹපන් මෝඩයා."

"මෝඩයා."

හේයි."

"හේයි."

"ලියෝ," හේසාල් විරෝධය පෑවාය. "එයාව අපහසුවට පත් කරන්න එපා."

"හරි, හරි," ලියෝ පැවසුවේය. "ඉතිං...ඔයා මොනවද බලාපොරොත්තු වෙන්නේ, ඔයාට අපේ උදව් ඕනෙද?"

"උදව්." එකෝ සතුටින් එකඟතාව පළ කළාය. ඇය තමා පසුපස එන ලෙස ඔවුන්ට සංඥා කර බෑවුමේ පහළට ගමන් කරන්නට වූවාය. ලියෝට ඇයව අනුගමනය කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි.

"අපි ඉක්මන් කළොත් හොඳයි," හේසාල් පැවසුවාය. "නැත්නම් අපිට එයාව මගහැරෙයි."

හොඳ පෙනුමැති කෙල්ලන් පිරිසක් ප්‍රශ්නයක් ලෙස ඔබ හඳුන්වන්නේ නම්, ඔවුන්ට දැන් හමුවී තිබෙන්නේ එවැනි ප්‍රශ්නයකි. පිපිරුමකින් ඇති වූ ආවාටයක හැඩය ගත් තෘණවලින් වැසුණු ස්ථානයකට එකෝ ඔවුන් කැඳවාගෙන ගියාය. එහි මැද කුඩා පොකුණක් තිබිණි. දිය තලය අද්දර එක්වී සිටියේ දුසිම් ගණනක් වූ කිඳුරියන් සමූහයකි. අඩුම වශයෙන් ඔවුන් කිඳුරියන් වන්නට ඇතැයි ලියෝ අනුමාන කළේය. අර්ධ ලෝහිත කඳුවුරේ සිටිවුන් මෙන්, මොවුන්ද සිනිඳු මකුළු දැලින් කළ ඇඳුම් හැඳ සිටියහ. ඔවුන්ගේ පාද තිරුවත් වූ අතර, සමේ වූයේ මඳ කොල පැහැයකි.

ඔවුන් කුමක් කරමින් සිටින්නේදැයි ලියෝට තේරුම් ගත නොහැකි වුවත්, ඔවුහු සියල්ලෝම එක් ස්ථානයකට රැස්වී පොකුණට මුහුණු හරවාගෙන සිටියහ. කීපදෙනෙක් ජංගම දුරකථන කැමරා අත දරාගෙන අන් අයගේ හිස්වලට ඉහළින් එබෙමින් ඡායාරූප ගැනීමට උත්සාහ කළහ. දුරකථන අතැති කිඳුරියන් ලියෝ මින්පෙර දැක තිබුණේ නැත. ඔවුන් බලා සිටින්නේ මළ සිරුරක් දෙස දැයි ලියෝ පුදුමයට පත් විය. එසේනම්, ඔවුන් උඩපනිමින් සිනාසෙන්නේ ඇයි?

"එයාල මොනවද බලන්නේ?" ලියෝ විමසුවේය.

"බලන්නේ." එකෝ සුසුමක් හෙළුවාය.

"හොයාගන්න එක විදිහයි තියෙන්නේ." හේසාල් කිඳුරියන් සිටි දෙසට ගියාය. "සමාවෙන්න, සමාවෙන්න."

"ඒයි!" එක් කිඳුරියක් මැසිවිලි නැගුවාය. "අපියි මෙතනට මුලින්ම ආවේ!"

"ඔව්," තවත් එකියක් පැවසුවාය. "එයා ඔයාට කැමති වෙන එකක් නෑ."

දෙවැනි එකියගේ කම්මුල් මත විශාල හදවත් දෙකක් රතු පැහැයෙන් සලකුණු කර තිබිණි.



"ආහ්, උපදෙව්වරුන්ගේ වැඩක්." ලියෝ බැරෑරුම් හඬක් මවා ගනිමින් පැවසුවේය. "පොඩ්ඩක් ඉඩ දෙන්න. ස්තූතියි."

කිඳුරියන් නොසතුටින් මුමුණන්නට වූවත්, ඔවුහු මඳක් මෑත් වන විට, තරුණ මිනිසෙක් පොකුණ අද්දර දණ ගසාගෙන ජලය දෙස බලා සිටින අයුරු පෙනිණි.

ලියෝ සාමාන්‍යයෙන් අනෙක් අයගේ පෙනුම ගැන අවධානය යොමු කරන්නකු නොවේ. තම කණ්ඩායමේ අයගේ පෙනුම ගැන පවා ඔහුගේ අවධානයක් නොතිබිණි.

එහෙත් කුමන ආකාරයකින් බැලුවත්, පොකුණ අසල සිටි මිනිසා සුපිරි පෙනුමකින් යුත් අයකු බව ලියෝට පිළිගැනීමට සිදුවිය. ඔහුගේ මුහුණ ප්‍රතිමාවක් බඳු විය. ගැහැනියකගේ රූමත් බවත්, පිරිමියකුගේ දේහධාරී කඩවසම් බවත් මිශ්‍ර වූ අපූරු පෙනුමක් ඔහු කෙරෙන් දිස්විය. ඔහු දාහත් හැවිරිදි වියේ හෝ විසි හැවිරිදි වියේ සිටින බව පෙනුණත්, එය නිසැකවම පැවසීමට අසීරු විය. එහෙත් ඔහුගේ දේහ විලාසය නර්තන ශිල්පියකුට සමාන විය. ඔහු හැඳ සිටියේ සරල සුදු ටී ෂර්ට් එකක් හා ජීන්සයකි. දුන්නක් සහ හී කොපුවක් පිටේ එල්ලී තිබිණි. සැහෙන කාලයක් එම අවි පාවිච්චියට ගෙන නොතිබූ බව පෙනී ගියේය. ඒ තල දූවිල්ලෙන් වැසී ගොස් තිබූ අතර දුන්නේ මුදුනේ මකුළු දැල් බැඳී තිබිණි.

ලියෝ පොකුණ අද්දරට සමීප වෙද්දී, ඔහුගේ මුහුණ අසාමාන්‍ය ලෙස රන්වන් පැහැති බව ලියෝට පෙනී ගියේය. බැස යන හිරු රශ්මියෙන් පොකුණ පතුලේ තිබූ විශාල දිව්‍යමය ලෝකඩ තහඩුවක් දිලිසෙමින් තිබිණි. එයින් පරාවර්තනය වන ඔහුගේ ප්‍රතිබිම්භයෙන් මිනිසා සතුටු වෙමින් සිටියේය.

හේසාල්ට හුස්ම ගැනීමට අමතක වී තිබිණි. "එයා හරිම ලස්සනයි."

ඇය වටා සිටි කිඳුරියෝ එකඟතාව පළ කිරීමට අත්පොලසන් නැගුහ.

"මම," මිනිසා සිහිනයෙන් මෙන් මිමිණුවේය. එහෙත් තවමත් ඔහුගේ බැල්ම යොමුවී තිබුණේ පොකුණටය. "මම එච්චර ලස්සනද?"

එක් කිඳුරියක් සිය අයි ෆෝනයේ තිරය පෙන්වූවාය. "එයාගෙ අලුත්ම යූ ටියුබ් වීඩියෝ එකට පැයක් ඇතුළත මිලියන ගාණක් ලයික් කරල තියෙනවා. මම හිතන්නෙ මමත් එයින් එක්කෙනෙක්."

අනෙක් කිඳුරියෝ සිනාසුණාහ.

"යූ ටියුබ් වීඩියෝව?" ලියෝ විමසුවේය. "වීඩියෝ එකක ... මොනවද කරන්නේ, සිංදු කියනවද?"

"නෑ, මෝඩයෝ," කිඳුරිය පැවසුවාය. "එයා කුමාරයෙක් වගේම පුදුමාකාර දඩයක්කාරයෙක්. ඒ වගේ දේවල් තමයි. ඒත් ... ප්‍රශ්නයක් නෙමෙයි. දැන් එයා හරියට...මේ බලන්න!" ඇය ලියෝ... වීඩියෝව පෙන්වූවාය.

ඒ ඔවුන් දැනටමත් දකිමින් සිටින දෙයමය - හාදයා පොකුණ... දෙස බලා සිටී.

"එයා හරිම සරාගිකයි." තවත් කෙල්ලක් පැවසුවාය. ඇගේ ... ෂර්ටයේ MRS NARCISSUS ලෙස සටහන් කර තිබිණි.

"නාසිසස්'?" ලියෝ විමසුවේය.

"නාසිසස්." එකෝ දුක්මුසුව එකඟතාව පළකළාය.

එකෝ එතැන සිටින බව ලියෝට අමතකව ගොස් තිබුණේය. කිසිදු කිඳුරියකටවත් ඇය එහි සිටින බව අවධානයට ලක්වූ බවක් නොපෙනුණි.

"ඕහ්, උඹ ආයෙත් එපා!" නාසිසස් එකෝව ඉවතට තල්ලු කිරීමට උත්සාහ කළේය. එහෙත් වේෂාන්තරණය වූ කෙල්ල සිටින්නේ කොතනදැයි හඳුනාගත නොහැකි වූ බැවින් ඔහු පසෙකට තල්ලු විය.

"ඔයාට ඔයාගෙ අවස්ථාව ලැබුණා, එකෝ!" අයි ෆෝනය අතැති කෙල්ල පැවසුවාය. "එයා ඔයාව හැලුවෙ අවුරුදු හාරදහසකට කළින්! ඔයා එයාට ගැලපෙන්නෙ නැහැ."

"ඔහුට." එකෝ පැවසුවාය.

"ටිකක් ඉන්න," හේසාල්ට පැහැදිළිවම කඩවසම් හාදයා වෙතින් නෙත් ඉවතට ගැනීමට නොහැකිව සිටියත් ඇය අසීරුවෙන් ඒ හැඟීම මැඩ පවත්වා ගත්තාය.

"මොනවද මෙතන වෙන්නේ? ඇයි එකෝ අපිව මෙතෙන්ට ගෙනාවෙ?"

1 ග්‍රීක දඩයක්කරුවකුව සිටි ඔහු තම රූපය නිසා කීර්තියට පත්විය. අධික ආඩම්බර අයකු වූ ඔහු තමාට ආලය කළවුන් හෙලා දැක්කේය. මෙය දුටු නෙමිසිස් ඔහුව පොකුණකට ආකර්ෂණය කර එයින් දකින ඔහුගේම ප්‍රතිබිම්භයට ආදරය කිරීමට සැලැස්සුවාය. තම ප්‍රතිබිම්භයේ අලංකාරයෙන් ඉවත්වීමට නොහැකිව නාසිසස් මිය ගියේය.



එක් කිඳුරියක් දෑස් හැටවූවාය. ඇය සමරු පොතක් සහ පෑනක් ද නාසිසස්ගේ පෝස්ටරයක් ද අත දරා සිටියාය. "එකෝත් අපි වගේම කිඳුරියක්. බොහොම කාලෙකට ඉස්සර, ඒත් එයා එහෙම පිටින්ම වාචාල එකියක්. ඕපදූපකාරියක්. හැමදාම."

"මම දන්නවා," තවත් කිඳුරියක් කෑ ගැසුවාය. "එක දවසක් මම ක්ලියොපියාට - ඔයා දන්නවනේ එයා ඉන්නෙ මට යාබද ගල් කුළේ බව- කිව්වා ඕපදූප කියන එක නවත්තන්න, නැත්නම් ඔයාටත් වෙන්නෙ එකෝට වෙච්ච දේ කියලා. ක්ලියෝපියාට තිබුණෙ එච්චර ලොකු කටක්. ඔයාට ඇහිල තියෙනවද එයා වළාකුළු කිඳුරියයි, නරාශ්වයයි ගැන කියන කතාව?"

"සම්පූර්ණයෙන්ම," පෝස්ටරය අතැති කිඳුරිය පැවසුවාය. "ඉතිං, කොහොමවුණත්, කියවිල්ලට දඬුවමක් විදිහට, හේරා එකෝට සාප කළා. එයාට පුළුවන් කියපු දෙයක් නැවත කියන්න විතරයි. ඒත් එකෝ අපේ ලස්සන හාදය නාසිසස්ට ආදරේ කළා - හරියට මනු සදාකාලිකව ඇයව පතාගෙන ඇවිත් වගේ."

"වගේ!" කිඳුරියන්ගෙන් අඩක් පමණ එකවිට පැවසූහ. "දැන් එයාට අමුතු අදහසක් ඇවිත් තියෙනවා නාසිසස්ව බේර ගන්න ඕනෙ කියලා. "නාසිසස් මහත්මිය ලෙස ටී ෂර්ටයේ සටහන් කරගෙන සිටි කිඳුරිය පැවසුවාය. "එයා ඉවතට යා යුතුයි."

"ඉවතට යා යුතුයි." එකෝ පැවසුවාය.

"මට හරිම සතුටුයි නාසිසස් ආයෙත් ජීවත්වීම ගැන," අළු පැහැති ඇඳුමින් සැරසුණ, තවත් කිඳුරියක් පැවසුවාය. ඇගේ අතේ පහළට විහිදෙන ලෙස කළු පැනකින් NARCISSUS + LAIEA යනුවෙන් සටහන් කර තිබිණි. "එයා කැමති හොඳම කෙනාට. ඒ වගේම එයා ඉන්නෙ මගෙ භූමි ප්‍රදේශයේ."

"ආහ්, ඕක නවත්තගන්න, ලායියා," ඇගේ මිතුරියක පැවසුවාය. " මම පොකුණු කිඳුරියක්. ඔයා නිකම්ම පර්වත කිඳුරියක්."

"නෑ, එයා නිසැකවම මෙහෙට එන්න ඇත්තේ එයා කැලෑ මල්වලට කැමති නිසයි." තවෙකෙකු පැවසුවාය. " ඒවා මගේ."

සියලු කිඳුරියෝ වාදයක පැටලී සිටින අතරතුර, ඔවුන්ව නොතකා හරිමින් නාසිසස් විල දෙස බලා සිටියේය.

"ඔහොම ඉන්න!" ලියෝ බෙරිහන් දුන්නේය. "කෙල්ලනේ, ඔහොම ඉන්න! මට නාසිසස්ගෙන් අහන්න දෙයක් තියෙනවා."

ක්‍රමයෙන් කිඳුරියන් සන්සුන් වී නැවත ඡායාරූප ගැනීම පටන් ගත්හ.

ලියෝ කඩවසම් ජේත්තුකාරයා අසල දණ ගසා ගත්තේය. "ඉතිං, නාසිසස්, මොකද වෙන්නේ?"

"ඔයාට හෙලවෙන්න පුළුවන්ද?" නාසිසස් විමසුවේය. "ඔයා දර්ශනය අවහිර කරනවා."

ලියෝ ජලය දෙස බැලුවේය. අඩක් ගිලුණු ලෝකඩ තහඩුව මත නාසිසස් අසලින් ලියෝගේ ප්‍රතිබිම්භයද සටහන් වී තිබිණි. තමාගේ රූ දෙස බලා සිටීමට ලියෝගේ කිසිදු කැමැත්තක් නොතිබිණි. නාසිසස් සමග බලන විට ඔහු විරූපී අයෙකි. එහෙත් සැකයක් නොමැතිව ඒ ලෝහය දළ වශයෙන් කවාකාර වන ලෙස තැලූ විෂ්කම්භය අඩි පහක් පමණ වූ දිව්‍යමය ලෝකඩ තහඩුවකි.

එය පොකුණේ කුමක් කරන්නේ දැයි ලියෝට සිතාගත නොහැකි විය. දිව්‍යමය ලෝකඩ පෘථිවියට පතිත වන්නේ අමුතු ස්ථානවලට ය. බොහෝ කැබලි තම පියාගේ වැඩපළින් ඉවත් කළ ඒවා බව ඔහු අසා තිබිණි. ව්‍යාපෘතියක් අසාර්ථක වූ විට හෙපියාස්ටස්ගේ ඉවසීම නැති වී ඔහු තම ලෝකඩ කැබලි මනුෂ්‍ය ලෝකයට විසිකර දැමුවේය. මේ කැබැල්ලේ පෙනුම අනුව එය දෙවියකුගේ පලිහක් ලෙස පෙනිණි. එහෙත් එය ක්‍රමානුකූලව නිමවා තිබුණේ නැත. ලියෝට එය නැවට ගෙන යාමට හැකිවුවහොත්, එහි ඔවුගේ අලුත්වැඩියා සඳහා ප්‍රමාණවත් තරමට ලෝකඩ තිබෙන බව පෙනී ගියේය.

"හරි, නියම දර්ශනය," ලියෝ පැවසුවේය."සතුටුයි දැක්කට, ඒත්, ඔයා ඒක පාවිච්චි කරන්නෙ නැත්නම්, මට ඒ ලෝකඩ තහඩු කැල්ල ගන්න පුළුවන්ද?"

"නෑ!" නාසිසස් පැවසුවේය. "මම ඔහුට කැමතියි. එයා හරිම ලස්සනයි."

කිඳුරියන් සිතාසෙන්නේදැයි බැලීමට ලියෝ වටපිට බැලුවේය. මෙය ලොකුම විහිලුවකි. එහෙත් ඔවුහු ඒකඟත්වය පළ කරමින් හිස් සෙලවූහ. හේසාල් පමණක් නාසය පිරිමදිමින් බිම බලාගෙන සිනාසෙන්නට වූවාය.

"මිනිහෝ," ලියෝ නාසිසස්ට පැවසුවේය. "ඔයා තේරුම් ගන්න ඕනෙ ඔයා වතුරෙ දකින්නෙ ඔයාගෙම රූපය කියන එක."



"මම එච්චර විශිෂ්ටයි," නාසිසස් සුසුමක් හෙලුවේය. ඔහු ජලය ස්පර්ශ කිරීමට අත දිගු කළත් නැවත එය ආපසු ඇද ගත්තේය. "නෑ, මට ජල තරංග ඇති කරන්න බැහැ. ඒකෙන් රූපය නැති වෙලා යයි. වාව්... මම කොච්චර විශිෂ්ටද?"

"ඔව්," ලියෝ මිමිණුවේය. "ඒත් මම ලෝකඩ තහඩුව ගත්තත් ඔයාට ජලයෙන් ඔයාගෙ රූපය දැක ගන්න පුළුවන් එහෙම නැත්නම්, මෙන්න ." තම උපකරණ පටියට අත දැමූ ඔහු කුඩා කණ්ණාඩියක් පිටතට ගත්තේය.

නාසිසස් කණ්ණාඩිය අතට ගත්තේය. "ඔයා මගෙ ඡායාරූපයකුත් තියාගෙන ඉන්නවද? මම ඔයාට දොස් කියන්නෙ නෑ. මම ලස්සනයි. ස්තුතියි." කණ්ණාඩිය පහතට දැමූ ඔහු තම අවධානය නැවත පොකුණට යොමු කළේය. "ඒත් මට දැනටමත් ඊට වඩා හොඳ රූපයක් තියෙනවා."

"ඔහ්. දෙවියනේ ඔව්!" කිඳුරියන් කෑ ගැසූහ. "මාව විවාහ කරගන්න, නාසිසස්!"

"නෑ, මාව!" තවෙකකු කෑ ගැසුවේය. "ඔයා මගෙ පෝස්ටරයෙ අත්සන් කරනවද?"

"නෑ, මගෙ කමිසෙ."

"නෑ, මගෙ නළලෙ."

"නෑ, මගෙ - "

"ඔක නවත්තගන්න," හේසාල් කෑ ගැසුවාය.

"ඔක නවත්තගන්න." එකෝ පැවසුවාය.

ලියෝට නැවත එකෝගේ දර්ශනය නොපෙනී ගොස් තිබිණි. එහෙත් ඇය නාසිසස්ගේ අනෙක් පැත්තේ දණ ගසාගෙන සිටින බව ඔහුට අවබෝධ විය. ඇය ඔහුගේ මුහුණ ඉදිරිපිට අත වනමින්, ඔහුගේ අවධානය බිඳ දැමීමට උත්සාහ කළාය. නාසිසස් ඇසිපිය පවා නොගැසුවේය.

කිඳුරු රසික සමාජය හේසාල්ව මාර්ගයෙන් ඉවත් කිරීමට උත්සාහ කළහ. එහෙත් තම අසිපත අතට ගත් ඇය ඔවුන්ව පසුපසට පැන්නුවාය.

"එයාට ඔයාගෙ කඩුවෙ අත්සන් කරන්න ඕනෙ නැහැ." පෝස්ටරය අතැති කිඳුරිය මැසිවිලි නැගුවාය.

"එයාට ඔයාව විවාහ කරගන්න ඕනෙත් නැහැ." අයි ෆෝත් කෙල්ල පැවසුවාය.

"ඒ වගේම ඔයාලට එයාගෙ ලෝකඩ කණ්ණාඩිය ගන්න බැහැ. එකෙන් තමයි එයාව මෙහෙ තියාගෙන ඉන්නෙ."

"උඹල සේරම මෝඩියො," හේසාල් පැවසුවාය. "කොහොමද උඹල එයාට කැමති වුණේ?"

"මම හරිම සරාගිකයි." නාසිසස් පැවසුවේය.

"නාසිසස්, අහන්න," හේසාල් ඇගේ අසිපත සූදානම් කරගෙන පැවසුවාය. "එකෝ අපිව මෙහාට ගෙනාවෙ ඔයාට උදව් කරන්න. එහෙම නේද, එකෝ?"

"එකෝ," එකෝ පැවසුවාය.

"කවුද?" නාසිසස් විමසුවේය.

"ඔයාට මොකද වෙලා තියෙන්නෙ කියල සැලකිල්ලක් දක්වන එකම කෙල්ල," හේසාල් පැවසුවාය. "ඔයාට මතකද මැරෙනවා?"

නාසිසස් මූහුණ හැකිළුවේය. "මම... නෑ. ඒක තිවැරදි වෙන්න බෑ. මම මරණයට වැදගත් වැඩියි."

"ඔයා ඔයා දිහාම බලාගෙන ඉඳල මැරුණා." හේසාල් පැවසුවාය. "මට දැන් කතාව මතකයි. නෙම්සිස් තමයි ඔයාට සාප කළේ, මොකද ඔයා ගොඩක් දෙනෙක්ගේ හදවත් බිඳ දැම්මා. ඔයාගෙ දඬුවම තමයි ඔයාගෙම ප්‍රතිබිම්භයට ආදරය කිරීම."

"මම මට ගොඩක් ආදරෙයි," නාසිසස් එකඟ විය.

"අන්තිමේදි ඔයාම මැරුණා." හේසාල් නැවත පැවසුවාය. "මම දන්නෙ නෑ කතාවෙ මොන සංස්කරණයද ඇත්ත කියලා. එක්කෝ ඔයාව ගිලිල මැරුණා, නැත්නම් ජලයට ඉහලින් එල්ලෙන මලක් වුණා. දෙකෙන් කොයිකද හරි?"

"කොයිකද හරි?" එකෝ අසරණ ලෙස පැවසුවාය.

ලියෝ නැගිට්ටේය. "ඒකෙ ප්‍රශ්නයක් නැහැ. වැදගත් දේ ඔයා ආයෙත් පණ පිටින් ඉන්න එකයි මිනිහෝ. ඔයාට දෙවැනි අවස්ථාවක් ලැබුණා. ඒක තමා නෙම්සිස් අපට කිව්වේ. ඔයාට නැගිටලා ගිහින් ජීවිතේ ගෙවන්න පුළුවන්. එකෝ උත්සාහ කරන්නෙ ඔයාව බේරග



න්න. එහෙම නැත්නම් ඔයාට පුළුවන් මෙතන ඉඳගෙන ආයෙත් මැරෙනකම් ඔයා දිහාම බලාගෙන ඉන්න."

"මෙහෙ ඉන්න." සියලු කිඳුරියෝ කෑ ගැසූහ.

"මැරෙන්න කලින් මාව විවාහ කරගන්න." තවෙකකු කෑ ගැසුවේය.

නාසිසස් තම හිස සැලුවේය. "ඔයාට ඕනෙ කරල තියෙන්නෙ මගෙ ප්‍රතිබිම්භය විතරයි. මම ඔයාට දොස් කියන්නෙ නෑ. ඒත් ඔයාට ඒක ගන්න බැහැ. මම අයිති මටයි."

හේසාල් නොරිස්සුමෙන් සුසුමක් හෙලුවාය. ඇය වේගයෙන් බැස යමින් තිබෙන හිරු දෙස බැලුවාය. "ලියෝ අපට විනාඩියක් කතා කරන්න පුළුවන්ද?"

"සමාවෙන්න," ලියෝ නාසිසස්ට පැවසුවේය. "එකෝ, ඔයාටත් එන්න ඕනෙද?"

"එන්න ඕනෙද?" එකෝ තහවුරු කළාය.

හේසාල් කිඳුරියන්ගෙන් තරමක් ඈතට ගියාය. "නෙම්සිස් කිව්ව හරි." ඇය පැවසුවාය. "සමහර උපදෙවියන්ට එයාලගෙ ස්වභාවය වෙනස් කරන්න බැහැ. නාසිසස් ආපහු මැරෙනකම් මෙතන ඉන්න හදන්නෙ."

"නෑ." ලියෝ පැවසුවේය.

"නෑ." එකෝ එකඟ වූවාය.

"අපට ඒ ලෝකඩ ඕනෙ." ලියෝ පැවසුවේය. "අපි ඒක ඉවතට අරන් ගියොත්, ඒකෙන් නාසිසස්ට එතනින් ඉවත්වෙන්න හේතුවක් ලැබෙයි. එකෝට එයාව බේරගන්න අවස්ථාවක් ලැබෙයි."

"එයාව බේරගන්න අවස්ථාවක්." එකෝ සතුටින් පැවසුවාය.

හේසාල් අසිපත වැල්ලේ සිටවූවාය. "ඒකෙන් මෙතන ඉන්න දූසිම් ගාණක් කිඳුරියො අපි එක්ක කේන්ති ගන්න පුළුවන්." ඇය පැවසුවාය. "ඒ වගේම නාසිසස් තවමත් දන්නවා ඇති එයාගෙ දුන්න පාවිච්චි කරන්නෙ කොහොමද කියලා."

ලියෝ ඒ ගැන සිතා බැලුවේය. හිරු බැස යාමට ආසන්න වෙමින් තිබිණි. අඳුරු වැටුණු පසු නාසිසස් කැළඹෙන බව නෙම්සිස් සඳහන් කළාය. සමහරවිට ඒ ඔහුගේ ප්‍රතිබිම්භය නොපෙනී යන

නිසා විය හැකිය. දෙවගත කැළඹීම යනුවෙන් සඳහන් කළ දෙයෙහි අර්ථය සෙවීමට ලියෝ කාලය වැය නොකළේය. ඔහුට උමතු කිඳුරියන් සමගද කටයුතු කර අත්දැකීම් තිබිණි. එය නැවතත් කිරීමට ඔහු පසුබට නොවිය.

''හේසාල්,'' ඔහු පැවසුවේය. ''වටිනා ලෝහ එක්ක තියෙන ඔයාගෙ බලය - ඔයාට පුළුවන් ඒව අඳුන ගන්න විතරද? නැත්නම් ඒව ඇත්තටම කැඳවන්නත් පුළුවන්ද?''

ඇය මුහුණ හැකිළුවාය. ''සමහරවෙලාවට මට ඒවා කැඳවන්න පුළුවන්. මම මීට කළින් එච්චර ලොකු දිව්‍යමය ලෝකඩ කැලි ගැන උත්සාහ කරල නෑ. මට ඒවා පෘථිවියෙන් ලබාගන්න පුළුවන්. ඒත් ඒක ටිකක් අමාරුයි. ඒකට ගොඩක් සිත එකඟ කර ගන්න ඕනෙ. ඒ වගේම වේගවත් නෑ.''

ලියෝ සාප කළේය. ඔහු බලාපොරොත්තු වූයේ ආපසු නැවට යාමටය. එයින් හේසාල්ට දිව්‍යමය ලෝකඩ කැඳවීමට හැකි ආරක්ෂිත දුරක් ලැබෙන ඇත.

''හරි,'' ඔහු පැවසුවේය. ''අපිට ටිකක් අවදානම් දේකට උත්සාහ කරන්න වෙනවා. හේසාල්, කොහොමද ඔයා මෙතන ඉඳලම ලෝකඩ කැඳවන්න උත්සාහ කළොත්? ඒක වැල්ලෙ ගිලෙන්න සලස්වලා, ඊට පස්සෙ පොළොව යටින් ඔයා ළඟට ආවම, අරගෙන නැවට යමු.''

''ඒත් නාසිසස් හැමවෙලාවෙම ඒක දිහා බලාගෙන ඉන්නේ.'' ඇය පැවසුවාය.

''හැමවෙලාවෙම.'' එකෝ පැවසුවාය.

''ඒ වැඩේ මටම කරන්න වෙයි.'' දැනටමත් තමාගෙ'ම සැලසුමක් සාදාගෙන සිටි ලියෝ පැවසුවේය. ''එකොයි, මමයි, විකර්ෂකයක් ඇති කරන්නම්.''

''විකර්ෂකයක්.'' එකෝ විමසුවාය.

''මම පැහැදිළි කරන්නම්.'' ලියෝ පෙරොන්දු විය. ''ඔයා කැමතිද?''

''කැමතියි.'' එකෝ පැවසුවාය.

''විශිෂ්ටයි,'' ලියෝ පැවසුවේය. ''දැන්, අපි බලාපොරොත්තු වෙමු අපිට මැරෙන්න වෙන එකක් නෑ කියලා.''

# 08
## ලියෝ

ලියෝ අතිශයින් කාර්යබහුල වී සිටියේය. මින්ට් කීපයක් සහ වැද්දුම් සඳහා භාවිතා කරන කණ්ණාඩි යුගලක් ඔහු තම උපකරණ පටියෙන් කැඳවා ගත්තේය. මේ කණ්ණාඩි නියම අව් කණ්ණාඩි නොවුණත්, ඒවායින් එම කාර්යයද කර ගැනීමට හැකි විය. ඔහු තම කමිසයේ අත් නවා ගත්තේය. තම කෙස්වැටිය පිටුපසට කර තබා ගැනීම සඳහා යන්ත්‍රවලට දමන තෙල් වර්ගයක් භාවිත කළේය. ඔහු තම පසුපස සාක්කුවේ ඉස්කුරුප්ප අඬුවක් දමාගෙන සිටියත් ඒ කුමක් සඳහා දැයි ඔහුවත් නොදැන සිටියේය. ''ඔයා මොනවද කල්පනා කරන්නේ?'' ඇගේ හඬෙහි නොරිස්සුමක් ගැබ් වී තිබිණි.

''මම හිතන්නෙ නැතුව ඉන්න උත්සාහ කරනවා,'' ලියෝ පැවසුවේය. ''මේ දිව්‍යමය ලෝකඩ ගත්ත ඒක ගැන විතරයි මම හිතන්නේ. එකෝ, ඔයා ලැස්තිද?''

''ලැස්තියි,'' ඇය පැවසුවාය.

ලියෝ ගැඹුරු හුස්මක් ගත්තේය. තමා කෙරෙන් කිසියම් විකාරරූපී බවක් පළ නොවෙතැයි අපේක්ෂාවෙන් ඔහු පොකුණ අසලට ගියේය.

කිඳුරියෝ පුදුමයෙන් විසිරී ගියහ. ඔවුන් තමාට කරදරයක් බව පෙන්වීමට මෙන් ලියෝ ඔවුන්ව ඉවතට පලවා හැරියේය. ''සමරු අත්සන් දෙන්න බෑ, කෙල්ලනේ. මම දන්නවා ඔයාලා මා එක්ක කාලය

ගත කරන්න ඕනේ කියලා. ඒත් මම ඔවට නෑ. ඔයාලා අර කැත, නාසිසස් වටේ කැරකෙනව නම් හොඳයි. එයා තොණ්ඩියෙක්නේ."

"තොණ්ඩියෙක්!" එකෝ සතුටින් පැවසුවාය.

කිඳුරියෝ කෝපයෙන් මුමුණන්නට වූහ.

"ඔයා මොනවද කියවන්නේ?" එකියක විමසුවාය.

"උඹ තොණ්ඩියෙක්!" තවත් එකියක පැවසුවාය.

තම කණ්ණාඩි සකසා ගත් ලියෝ සිනා නැඟුවේය. ඔහු තම බාහුවේ මස් පිඬු පුම්බා පෙන්නුවත්, ඒවායේ පිම්බීමට තරම් මස් ගොබ නොතිබිණි. ඔහු තම Hot Stuff පච්චය පෙන්වූයේය.

"ඔයාලා දන්නවද නාසිසස් කොච්චර කැතද කියලා?" ලියෝ කිඳුරියන්ගෙන් විමසුවේය. "එයා ඉපදුන වෙලාවෙ එයාගේ අම්මා හිතුවේ එයා නරාශ්වයෙක් කියලා."

සමහර කිඳුරියෝ ගැස්සුණු බවක් පෙනිණි. නාසිසස් රවාගෙන සිටියේය.

"ඔයාලා දන්නවද එයාගෙ දූත්තෙ මකුළු දැල් තියෙන්නෙ ඇයි කියලා?" ලියෝ නැවත පැවසුවේය. "එයා ඒක පාවිච්චි කරන්නෙ රටඉඳි කඩන්න. ඒත් එයාට එකක්වත් හොයාගන්න බැරි වුණා."

එක් කිඳුරියක් සිනා නැඟුවාය. සෙස්සෝ වැලමිටෙන් ඇන ඇයව නිහඬ කළහ.

නාසිසස් ලියෝ දෙසට හැරී දොස් පවරන්නට විය. "උඹ කවුද?"

"මම සුපිරි කොල්ලෙක්," ලියෝ පැවසුවේය. "මම ලියෝ වැල්ඩේස්, නරක කොල්ලෙක්. ඒ වගේම කෙල්ලො කැමතිත් නරක කොල්ලන්ට."

පැනක් පිටතට ගත් ලියෝ එක් කිඳුරියකගේ අත්ල මත සමරු සටහනක් තැබුවේය. "නාසිසස් පරාජිතයෙක්! ඒ වගේම දුර්වලයෙක්. තොණ්ඩියෙක්. ඔයාලා විකිපීඩියා එකේ තොණ්ඩි කියන වචනය බැලුවොත්, ඔයාලට නාසිසස්ගෙ පින්තූරෙ දකින්නට ලැබෙයි. එච්චර කැත පින්තූරයක් කවුරුවත් බලන්නේ නැහැ."

නාසිසස් තම කඩවසම් ඇහිබැම එසවූයේය. ඔහුගේ මුහුණ තඹ පැහැයෙන් රෝස පැහැයට හැරී තිබිණි. මොහොතකට, ඔහුට



මුළුමනින්ම පොකුණ අමතක ව ගොස් තිබුණේය. ඒ අතර වැල්ලේ හිලී තිබූ ලෝකඩ තහඩුව ලියෝගේ දෙනෙතට හසු විය.

"ඔයා මොනවද කියන්නේ?" නාසිසස් කෑ ගැසුවේය. "මම පුදුමාකාර කෙනෙක්. හැමෝම ඒක දන්නවා."

තවත් කිඳුරියක් සිනා නැඟුවාය. ඉන්පසු තවත් අයෙක් එයට එක්විය. නාසිසස් ගෙරවූයේය. එයින් ඔහුගේ කඩවසම් බව තරමක් අඩු වී ගියේය. මේ අතරතුර ලියෝ තම කණ්ණාඩිය තම නළලත රඳවාගෙන, දැත් විදහමින් ඔල්වරසන් නැඟුවේය. "ඒක හරි," ඔහු පැවසුවේය. "ලියෝගේ කණ්ඩායම දිනුම්."

"ලියෝගේ කණ්ඩායම දිනුම්!" එකෝ කෑ ගැසුවාය. ඇය කිඳුරියන් අතර සිට ඔවුන්ගේ පැහැයට මිශ්‍ර වී සිටි හෙයින් හඳුනාගැනීම අසීරු විය. එබැවින් කිඳුරියන් සිතුවේ ඒ හඬ තමාගේම අයෙකුගෙන් පැමිණියේ යැයි කියාය.

"ඔහ්, මගේ දෙවියනි, මම හරිම භයංකාරයිනෙ!" ලියෝ පැවසුවේය.

"හරිම භයංකාරයි!" එකෝ පැවසුවාය.

"එයා හරි අපූරුයි," කිඳුරියක් පැවසුවාය.

"ඒ වගේම කෙට්ටු වුණාට ලස්සනයි," තවත් එකියක පැවසුවාය.

"කෙට්ටු?" ලියෝ විමසුවේය. "කෙට්ටු වීම තමයි අලුත් විදිහ. ඉතිං මම කෙට්ටු වුණා. නාසිසස්? එයා කොච්චර පරාජිතයෙක්ද කියනවා නම් පාතාල ලෝකයටවත් එයාගෙන් වැඩක් නැහැ. අඩුග ාතේ භූත කෙල්ලක්වත් එයාට කැමති වෙන්නේ නැහැ."

"නවත්තගනිං!" නාසිසස් නැගී සිටියේය. "මේක හරි දෙයක් නෙමෙයි, ඉතිං එයා..." ඔහු නිවැරදි වචනය තෝරා ගැනීමේ උත්සාහයක යෙදුනේය. ඔහු තමා ගැන හැර වෙනත් දෙයක් ගැන කතා කර බොහෝ කාලයක් ගත වී තිබෙන බව පෙනුණේය. "එයා අපිව රවට්ටනවා."

නාසිසස් සම්පූර්ණ මෝඩයකු නොවන බව පෙනී ගියේය. අවබෝධයක සේයාවක් ඔහුගේ මුහුණේ ඇඳී යද්දී ඔහු නැවත පොකුණ දෙසට හැරුණේය. "ලෝකඩ කණ්ණාඩිය අතුරුදහන්. මගේ ප්‍රතිබිම්භය ඒක මට ආපසු දීපන්."

"ලියෝ ගේ කණ්ඩායම," එක් කිඳුරියක් පැවසූ නමුත්, අනෙක් පිරිස නාසිසස් වෙතට අවධානය යොමු කළහ.

"මම තමයි ලස්සනම කෙනා!" නාසිසස් විරෝධය පෑවේය. "එයා මගේ කණ්ණාඩිය හොරකම් කළා. අපිට ඒක ආයෙ ගන්න බැරිවුණොත් මට පිට වෙන්න වෙනවා."

කෙල්ලෝ ගැස්සී ගියහ. එකියක් අත දිගු කළාය. "අතන,"

"ඒක ආපහු ගන්න," කිඳුරියක් කෑ ගැසුවාය.

සමහර විට ඇගේ කැමැත්තට එරෙහිව වුවත්, එකෝ හඬ නැඟුවාය. "ඒක ආපහු ගන්න."

"ඔව්!" තම දුන්න අතට ගත් නාසිසස්, දූවිලි බැඳුණු හී කොපුවෙන් හීයක් ගත්තේය. "ලෝකඩ ගත්ත පළවෙනි කෙනා. මම මට තරම්ම උඹටත් කැමති වෙයි. මගේ ප්‍රතිබිම්බය සිපගන්න ගමන් මම උඹවත් සිපගන්නම්."

"ඔහ්, මගේ දෙවියනේ!" කිඳුරියෝ කෑ ගැසූහ.

"ඒ වගේම අර උපදෙවිවරු මරා දමන්න." ලියෝ දෙස බලමින් නාසිසස් පැවසුවේය. "උන් මම තරම් කඩවසම් නැහැ."

යමෙකු තමාව මරන්නට උත්සාහ කරන අවස්ථාවලදී, ලියෝට තරමක් වේගයෙන් දිවීමට හැකියාව තිබිණි. අවාසනාවකට, ඔහුට තවත් බොහෝ පුහුණුව අවශ්‍ය විය.

ඔහු හේසාල්ව ද ඇදගෙන දිව ගියේය. රාත්තල් පනහක් බරැති දිව්‍යමය ලෝකඩ ඔසවාගෙන දිව යෑම පහසු වූයේ නැත. ලෝහ තහඩුවේ එක් පැත්තක් ඔසවා ගත් ඔහු පිටුපස හැරී බැලුවේය. ඔහු හීය මානාගෙන සිටියත්, බෙහෙවින් පැරණි වූ එය කුඩා පතුරුවලට කැඩී ගියේය.

සාමාන්‍යයෙන් කිඳුරියෝ ඉක්මන්ය- අඩුම වශයෙන් අර්ධ ලෝහිත කඳවුරේ සිටි අය එවැනි අය විය- එහෙත් මේ පිරිස පෝස්ටර්, ටී ෂර්ට් සහ නාසිසස්ගේ වෙනත් දෑ වලින් බර වී සිටියහ. එසේම කණ්ඩායමක් ලෙස වැඩකරද්දී කිඳුරියෝ එතරම් හොඳ මට්ටමක නොසිටියහ. ඔවුහු එකා පිට එකා නගිමින්, තල්ලු කරගනිමින් ඉදිරියට ගාටන්නට වූහ. ඔවුන් අතරින් දිව යමින්, ඔවුන්ව පෙරළා දමමින් එතැන තත්ත්වය තවත් අවුල් කර දැමීමට එකෝ ඇයට හැකි උපරිමය කළාය.



තවමත්, ඔවුහු වේගයෙන් ළං වෙමින් සිටියහ.

"ඒරියන්ට කතා කරන්න," ලියෝ පැවසුවේය.

"දැනටමත් කරල තියෙන්නේ," හේසාල් පිළිතුරු දුන්නාය.

ඔවුහු වෙරළ කරා දිව ගියහ. වෙරළ අද්දරට පැමිණි විට ඔවුන්ට අගෝ II දකගැනීමට හැකි වුවත්, ඒ වෙත යාමට ක්‍රමයක් නොතිබිණි. ලෝකඩ ඔසවාගෙන එතරම් දුරක් පිහිනීමද කළ නොහැක්කක් විය.

ලියෝ ආපසු හැරුණේය. කලහකාරී පිරිස වැලි කඳු මතින් දිව එමින් සිටියහ. වාද්‍ය වෘන්දයක ප්‍රධානියා අත තිබෙන යෂ්ටිය මෙන් තම දුන්න වනමින් නාසිසස් පෙරමුණ ගෙන සිටියේය. කිඳුරියන් අත වූයේ ඔවුන්ගේ කැමැත්ත මත තෝරාගත් ආයුධය. සමහරු ගල් ගෙඩි ඔසවාගෙන ආහ. සමහරු අත වූයේ මල් පවා වැඩී තිබූ ලී කැබලිය. දිය කිඳුරියන් කීප දෙනෙකුට දිය විදින තුවක්කු තිබුණත් ඒවා එතරම් භයානක ඒවා නොවන බව පෙනිණි. එහෙත් ඔවුන්ගේ මුහුණු තවමත් මාරාවේශ වී තිබිණි.

"අපොයි," තමාටම මුමුණාගත් ලියෝ තම නිදහස් අතට ගින්දර කැඳවූයේය. "කෙළින් සටන මගෙ විදිහ නෙමෙයි."

"දිව්‍යමය ලෝකඩ අල්ලගන්න," හේසාල් තම අසිපත අදිමින් පැවසුවාය. "මගෙ පිටිපස්සට වෙන්න."

"මගෙ පිටිපස්සට වෙන්න," එකෝ එය ප්‍රතිරාවය කළේය. වේෂාන්තරණය වූ කෙල්ල දැන් කලහකාරීන්ට ඉදිරියෙන් දිව එමින් සිටියාය. ලියෝ ඉදිරිපිටට පැමිණ නැවතී ආපසු හැරුණු ඇය තමාව ආරක්ෂා කර ගන්නා පලිහක් මෙන් දැත් විදහාලුවාය.

"එකෝ?" ලියෝ තමා පැවසීමට ආ දේ උගුරේ සිරවිණි. "ඔයා නිර්භීත කිඳුරියක්."

"නිර්භීත කිඳුරියක්?" ඇගේ හඬෙන් එය ප්‍රශ්නයක ස්වරූපය ගත්තේය.

"ඔයා ලියෝගේ කණ්ඩායමේ සිටීම ගැන මට ආඩම්බරයි," ඔහු පැවසුවේය. "අපිට මෙතැනින් පණ බේරා ගන්න ලැබුණොත්, ඔයා නාසිස්ව අමතක කරන්න ඕනේ."

"නාසිසස්ව අමතක කරන්න?" ඇය අවිනිශ්චිතව පැවසුවාය.

"ඔයාගෙ විදිහ එයාට හොඳ වැඩියි."

අර්ධ කවාකාර ලෙස කිඳුරියෝ ඔවුන්ව වටකර ගත්හ.

"ප්‍රෝඩාවක්." නාසිසස් පැවසුවේය. "එයාලා මට ආදරේ කරන්නේ නෑ, කෙල්ලනේ! ඔයාල හැමෝම මට ආදරෙයි, එහෙමද?"

"ඔව්!" කහ පැහැති ගවුමක් හැඳි ව්‍යාකූලව සිටි එකියක හැරුණු විට සෙසු සියල්ලෝම පැවසූහ.

"එයාලාව මරන්න!" නාසිසස් නියෝග කළේය.

කිඳුරියෝ ඉදිරියට ඇදෙන්නට වුවත්, ඔවුන් ඉදිරිපිට වූ වැල්ල පුපුරා හැලුණේය. කොහේ හෝ සිට පැමිණි ඒරියන්, පිරිස වටා වේගයෙන් දිව යමින් වැලි කුණාටුවක් නිර්මාණය කළේය. ධවල වැල්ල ඔවුන්ගේ දෑස්වලට විසිරිණි.

"මම මේ අශ්වයාට කැමතියි!" ලියෝ පැවසුවේය.

කහිමින් සහ ගැහෙමින් කිඳුරියෝ එකාමත එකා ඇද වැටුණාහ. දෑස් නොපෙනී ගිය නාසිසස් ඉබාගාතේ ඇවිදින්නට විය.

පැදූලය මතට නැඟුණු හේසාල් දිව්‍යමය ලෝකඩ අසු මත තබා ගත්තාය. ඉන්පසු ලියෝට අසු පිටට නැගීමට අත දිගු කළාය.

"අපිට එකෝව දාල යන්න බැහැ," ලියෝ පැවසුවේය.

"එකෝ දාල යන්න," කිඳුරිය පැවසුවාය.

ඇය සිනාසුණාය. පළමු වරට ලියෝට ඇගේ මුහුණ දැකගත හැකි විය. ඇය සැබවින්ම රූමත් ය. ඔහු අපේක්ෂා කළාටත් වඩා ඇගේ දෑස් නිල් පැහැයෙන් යුක්ත විය. ඔහුට එය මඟහැරුණේ කෙසේද?

"ඇයි?" ලියෝ විමසුවේය. "ඔයාට හිතෙන්නේ නැද්ද, තවමත් ඔයාට නාසිසස්ව බේරාගන්න පුළුවන්..."

"නාසිසස්ව බේරාගන්න," ඇය විශ්වාසයෙන් පැවසුවාය. ඇය ජීවිතයේ දෙවන අවස්ථාවක් ලබා තිබූ අතර එය තමා ආදරය කරන තැනැත්තාව ආරක්ෂා කිරීම සඳහා පාවිච්චි කිරීමට ඇය අදහස් කළාය.

ලියෝට විරුද්ධ වීමට වුවමනා වුවත්, එකෝ ඉදිරියට නැවී ඔහුගේ කම්මුලට හාද්දක් දුන්නාය. ඉන්පසු සෙමින් එතැනින් ඉවතට ගියාය.

"ලියෝ, එන්න." හේසාල් අඬ ගැසුවාය.

අනෙක් කිඳුරියෝ යථාතත්ත්වයට පත් වෙමින් සිටියහ. දෑස්වල තිබූ වැලි පිසදා ගත් ඔවුහු දත් කෝපයෙන් කොළ පැහැ



ගැන්වී සිටියහ. ලියෝ නැවත එකෝ දෙස බැලුවේය. එහෙත් ඇය දර්ශනයෙන් ඉවතට ගොස් සිටියාය.

"ඔව්," ඔහු පැවසුවේය. ඔහුගේ උගුර වියළී තිබිණි. "ඔව්, හරි."

ඔහු හේසාල්ගේ පිටුපසින් අසු මතට නැඟුණේය. ඒරියන් ජල තලය හරහා පැන්නේය. කිඳුරියෝ ඔවුන්ගේ පිටුපසින් බෙරිහන් දෙන හඬත්, නාසිසස් කෑ ගසන හඬත් ඇසිණි. "ආපසු වරෙන්! ආපසු වරෙන්!"

ඒරියන් අගෝ II වෙත යද්දී, නෙමසිස් එකෝ සහ නාසිසස් ගැන කියූ දේ ලියෝගේ මතකයට නැඟිණි. සමහර විට එයාලා ඔයාට පාඩමක් උගන්වයි.

ඇය පැවසුවේ නාසිසස් ගැන විය හැකි යැයි ඔහු සිතා සිටියත්, ඔහුට නියම පාඩම උගැන්වූයේ එකෝ බව ඔහුට අවබෝධ විය. ඒ එම සගයන්ගෙන් අදෘශ්‍යමාන වෙමින්, තමන්ව ගණන් නොගන්නා අයෙකුට ආදරය කිරීමේ සාපය ගෙවීමයි. සත්වැනි රෝදය. ඔහු ඒ සිතිවිල්ල පලවා හැරීමට උත්සාහ කළේය.

තමාට එකෝගේ මුහුණ කිසිවිටෙක අමතක කළ නොහැකි බව ඔහුට සහතිකය. ඔහු දෑස් වසා ගත්තේය. එහෙත් ඇගේ සිනාවේ මතකය තවමත් බොඳ වෙමින් දර්ශනය විය.

# 09

# පිපර්

පිපිර්ට පිහියක් පාවිච්චි කිරීමට වුවමනා නොවීය.

එහෙත් ජේසන්ගේ කුටිය තුළට වී, ඔහු අවදිවන තුරු බලා හිඳින විට, දුනුණු හුදෙකලාව නිසා ඇයට එය මැඩපවත්වා ගත නොහැකි විය.

මළ සිරුරක මෙන් ජේසන්ගේ මුහුණ සුදුමැලි වී තිබිණි. ගඩොල ඔහුගේ හිසේ වදින නැගුණු බියකරු හඬ ඇගේ මතකයේ තිබිණි. ජේසන්ට තුවාල සිදුවූයේ ඔහු රෝමවරුන්ගෙන් ඇයව ආවරණය කිරීමට උත්සාහ කළ නිසාය.

පැණි සහ අමෘතය බලෙන්ම ලබා දුන්නත්, ඔහු අවදි වූ පසු පවා ඔහුගේ තත්ත්වය යහපත් වේයැයි පිපර්ට විශ්වාසයක් නොතිබිණි. ඔහුගේ මතකය නැවත අහිමි වුණොත්?- එහෙත් මේ වතාවේ ඔහුගේ මතකයන් වූයේ ඇයයි.

ඇය තම අසිපත අතට නොගත යුතුව තිබිණි. එයින් සිදුවන්නේ ඇගේ හැඟීම් තවත් නරක අතට හැරීම පමණකි.

අවසානයේ පෙළඹවීම දැඩි වූයේය. ඇය තම කැටොප්ට්‍රිස්[1] තලය අතට ගත්තාය. එය එතරම් විශේෂිත බවක් නොපෙනුණ අලංකාර නොවූ මිටක් සහිත ත්‍රිකෝණාකාර තලයක් වුවත්, එය

1 කලෙක ත්‍රෝයි හි හෙලන්ට උරුමව තිබූ පිපර්ගේ කිණිස්ස ය.



කලෙක අයත්ව තිබුණේ ත්‍රෝයි හි හෙලයන්ටය. කිණිස්සේ නම වූයේ 'බලන වීදුරුව' යන්නයි.

පිපර් ලෝකඩ තලය දෙස බලාගෙන සිටියාය. මුලදී ඇයට දක්නට ලැබුණේ ඇගේ ප්‍රතිබිම්බය පමණකි. ඉන්පසු ආලෝක තරංග ලෝහය පුරා රැළි නැංවූයේය. රෝම උප දෙවිවරු පිරිසක් විනිශ්චය ශාලාවේ රැස්වී සිටින අයුරු ඇය දුටුවාය. තඹවන් පඹයෙකුගේ පෙනුමැති දරුවෙකු වූ ඔක්ටේවියන්, තම අත් මිට මොලවාගෙන කලබලකාරී පිරිස අමතමින් සිටියේය. පිපිර්ට ඔහු පැවසූ දේ නැසුණත්, ඉරියව් පැහැදිලි විය. අපි අර ග්‍රීකයන් මරා දැමිය යුතුයි.

විනිසුරුවරිය, රෙයිනා, එක් පසෙක පිටගෙන සිටියාය. ඇගේ මුහුණෙන් ඇය තම හැඟීම් මැඩගෙන සිටින බව පෙනිණි. දුකද? කෝපයද? පිපර්ට සිතාගත නොහැකි විය.

ඇය රෙයිනාට වෛර කිරීමට සිතුවත්, ඇයට එසේ කළ නොහැකි විය. විනිශ්චය ශාලාවේ භෝජන සංග්‍රහය අතරතුර, රෙයිනා ඇගේ හැඟීම් සඟවා ගෙන සිටි ආකාරය පිපර් අගය කළාය.

රෙයිනා දැනටමත් පිපර් සහ ජේසන් අතර තිබෙන සම්බන්ධය තක්සේරු කර තිබුණාය. ඇෆ්‍රොඩයිට්ගේ[1] දියණිය ලෙස, පිපර්ට එවැනි දෑ ගැන පැවසීමට හැකියාව තිබිණි. තවම රෙයිනා සන්සුන්ව සහ සංයමයකින් බලා සිටියාය. ඇය තම කඳවුරේ අවශ්‍යතා හැඟීම්වලට ඉදිරියෙන් තබන්නියකි. අගෝ II නගරය විනාශ කරන තුරු ඇය ග්‍රීකයන්ට අවංකව අවස්ථාව ලබා දුන්නාය.

ජේසන්ගේ පෙම්වතිය වීම ගැන පිපර් තුළ වරදකාරී හැඟීමක් ඇති කරවීමට ඇය සමත් වූවාය. එහෙත් එය මෝඩ අදහසක් විය. ජේසන් කිසිවිටෙක රෙයිනාගේ පෙම්වතා ව නොසිටියේය.

සමහර විට රෙයිනා එතරම් නරක අයකු නොවන්නට ඇතත්, දැන් එහි ගැටලුවක් නැත. සාමය සඳහා වූ අවස්ථාව ඔවුහු අහිමි කරගෙන තිබිණි. පිපර්ගේ ඒත්තු ගැන්වීමේ බලය, එක වරක්, අසාර්ථක වී තිබුණේය.

ඇගේ රහසිගත බියද? සමහර විට ඇය තදින් උත්සාහ නොකළා විය හැකිය. රෝමවරු සමඟ මිශ්‍රවීමට පිපර්ට කිසි දා

1 ආදරයට සහ අලංකාරයට අධිපති ග්‍රීක දෙවඟන. ඇය හෙපියාස්ටස් සමඟ විවාහ වූ නමුත්, යුද්ධයට අධිපති දෙවියන් වූ ඒරිස්ට ආදරය කළාය. ඇගේ රෝම ආකාරය වීනස් ය.

අවශ්‍යතාවයක් නොතිබිණි. ඇය වැඩියෙන්ම කරදර වූයේ ජේසන්
ඔහුගේ පැරණි ජීවිතය අහිමි වෙතැයි යන්න ගැනය.

දැන් ජේසන් තුවාල ලබා ඇත. ඖෂධකාව මුළුමනින්ම
විනාශ වී ගොසිණි. එසේම, ඇගේ කිණිස්සට අනුව, ඔක්ටේවියන්
රෝමවරු යුද්ධයට පොළඹවමින් සිටී.

ඇගේ තලයේ දිස්වුණ දර්ශනය වෙනස් විය. එහි ඇය
පෙර දැක තිබූ රූප ගණනාවක් වේගයෙන් දිස් වුවත්, ඇයට
ඒවා තේරුම් ගැනීමට නොහැකි විය. ජේසන් අසකු පිට නැගී යුද්ධ
යමින් සිටියේය. ඔහුගේ දෑස්වල නිල් පැහැය වෙනුවට වූයේ
පැහැයකි. පැරණි පන්නයේ දකුණු දිග ගවුමකින් සැරසුණු කාන්තාව
මුහුද සමීපයේ වූ උද්‍යානයක පාම් ගස් යට සිටගෙන සිටියාය.
වවාගත් මුහුණක් සහිත ගවයෙක්, ගංගාවකින් නික්මිණි. එක සමා
කහ පැහැති ටෝගාවලින් සැරසුණු යෝධයින් දෙදෙනෙක් කප්පියක
දැවටූ කඹයක් ආධාරයෙන් විශාල ලෝකඩ බඳුනක් ඔසවමින් සිටියහ

නරකම දර්ශනය පැමිණියේ අනතුරුවය. ඇය ජේසන් සහ
පර්සි සමඟ කවාකාර අඳුරු කුටියක ඉඟ තෙක් දියේ ගිලී සිටිනු ඇ
දුටුවාය. ජල මට්ටම වේගයෙන් ඉහළ නගිද්දී, භූත හැඩයන් ජලය තු
චලනය විය. පිටවීමට උත්සාහ දරමින් පිපර් බිත්තිවල එල්ලුණා
එහෙත් එතැන පලායාමට තැනක් නොතිබුණේය. ජලය ඔවුන්ගේ ළ
දක්වා පැමිණියේය. ජේසන්ව පහළට ඇද ගැනිණි. පර්සි දඟලමින්
අතුරුදහන් විය.

මුහුදු දෙවියන්ගේ දරුවෙක් ගිලෙන්නේ කොහොමද? පිප
එය දැන නොසිටි නමුත්, තමා අඳුරේ දඟලමින්, ජලය හිස මතින් යන
තෙක් දඟලන අයුරු පිපර් බලා සිටියාය.

පිපර් දෑස් වසාගත්තාය. ඒක මට ආයෙ පෙන්නන්න එපා
ඇය අයැද සිටියාය. මට උදව්වක් වෙන දෙයක් පෙන්වන්න.

ඇය ආයාසයෙන් නැවත තලය දෙස බැලුවාය.

මේ වතාවේ ඇය දුටුවේ ඉරිඟු සහ සූරියකාන්ත යායක් මැදින්
දිවෙන, හිස් මහාමාර්ගයකි. සැතපුම් කණුවේ ටොපේකා 32 යනුවෙන්
සටහන් කර තිබිණි. මාර්ගය අද්දර, කාකි කොට කලිසමකින් සහ දම්
පැහැති කඳවුරු කමිසයකින් සැරසුණු මිනිසෙක් හිටගෙන සිටියේය.
ඔහු පැළඳ සිටි හිස්වැස්මේ පළල් වාටියෙන් ඔහුගේ මුහුණ සැඟවී



දුන්නේය. කෙසේ හෝ ඔහු ඇයට යම් ආකාරයක ත්‍යාගයක් පිරිනමමින්
සිටින බව ඇය දැන ගත්තාය- ඖෂධයක් හෝ විෂ නාශකයක්.

''හේයි,'' ජේසන් කැස්සේය.

පිපර්ගේ අතින් කිණිසි තලය බිම වැටීමට ආසන්න විය. ''ඔයා
අවදිවෙනවා!''

''ඔච්චර පුදුම වෙන්න එපා,'' ජේසන් වෙළුම් පටි දැමූ තම
හිස අත ගා මුහුණ හැකිළුවේය. ''මො...මොනවද වුණේ? මට පිපිරුම්
මතකයි, ඒ වගේම...''

''ඔයාට මාව මතකද?''

ජේසන් සිනාසීමට උත්සාහ කළත් එය වේදනාකාරී
ගැස්සීමකට හැරිණි. ''මම අන්තිමට පරීක්ෂා කරන කොට ඔයා මගේ
කැත පෙම්වතිය වෙලා හිටියා, මම සිහි නැතුව ඉන්න ටිකේ මොනවත්
වෙනසක් නොවුණා නම්?''

පිපර් කෙතරම් අස්වැසිල්ලට පත් විද යත්, ඇයට ඉකි ගැසිණි.
ඇය ඔහුට හිඳ ගැනීමට උදව් කර, තවත් පැණි ස්වල්පයක් දුන්නාය.
ඔවුන්ට ඉහළින් වූ නැව් තට්ටුව මත අස් කුර ගැටෙන හඬ ඇසෙද්දී,
නැව අලුත්වැඩියා කිරීම සඳහා වූ ලියෝ ගේ සැලසුම ඇය ඔහුට
විස්තර කළාය.

මොහොතකට පසු, ලියෝ සහ හේසාල් ගාටමින් පැමිණ දොර
අසල නතර වූහ. ඔවුන් අතර වූයේ තලන ලද විශාල ලෝකඩ පතුරුය.

''ඔලිම්පස් හි දෙවියනේ,'' පිපර් ලියෝ දෙස බැලුවාය.
''ඔයාලට මොකද වුණේ?''

ඔහුගේ හිසකෙස් පිටුපසට ඇලී තිබිනි. නළලතේ වැද්දුම්
කණ්ණාඩි යුගලක් විය. කම්මුල්වල තොල් ආලේපන සලකුණුද, අත්
පුරා පච්චයන්ද දක්නට ලැබුණු අතර, ටී ෂර්ටය මත HOT STUFF,
BAD BOY සහ TEAM LEO යනුවෙන් සටහන් කර තිබිණි.

''දිග කතාවක්,'' ඔහු පැවසුවේය. ''අනෙක් අය ආපහු ආවද?''

''තවම නැහැ,'' පිපර් පැවසුවාය.

ලියෝ සාප කළේය. ජේසන් හිඳගෙන සිටින අයුරු ඔහුට
පෙනුණේ එවිටය. ඔහුගේ මුහුණ පැහැපත් විය. ''හේයි, මනුස්සයෝ!
ඔයා හොඳින් ඉන්න එක ගැන සතුටුයි. මම එන්පින් කාමරයට
යන්නම්.''

හේසාල් දොරටුව අසල සිටියදී ඔහු ලෝකඩ පතුරු සමඟ එතැනින් ඉවත් ව ගියේය.

පිපර් ඇය දෙස බලා දෙබැම එසැවූවාය. "ලියෝගේ කණ්ඩායම?"

"අපිට නාසිපස්ව හමුවුණා," වැඩිදුර පැහැදිලි කිරීම නොකර හේසාල් පැවසුවාය. "ඒ වගේම පළිගැනීමේ දෙවඟන, නෙමසිස්වත්."

"ජේසන් සුසුමක් හෙලුවේය. "මට ඒ සේරම ජෝලි නැතිවුණා."

ඔවුන්ට ඉහළින් වූ නැව් තට්ටුව මතට බරැති යමක් පතිත වන හඬක් ඇසිණි. ඇනබෙත් සහ පර්සි පහළ ශාලාවට පිවිසියහ. පර්සි සැර ගන්ධයකින් යුත් ගැලුම් පහේ ප්ලාස්ටික් බාල්දියක් ඔසවාගෙන සිටියේය. කළු පැහැති පැල්ලමක් ඇනබෙත්ගේ කොණ්ඩයේ ඇලී තිබිණි. පර්සිගේ සම්පූර්ණ කමිසයම ඒවායින් වැසී ගොස් තිබුණේය.

"වහලෙට දාන තාරද?" පිපර් අනුමාන කළාය.

ෆෑන්ක් ඔවුන්ට පිටුපසින් ගැටුවේය. එයින් ශාලාවට යන පැසේජය උප දෙවිවරුන්ගෙන් අවහිර විය.

"හේයි, ජේසන්," ඇනබෙත් පැවසුවාය. "ඔයා අවදිවීම ගැන සතුටුයි. හේසාල්, ලියෝ කොහේද?"

ඇය පහළට අත දිගු කළාය. "එන්ජින් කාමරයේ."

එක්විටම නෞකාව ඉහළට එසවිණි. උප දෙවිවරු විසිවූහ. පර්සි තම අත වූ තාර බාල්දිය විසිරී යාම වළකා ගත්තේ යාන්තමිනි. "ඌහ්, ඒ මොකක්ද?" ඔහු විමසුවේය.

"θθඕහ්..." හේසාල් තරමක් අපහසුවට පත් වූ අයුරු පෙනිණි. "අපි විලේ ඉන්න කිඳුරන්ව කෝප කරන්න ඇති...එයාල සේරම."

"විශිෂ්ටයි." පර්සි තම අත වූ තාර බාල්දිය ෆ්‍රෑන්ක් සහ ඇනබෙත් අතට දුන්නේය. "ඔය හාදයෝ ලියෝට උදව් කරන්න. මට පුළුවන් තරම් වේලාවක් මම ජල ආත්ම රඳවා තියා ගන්නම්."

හේසාල් කුටියේ දොරටුව අසල තනිකර ඔවුන් තිදෙනා ඉවත ගියහ. නෞකාව නැවත සෙලවිණි. හේසාල් ඇගේ උදරය තද කර ගත්තාය. "මම ටිකක්..." පැවසීමට ආ දේ ගිලගත් හේසාල් දුර්වල ලෙස පැසේජය හරහා ඉවතට ගියාය.



නෞකාව ඉදිරියටත් පසුපසටත් පැද්දෙන අතරේ, ජේසන් සහ පිපර් පහළ බලා සිටියහ. ජල තරංග නැව් බඳට පහර දුන් අතර, ඉහළ නැව් තට්ටුවෙන් කෝපාවිෂ්ට හඬවල් නැගී ආවේය. පර්සි කෑ ගසමින් සිටියේය. කෝච් හෙජ් විලට බැන වැදුණේය. ෆෙස්ටස් කිපවරක්ම ගිනි විද්දේය. පහළ ශාලාවේ, තම කුටියට වී හේසල් යමක් මුමුණමින් සිටියේය. පහළ එන්ජින් කාමරය තුළ සිටි ලියෝ ඇතුළු පිරිසට පිටගෙන සිටීමටත් දැඩි වෙහෙසක් දැරීමට සිදුවිය. පැය ගණනක් ගෙවී ගියා සේ දැනුණු කාලයකට පසු, එන්ජිම ක්‍රියාත්මක වන්නට පටන් ගත්තේය. හබල් වලින් හඬ නැගෙන්නට විය. නෞකාව ගුවනට එසවෙන බවක් පිපර්ට දැනිණි.

ගැස්සීම සහ පැද්දීම නැවතී තිබුණේය. යන්ත්‍රවල හඬ හැරුණු විට නෞකාව නිශ්චල වී තිබිණි. අවසානයේ, ලියෝ එන්ජින් කාමරයෙන් පිටතට පැමිණියේය. ඔහු දහදියෙන්, හුණු දූවිල්ලෙන් සහ තාර වලින් වැසී තිබිණි. දැන් ආරක්ෂිතව ගමන් කළ හැකි බව ඔහු නිවේදනය කළේය.

"පැයකින් භෝජන ශාලාවෙ රැස්වීම," ඔහු පැවසුවේය. "පිස්සු දවසක් නේද?"

සියල්ලෝම පිරිසිදු වීමෙන් අනතුරුව, කෝච් හෙජ් සුක්කානම බාරගත් අතර උප දෙවිවරු රෑ කෑමට එක් වූහ. සියල්ලෝම- හරියට ම සත් දෙනා- එකට එක් වූ පළමු අවස්ථාව එය විය. සමහර විට ඔවුන්ගේ දර්ශනය පිපර්ට ධෛර්යයක් වුවත්, ඔවුන් සියල්ලෝම එකම තැනක දැකීමෙන් සිදුවූයේ සත් දෙනාගේ අනාවැකිය මතකයට නැගීම පමණකි. තවදුරටත් ලියෝ නෞකාව අවසන් කරන තුරු බලා සිටිය යුතු නැත. රෝමවරු පිටුපස ලුහුබඳිද්දී ඔවුහු දැන් ඉදිරියෙන් ඇති පැරණි භූමි කරා ගමන් කරමින් සිටිති. යෝධයන් බලා හිඳිනු ඇත. ගයියා නැගී සිටිනු ඇත. ඔවුන්ගේ මේ ගවේෂණය සාර්ථක නොවුණොත් ලෝකය විනාශ වනු ඇත.

අනෙක් අයටද එය දැනුණා විය යුතුය. භෝජන ශාලාව පුරා අකුණු කුණාටුවක් මෙන් ආතතිය නැංවී තිබිණි. ටික වේලාවකට පසු පර්සි සහ ජේසන් මේසයේ තිබූ ප්‍රධාන අසුන්වල හිඳ ගැනීමට උත්සාහ කළහ. ජේසන්ගේ දෑත්වලින් ගිනි පුළිඟු විසිරිණි. දෙදෙනාම කල්පනාවේ ගැලී සිටින සේ පෙනුණු කෙටි මොහොතකට පසු, අසුන ඇනබෙත්ට පැවරූ ඔවුහු ප්‍රතිවිරුද්ධ පැත්තේ අසුන්වල හිඳ ගත්හ.

පිරිස ලවණ විල් නගරයේදී සිදු වූ දේ ගැන කතා කළහ. එහෙත් නාසිපස්ව ප්‍රයෝගයකින් රැවටූ, ලියෝගේ විහිලු කතාවේදී පවා ඔවුන්ට සිනාසීමට හැකියාවක් නොතිබිණි.

''ඉතිං දූන් කොහාටද?'' ලියෝ මුවේ පීට්සාවක් පුරවාගෙන විමසුවේය. ''මම ඉක්මනින්ම නැව අලුත්වැඩියා කරල විලෙන් පිටවුණා, ඒත් තවමත් හානි ගොඩක් තියෙනවා. අත්ලාන්තික් හරහා යන්න කලින් අපි ආයෙ කොහෙට හරි ගොඩ බස්සල ඒවා හදාගන්න වෙනවා.''

''අපියි ජුපිටර් කඳවුරයි අතර යම් දුරක් තියාගන්න ඕනේ,'' පර්සි පැවසුවේය. ''ලවණ විලේ නගරයට ඉහළින් ෆ්‍රෑන්ක් රාජාලීන් කීප දෙනෙකු දූක තියෙනවා, රෝමවරු අපිට ගොඩක් පිටිපස්සෙන් තියා ගන්න ඕනේ.''

එයින් මේසයේ වූ පෙනුම වෙනස් වූයේ නැත. පිපර්ට කිසිවක් පැවසීමට අවැසි නොවුණත්, ඇය තරමක වරදකාරී හැඟීමකින් පසු වූවාය. ''මම හිතනවා අපි ආපහු ගිහින් රෝමවරු එක්ක කතා කරන්න උත්සාහ කළ යුතුයි කියලා. සමහර විට මම එතරම් ප්‍රබලව වශී කතාව කරන්න නැතුව ඇති.''

ජේසන් ඇගේ අත අල්ලා ගත්තේය. ''ඒක ඔයාගෙ වැරැද්දක් නෙමෙයි, පිපර්. එහෙම නැතිනම් ලියෝගෙත් නෙමෙයි.'' ඔහු ක්ෂණිකව පැවසුවේය. ''මොන දේ සිද්ධ වුණත්, ගයියා ඒක කළේ කඳවුරු දෙක වෙන් කරන්න.''

ඔහු උදව්වට පැමිණීම ගැන පිපර් සතුටු වූවාය. එහෙත් තවමත් ඇයට අපහසුවක් දැනිණි. ''සමහර විට· අපිට ඒක පැහැදිලි කරන්න පුළුවන් වුණොත්, ඒත්...''

''සාක්ෂි නැතුව?'' ඇනබෙත් විමසුවාය. ''ඒ වගේම ඇත්තටම මොකක්ද වුණේ කියල කිසිම අදහසක් නැහැ නේද? ඔයා කියන දේ මම පිළිගන්නවා, පිපර්. මට රෝමවරු අපේ විරුද්ධ පැත්තෙ ඉන්නව දකින්න ඕනෙ නැහැ. ඒත් ගයියා කරන දේ අපි තේරුම් ගන්නකම්, ආපසු යනව කියන්නේ සිය දිවි නසා ගැනීමක්.''

''ඇය හරි,'' හේසල් පැවසුවාය. ඇය තවමත් මුහුදු අසනීපයෙන් සම්පූර්ණ යථා තත්ත්වයට පැමිණ නොසිටියාය. ''රෙයිනා ඇහුම්කන් දෙන්න පුළුවන්, ඒත් ඔක්ටේවියන් එහෙම නෑ. රෝමවරු ගෞරවය ගැන හිතනවා. එයාලා ප්‍රහාරයකට ලක්වුණා. එයාලා මුලින් පහර දීලා පසුව ප්‍රශ්න අහයි.''



පිපර් තම කිණිසි තලයෙන් දුටු දර්ශනය ගැන සිතුවාය. රත් ඇස් සහිත ජේසන්, මිනිස් හිසක් තිබූ ගවයා, වළකින් ලෝහ බඳුන එස වූ ටෝගාව හැඳ සිටි යෝධයින්, සේරටමත් වඩා නරක වූයේ තමා කළු ජලයේ ගිලෙන බව ඇගේ මතකයේ තිබීමය.

පිපර් නිතරම ජලයට ප්‍රිය කළාය. තම පියා සමඟ දිය මත ලිස්සා යාමේ ක්‍රීඩාවේ නිරත වූ ආකාරය ගැන ඇයට රසවත් මතකයන් තිබිණි. එහෙත් කිණිසි තලයෙන් ඇය දුටු දර්ශනය ඇය තුළ ජලය ගැන බියක් ඇති කරවීමට සමත් විය.

''ඔයාලා කියන දේ හරි,'' ඇය තීරණය කළාය. ''අපි දිගටම යන්න ඕනෙ. රෝමවරු නිසාම නෙමෙයි. අපිට ඉක්මන් කරන්න වෙනවා.''

හේසාල් හිස සැලුවාය. ''නෙමිසිස් කිව්ව විදිහට නිකෝගෙ මරණයටයි, රෝමයෙ විනාශයටයි තියෙන්නෙ දවස් හයයි.''

ජේසන් මුහුණ හැකිලුවේය. ''ඔයා කිව්ව රෝමය නේද, නව රෝමය නෙමෙයිනෙ?''

''මම හිතන්නෙ,'' හේසාල් පැවසුවාය. ''ඒත්, ඒක එහෙමනම්, අපිට වැඩි කාලයක් නැහැ.''

''ඇයි දවස් හයක්?'' පර්සි විමසුවේය. ''ඒ වගේම එයාලා කොහොමද රෝමය විනාශ කරන්න යන්නේ?''

කිසිවෙකු පිළිතුරු නොදුන්හ. පිපර්ට තවදුරටත් නරක ප්‍රවෘත්ති එක් කිරීමට අවශ්‍ය නොවුණත්, එය කළ යුතු බව ඇයට හැඟී ගියාය. ''තව දෙයක් තියෙනවා,'' ඇය පැවසුවාය. ''මම මගේ පිහි තලයෙන් යම් දෙයක් දකිමින් ඉන්නේ.''

''මොන වගේ ඒවද?'' ෆ්‍රෑන්ක් විමසුවේය.

''ඒවායින් කිසිම අදහසක් ලැබෙන්නේ නෑ,'' පිපර් පැවසුවාය. ''නිකං රූප ටිකක් විතරයි, ඒත් මම දූක්ක එක වගේ ඇඳගෙන ඉන්න යෝධයෝ දෙන්නෙක්. සමහර විට නිවුන්නො වෙන්න ඇති.''

''එලාගෙ අනාවැකියෙ කියවුණු යෝධයෝ වගේ,'' ඇනබෙත් පැවසුවාය.

''අපිට මේ ජේළි ටික තේරුම් ගන්න පුළුවන් වුණොත්, ඒක උදව්වක් වෙයි.''

"නුවණේ දියණිය හුදෙකලාව ඇවිද යයි." පර්සි පැවසුවේය. "ඇතීනාගේ සලකුණ රෝමය අතරින් දුවෙයි. ඇනබෙත්, ඒකෙන් කියන්නෙ ඔයා ගැනයි. ජූනෝ මට කිව්වා...ඔයාට රෝමයෙදි අසීරු වැඩක් කරන්න වෙනව කියලා. ඔයා ඒක කරයිද කියල ඇයට සැකයි කියලත් කිව්වා. ඒත් මම දන්නවා එයා වැරදියි කියලා."

ඇනබෙත් දිගු හුස්මක් ගත්තාය. "නෞකාවෙන් අපිට පහර දෙන්න කලින් රෙයිනා මට යම් දෙයක් ගැන කිව්වා. රෝම විනිසුරුවරු අතර පැරණි පුරාවෘත්තයක් තියෙනව කියලා ඇය සඳහන් කළා. ඇතීනාට කළ යම් දෙයක් ගැන. රෝමවරු සහ ග්‍රීකයෝ කවදාවත් එක් නොවන්නෙ ඒ හේතුව නිසා වෙන්න පුළුවන් කියලයි එයා කිව්වේ."

ලියෝ සහ හේසාල් අමුතු බැල්මක් හුවමාරු කර ගත්හ. "ඒකට සමාන දෙයක් තෙම්සිස් සඳහන් කළා." ලියෝ පැවසුවේය. "එයා කිව්වෙ සමථයකට පත්විය යුතු පරණ එදිරිවාදිකමක් ගැන." මඳ නිහැඬියාවක් පැතිර ගියේය.

හේසාල් නිහැඬියාව බිඳ දැමුවාය. "එතකොට අනෙක් ජේළි?"

"නිමක් නැති මරණයේ යතුර දරා සිටින දෙවඟනගේ සුසුමින් යෝධයින් නික්මෙයි. යෝධයින්ගේ නපුර රනින් වියැකී යනු ඇත." ෆ්‍රෑන්ක් පැවසුවේය. "වියන ලද සිරගෙයින් වේදනාවෙන් ජය ලබයි."

"යෝධයන්ගේ නපුර," ලියෝ පැවසුවේය. "යෝධයන්ගේ නපුරේ කිසි දේකින් අපිට හොඳක් වෙයිද? ජේන විදියට ඒක තමයි අපි හොයාගන්න ඕන කරන්නේ."

පර්සි හිස සැලුවේය. "දෙවිවරුන්ගේ උදව් නැතිව අපිට යෝධයින්ව මරන්න බැහැ."

ජේසන් ෆ්‍රෑන්ක් සහ හේසාල් දෙසට හැරුණේය. "මම හිතුවෙ වතාවක් ඇලස්කාවෙදි ඔයාලා යෝධයො මැරුවෙ දෙවියන්ගෙ උදව් නැතිව, ඔය දෙන්න විතරක් කියලයි."

"ඇල්සියෝනියස් විශේෂ සිද්ධියක්," ෆ්‍රෑන්ක් පැවසුවේය. "එයා අමරණීය වෙන්නෙ එයා ඉපදුණු භූමියෙදි- ඇලස්කාවෙදි- විතරයි. කැනඩාවෙදි නෙමෙයි. මම කැමතියි මට ඔය යෝධයො සේරම ඇලස්කාවේ ඉඳන් කැනඩාවට ඇදගෙන ඇවිත් මරන්න පුළුවන් නම්. ඒත්..." ඔහු දෙවුර සැලුවේය. "පර්සි කියන දේ හරි. අපිට දෙවිවරු ඕනෙ වෙනවා."



පිපර් බිත්ති දෙස බලා සිටියාය. ලියෝ අර්ධ ලෝහිත කඳවුර පෙනෙන ලෙස ඒවාට ජප කර නොතිබුණා නම් මැනවැයි ඇය සිතුවාය. එය ඇයට කිසිදාක පිවිසිය නොහැකි නිවෙසට යන දොරටුවක් මෙන් විය. අඳුර වැටීමත් සමඟ කඳවුරේ පහන් නිවී යද්දී, තණ බිම මැද හෙස්ටියාගේ ගිනි මැලය දැල්වෙන දෙස ඇය බලා සිටියාය.

රෝම උප දෙවිවරුන් වූ ෆ්‍රෑන්ක්ට සහ හේසාල්ට මේ රූප දැනෙන්නේ කෙසේ දැයි ඇය සිතුවාය. ඔවුන් කිසිකලෙක අර්ධ ලෝහිත කඳවුරේ සිට නැත. ඔවුන්ට එය පිටසක්වළ ලොවක් සේ නුහුරු තැනක් ලෙස දිස්වෙනවා විය හැකිය.

අනාවැකියේ අනෙක් ජේළි පර්සිගේ හිස තුළ කරකැවෙන්නට වූයේය. වියන ලද සිරගෙය කිව්වෙ මොකක්ද? දෙවඟනගෙ සුසුමින් යෝධයො නික්මෙන්නෙ කොහොමද? නිමක් නැති මරණයේ යතුර යන්න කොහෙත්ම සතුටුදායක පෙළක් නොවේ.

"ඉතිං..." ලියෝ මේසයෙන් තම අසුන පිටුපසට තල්ලු කරමින් පැවසුවේය. "මුලින් කළ යුතු දේ මුලින්ම, අපි උදෙන්ම අලුත්වැඩියාව අවසන් කරන්න නෞකාව පහත් කරන්න ඕනෙ."

"නාගරයට කිට්ටු තැනක," ඇනබෙත් යෝජනා කළාය. "අනික අපිට සැපයුම් ඕනෙ කරනවා. ඒත් මාර්ගයෙන් පිටත යම් තැනක ගොඩබසිමු. එතකොට රෝමවරුන්ට අපිව හොයාගන්න එක ප්‍රශ්නයක් වෙයි. මොනවා හරි අදහස් තියෙනවද?"

කිසිවකු කතා නොකළහ. පිපර්ට ඇගේ පිහි තලයෙන් දුටු දර්ශනය සිහිපත් විය. ඇයට පුකුරුව පිරිනැමූ දම් පාට හැඳි අද්භූත මිනිසා. ඔහු සිටගෙන සිටියේ ටොපේකා 32 යනුවෙන් සඳහන් වූ නාම පුවරුව අසලය.

"හොඳයි," ඇය පැවසුවාය. "ඔය හාදයින්ට කන්සාස් ගැන කොහොමද දැනෙන්නේ?"

# 10
# පිපර්

නින්දට යාමත් පිපර්ට ප්‍රශ්නයක් වී තිබිණි.

ඇදිරි නීතියෙන් පසුව ගෙවුණු මුළු පැයම කෝච් හෙප් ඔහුගේ රාත්‍රි වැඩමුරය වෙනුවෙන් වැය කළේය. පටු පැසේජයේ එහාට මෙහාට ඇවිදිමින් ඔහු බෙරිහන් දුන්ණේය. ''පහන් නිවන්න, කතාව නවත්තන්න! නැත්නම් ඔයාලව ආපහු ලෝංග් අයිලන්ඩ් වලට යවනවා!''

යාන්තමට හෝ සද්දයක් ඇසුණු විට ඔහු කළේ එතැන නැවතී, ඔහුගේ බේස් බෝල් පිත්තෙන් දොරට තඩිබාමින්, සැමටම නින්දට යන ලෙස පවසමින් කෑ ගැසීමය. එහෙත් එයින් සිදු වූයේ කිසිවකුටත් නිදාගැනීමට නොහැකිවීම පමණකි. ඔහු වයිල්ඩහස් පාසලේ කායවර්ධන ගුරුවරයෙකුව සිටි බව ඇඟවීමට කරන මේ වැඩේ පිපර්ට අපූරු විනෝදයක් ගෙන දුන්නේය.

ඇය සිවිලිමේ තිබූ තඹ පැහැති බාල්ක දෙස බැලුවාය. ඇගේ කුටිය තරමක් උණුසුම් තැනක් විය. ඔවුන් සිටි කොටස එහි නේවාසිකයන්ට කැමති උෂ්ණත්වයක් ස්වයංක්‍රීයව ලැබෙන ලෙස ලියෝ ක්‍රමලේඛයක් සැලසුම් කර තිබිණි. ඒනිසා කිසිදු විටෙක එතැන ඕනෑවට වඩා සිසිලසක්වත්, උණුසුමක්වත් තිබුණේ නැත. කොට්ට මෙට්ට පවා බෙහෙවින් සැපපහසුවට ඒවා විය. සිවිලිමේ එල්ලෙමින් තිබුණ ලෝකඩ ලන්තෑරුමෙන් ලැබුණ ආලෝකය පවා පිපර්ගේ කැමැත්තට අනුව සැකසී තිබිණි. ලන්තෑරුමේ සෑම පැත්තකම



අල්පෙනිති සිදුරු තරමේ සිදුරු වලින් තාරකා රාශියක් ලෙස බිත්තිම වලට එළිය වැටී තිබුණේය.

සිතේ ඇති බොහෝ දේ නිසා තමන්ට කොහෙත්ම නින්දක් නොලැබෙනු ඇතැයි පිපර් සිතුවාය. එහෙත් ඔවුන් ගුවන් ගැබ හරහා යද්දී, නෞකාවේ පැද්දීමත්, ගගන තබල්වල ගුමු ගුමු නාදයත් යම් ආකාරයක සාමකාමී බවක් ඇති කළේය.

අන්තිමේදී තදින් දෑස් පියාගත් ඇය නින්දට වැටිණි.

උදෑසන ආහාරයට සීනුව නාදවන විටම ඇය අවදි වූවාය. ඇයට දැනුණේ තත්පර කීපයකට නින්ද ගියා වැනි හැඟීමකි.

''ඒයි, පිපර්,'' ලියෝ ඇගේ දොරට තට්ටු කරමින් පැවසේය. ''අපි ගොඩබානවා!''

''ගොඩබානවා?'' පිපර් නිදිමතේම විමසුවාය.

දොර ඇරපු ලියෝ, ඔහුගේ හිස ඇතුළට එබුවේය. ලියෝ තම අත තළලේ තබා ගත්තේය. ''ඔයා ශිෂ්ටයිද?''

''ලියෝ!''

''කොහොමවුණත්, ඉල්ලීම විදිහට අපි වොෂෙකාවලට හැතැප්ම කීපයක් පිටතින් ගොඩ බසිනවා. ඒ වගේම...'' ඔහු පැසේජය දෙස බලා නැවතත් හිස එබුවේය. ''ඊයේ රෝමන්වරුන්ට පහර දුන්නට මට වෛර නොකරන එක ගැන ස්තූතියි.''

පිපර් ඇගේ ඇස් පිසදැම්මාය. ''ඒක හරි, ලියෝ, ඔයාට ඔයාව පාලනය කරගන්න බැරිවුණා.''

''ඔව්, ඒත් තවමත්... ඔයාට මාව රුස්සන්නේ නෑ.''

''ඔයා විහිලු කරනවද? ඔයා කරදර කරන්නෙ හරියට මට කවදාවත් නොහිටිය මල්ලි කෙනෙක් වගේ. ඇත්තටම මම ඔයා කරන දේවල් ඉවසන්නම්.''

''ආහ්... ස්තූතියි!''

ඉහළ සිට කෝච් හෙජ් බෙරිහන් දෙනු ඇසිණි.

''ශුද්ධ වූ හෙපියාස්ටස්,'' ලියෝ පැවසුවේය. ''ඇත්තටම එයාට ඕනේ වෙලා තියෙන්නේ එයාගෙ නැව් භාෂාවෙන් වැඩ කරන්න. මම නැව් තට්ටුව උඩට ගියොත් හොඳයි වගේ.''

ඒ අතර ඇඳුම් මාරු කරගත් පිපර් භෝජන ශාලාවට පිවිස මුද්දක හැඩයෙන් යුත් පාන් ගෙඩියක් අතට ගත්තාය. නැවේ ගොඩ බැමේ තිරිංග හඬ පිපර්ට ඇසිණි. ආගෝ II සූරියකාන්ත යාත්‍රා මැද්දට ගොඩබසින අතරේ පිපර් නැව් තට්ටුවට ගොස් අනෙක් පිරිසට එකතු වූවාය. හබල් ඇතුළට ඇදිණි. පාරු මඟ ස්වංක්‍රීයව පහත් විය.

උදෑසන වාතය සරු පසේත්, උණුසුම් පැළෑටිවලත්, ජල මාර්ගවලත් සුවඳිනුත් පිරී තිබිණි. ඒක නරක ගන්ධයක් නෙමෙයි. එයින් පිපර්ට ඔක්ලහෝමාවල ටාලෙකෝවල පිහිටා තිබූ ඇගේ සීයාගේ නිවෙස සිහිපත් විය.

ඇයට මුලින්ම දකින්න ලැබුණේ පර්සිය. ඔහු සුබ පතන ආකාරයෙන් සිනාසුණේය. එය පිපර් තුළ යම් ආකාරයක පුදුමයක් ඇති කිරීමට සමත් විය. ඔහු හැඳ සිටියේ දුර්වර්ණ වූ ජීන්සයක් සහ අර්ධ ලෝහිත කඳවුරේ තැඹිලි පැහැති ටී ෂර්ටයකි. ඔහු කෙසේවත් ග්‍රීක පාර්ශ්වයෙන් ඉවත්ව නොමැති බව ඉන් පැහැදිළි විය. සමහරවිට අලුත් ඇඳුම් ඔහුගේ අලුත් පෙනුමට උදව්වක් වන්නට ඇත. සැබැවින්ම, වැදගත් කරුණ වූයේ ඔහු අත්වැට අසල සිටගෙන සිටි ආකාරයයි. ඔහුගේ අතක් තිබුණේ ඇනබෙත්ගේ කරවටා ය.

දීප්තිමත් දෑසක් සහිතව ඇනබෙත් නැවත දකින්නට ලැබීම පිපර්ට සතුටක් විය. මක්නිසාද යත් පිපර් කෙදිනකවත් හොඳ මිතුරියකව නොසිටිය නිසාය. මාස ගණනාවක්ම, ඇනබෙත් සිහින් වධ වින්දාය. ඇගේ සෑම පියවරක්ම පර්සි සෙවීම සඳහා වැයවිය. දැන්, ඔවුන් මුහුණ දී සිටින භයානක ගවේෂණය පසෙකින් තැබුවත්, අඩුම වශයෙන් ඇයට, ඇගේ පෙම්වතා හෝ ආපසු ලැබී තිබේ.

"ඉතිං!" පිපර්ගේ අතේ තිබූ පාන් කැබැල්ල උදුරා ගෙන එයින් කැබැල්ලක් හපන අතරතුර ඇනබෙත් විමසුවාය. එහෙත් එය පිපර්ට හිරිහැරයක් වූයේ නැත. ඊට පෙර කඳවුරේදීත්, ඔවුන් විහිලු තහලු කරමින්, එකිනෙකාගේ පාතරාසය සොරකම් කර ගනිමින් විනෝද වූහ. "මෙන්න අපි ආවා. මොකක්ද සැලැස්ම?"

"මට මහාමාර්ගය පරීක්ෂා කරන්න ඕනේ." පිපර් පැවසුවාය. "ටොපෙකා 32 කියලා සඳහන් වෙන සලකුණ හොයාගන්න ඕනේ."

ලියෝ තම Wii පාලකය කරකවන විට ස්වයංක්‍රීයව රුවල් ඉබේටම පහත් විය. "අපි ඉන්නේ එච්චර ඈතකින් වෙන්න බැහැ."



ඔහු පැවසුවා. "මමයි, ෆෙස්ටසුයි ගණනය කරලා අපිට පුළුවන් හොඳම තැනට තමයි ගොඩ බැස්සේ. සැතපුම් කණුව හොයා ගැනීමෙන් ඔයා මොකක්ද බලාපොරොත්තු වෙන්න?"

පිපර් පිහිය තුළින් දුටු ගුරුලේත්තුවක් සහිත දම් පැහැති මිනිසා ගැන අනෙක් අයට පැහැදිලි කළා. ඒත් එයා දකපු අනිත් දේවල්, ඒ කියන්නේ පර්ස්, ජේසන් සහ තමන් ගිලී මියයන දර්ශන ගැන එයා මොනවත්ම කියන්න ගියේ නැහැ. එකේ තේරුම මොකක්ද කියන එක ගැන එයාට හරි අදහසක් තිබුණේ නැහැ. කොහොම වුණත් හැමෝම මෙච්චර ප්‍රාණවත්ව ඉන්න උදෑසනක, ඒ ප්‍රබෝධමත් ගතිය නැතිකරලා දාන්න එයාට ඕනේ වුණේ නැහැ. "දම්පාට කමිසයක්ද?" ජේසන් විමසුවා. "එයාගේ හිස්වැසුමේ මිදි වැලක් තිබුණද? ජේන විදියට නම් බැචස් වගේ."

"ඩයෝනීසස්," පර්සි කෙඳිරුවා. "අපි මේ මුළු දුර ගෙවාගෙන කන්සාස් වලට ආවේ ඩී මහත්තයාව බලන්න නම්."

"බැචර් එහෙම නරක කොනෙක් නෙමෙයි," ජේසන් පැවසුවා.

"මම එයාගේ අනුගාමිකයන්ට එච්චර කැමති නැහැ."

පිපර්ව වෙව්ලා ගියා. ජේසන්ටත්, ලියෝට සහ ඇයට මීට මාස කීපයකට කළින් ආවේශ වූ ස්ත්‍රියක් සමඟ හැප්පෙන්න සිද්ධ වෙලා තිබුණේ. තව ඩිංගෙන් කෑලි ටික විතරයි ඉතුරු වෙන්නේ.

"ඒත් ඒ දෙවියන්ගේ ප්‍රශ්නයක් නැහැ." ජේසන් නැවත පැවසුවා.

"වයින් රටේදි මම එක පාරක් එයාගේ උපකාරය ලබාගෙන තියෙනවා."

පර්සි තැතිගත් බවක් පෙන්නුම් කළා. "මිනිහා මොකක් වුණත්. සමහරවිට එයා රෝමය පැත්තේ ඉන්න එක වැඩිය හොඳයි. ඒත් ඇයි එයා කන්සාස්වල කැරකෙන්නේ? මනුෂ්‍යයෝ එක්ක තියෙන සියලු සම්බන්ධතා නවත්වන්න කියලා නොමෙයිද සියුස් නියෝග කරලා තියෙන්නේ?"

ෆ්‍රෑන්ක් උඹනාපයට පත් අයුරින් ගෙරවීමක් පිට කළා. විශා හාදයා මේ උදෑසන පිල්හට ක්‍රීඩා ඇඳුමකින් සැරසිලා හිටියේ හරිය සූරියකාන්ත යායේ ඇවිදින්න ලෑස්ති වෙලා වගේ.

"දෙවිවරු ඒ නියෝගය එච්චර හොඳට පිළිපදින බ ජේන්නේ නෑ." ඔහු පැවසුවා. "අනිත් එක හේසාල් කිව්වා ව දෙවියන්ට හිත්තෝන්මාදය හැදිලා නම්.

"ඒ වගේම ලියෝත් ඒක කිව්වා." ලියෝ කොටසක් කළා. ෆ්‍රෑන්ක් ඔහු දෙස රවා බැලුවා. "එහෙමනම් ඔලිම්පියන්ස් එක්ක මොනවා වෙනවද කියලා කවුද දන්නේ? මෙහෙදී මොනව නරක දෙයක් සිද්ධවෙන්න පුළුවන්."

"ජේන විදියට භයානකයි," ලියෝ ඒ කතාවට එකඟ වෙමි පැවසුවා. "හොඳයි හාදයිනේ... ඔයාලා විනෝද වෙන්න. මම ගහ අලුත්වැඩියා කරලා ඉවර කරන්නම්. කෝච් හෙජ් කැඩුණු ටික හදයි. ඒ වගේම, ඇනබෙත්... මට ඇත්තටම ඔයාගේ උදව් ඕනේ යාන්ත්‍රික ශිල්පය ගැන දේවල් දන්න අනිත් එකම කෙනා ඔයා විතරයි."

සමාව අයැදින ආකාරයෙන් ඇනබෙත්, පර්සි දිහා බැලුවා. "එයා හරි. මම නැවතිලා උදව් කරන්න ඕනේ." "මම ආපහු එන්නම්," ඇගේ කම්මුලට හාදුවක් දෙමින් ඔහු පැවසුවා. "සත්තකින්ම."

දෙදෙනා මෙතරම් පහසුවෙන් එක්වීම පිපර්ගේ නම් හදව රිදුම් දෙන්නට තරම් කාරණයක් වෙලා තිබුණා.

ඇත්තට ජේසන් ශ්‍රේෂ්ඨයෙක්. ඒත් සමහර වෙලාවට එයා හැසිරුණේ දුරින් ඉන්න කෙනෙක් වගේ. ඊයේ රෑත් එයාගේ හැසිරීම ඒ විදියමයි. එයා පැරණි රෝම පුරාවෘත්ත ගැන කතා කරන්න කැමති වුණේ නැහැ. හැමතිස්සෙම එයා ජුපිටර් කඳවුරේ ගෙවුණු පරණ ජීවිතේ ගැන හිතමින් ඉන්න බව පෙනුණා. මේ බාධකය බිඳලා දාන්න තමන්ට පුළුවන් වෙයිද කියන එක ගැනත් පිපර්ට තිබුණේ සැකයක්.

පෞද්ගලිකව රෙයිනාව හමුවෙන්න ජුපිටර් කඳවුරට ගිය ගමනෙන් ප්‍රයෝජනයක් වුණේ නැහැ. ජේසන් රෝමවරුන්ගේ වර්ණය වූ දම් පැහැති කමිසයකින් සැරසිලා හිටියත් ඒකෙන් කිසිම ඵලක් වුණෙත් නැහැ.

තම උරහිසේ එල්ලාගෙන සිටි දුන්න අතට ගත් ෆ්‍රෑන්ක් එය අත්වැටට හේත්තු කළා. "මං හිතන්නේ මම කපුටෙක් හරි වෙන මොකෙක් හරි වෙලා පියාඹලා, රෝම රාජාලියෝ ගැන හොයලා බලන්න ඕනේ."



"ඇයි කපුටෙක් වෙන්නේ?" ලියෝ විමසුවා. "මිනිහෝ, ඔයාට මකරෙක් වෙන්න පුළුවන් නම් ඇයි ඔයා හැම වෙලාවම මකරෙක් බවට හැරෙන්නේ නැත්තේ? ඒක තමයි හොඳම."

ෆ්‍රෑන්ක්ගේ මුහුණ දම් පාට වුණා. "ඒක හරියට ඔයා බර උස්සන කොට බංකුවට ඔයාගේ උපරිම බර දෙන්න නැත්තේ ඇයි කියලා අහනව වගේ දෙයක්. මොකද ඒක උඹාරු දෙයක් වගේම ඒකෙන් ඔයාට පීඩාවක් වෙන්නත් පුළුවන් නිසා. මකරෙක් බවට පත්වෙන එක ලේසි දෙයක් නෙමෙයි.

"ආත්," ලියෝ ඔලුව වැනුවා. "මම දැනගෙන හිටියේ නෑ. මම බර උස්සන්නේ නැහැ."

"ඔව්. හොඳයි, සමහරවිට මයා ඒ ගැන සලකලා බලයි,"

හේසාල් ඔවුන් දෙදෙනා අතරට පැමිණියා.

"මම ඔයාට උදව් කරන්නම්, ෆ්‍රෑන්ක්, "ඇය ලියෝ දිහාට යකඩ බැල්මක් හෙලමින් පැවසුවා. "මට පුළුවන් ඒරියන්ව කඳවලා පහළ ඔත්තු බලන්න කියන්න."

"සත්තකින්ම," තවමත් ලියෝ දිහා බලාගෙන හිටපු ෆ්‍රෑන්ක් පැවසුවා.

"ඔව්, ස්තූතියි."

මේ තුන්දෙනා අතරේ මොනවද වෙන්නේ කියන එක ගැන පිපර්ට තිබුණේ ප්‍රදුමයක්. හේසාල්ගේ හිත දිනාගන්න කොල්ලෝ දෙන්නා රඟපානවා... ඇය තේරුම් ගත්තේ ඒ විදියට. ඒත් හැසාල්ටත්, ලියෝටත් අතීත කතාවක් තියෙන බව ජේන්න තිබුණා. ඇය දැනගෙන හිටිය තරමට ,ඊයේ තමයි පළමු වතාවට එයාලා මූණ ගැහුණේ. මහා ලවණ විලට ගිය ඔවුන්ගේ ගමනෙදී වෙන මොනවහරි දෙයක් සිද්ධවෙලා තියෙන බව ඇයට දැනුණා... ඔවුන් කියපු නැති මොනවහරි දෙයක්.

හේසාල් පර්සි දිහාවට හැරුණා. "මොහෙත් පිටට යනකොට ඔයා ප්‍රවේශම් වෙන්න. ගොවිබිම් ගොඩක් වගේම අස්වැන්නත් ගොඩක් තියෙනවා. කපොයි නිදහස් වෙලා තියෙන්න පුළුවන්.

"කපොයි?" පිපර් විමසුවා.

"ධාන්‍ය ආත්ම," හේසාල් පැවසුවා. "ඔයාලට එයාලව මුණගැහෙන්න වුවමනාවක් නැහැ."

ධාන්‍ය ආත්ම එච්චරටම නරක වෙන්නේ කොහොමද කියන එක පිපර්ට තේරුම් ගන්න බැරි වුණත් හේසාල් ඒක කියපු විදිහ නිසා පිපර් ඒ ගැන අහන්න ගියේ නැහැ.

"සැතපුම් සලකුණ පරීක්ෂා කරන එක අපි තුන්දෙනාට ඉතුරු කරන්න." පර්සි කිව්වා. "මමයි, ජේසනුයි, පිපරුයි. ඩී මහත්මයාව ආයේ දකින්න මගේ කැමැත්තක් නැහැ. ඒ හාදයා පීඩාවක්. ඒත්, ජේසන්, ඔයාට එයා එක්ක හොඳම කොන්දේසි තියෙනවා නම්."

"ඔව්," ජේසන් පිළිතුරු දුන්නා. "අපි එයාව හොයාගත්තාම, මම එයාට කතා කරන්නම්. පිපර්, ඒක ඔයාගේ දක්ම. ඔයයි පෙරමුණ ගන්න ඕනේ.

පිපර්ව වෙව්ලන්නට ගත්තා. ඔවුන් තිදෙනාවම අඳුරු ළිඳක ගිලෙන ආකාරය ඇය දැක තිබුණා. ඒක සිද්ධවෙන්නේ කන්සාස් වලදීද? ඒක නිවැරදි බවක් නොපෙනුණත්, ඇයට ඒ ගැන සහතිකවම කියන්න පුළුවන් කමක් තිබුණෙත් නැහැ.

"ඇත්තවශයෙන්ම," හඬ පාලනය කර ගැනීමට උත්සාහ දරමින් ඇය පැවසුවා. "අපි මහාමාර්ගය හොයා ගනිමු.

ලියෝ කිව්වේ එයාලා සමීපයි කියලා. "සමීපයි" කියන එයාගේ අදහසට සමහර වැඩ ඕනේ වුණා.

හැතැප්ම භාගයක් විතර, උණුසුම් ගොවිපළ අතරින් ගැටුවට පස්සේ අන්තිමේද ඔවුන්ට මාර්ගයට ළඟා වෙන්න හැකිවුණා. සූරියකාන්ත යාය අතරින් ආව ඒ ගමනේදී මදුරුවන්ගේ ප්‍රහාරයට විතරක් නෙමෙයි කසන සුලු සූරියකාන්ත මල්ද ඔවුන්ට මහත් පීඩාවක් වුණා. "බූමාගේ ගැස් සහ කෑම" යනුවෙන් සඳහන් පරණ වෙළෙඳ පුරුවෙන් කියවුණේ ඔවුන් තවමත් පළමු ටොපෙකා පිටවුමට සැතපුම් හතලිහක් ඈතින් සිටින බවයි. "මගේ ගණන් හැදිල්ල හරි. පර්සි පැවසුවා." ඒත් ඒකේ තේරුම අපිට හැතැක්ම අටක් ඇවිදින්න වෙනව කියන එක නෙමෙයිද?"

ජේසන් නැව් මාර්ගයේ දෙපැත්තකටම හිස යොමු කළා. අමෘතයේ සහ පැණිවල ඉන්ද්‍රජාලික සුවපත් කිරීමට ස්තූතිවන්තවන්නට අද ඔහුගේ පෙනුම හරිම අපූරුයි. එයාගේ කළු පැහැය සාමාන්‍ය පැහැයට හැරිලා තිබුණා. ඒ වගේම තළලේ තිබුණු කැළල සම්පූර්ණයෙන්ම අතුරුදහන් වෙලා. ගෙවුණු සීත ඍතුවේදී හේරා විසින් ඔහුට ලබා දුන් අලුත් කෙටි කඩුව ඔහුගේ බඳ පටියේ එල්ලෙමින් තිබුණි. ඉනේ කොට



කඩුවකුත් එල්ලගෙන එහෙ මෙහෙ යන එක ගොඩක් අය කරදරයක් විදියට හිතුවත්, ජේන්ස්ට නම් ඒක බොහොම සාමාන්‍ය දෙයක් බවයි පෙනුණේ.

"කාර් එකක්වත් නැහැ..." ඔහු පැවසුවා. "එත් මම හිතනවා අපිට අනිත් අයගේ වාහනවල පිනට යන්න ඕනේ වෙන එකක් නැහැ කියලා." "නෑ." පිපර් කිව්වේ මාර්ගයේ පහළ දෙසට හිස හරවමිනි.

"අපි දැනටමත් ගොඩබිමේ ඕනාවට වැඩි වෙලාවක් ගත කරලා තියෙනවා. පාටිව්ය කියන්නේ ගයියාගේ ප්‍රදේශයක්."

"හ්මම්..." ජේසන් තම ඇඟිලි සැපුවේය. "මට පුළුවන් ගමනට යාළුවෙකුට කතා කරන්න."

පර්සිගේ දෙබැම එසැවිනි. "ආහ්, ඔව්? මටත් පුළුවන්. අපි බලමු කාගේ යාලුවද ඉස්සෙල්ලාම මෙතෙන්ට එන්නෙ කියලා."

ජේසන් විසිල් කළේය. ඔහු කරන්නේ කුමක්දැයි ඇය දැන සිටියත්, පසුගිය සිසිරයේ වෘක මන්දිරයේදී කුණාටු ඔවුන්ට ආත්මයන් මුණ ගැසුණයින් පසු ඔහු තද කුණාටුවක් කැඳවා ඇත්තේ තුන්වතාවක් පමණි. ඈ අහස පවා තිල් පැහැයෙන් දිස්වෙද්දී එය කළ හැක්කේ කෙසේදැයි පිපර්ට වටහාගත නොහැකි විය.

දෑස් වසාගත් පර්සි සිත එකඟ කරන්නට විය.

පිපර්ට මීට පෙර සමීපව සිට ඔහුට අධ්‍යනය කිරීමට ලැබී නොතිබිණි. අර්ධ ලෝහිත කඳවුරේදී පර්සි ජැක්සන් පිළිබඳ කතා බොහෝමයක් අසන්නට ලැබිණි. පර්සි ජැක්සන් මෙහෙමයි, පර්සි ජැක්සන් අරෙහෙමයි වැනි කතා අතරේ ඔහු මනා පෙනුමකින් යුක්ත වන්නට ඇතැයි ඇය සිතුවාය. එහෙත් ඔහු විශේෂයෙන්ම ජේසන් අසල සිටින බව සිත් ගන්නා සුළු අයෙකු නොවීය. පර්සි, ජේසන්ට වඩා කෙසඟ වූ අතර, අඟලකින් පමණ කොට විය. එසේම පර්සිට තිබුණේ ජේසන්ට වඩා තරමක් දිගු, තද පැහැති කෙස්ය.

සැබැවින්ම ඔහු පිපර් ප්‍රියකළ ආකාරයේ කෙනෙකු නොවිය. කඩවීදියක කොහේදී හෝ ඇයට ඔහු දකින්නට ලැබුණේ නම්, ඔහු ලිස්සා යන්නකු ලෙස සිතනු ඇත. ඇගේ ජීවිතය තුළ ඇයට ඇති තරමට ප්‍රශ්න තිබිණි. එහෙත් ඇනබෙත් ඔහුට කැමති ඇයිද යන්නත්, පර්සිට ඔහුගේ ජීවිතයට ඇනබෙත් අවශ්‍ය ඇයිද යන්නත් පිපර්ට වටහා ගැනීම අසීරු වූයේ නැත. එවැනි හාදයෙකු පාලනයක් යටතේ තබා ගැනීමට හැකි කවුරුන් හෝ සිටීනම්, ඒ ඇනබෙත්ය.

පැහැදිලි අහස් කුසේ අකුණක් පුපුරා ගියේය.

ජේසන් සිනාසිනි. "ඉක්මනින්ම!

"ප්‍රමාද වැඩියි. නැගෙනහිර පැත්තෙන් පියාපත් සහිත
පැහැති හැඩයක් ඔවුන් දෙසට ඇදී එන අයුරු පෙන්වමින්
පැවසුවේය. මුලදී ඒ කපුටෙකු බවට පත්වුණු ෆ්‍රෑන්ක් වන්නට
පිපර් සිතුවාය. ඒ පක්ෂියකුට වඩා බෙහෙවින් විශාල වූවක් බව
ඇයට අවබෝධ විය.

"කළු පෙගාසස්?" ඇය පැවසුවාය. කවදාවත් ඒ
කෙනෙක් දැකලා නැහැ."

පියාපත් සහිත අශ්වයා පොළොවට බැස්සේය. ඌ පර්සි
ඇවිදිමින් නාසය ඔහුගේ මුහුණේ ඇතිල්ලුවේය. ඉන්පසු පිපර්
ජේසන් දෙසට කුතුහලයෙන් හිස හැරවූයේය.

"බ්ලැක් ජැක්," පර්සි පැවසුවේය. "මේ පිපර් සහ ජේසන්
එයටි අශ්වයා සිහින් හඬක් නැගුවේය.

"ආහ්. සමහරවිට පස්සේ, "පර්සි පිළිතුරු දුන්නේය.

පර්සිට අශ්වයින් සමඟ කතාකළ හැකි බව පිපර් අසා තිබුණාය.
අශ්වයන්ට අධිපති පොසිඩන් දෙවිඳුන්ගේ පුත්‍රයා වූ බැවින් ඔහුට එය
කළ හැකිවුවත්, ඇය කිසිවිටෙක එය ක්‍රියාවෙන් දැක නොතිබුණි.

"බ්ලැක් ජැක්ට මොනවද ඕනේ?" ඇය විමසුවාය.

"ඩෝනට්," පර්සි පැවසුවේය. "හැමතිස්සෙම ඩෝනට්. එයාට
අපි තුන්දෙනාවම අරගෙන යන්න පුළුවන් ඒ..."

එක්විටම වාතය සිසිල් විය. පිපර්ගේ කන් අගුළු වැටිණි. යාර
පණහක් පමණ ඈතින්, තට්ටු තුනක් පමණ උසැති, කුඩා ප්‍රමාණයේ
සුළි සුළඟක් සූරියකාන්ත යායට ඉහළින් නැගී එමින් තිබුණේ "ඕස් හි
මායාකාරයා! හා ජවනිකාවක් සිහි ගන්වමිනි. ජේසන් ආසන්නයේ මාර්ග
යට පිවිසි එය, අශ්වයෙකුගේ සිරුර පුරා විදුලිය දිවෙන ජවසම්පන්න
අශ්වයෙකුගේ නොපැහැදිලි ස්වරූපයට පත්විය. "ටෙම්පෙස්ට් (චණ්ඩ
මාරුතය)" ජේසන් පැවසුවේය. "ගොඩක් කාලෙක ඉඳන් මගේ
යාළුවෙක්."

කුණාටු ආත්මය මඳ හේෂාරාවයක් නැගුවේය. බ්ලැක්ජැක්
කලබලකාරී ලෙස පසුපසට විය.



"කලබලවෙන්න එපා, කොල්ලෝ," පර්සි පැවසුවේය. "එයත්
අපේ යාළුවෙක්. "ඔහු ජේසන් දෙස බැලුවේය. "අපූරු පැදවීම." ජේසන්
දෙවුර සෙලුවේය. "වෘක මන්දිරයේ අපේ සටන් තිබුණු කාලෙදි තමයි
මම එයා එක්ක යාළු වුණේ. ඇත්තටම එයා නිදහස් ආත්මයක්. ඒත්
එකපාරක් එයා මට උදව් කරන්න එකඟ වුණා."

පර්සි සහ ජේසන් ඔවුනොවුන්ගේ අශ්වයන් පිට නැගුණේය.
පිපර්ට ටෙම්පෙස්ට් මත හිඳීම කිසිවිටෙකත් සුව පහසුව දනවන්නක්
නොවීය. ඕනෑම මොහොතක වාෂ්ප වී යා හැකි මෘගයෙකු මත
හිඳගෙන සිටීම ඇයව තමරමක් අපහසුතාවයට පත් කරවන්නක් විය.
එසේවුවත්, ජේසන් දිගු කළ අත පිළිගත් ඇය, අසු පිටට නැගුණාය.

බ්ලැක්ජැක් ඉහළින් පියාසර කරද්දී, ටෙම්පෙස්ට් මාර්ගය මතින්
දිව ආවේය. වාසනාවකට, ඔවුන් පසුකර යන කිසිදු මොටර් රථයක්
හමු නොවූ අතර එසේ වූවා නම් ඔවුන් විනාශ වීමට ඉඩ තිබිණි. ටික
වේලාවකින් ඔවුහු සැතපුම් 32 සලකුණු කළ ස්ථානයට පැමිණියහ. එය
සැබැවින්ම පිපර් ඇගේ දර්ශනයේදී දුටු පෙනුමට සමාන විය.

බ්ලැක්ජැක් බිමට පහත් විය. අශ්වයින් දෙදෙනාම ධාවන පථය
පහුර ගාන්නට වූහ. මෙතරම් ඉක්මණින් නැවතීමට සිදුවීම දෙදෙනාගෙ
'ම සතුටට හේතු වූ බවක් නොපෙනුණි. බ්ලැක්ජැක් යමක් මිමිණුවේය.

"ඔයා හරි," පර්සි පැවසුවේය. "සූරා ජේත්තුකාරයා ගැන
කිසිම සලකුණක් නැහැ."

"මම ඔබගෙන් සමාව අයැපිනවා," ගොවිපළ දෙසින් හැඬක්
නැගිණි.

ටෙම්පෙස්ට් කොතරම් වේගයෙන් හැරුණේද යත්, පිපර් බිමට
නොවැටී බේරුණේ යාන්තමිණි.

තිරිඟු ගස් දෙබෑ කරමින් ඉදිරියට පියවර තබන මිනිහෙක්
පිපර්ගේ දෙනෙතට හසුවිය. ඔහු පැළඳ සිටි පුළුල් වාටිය සහිත
හිස්වැස්ම මත මිදි වැල් එතී තිබිණි. ඔහු හැඳ සිටියේ කොට අත්
සහිත දම් පැහැති කමිසයක්, කාකි කොට කලිසමකි. සුදු මේස් පැළඳ
දෙපා බ්‍රිකන්ස්ටොක්ස් පාවහන් වලින් සැරසිණි. පෙනුමින් තිස් හැවිරිදි
පමණ වන්නට ඇති ඔහුට තිබුණේ තරමක් පිම්බුණු උදරයකි.

"කවුරුහරි මට සූරා ජේත්තුකාරයා කියලා කථා කළාද?"
ඔහු උදාසීන, නැළවිලි හඬකින් විමසුවේය. "කරුණාකරලා බැවස්

කියන්න. එහෙම නැත්නම් බැචස් මහත්මයා. එහෙම තරත්නම් බැචස් උතුමාණන්. එහෙමත් නැත්නම් සමහර විට, මගේ දෙවියනේ කරුණාකරලා- මාව- මරන්න එපා, බැචස් උතුමාණනි.''

පර්සි බ්ලැක්ජැක්ට ඉදිරියට යන්නට සංඥා කළත්, පියාඹන අශ්වයා එයට කැමති බවක් නොපෙනුණි.

''ඔයා වෙනස් වෙලා,'' පර්සි දෙවියාට පැවසුවේය. ''කෙට්ටු වෙලා. ඔයාගේ කෙස් දිගුවෙලා. ඒ වගේම ඔයාගේ කමිසේ ඔච්චර සද්දෙ වෙන්න බැහැ.''

වයින් දෙවියා ඇස් කොණකින් ඔහු දෙස බැලුවේය. ''මොන ගින්නක් ගැනද එයා කථා කරන්නේ? ඔයා කවුද, ඒ වගේම සෙරස් කොහේද?''

''ආහ්... මොන සිරිස්ද?''

''මම හිතන්නේ එයා අදහස් කළේ සෙරස් කියන එකයි.'' ජේසන් පැවසුවේය. ''කෘෂිකර්මාන්තයට අධිපති දෙවඟන. ඔයාලා එයාට කියන්නේ ඩෙමිටර් කියලා. ''ඔහු දෙවියා දෙස බලා ගෞරවණීය ලෙස හිස සැලුවේය. ''බැචස් උතුමාණනි, ඔයාට මාව මතකද? සොනොමා වලදී අතුරුදන් දිවියා එක්ක මම ඔයාට උදව් කළා.''

බැචස් ඔහුගේ තරබාරු නිකට පිරිමැද්දේය. ''ආහ්... ඔව් ජෝන් ග්‍රීන්.''

''ජේසන් ග්‍රේස්.''

''මොකවුණත්,'' දෙවියා පැවසුවේය. ''එහෙමනම් සෙරස්ද ඔයාලව එව්වේ?''

''නෑ, බැචස් උතුමාණනි, ''ජේසන් පැවසුවේය. ''ඔයා මෙහෙදී ඇයව හමුවෙන්න බලාපොරොත්තු වුණාද?''

දෙවියා ගෙරවීය. ''හොඳයි, මම කන්සාස්වලට ප්‍රිය සම්භාෂණයකට ආවේ නෑ, මගේ කොල්ලෝ. සෙරස් යුද කවුන්සිලයකට මට මෙහොට එන්න කිව්වා. ගියා ගෙ නැගීමත් එක්ක අස්වැන්න පාළු වෙමින් යනවා. නියඟය පැතිරෙනවා. කාපොයි කැරලි ගහනවා. මගේ මිදි ටිකවත් ආරක්ෂා වෙලා නෑ. සෙරස්ට ඕනේ වෙලා තියෙනවා ශාක යුද්ධයට එක්සත් පෙරමුණක්.''

''ශාක යුද්ධය,'' පර්සි පැවසුවේය. ''ඔයා හදන්නේ ප්‍රංචි මිදි ගෙඩි ජේරම කුඩා ඇසෝල්ට් රයිෆල් වලින් සන්නද්ධ කරන්නද?''



දෙවියා දැස් පටු කළේය. ''අපි හමුවෙලා තියෙනවද?''

''අර්ධ ලෝහිත කඳවුරේදී,'' පර්සි පැවසුවේය. ''මම ඔයාව දැනගෙන හිටියේ ඩී මහත්මයා- ඩියොනීසස් විදිහට.''

''ආහ්!'' ඇසක් ගැසූ බැචස් ඔහුගේ අත් කම්මුල්වලට තබා තද කළේය. මොහොතකට ඔහුගේ රුව, වෙව්ලන්නට විය. පිපර් වෙනස් පුද්ගලයෙකු දුටුවාය. තර, වඩාත් හඬ ඇති දිවියෙකුගේ රටා ඇති කමිසයක්. ඉන්පසු බැචස් නැවත බැචස් බවට පත්විය. ''ඒක නවත්තන්න!'' ඔහු කෑගැසුවේය. ''මාව ග්‍රීකයෙක් විදියට හිතන එක නවත්තන්න.''

පර්ස ඇසිපිය ගැසුවේය. ''ආහ්, ඒත්...''

''එහෙම කේන්ද්‍රගතවෙලා ඉන්න එක කොච්චර උභාරු දෙයක්ද කියන එක ගැන ඔයාට අදහසක් තියෙනවද? හැමතිස්සෙම ඔළුවේ කැක්කුම! මම කොහෙත්ම දන්නේ නෑ මම මොනවද කරන්නේ හෝ මම කොහොමද යන්නේ කියලා. හැමතිස්සෙම කේන්තියෙන්.''
''ඒක ඔයාට ටිකක් සාමාන්‍යයි,'' පර්සි පැවසුවේය.

දෙවියාගේ නාස් පුඩු වලින් ගිනිදලු පිටවිය. ඔහුගේ හිස්වැස්ම මත තිබූ මිදි කොළවලින් එකක් පිළිස්සී ගියේය. ''අනෙක් කඳවුරේදී අපි එකිනෙකාව දැනගෙන හිටියනම්, මට පුදුම මම දැනටමත් ඔයාව ඩොල්පින් කෙනෙක කළේ නැත්තේ ඇයි කියලා.''

''ඒ ගැන සාකච්ඡා වුණා,'' පර්සි ඔහුට සහතික විය. ''මම හිතන්නේ ඔයා ඒක කරන්න ගොඩක් කම්මැලි වුණා.''

බියකරු වශීකරණයකින් පිපර් එදෙස බලාගෙන සිටියහ. මේ ආකාරයෙන් ඇයට ඉදිරියේදී මොටර් රථයක විනාශයක් දැකගත හැකිවනු ඇත. පර්සි කිසිවක් හොඳින් කරන්නකු නොවන බව දූත් ඇයට අවබෝධ වෙමින් තිබිණි. ඇනබෙත් ඔහුට නාස් ලණුවක් දමා නොතිබුණාය. මුහුදු ක්ෂරපායියකු ලෙසින් පර්සිව නැවත රැගෙන ගියොත් ඇගේ මිතුරිය ඇයට කිසිවිටෙක සමාවක් නොදෙන බව ඇය දූන සිටියාය.

''බැචස් උතමාණනි,'' ටෙම්පෙස්ට්ගේ පිටින් බසිමින් ඇය බාධා කළාය.

''පිපර්, පරිස්සමින්,'' ජේසන් පැවසුවේය.

ඇය අනතුරු ඇඟවන බැල්මකින් ඔහු දෙස බැලුවාය. "මම මේක කරන්නම්.

"ඔයාට කරදර කළාට සමාවෙන්න, උතුමාණනි," ඇය දෙවියාට පැවසුවාය. "ඒත් ඇත්තටම, අපි මෙහාට ආවේ ඔයාගේ උපදේශයක් ගන්න. කරුණාකරලා, අපට ඔයාගේ දැනුම අවශ්‍යයි."

ඇය බෙහෙවින් සන්සුන්ව, ඇගේ විනීත හඬින් කතා කළාය.

දෙවියා රවාගෙන සිටි නමුත්, ඔහුගේ දෑස්වල තිබූ දම් පැහැති දිලිසීම වියැකී ගියේය.

"ඔයා හොඳට කතාකරන ගෑනු ළමයෙක්. උපදේශයක් නේද? බොහෝම හොඳයි. මම කැරොකේ මගහරිනවා. ඇත්තටම තේමා සම්භාෂණ වලටත් යන්නේ නැහැ. මේ කටුක කාලයේදී, මිනිස්සු හොයන්නේ සරල, ප්‍රකට නැති සම්බන්ධතා දේශීයව නිපදවපු කාබණික කෑම සහ..."

"සම්භාෂණ ගැන නෙමෙයි." පිපර් බාධා කළාය. "ඒක පුදුමාකාර ප්‍රයෝජනවත් උපදේශයක් වුණත්, බැචස් උතුමාණෙනි මම කියන්නේ ඒ ගැන නෙමෙයි. අපි බලාපොරොත්තු වෙන්නේ අපේ ගවේෂණයේදී ඔයා අතට උදව් කරයි කියලා."

ඇය ආර්ගෝ II ගැන පැහැදිලි කළ අතර, ගියා ව අවදි කරමින් සිටින යෝධයින් නැවැත්වීමේ ඔවුන්ගේ චාරිකාව ගැනද පැහැදිලි කළාය. නෙම්සිස් පැවසූ දේ ඇය ඔහුට පැවසුවාය. ඒ දින හයක් තුළ රෝමය විනාශ වන බවයි. බැචස් ඇයට රිදී පූකුරුට පිරිනැමූ තැනදී ඇගේ පිහියෙන් පරිවර්තනය වූ දර්ශනය ගැන ඇය පැවසුවාය.

"රිදී පූකුරුව?" දෙවියන්ගේ හැඬේ තැතිගැන්මක් නොතිබිණි. කොහෙන්දෝ ඩයට් පෙප්සි පැනයක් අතට ගත්ඔහු එහි උඩ කොටස කඩා දැමුවේය.

"ඔයා බොන්නේ ඩයට් කෝක් නේ," පර්සි පැවසුවේය.

"මම දන්නේ නෑ ඔයාලා මොනවා ගැනද කියන්නේ කියල," බැචස් උගුරක් පානය කළේය. "පූකුරුවේ දර්ශනය විදිහට, තරුණ නෝනා, මට ඔයාට දෙන්න වෙන දෙයක් නැහැ. ඔයාට පෙප්සි ඕනේ නැති වුණත්. බාලයන්ට වයින් දෙන්න එපා කියලා ජුපිටර් ඕනේ නැති වුණත්. බාලයන්ට වයින් දෙන්න එපා කියලා ජුපිටර් මට තදින්ම නීතියක් පනවල තියෙන්නේ. කරදරයන් තමයි, ඔයාලා ඒක ගන්න



ඕනේ. යෝධයෝ ගැන කියද්දි නම්, මම එයාල ගැන හොඳට දන්නවා. ඔයාලා දන්නවද, මම පළවෙනි යෝධ යුද්දෙත් සටන් කළා.

"ඔයාට කරන්න පුළුවන්ද?" පර්සි විමසුවේය.

ඩියෝනිසස් ගෙරෙවුවේය. ඔහුගේ පෙප්සි කැනය, මුදුනේ පයින් ගෙඩියක් සහිත, අඩි පහක පමණ රිටක් බවට පත්විය. එහි වැලක් එතී තිබිණි.

"තිර්සස්," දෙවියා ඉන් පර්සිගේ හිසට පහර දීමට පෙර ඔහුගේ අවධානය බිඳී යන අයුරින් පිපර් පැවසුවාය. උබතු දෙවගනන්ගේ අතෙහි එවැනි ආයුධ තිබෙන අයුරු ඇය මින් පෙර දැක තිබුණු අතර එය නැවත දැකීම සතුට උපදවන්නක් වූයේ නැත. එහෙත් ඇය විස්මය පෙන්වීමටට උස්සාහයක් වූයේ නැත. එහෙත් ඇය විස්මය පෙන්වීමට උත්සාහ කළාය. "ආහ්, කොච්චර විශාල ආයුධයක්ද!"

"ඇත්තවශයෙන්ම," බැචස් එකඟ විය. ඔයාලගේ කණ්ඩායමේ කවුරුහරි කෙනෙක් දක්‍ෂයෙක් වීම ගැන මම සතුටු වෙනවා. පයින් ගෙඩිය කියන්නේ විනාශය සඳහා බියකරු උපකරණයක්. පළවෙනි යෝධ යුද්දයේදී මම උපදෙවියෙක් වෙලා හිටියා. ජුපිටර්ගේ පුත්‍රයා!

ජේසන් හැකිළුනේය. ඒ වයින් ජේත්තුකාරයා තම වැඩිමහල් සොහොයුරා බව මතකයට නඟා ගැනීම ඔහුට සතුටට කරුණක් නොවන බව පෙනිණි.

බැචස් ඔහුගේ රිට ගුවනේ කරකවන්නට විය. එහෙත් කලගෙඩි උදරය මුළුමනින්ම ඔහුගේ සමබරතාවය නැති කිරීමට සමත් විය. "ඇත්තවශයෙන්ම ඒ මම වයින් හඳුන්වා දෙන්නට සහ උඹරණීයත්වයට පත්වෙන්න බොහොම ඉස්සර. මම දෙවිවරු සහ තවත් යම් උපදෙවියකු සමඟ සටන් කළා.... හරි ක්ලීස් මම හිතන්නේ."

"හෙරක්ලස්ද?" පිපර් ආචාරශීලීව විමසුවාය.

"මොකා හරි," බැචස් පැවසුවේය. "කොහොමවුණත්, මම එපියාල්ටිස් යෝධයාවයි එයාගේ සහෝදරයා ඔටිස්වයි මරලා දැම්මා ඒ දෙන්නම, භයානක නහරකාරයෝ දෙන්නෙක්. උන් දෙන්නගෙ මුහුණුවලට පයින් ගෙඩි පාර වැදුණා."

පිපර් හුස්ම නොහෙලා බලා සිටියාය. සියල්ල එක්විට, අදහ කීපයක් ඇගේ හිස තුළට ඇතුළු විය. සිහියෙන් දුටු දර්ශනය රැයක පෙර ඔවුන් සාකච්ඡා කර තිබූ අනාවැකි පෙළ ඇගේ හිස තුළට ඇ විය. තම පියා සමඟ කිම්දෙද්දී, දිය යටදී ඔහු ඇගේ මුබ ආවරණ

ඉවත් කළ විට දැනෙන හැඟීමක් ඇයට ඇති විය. එක්විටම සියල්ල පැහැදිලි විය.

"බැචස් උතුමාණනි." හඬෙහි වූ චකිතය පාලනය කරගැනීමට උත්සාහ දරමින් ඇය පැවසුවාය. "ඒ යෝධයෝ දෙන්නා, එපියාල්ටීස් සහ ඔටිස්... එයාලා දෙන්නා නිවුන්නොෝ වෙන්න පුළුවන්ද?"

"හ්ම්ම්?" තම තිර්සසය කරකැවීමෙන් දෙවියන්ගේ අවධානය බිඳී ගිය බවක් පෙනුණත්, ඔහු හිස සැලුවේය. "ඔව්, නිවුන්නෝ. ඒක හරි."

පිපර් ජේසන් දෙසට හැරුණේය. ඔහුත් ඇය සිතන දේම සිතන බව ඇයට පෙනී ගියේය. දෙවියන්ගේ සුසුම්න් ඇඳ ගත් නිවුන්නු.

කැටොප්ට්‍රිස් හි තල තුළදී, කහ පැහැති ලෝගුවලින් සැරසුණු යෝධයන් දෙදෙනෙක්, ගැඹුරු වලකින් බඳනක් ඔසවන අයුරු ඇය දැක තිබුණාය.

"ඒ නිසා තමයි අපි මෙහෙ ආවේ." පිපර් දෙවියාට පැවසුවාය. "ඔයා අපේ ගවේෂණයේ කොටසක්!

බැචස් මුහුණ හැකිළුවේය. "සමාවෙන්න, මගේ කෙල්ලේ මම තවදුරටත් උපදෙවියෙක් නෙමෙයි. මට ගවේෂණ කරන්න බැහැ."

"ඒත් යෝධයින්ව මරන්න පුළුවන් වීරයෝයි දෙවියෝයි එකතුවෙලා වැඩකළොත් විතරයි." ඇය විරෝධය පෑවාය. "ඔයා දැන් දෙවි කෙනෙක්, ඒ වගේම අපිට සටන් කරන්න වෙන්නේ එපියාල්ටීස් සහ ඔටිස් කියන යෝධයෝ දෙන්නා එක්ක. මම හිතන්නේ... මම හිතන්නේ එයාලා අපිව බලාපොරොත්තුවෙන් රෝමයේ ඉන්නවා. කොයි විදියකින් හරි එයාලා හදන්නේ නගරය විනාශ කරන්න. මගේ දර්ශනයේදී මම දැකපු රිදී පූකුරුව- සමහරවිට ඒක ඔයාගේ උපකාරය ගැන සලකුණක් වෙන්න ඇති. යෝධයින්ව මරන්න ඔයා අපිට උදව් කරන්න ඕනේ."

බැචස් ඇය දෙස බලාගෙන සිටියේය. ඇය තම වචන දුර්වල ලෙස තෝරගන්නා බව ජේසන්ට අවබෝධ විය.

"මගේ කෙල්ලේ," ඔහු මෘදුව පැවසුවේය. මට කරන්න කිසිම දෙයක් නැහැ. අනිත් අතට, මම උදව් කරන්නා මට නියම ගෞරවය දුන්න අයට විතරයි. සියවස් ගණක් කවුරුවත්ම ඒක කරලා නෑ."

බ්ලැක්ජැක් අපහසුවෙන් නලියන්නට විය.



පිපර්ට ඒ ගැන දොස් පැවරිය නොහැකි වූවාය. ගෞරවයට වැනි දේවලට ඇය කැමති නොවූවාය. ඇයට බැචස්ගේ අනුගාමිකයින් වූ ආවේශ වූ ස්ත්‍රීන්ට මතකයට නැගිණි. ඔවුන් තම බැතිමතුන් නොවන අය දැකින් ඉරා දමති. එසේම එය සිදුවන්නෙත් ඔවුන් හොඳ චිත්ත ස්වභාවයකින් සිටින විටදීය.

ඇය ඇසීමට බිය වූ ප්‍රශ්නය පර්සිගේ මුවින් එළියට ආවේය. "මොන විදිහේ ගෞරවයක්ද?"

එය නොසලකා හැරීමට බැචස් අත වැනුවේය. "උඹට කරන්න කිසිම දෙයක් නෑ, අහංකාර ග්‍රීකයෝ. ඒත් මම තුඹලාට නොමිලේ උපදේශයක් දෙන්නම්. ඒ මේ කෙල්ලගේ යම් තරමක ආචාරශීලීබවක් තිබුණ නිසා. ගියා ගේ පුත් පෝසයිඩ්වල හොයන්න. එයා හැමතිස්සෙම එයාගේ අම්මට වෛර කරනවා. මම ඒ ගැන එයාට වැරදි කියන්නේ නැහැ. එයාගේ සහෝදර නිවුන්නන්ගෙනුත් එයාට එච්චර එලක් නැහැ. අර වීරවරිය- ඇට්ලැන්ටා නමින් නම් කළ නගරයේදී ඔයාලට එයාව හමුවෙයි."

පිපර් හැකිළුණාය. "ඔයා කියන්නේ ඇට්ලැන්ටා කියලද?"

"ඒක තමයි."

"ඒත් මේ පෝපයිස්," ජේසන් පැවසුවේය. "එයා යෝධයෙක්ද? ටයිටන් කෙනෙක්ද?"

බැචස් සිනාසුණේය. "දෙකෙන් එකක්වත් නෙමෙයි. ලුණු වතුර හොයා ගන්න."

"ලුණු වතුර..."පර්සි පැවසුවේය. "ඇට්ලැන්ටාවල?"

"ඔව්," බැචස් පැවසුවේය. "ඔයාට කන් ඇහෙනවා අඩුද? ගියා සහ නිවුන්නු ගැන දැනුම දෙන කවුරු හරි ඉන්නවානම්, ඒ පෝසයිස්. එයා ගැන විතරක් හොයන්න."

"ඔයා මොකක්ද අදහස් කරන්නේ?" ජේසන් විමසුවේය.

බැචස් ඒ වනවිටත්, සම්පූර්ණයෙන්ම පාහේ මුදුන් වී තිබූ හිරු දෙස බැලුවේය. "සෙරස් ප්‍රමාදවෙන්න විදියක් නෑ, එයාට මේ ප්‍රදේශයේ මොනවහරි භයානක දෙයක් ගැන දැනිලා නැත්නම්. එහෙම නැත්නම්..."

දෙවියාගේ මුහුණ එක්විටම දුර්මුඛී විය. "එහෙම නැත්නම් උගුලක්. හොඳයි, මම යන්න ඕනා! ඒ වගේම මම ඔයා චූණාතම් ... කරනනෙත් ඒකමයි."

"බැචස් උතුමාණනි, ටිකක් නවතින්න!" ජේසන් විරෝධ පෑවේය. සෝඩා කෑනයක පියන විවරවන හඬක් නංවමින් දෙවි... අතුරුදහන් විය.

සූරියකාන්ත යාය අතරින් සුළං හමා ගියේය. අශ්වයෝ කලබලයෙන් පියවර තබන්නට වූහ. වියළි උණුසුම් දිනයක් වුව... පිපර් වෙව්ලන්නට වූවාය. සීතල හැඟීමක්... ඇනබෙත් සහ ලියෝ දෙදෙනාව සීතල හැඟීම විස්තර කර තිබුණාහ...

"බැචස් නිවැරදියි, "ඇය පැවසුවාය. "අපි පිටවෙන්න ඕනේ.." නිද්‍රාශීලි හඬකින් පැවසීය. එයා පිපර්ගේ දෙපා යට පිහිටි භූමියෙන් අසුනඳ දුන්නේය.

පර්ස් සහ ජේසන් ඔවුන්ගේ අසිපත් ඇඳ ගත්හ. බියෙන් ගල් ගැසුණු පිපර්, මාර්ගය මත ඔවුන් දෙදෙනාට මැදිව සිටගෙන සිටියාය. ගියා ගේ බලය එක්විටම සෑමතැනකම විය. සූරියකාන්ත මල් හැරී ඔවුන් දෙස බලා සිටියහ. දැකැති මිලියන ගණනක් මෙන් ඉරිඟු ඔවුන් දෙසට නැමිනි.

මගේ සම්භාෂණයට සාදරයෙන් පිළිගන්නවා, ගියා මිමිණුවාය. ඇගේ හඬ පිපර්ට ධාන්‍ය වැඩෙන ආකාරය සිහිගැන්වීය. පිපිරෙන, පිඹින, උණුසුම් සහ නොනවතින හඬ ඇය ඔක්ලහොමාවල තම සීයාගේ නිවෙසීදී සෑම රාත්‍රියකම අසා තිබුණාය.

බැචස් මොනවද කිව්වේ? දෙවඟන සමච්චල් කළාය. කාබණික ආහාර සමඟ සරල සම්බන්ධයක් ගැනද? ඔව් මගේ ආහාරවලට, මට ඕනෑ වෙන්නේ දෙවර්ගයක් විතරයි. ගැහැනු උපදෙවියෙක්ගේ රුධිරයයි, පිරිමියෙක්ගේ රුධිරයයි. පිපර්, මගේ පැටියෝ, ඔයත් එක්ක මැරෙන කෙනාව තොරගන්න.

"ගියා!" ජේසන් කෑගැසුවේය. "ඉරිඟු අස්සේ හැංගෙන එක නවත්තලා එළියට වරෙන්!"

එච්චර නිර්භීතකමක්, ගියා පිම්බාය. ඒත් අනෙක් කෙනා, පර්ස් ජැක්සන්, එයත් ඉල්ලීමක් කරනවා. තෝරගන්න පිපර් මැක්ලියාන් එහෙම නැත්නම් මම කරන්නම්.



පිපර්ගේ හදවත ගැහෙන්නට විය. ගියා සුදානම් වන්නේ ඇය මරා දමීමටය. එහි පුදුමයක් නැත. එහෙත් මේ එක කොල්ලකු තෝරගන්නේ කුමකටද? ඇයි ගියාට ඔවුන් දෙදෙනාට යන්නට හරින්න බැරි? එහි උගුලක් ඇත.

උඹ උන්මත්තකයෙක්" ඇය කෑ ගැසුවාය. "මම උඹ වෙනුවෙන් කිසිම කෙනෙක්ව තොරගන්නේ නැහැ."

එක්විටම ජේසන් ගැස්සිණි. ඔහු තම සෑදලය මත සෘජුව හිඳ ගත්තේය.

"ජේසන්!" පිපර් කෑ ගැසුවාය. "මොකද වුණේ...?"

ඔහු පහළ සිටින ඇය දෙස බැලුවේය. ඔහුගේ ඉරියව් අයහපත් ලෙස සන්සුන් වී තිබිණි. ඔහුගේ දෑස් තවදුරටත් නිල් පැහැ නොවිය. ඒවා තනි රන් පැහැයෙන් දිළිසිනි.

"පර්සි, උදව් කරන්න!" පිපර් නැවත මුම්පෙස්ට් වෙතින් ඉවතට ගාටමින් පැවසුවාය.

එහෙත් පර්සි ඔවුන් වෙතින් ඉවත් ව සිටියේය. ඔවුන්ට අඩි තිහක් පමණ ඈතින් මාර්ගයේ නැවතුණු ඔහු, තම අශ්වයාව වටේට කරකවන්නට විය. තම අසිපත එසවූ ඔහු එහි තුඩ ජේසන් දෙසට එල්ල කළේය.

"එක්කෙනෙක් මැරයි," පර්සි පැවසුවේය. එහෙත් ඒ හඬ ඔහුගේ නොවීය. එය යමෙකු කාලතුවක්කු බැරලයක් තුළ සිට කොඳුරන්නාක් වැනි හඬකි.

"මම තෝරන්නම්," ජේසන් එවැනිම හිස් හඬකින් පිළිතුරු දුන්නේය.

"නෑ!" පිපර් කෑ ගැසුවාය.

පර්සි සහ ජේසන් එකිනෙකාට උභියෝග කරගන්නා විට, ඇය අවට සෑමතැනකම භූමියෙන් ගියා ගේ සිනහව නැඟී ආවේය. පර්සිගේ සහ ජේසන්ගේ අවි සූදානම්ව තිබිණි.

# 11
# පිපර්

අශ්වයන් නොසිටියේ නම්, පිපර් මිය යාමට ද ඉඩ තිබිණි.

ජේසන් සහ පර්සි එකිනෙකා සමඟ සටන් වැදුණත්, ටෙම්පෙස්ට් සහ බ්ලැක්ජැක්, පිපර්ට එතැනින් පැනගැනීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන තෙක් ඔවුන්ට බාධා කළහ.

මාර්ගයේ අද්දර තෙක් පෙරළී ගිය ඇය, කොල්ලන් දෙදෙනා අසිපත් ආමෝරාගෙන සිටින දෙස බියෙන් බලා සිටියාය. රත් සහ ලෝකඩ එකිනෙකාට එරෙහි වී තිබිණි.

ගිනි පුළිඟු විසිරිණි. අසිපත් තල බොඳවන තරමට ඒවායේ පහර වේගවත් විය. පහර දීම්, පහර වැළකීම් අතර පොළොව දෙදරන්නට විය. පළමු පිරිනැමීමට තත්පරයක් පමණ ගතවුවත්, පිපර්ට ඔවුන්ගේ කඩු සටනේ වේගය විශ්වාස කළ නොහැකි තරම් විය. අශ්වයෝ එකිනෙකා තල්ලු කර ගන්නට වූහ. ටෙම්පෙස්ට් ගුගුරමින් විරෝධය පළ කළ අතර, බ්ලැක්ජැක් ඔහුගේ පියාපත් ගැසුවේය. "ඕක නවත්තන්න!" පිපර් කෑගැසුවාය.

මොහොතක් ගතවන තුරු, ජේසන් ඇගේ හඬට කන්දුන්නේය. ඔහුගේ රත් පැහැති දෑස ඇය දෙසට යොමු වී තිබිණි. අසිපත ලෙලවමින් පර්සි ජේසන්ට පහර දුන්නේය. වාසනාවකට, පර්සි ඔහුගේ අසිපත හැරෙවූයේය... සමහරවිට එය හිතාමතා කළ දෙයක් හෝ අහම්බයකින් සිදුවූවක් විය හැකිය. එනිසා ජේසන්ගේ ලයේ ගැටුණේ



අසිපත් තලයේ පැතලි පැත්තයි. එහෙත් ඒ පහර ජේසන්ව අසු පිටින් බිම ඇද දැමීමට ප්‍රමාණවත් විය.

"පර්සි!" පිපර් කෑ ගැසුවාය. "ජේසන් ඔයාගේ යාළුවෙක්. ඔයාගේ කඩුව බිම දාන්න!"

පර්සිගේ අසිපත රැඳී අත පහතට වැටිණි. පිපර්ට ඔහුව තම පාලනය යටතට ගැනීමට හැකිවනු ඇත. එහෙත් අවාසනාවකට ජේසන් නැගිටීමට සමත් වී තිබිණි.

ජේසන් ගෙරෙවූයේය. විදුලි එළියක් චාපයක් මෙන් නිල් පැහැති අහසේ ඇදී ගියේය. එයින් කෙටී කඩුව ඉවතට විසි වී ගොස් පර්සි අශ්වයා පිටින් ඇද වැටිණි.

බ්ලැක්ජැක් කරකැවී ගොස් ඉරිඟු යායක් තුළට වැදුණේය. ජේසන් පර්සිට පහර දුන්නේය. මේ වනවිට විදුලිය හේතුවෙන් ඔහුගේ ඇඳුම්වලින් දුම් දමමින් තිබුණි.

බියකරු මොහොතේදී, පිපර්ට කතා කර ගැනීමට නොහැකි විය. ගයියා ඇයට කොඳුරන බව පෙණිනි. ඔබ කෙනෙක් තෝරාගත යුතුයි. ඇයි ජේසන්ට ඔහුව මරන්නට ඉඩ නොදෙන්නේ?

"නෑ!" ඇය කෑ ගැසුවාය. "ජේසන්, නවත්තන්න!"

අසිපත පර්සිගේ මුහුණට අඟල් හයක් මෑත්ව තිබියදී ජේසන් ගල් ගැසුණාක් සේ නතර විය.

ජේසන් හැරී බැලුවේය. ඔහුගේ දෑස් තුළවූ රත් ආලෝකය අවිනිශ්චිත ලෙස දිලිසෙමින් තිබිණි. "මට නවත්තන්න බැහැ. එක්කෙනෙක් මිය යා යුතුයි."

ඒ හඬෙහි යම් දෙයක් තිබිණි... ඒ ගයියා නොවේ. ඒ ජේසන්ද නොවේ. කතා කළ කවුරු වුණත්, තතනමින් කතා කළේ ඉංග්‍රීසි දෙවැනි භාෂාව මෙනි.

"තුඹ කවුද?" පිපර් විමසුවාය.

ජේසන්ගේ කට ඇඹරී ගොස්, බියකරු සිනාවක් මතුවිය. "අපි අරක් ගත් ආත්ම. අපි නැවත ජීවය ලබමු."

"එයිඩොලොන්ල?" පිපර්ගේ මනස ව්‍යාකූල විය. අර්ධ ලෝහිත කඳවුරේදී ඇය සියලු ආකාරයේ රාක්ෂයන් ගැන ඉගෙන ගෙන තිබූ නමුත් ඒ වචනය එතරම් හුරුපුරුදු වූවක් නොවිය. "තුඹ... තුඹ යම් ආකාරයක භූතයෙක්ද?"

"ඔහු මිය යා යුතුයි..." ජේසන්ගේ අවධානය නැවත පර්සි වෙතට යොමුවිය. එහෙත් ඔවුන් දෙදෙනා අවබෝධ කරගෙන තිබුණටත් වඩා, පර්සි ප්‍රකෘති තත්ත්වයට එළැඹ සිටියේය. ඔහු තම පාදයෙන් ජේසන්ට බිම වැටවෙන්නට පහරක් දුන්නේය.

අප්‍රසන්න හඬක් නගමින් ජේසන්ගේ හිස මහාමාර්ගයේ ගැටිණි.

පර්සි, ජේසන්ගේ ළයට ඉහළින් තම රිප්ටයිඩය එසවූයේය. ක්ෂණික බියකින් පිපර්ගේ උගුර වියළී ගියේය. ඇයට තම කිණිස්සෙන් පර්සිට පහර දීමට අවශ්‍ය වුවත්, එයින් කිසිදු ඵලක් නොවන බව ඇය දැන සිටියාය. ඔහුව ග්‍රහණයට ගෙන සිටින කුමක් වුවත් එය පර්සිගේ හැකියාවන් සියල්ල පාලනය කරමින් සිටී. සටනකින් ඇයට ඔහු පැරදවීමේ කිසිදු හැකියාවක් නොතිබිණි.

ඇය, අවධානය ලබා ගැනීමට උත්සාහ කළාය. ඇගේ සියලු කෝපය වචනවලට පෙරළ ඇය කෑ ගැසුවාය. "එයිඩෝලන්, නවතිනු."

පර්සි ගල් ගැසුණේය.

"මා දෙස බලනු." පිපර් නියෝග කළාය.

මුහුදු දෙවියාගේ පුත්‍රයා හැරුණේය. ඔහුගේ දෑස්වල කොළ පැහැය වියැකී රන් පැහැයක් ගෙන තිබූ අතර, මුහුණ සුදුමැලි වී කෲර බවක් ගෙන තිබිණි. එය කිසිසේත්ම පර්සිගේ මුහුණ නොවීය.

"ඔබ තෝරගත් කෙනා නෙමෙයි." ඔහු පැවසුවේය. "එබැවින් මොහු මිය යනු ඇති."

"නුඹ පාතාලයෙන් ආ ආත්මයක්," පිපර් අනුමාන කළාය. "නුඹ පර්සි ජැක්සන්ට අරක්ගෙන සිටිනවා, එහෙම නේද?"

පර්සි අවඥාවෙන් බලා සිටියේය. "මේ සිරුර තුළ මට නැවත ජීවය ලැබුණා. පොළෝ මාතාව අවසර දුන්නා, මම කැමති ඕනෑම තැනක යන්න, මම කැමති කෙනෙක් පාලනය කරන්න."

ශීත රළ පහරක් පිපර්ව නහවන්නාක් සේ දැනිණි. "ලියෝ... ලියෝටත් වුණේ ඒකයි. එයාවත් පාලනය කරලා තියෙන්නේ එයිඩෝලන් කෙනෙක්."

පර්සිගේ ස්වරූපයෙන් සිටි දෙය සිනාසිණි. එහෙත් එය සරදම් සිනාවක් නොවීය. "ඔයා තේරුම් ගන්න කොට පරක්කු වැඩියි. ඔයාට විශ්වාස කරන්න පුළුවන් කවුරුවත් නැහැ."



ජේසන් තවමත් නොසෙල්වී සිටියේය. අසරණව සිටි පිපර්ට, ඔහුව ආරක්ෂා කිරීමේ හැකියාවක් නොතිබිණි.

පර්සිට පිටුපසින්, හිරිගු යාය තුළ යමක් සෙලවිණි. පිපර්ට කළු පැහැති පියාපතක කෙළවරක් දක්නට ලැබිණි. පර්සි හඬ ආ දෙසට හැරෙන්නට සූදානම් විය.

"ඒක පැත්තකට දාන්න!" ඇය කෑ ගැසුවාය. "මා දිහා බලන්න." පර්සි අවනත විය. "ඔබට මාව නවත්තන්න බැහැ. මම ජේසන් ග්‍රේස්ව මරණවා."

ඔහුට පිටුපසින්වූ , හිරිගු යායෙන් බ්ලැක්ජැක් මතුවූයේ එවැනි විශාල සත්ත්වයෙකුට කළ නොහැකි තරමේ රහස්‍යභාවයකිනි. "ඔයාට එයාව මරන්න බැහැ. " පිපර් නියෝග කළාය. එහෙත් ඇය පර්සි දෙස බලාගෙන සිටියේ නැත. පියාපත් සහිත අශ්වයා දෙසට යොමුවූ ඇගේ ඇස්, අගුළු වැටී තිබිණි. ඇගේ සියලු බලය වචන වලට ඇතුළු කළ ඇය බ්ලැක්ජැක්ට එය තේරුම් ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කළාය.

"ඔබ ඔහුව බිම දායි"

වශී කතාවට පර්සි රැවටුණේය. ඔහු අවිනිශ්චිත ලෙස සිය බර එසවූයේය. "මම... එයාව බිම දමයිද?"

"ආහ්, සමාවෙන්න." පිපර් සිනාසුණාය. "මම කතාකළේ ඔයාට නෙමෙයි."

පිටුපසින් ළංවූ බ්ලැක්ජැක්, තම කුරය ගෙන පර්සිගේ හිස මත තැබුවේය.

වකුටුවෙමින් පර්සි, ජේසන් අසලින්ම මාර්ගය මත ඇද වැටුණේය.

"ආහ්, දෙවියනේ!" පිපර් කොල්ලන් දෙදෙනා දෙසට දිව ගියාය. "බ්ලැක්ජැක් ඔයා එයාව මැරුවේ නෑ නේද?"

පියාපත් සහිත අශ්වයා හඬ නගමින් හුස්මක් පිට කළේය. පිපර්ට අශ්වයා සමඟ කතා කළ නොහැකි වුවත්, මම මගේ ශක්තිය ගැන දන්නවා, යනුවෙන් ඌ කියන්නට ඇතැයි ඇය සිතුවාය.

ටෙම්පෙස්ට් කොතැනකවත් දක්නට නොසිටියේය. පැහැදිලි දිනකදී කුණාටු ආත්මයන් සජීවීවන කොතැනකට වුව විදුලි කොටන අශ්වයා පැහැදිලිවම නැවත පැමිණෙනු ඇත.

පිපර් ජේසන්ව පරීක්ෂා කළාය. ඔහු එකාකාරව හුස්ම ගනිමින් සිටි නමුත්, දින දෙකක් තුළ, හිස් කබලට පහර දෙකක් එල්ල වීම ඔහුගේ පැත්තෙන් යහපත් දෙයක් නොවිය. ඉන්පසු ඇය පර්සිගේ හිස පරීක්ෂා කළාය. කිසිදු ආකාරයක රුධිර ගලනයක් ඇයට දක ගැනීමට නොහැකි වුවත්, අශ්වයාගේ පහර වැදුණු තැන විශාල ගැටිත්තක් ඇති වී තිබෙණු දක්නට ලැබුණි. "අපි මේ දෙන්නව ආපහු නැවත ගෙනයන්න ඕනේ." ඇය බ්ලැක්ජැක්ට පැවසුවාය.

පියාපත් සහිත අශ්වයා එකඟතාවය පළ කිරීමට හිස සැලුවේය. ඌ බිම දණගසා ගත්විට, පිපර්ට, පර්සිව සහ ජේසන්ව ඇද ගෙන ගොස් උගේ පිටමත දැමීමට හැකි විය. දැඩි උත්සාහයක් දැරීමෙන් පසු (සිහිසුන් කොල්ලන්ගේ බර වැඩිය) ඇයට ඔවුන් වෙනුවෙන් සාධාරණ ආරක්ෂාවක් ලබාදීමට හැකි විය. ඉන්පසු බ්ලැක්ජැක්ගේ පිටමතට නැගුණු ඇය නෞකාව බලා පිටත් වූවාය.

සිහිසුන් උපදෙවියන් දෙදෙනාද සමඟ පිපර් පියාඹන අශ්වයාගේ පිට පැමිණීම, අත් අයට තරමක පුදුමයක් විය. ෆ්‍රෑන්ක් සහ හේසල් කොල්ලන් දෙදෙනාව ගිලන් කිළියට රැගෙන යාමට උපකාරී වූහ.

"මේ විදියට ගියොත්, අපේ අමෘතය ඉවර වෙයි," තුවාලවලට එබෙමින් පරීක්ෂා කරන අතර කෝච් හෙජ් පැවසුවේය.

පිපර් ජේසන්ගේ පසෙකින් හිඳගෙන සිටියාය. පැණි සහ ජලය ස්වල්පයක් සප්පායම් වූ පසු පිපර්ට දැනුණේ සුවදායී හැඟීමකි. එහෙත් ඇය තවමත් කොල්ලන් ගැන කරදරයට පත් වූවාය.

"ලියෝ," පිපර් පැවසුවාය, "අපි යාත්‍රා කරන්න ලැස්තිද?"

"ඔව්, ඒත්..."

"ඇට්ලැන්ටාවලට ගමන ලැස්ති කරන්න. මම පස්සේ පැහැදිලි කරන්නම්."

"ඒත්... හරි." ඔහු ඉක්මනින් පිටව ගියේය.

ඇනබෙත් ද පිපර් සමඟ වාද නොකළාය. පර්සිගේ හිසේ තිබූ අශ්ව ලාඩම හැඩයේ ගැටිත්ත පරීක්ෂා කිරීමට සිදු වූ බැවින් ඇය කාර්යබහුලව සිටියාය.

"කවුද එයාට ගැහුවේ?" ඇනබෙත් විමසුවාය.

"බ්ලැක්ජැක්." පිපර් පැවසුවාය.

"මොකක්?"



කෝච් හෙජ් විසින් පර්සිගේ හිසේ යම් ඖෂධ තලපයක් ගල්වන අතරතුර පිපර් ඇනබෙත්ට පැහැදිලි කිරීමට උත්සාහ කළාය. හෙජ්ගේ හෙදකම්වල හැකියාව පිළිබඳ ඇය මීට පෙර කිසිවිටෙක සතුටක් නොදැක්වූ නමුත්, ඔහු යම් නිවැරදි දෙයක් කළ පළමු වතාවට මෙය විය යුතුය. ඒ හේතුවෙන් හෝ කොල්ලන් අරක් ගෙන සිටි ආත්මයන් නිසා හෝ ඔවුන්ට අතිරේක ප්‍රත්‍යාස්ථබවක් ලැබී තිබිණි. ගොරවමින් දෙදෙනාම දෑස් විවර කළහ.

මිනිත්තු කිපයක් තුළ, ජේසන් සහ පර්සි ඔවුනොවුන්ගේ නිදන කුටි තුළ හිඳගෙන සිටි අතර ඔවුන්ට වාක්‍යයක් සම්පූර්ණයෙන්ම කතා කිරීමට හැකියාව ලැබී තිබිණි. සිදුවූ දේ ගැන දෙදෙනාටම තිබුණේ බොඳ වූ මතකයන්ය. මහාමාර්ගය මත සිදුවූ ඔවුන්ගේ ද්වන්ධ සටන ගැන පිපර් විස්තර කරන විට, ජේසන් ඇසක් ඉගි මැරුවේය.

"දවස් දෙකක් තුළ දෙපාරක් ගුටි කෑවා," ඔහු කෙඳිරුවේය. "මාර උපදෙවියා." ඔහු ලැජ්ජාවෙන් පර්සි දෙසට හැරුණේය. "සමාවෙන්න, මිත්‍රයා, මම ඔයාව පුපුරවල දාන්න හිතුවේ නෑ."

පර්සිගේ කමිසය, පිළිස්සුම් සිදුරුවලින් වැසී තිබුණි. ඔහුගේ කොණ්ඩය පවා සාමාන්‍ය ආකාරයට වඩා අවුල් වී තිබිණි. එය නොසලකා හරිමින් ඔහු දුර්වල සිනාවක් නැගුවේය. "පළවෙනි වතාව නෙමෙයි. ඔයාගේ වැඩිමල් සහෝදරී මට කඳවුරේදීත් හොඳ එකක් දුන්නා."

"ඔව්, ඒත්... මට ඔයාව මරන්න පුළුවන්කම තිබුණා."

"එහෙම නැත්නම්, මට ඔයාව මරන්න පුළුවන්කම තිබුණා," පර්සි පැවසුවේය.

ජේසන් දෙවුර සැලුවේය. "කන්සාස්වල සාගරයක් තිබුණානම්, වෙන්න පුළුවන්."

"මට සාගරයක් ඕනේ නැහැ..."

"කොල්ලනේ," ඇනබෙත් බාධා කළාය. "ඔය දෙන්නම එකිනෙකා මරා ගැනීමේදී අනභිබවනීයයි. ඒත් දැන් ඔයාලට ටිකක් විවේකය අවශ්‍යයි."

"ඉස්සරවෙලාම කෑම," පර්සි පැවසුවේය. "කරුණාකරලා? ඒ වගේම ඇත්තටම අපි කතා කරන්න ඕනේ. බැචස් කිව්ව යම් දෙයක්..."

"බැවස්?" ඇනබෙත් ඇගේ අත එසවූවාය. "හරි, අපූරුයි. අපි කතාකරන්න ඕනේ. භෝජන ශාලාවට එන්න. මිනිත්තු දහයකින්. මම අනිත් අයටත් කියන්නම්. ඒ වගේම කරුණාකරලා, පර්සි..., ඔයාගේ ඇඳුම් මාරු කරගන්න. ඔයාගෙන් එන්නේ හරියට විදුලි අශ්වයෙක් පිටේ ගියා වගේ ගඳක්."

ලියෝ නැවතත් කෝච් හෙජ්ට පාලනය බාර දුන්නේ, විනෝදය සඳහා ඔවුන්ව ළඟම පිහිටි හමුදා කඳවුරට ගෙන යාමට අවසර දෙන බවට නරාශ්වයා පොරොන්දු කරවා ගැනීමෙන් පසුවය.

ඔවුහු රාත්‍රී කෑම මේසය වටා රැස් වූහ. ටොපෙකා 32දී සිදු වූයේ කුමක්ද යන්න - එනම් බැවස් සමඟ ඔවුන්ගේ සංවාදය, ගයියා විසින් අටවනු ලද උගුල, කොල්ලන් දෙදෙනාට අරක්ගත් එයිඩොලොන් ගැන - ඇය පැහැදිලි කළාය.

"ඇත්තවශයෙන්ම!" හේසාල් මේසයට තට්ටු කළාය. "ලියෝට වුණෙත් ඒකම තමයි."

"එහෙනම්, ඒක මගේ වැරැද්දක් නෙමෙයිනේ," ලියෝ හුස්මක් පිට කළේය. "මම තුන්වෙනි ලෝක යුද්දේ පටන් ගත්තේ නැහැ. මට යක්ෂ ආත්මයක් අරක් ගත්ත විතරයි. ඒක අස්වැසිල්ලක්!"

"ඒත් රෝමන්වරු ඒක දන්නෙ නැහැ." ඇනබෙත් පැවසුවාය. "ඒ වගේම අපි කියන දේ එයාල පිළිගන්න එකකුත් නැහැ."

"අපිට රෙයිනාව සම්බන්ධ කරගන්න පුළුවන් වෙයි," ජේසන් යෝජනා කළේය. "ඇය අපිව විශ්වාස කරයි."

තම අතීත ජීවිතයේ කොටසක් ලෙසින්- ජේසන් ඇගේ නම කියූ ආකාරය ඇසීමෙන්, පිපර්ගේ හදවත ගිලී ගියේය.

දෑසේ බලාපොරොත්තු සහගත දිලිසීමක් සමඟින් ජේසන් ඇය දෙසට හැරුණේය. "ඔයාට පුළුවන් එයාට ඒත්තු ගන්වන්න, පිපර්. මම දන්නවා ඔයාට පුළුවන්."

පිපර්ට දැනුණේ ඇගේ සියොළඟ රුධිරයම දෙපා මුලට ගලා හැලෙන බවකි. ඇනබෙත් අනුකම්පා සහගතව ඇය දෙස බැලුවාය. කොල්ලෝ කියන්නේ දැනුමක් තේරුමක් නැති අය වැනි අදහසක් එම බැල්මේ ගැබ්ව තිබිණි. හේසාල් පවා හයින් හැකිළිණි.

"මට උත්සාහ කරන්න පුළුවන්," ඇය උදාසීනව පැවසුවාය. "ඒත් අපි කරදර වෙන්න ඕනේ කෙනා තමයි ඔක්ටේවියන්. මගේ



කිණිස්සේ තලයෙන්, මම දක්කා එයා රෝම ජනතාවගේ පාලනය අතට ගන්නවා. රෙයිනාට ඔහුව නවත්තන්න පුළුවන් වෙයිද කියලා මම නම් විශ්වාසයක් නැහැ."

ජේසන්ගේ මුහුණ මැලවිණි. ඔහුගේ මතකය පුපුරුවා හැරීම ගැන පිපර් තුළ කිසිදු සතුටක් නොවූවත්, අනෙක් රෝමන්වරු- හේසාල් සහ ෆ්‍රෑන්ක්- එකඟතාවය පළ කිරීමට හිස් සැලූහ.

"ඇය නිවැරදියි," ෆ්‍රෑන්ක් පැවසුවේය. "අද හවස අපි මත්තු බලනකොට, අපි ආයෙත් රාජාලින්ව දක්කා. එයාලා දීර්ඝ ගමනක් ඇවිත් හිටියත් වේගයෙන් ගමන් කළා. ඔක්ටේවියන් යුද්ධයට සූදානම් වෙනවා.

හේසාල් මුහුණ පුළුටු කර ගත්තාය. " නිසැකවම මේක ඔක්ටේවියන්ට හැමතිස්සෙම ඕන කරලා තිබුණ අවස්ථාවක්. එයා උත්සාහ කරන්නේ බලය අල්ල ගන්න. රෙයිනා විරුද්ධ වුණොත් එයා කියයි, ඇය ග්‍රීකයන්ට මෘදු පිළිවෙතක් අනුගමනය කරනවා කියලා. අර රාජාලියෝ... උන්ට අපේ සුවඳත් දනෙනවා."

"එයාලට පුළුවන්," ජේසන් පැවසුවේය. "රෝම රාජාලියන්ට එයාලගේ මායා ගන්ධයෙන්, රාක්ෂයන්ටත් වැඩිය හොඳින් උප දෙවිවරුන්ව දඩයම් කරන්න පුළුවන්. මේ නෞකාව අපි මොනවිදිහකින් හරි සඟවන්න ඕනේ. ඒත් සම්පූර්ණයෙන්ම නෙමෙයි. එයාලගෙනුත් නෙමෙයි."

ලියෝ ඇඟිලි වලින් තට්ටු කළේය. "නියමයි. මම දුම් තිරයක් ස්ථාපිත කරන්නම්. ඒකෙන් නෞකාවේ ගන්ධය යෝධ කුකුළු කැටයක් වගේ දැනෙයි. ඊළඟ වතාවේ ඒක නිර්මාණය කරන්න මට මතක් කරන්න."

හේසාල් මුහුණ හැකිලුවාය. "කුකුළු කැටයක් කියන්නේ මොකක්ද?"

"ආහ්, මනුස්සයෝ," ලියෝ පුදුමයෙන් හිස සැලුවේය. "ඒක හරි. ඔයාට අන්තිම අවුරුදු හැත්තෑව වගේ මඟ හැරුණනෙ. හොඳයි, මගේ ගෝලයා, කුකුළු කැටය කියන්නේ..."

"ප්‍රශ්නයක් නෑ," ඇනබෙත් බාධා කළාය. "ප්‍රධාන දේ තමයි, රෝමන්වරුන්ට පැහැදිලි කරන්න අපට අසීරු කාලයක් ගෙවන්න වෙයි. එයාල අපිව විශ්වාස කළත්..."

"ඔයා හරි," ජේසන් ඉදිරියට නැමුණේය. "අපි දිගටම ගෙ කළ යුතුයි. අත්ලාන්තික් වලට ගියාම, අපිට ආරක්ෂාවක් තියෙ අඩුමගානේ ලෙජියන් එකෙන්වත්."

ඔහුගේ මත්දෝත්සාහීබව කෙරෙහි අනුකම්පා කරන්න නැතහොත් අමනාප වන්න දැයි පිපර්ට වටහාගත නොහැකි විය. "ඔ කොහොමද විශ්වාසයෙන් කියන්නේ?" ඇය විමසුවාය. "ඇයි එයා අපිව ලුහුබඳින්නේ නැත්තේ?"

ඔහු තම හිස සැලුවිය. "ඔයා අහල තියෙනවනේ රෙදි පැරණි භූමි ගැන කතා කරනවා. ඒවා ඉතාම භයානකයි. පරම්පරා ගාණක ඉඳන් රෝම උප දෙවිවරුන්ට එහෙට යන එක තහනම් වෙලා තිබුණේ. ඔක්ටේවියන්ට පවා ඒ නීතියට පිටින් යන්න බැහැ."

තම මුව තුළ වූ ආහාර කාඩ්බෝඩ් කැබැල්ලක් වූ කලෙක මෙන් ෆ්‍රෑන්ක් එය ගිල දැම්මේය. "ඉතිං, අපි එහෙ ගියොත්..."

"අපිව පිටුවහල් කරයි. ඒ වගේම රාජ ද්‍රෝහියෝ වෙයි," ජේසන් තහවුරු කළේය. "දුටු මතින් අපිව මරා දමන්න ඕනෑම රෝම උප දෙවියකුට අයිතිය ලැබෙනවා. ඒත් මම ඒ ගැන කරදර වෙන්නේ නැහැ. අපි අත්ලාන්තික් හරහා ගියොත්, එයාලා අපිව ලුහුබඳින එක අතහරියි. එයාලා හිතයි මධ්‍යධරණියේදී- මාරි නොස්ට්‍රම්වලදී- අපි මැරුණා කියලා."

පර්සි ඔහුගේ පිට්සා කැබැල්ල ජේසන්ට පෙන්වූයේය. "සර්, ඔයා හිරුකිරණ වගේ."

ජේසන් වාදයට ගියේ නැත. අනෙක් උපදෙවිවරුන් ඔවුන්ගේ පිඟන් දෙස බලා සිටි අතර, පර්සි පමණක් ඔහුගේ පිට්සා කැබැල්ල සමඟ විනෝදවෙමින් සිටියේය. මේ කෑම සියල්ල ඔහුගේ කොහෙට යන්නේ දැයි පිපර් දැන සිටියේ නැත. මේ හාදයාට නරාශ්වයෙකු මෙන් කෑම ගිල දැමිය හැකිය.

"ඉතිං අපි ඉදිරිය සැලසුම් කරමු," පර්සි යෝජනා කළේය.

"ඒ වගේම අපි නොමැරෙන බවත් තහවුරු කර ගනිමු. ඩී මහත්මයා- බැචස්- ආහ්, මට දැන් එයට බී මහත්මයා කියලා කථා කරන්න පුළුවන්ද? කොහොම වුණත්, එලාගේ අනාවැකියේ එන තිවුන්නෝ ගැන එයා සඳහන් කළා. යෝධයෝ දෙන්නෙක්. ඔටිස් සහ ආහ්, F වලින් පටන් ගන්න මොකක් හරි එකක්?"

"එපියාල්ටිස්," ජේසන් පැවසුවේය.



"පිපර් එයාගේ පිහි තලයෙන් දැක්ක වගේ යෝධයෝ දෙන්නෙක්..." ඇනාබෙත් තම ඇඟිලි කෝප්පයේ දාරය වටා ගෙන ගියාය. "මට මතකයි යෝධයෝ දෙන්නා ගැන කථාව. කඳු රාශියක් ගොඩගසමින් එයාලා ඔලිම්පස් කන්දට ළඟාවෙන්න උත්සාහ කළා."

ෆ්‍රෑන්ක්ගේ හුස්ම හිරවීමට ආසන්න බව පෙනිණි. "හොඳයි, ඒක නියමයි."

ංගඩොල් කැට විදිහට කඳු පාවිච්චි කරන යෝධයෝ. ඔයා කිව්වා නේද බැචස් මේ දෙන්නව මැරුවේ රිටක සවි කරපු පයින් ගෙඩියකින් කියලා?"

"ඒ වගේ මොකකින් හරි තමයි," පර්සි පැවසුවේය. "මම හිතන්නේ නෑ මේ වතාවේදී අපට එයාගේ උදව් ලැබෙයි කියලා. එයාට ඕනේ වෙලා තියෙන්නේ ගෞරවය. ඒ වගේම අපෙන් ඒක නොලැබෙන බවත් එයාට පැහැදිලියි."

මේසය පුරා නිහැඬියාවක් පැතිර ගියේය. මේසයේ හරියටම ඉහළින් සිටි කෝච් හෙජ් ගීතයක් ගයන හඬ පිපර්ට ඇසිණි. "Blow The Man Down..." ඔහු දැන සිටියේද එපමණකි. වචන අමතක වීම නිසා ඔහුගේ ගීතයේ ඉතිරි කොටස් "බලා... බලා... හම්ඩි... ඩම්, වැනි වචන වලට සීමා විය.

බැචස් ඔවුන්ට උදව් කරනැයි දැනෙන හැඟීම ඉවත දැමීමට පිපර්ට නොහැකි විය. නිවුන් යෝධයෝ සිටින්නේ රෝමයේය. උප දෙවිවරුන්ට අවශ්‍ය යමක් ඔවුන් සන්තකයේ තිබේ. ලෝකඩ බඳුනක් තුළ වූ යමක්. එය කුමක් වුවත් මරණයේ දොරටු මුද්‍රා තැබීමට අවශ්‍ය පිළිතුර එහි රැඳී ඇති බව ඇයට හැඟිණි- අනන්ත මරණයට යතුර. ඒ ආකාරයෙන්ම බැචස්ගේ සහයෝගය නොමැතිව ඔවුන්ට කිසිවිටෙක මේ සටන ජය ගත නොහැකි බවද ඇයට හැඟී ගියාය. එසේම ඒ දින පහ තුළ ඔවුන්ට එය කිරීමට නොහැකි වුවහොත්, රෝමය විනාශ වී යනු ඇත. හේසාල්ගේ සොයුරු, නිකෝ මිය යනු ඇත.

අනෙක් අතට, බැචස් ඇයට පිරිනැමූ රිදී පුකුරුවේ දර්ශනය වැරදි නම්, සමහරවිට අනෙක් දර්ශනයන්ද සැබෑ ඒවා නොවනු ඇත. විශේෂයෙන්ම ඇයත්, පර්සිත් ජේසනුත් ගිලී යන දර්ශනය සමහරවිට එය හුදෙක් සංකේතයක් පමණක් විය හැකිය.

ගැහැනු උප දෙවියකුගේ රුධිරය, ගයියා පැවසුවාය. එසේම පිරිමියෙකුගේ රුධිරය පිපර්, මගේ පැටියෝ, ඔබ සමඟ මිය යන විරුවා තෝරාගන්න.

"ඇයට අපෙන් දෙයක් ඕනේ." පිපර් කෙඳිරුවාය.

සියල්ලෝම හැරී ඇය දෙස බැලූහ.

සැමගේ අවධානය තමා වෙතට යොමු වීම පිපර්ට පිස්සුම දෙන්නක් නොවීය. සමහරවිට එය ඇප්‍රොඩයිට්ගේ දරුවෙකුට අමුතු වන්න ඇති නමුත්, සිනමා තාරකාවක් වූ ඇගේ පියාගේ කීර්තිය දෙස වසර ගණනාවක්ම ඇය බලා සිටියාය. මුළු කඳවුරම ඉදිරිපිට උත්සවාග්නිය අසලදී ඇප්‍රොඩයිට් ඇය රූප රැජිණක් බව ප්‍රකාශ කළ අවස්ථාව ඇගේ මතකයට නැගිණි. එය ඇගේ ජීවිතයේ වඩාත්ම සතුටුදායක මොහොතක් විය. මෙහිදී පවා, පිපර් සිටියේ තවත් උපදෙවිවරුන් හයදෙනෙකු සමඟ පමණි.

එයාලා මගේ මිත්‍රයෝ. ඒකට කමක් නැහැ.

එහෙත් ඇස් යුගල් හයකට වැඩි ගණනක් තමා දෙස බලා සිටිනවා වැනි අමුතුම හැඟීමක් ඇයට ඇති වී තිබිණි.

"අද මහා මාර්ගයේදී," ඇය පැවසුවාය. "ගයියා මට කිව්වා එයාට ඕනේ උප දෙවියන් දෙන්නෙකුගේ රුධිරය විතරයි කියලා... එක ගැහැනු කෙනයි, එක පිරිමි කෙනයි... එයා මට කිව්වා මැරෙන්න කැමති කෙනා මට තෝරගන්න කියලා."

ජේසන් ඇගේ අත මිරිකුවේය. "ඒත් අපි දෙන්නගෙන් කවුරුවත්ම මැරුණේ නෑ. ඔයා අපිව බේර ගත්තා."

"මම දන්නවා... ඒක නිකම්...ඇයි එයාට එහෙම ඕනේ වුණේ."

ලියෝ මෘදු විසිල් හඬක් නැගුවේය. "හාදයිනේ, මතකද වෘක මන්දිරයෙදි? අපේ ප්‍රියතම අයිස් කුමරිය, කියොන්? ඇය ජේසන්ගේ රුධිරය වැගිරීමක් ගැන කථා කළා. කොහොමද ඒකෙන් පරම්පරා ගාණක් ස්ථානය කෙලෙසෙන්නේ කියලා කිව්වා. සමහරවිට උප දෙවියන්ගේ රුධිරයේ යම් ආකාරයක බලයක් ඇති."

"ඕහ්..." පර්සි ඔහුගේ තුන්වැනි පිට්සා කැබැල්ලට වගකීම ඇරඹුවේය. අශ්වයා හිසට පහරදීම මේ දන් සිදුවූවක් බව අඟවන්නා සේ ඔහු පිටුපසට ඇළ වී හිස් බැල්මෙන් බලා සිටියේය.

"පර්සි?" ඇනබෙත් ඔහුගේ අතින් අල්ලා ගත්තාය.



"ඕහ්, නරකයි," ඔහු කෙඳිරුවේය. "නරකයි. නරකයි." ඔහු ෆ්‍රෑන්ක් සහ හේසල් දෙස බැලුවේය. "ඔය හාදයින්ට මතකද පොලිබෝටස්ව?"

"ජුපිටර් කඳවුර ආක්‍රමණය කරපු යෝධයා," හේසල් පැවසුවේය. "ඔයා ටර්මිනස් ප්‍රතිමාවේ හිසෙත් විනාශ කරපු පොසිඩන් විරුද්ධවාදියා. ඔව්. මම හිතන්නේ මට මතකයි."

"මට හීනයක් තිබුණා," පර්සි පැවසුවේය. "අපි ඇලස්කාවට පියාසර කරන කොට, පොලිබෝටස් නපුරු දුෂ්ඨ ඇති අයට කතා කළා. එයා කිව්වා... එයා කිව්වා එයාව මාව සිරකරුවෙක් විදියට ඕනේ කියලා. නොමරා පණපිටින්." ඔහු කිව්වා, 'මට ඒකව විලංගු දාලා මගේ දෙපතුල් ළඟට ගේන්න ඕනේ, එතකොට කාලය පැමිණියාම මට ඒකව මරන්න පුළුවන්' කියලා. ඔහුගේ රුධිරයෙන් ඔලිම්පස් කන්දේ පාෂාණ වතුර වෙයි. මහී මාතාව අවදි වෙයි කියලා."

කාමරයේ උෂ්ණත්ව පාලක බිඳී ගොස් ඇත්දැයි පිපර් සිතුවාය. එක්විටම ඇයට වෙව්ලීම නතරකර ගත නොහැකි විය. ටොපෙකා වල මහාමාර්ගයේදී ඇයට ඇති වූයේත් මේ හැඟීමමය. "ඔයා හිතන්නේ යෝධයෝ අපේ රුධිරය පාවිච්චි කරයි කියලද... අපේ දෙන්නෙක්ගෙ රුධිරය..."

"මම දන්නේ නැහැ," පර්සි පැවසුවේය. "ඒත් අපි ඒක හොයාගන්න තුරු, අපි හැමෝම අහු නොවී සිටින්න උත්සාහ කළ යුතුයි."

ජේසන් ගෙරවීය. "මමත් ඒකට එකඟයි."

"ඒත් අපි කොහොමද ඒක හොයාගන්නේ?" හේසල් විමසුවාය.

"ඇතීනාගේ සලකුණ, නිවුන්නු, එලාගේ අනාවැකිය. කොහොමද මේ සේරම එකට සම්බන්ධ වෙන්නේ?"

ඇනබෙත් තද දෑත් මේසයේ දාරයට තට්ටු කළාය. "පිපර්, ඔයා කිව්වනේ ලියෝට අපේ මාර්ගය ඇට්ලැන්ටා පැත්තට හරවන්න කියලා."

"හරි," පිපර් පැවසුවාය." බැචස් අපට කිව්වේ අපි හොයාගන්න ඕනේ- මොකක්ද එයාගේ නම කිව්වේ?"

"පෝසයිඩ්," පර්සි පැවසුවේය.

තම පෙම්වතා සතුව පිළිතුරු නැතැයි සිතා සිටියාක් මෙන් ඇනබෙත් පුදුමයෙන් බැලුවාය. "ඔයා එයාව දන්නවද?"

පර්සි දෙවුර සැලුවේය. "මුලදී මට නම මතක් වුණේ නැහැ. ඊටපස්සේ බැවස් ලුණු වතුරයි, සීනුව නාද වීම ගැනයි සඳහන් කළා. මගේ තාත්තාගේ කාලයට කලින් සිට පෝසයිඩ් පරණ මුහුදු දෙවියෙක්. කවදාවත් ඔහුව හමුවෙලා නැහැ. ඒත් ගයියාගේ පුතෙක් කියලා හිතනවා. මට තවමත් තේරුම් ගන්න බැරි මුහුදු දෙවියෙක් මොනවද ඇට්ලැන්ටාවල කරන්නෙ කියලා."

ලියෝ ගෙරවුයේය. "වයින් දෙවියා කන්සාස්වල මොනවද කරන්නෙ? දෙවිවරු අමුතුයි. කොහොම වුණත්, හෙට මධ්‍යන්තය වෙද්දි අපි ඇට්ලැන්ටාවලට ළඟා වෙන්න ඕනේ. එහෙම නොවුණොත් මොනව හරි වැරැද්දක් වෙන්න පුළුවන්."

"එහෙම කියන්නවත් එපා," ඇනබෙත් සෙමින් පැවසුවාය.

"පරක්කු වෙලා. අපි හැමෝම ටිකක් නිදාගන්න ඕනේ."

"ටිකක් ඉන්න," පිපර් පැවසුවාය.

නැවත වරක්, සියල්ලෝම ඇය දෙස බැලුහ.

ඇය වේගයෙන් තම ධෛර්යය අහිමි කරගනිමින් සිටියාය. ඇගේ සහජ බුද්ධිය නිවැරදි නොවුවත්, ඇය කතා කිරීමට වීරිය ගත්තාය.

"අවසානයට තව එක දෙයක් තියෙනවා," ඇය පැවසුවාය.

"එයිඩෝලන්ලා... අරක්ගත් ආත්ම. එයාලා තවමත් මෙතන, මේ කාමරය ඇතුළේ ඉන්නවා.

# 12
# පිපර්

එය දන සිටියේ කෙසේදැයි පිපර්ට පැහැදිලි කිරීමට හැකියාවක් නොවීය.

අවතාර සහ වධයට ලක්වූ ආත්මයන් පිළිබඳ කතා සැමවිටම ඇයව පුදුමයට පත් කළේය. ඇගේ පියා, ටොම් සීයාගේ චෙරෝකි පුරාවෘත්ත ගැන විහිලු කථා පැවසීමට පුරුදුව සිටි නමුත්, ඔවුන්ගේ දුවැන්ත මාලිබු මන්දිරයේදී පවා, පැසිපික් සාගරය දෙස බලාගෙන, ඇගේ පියා භූත කතාන්දර පවසන සැම විටම, ඇයට ඒවා සිතින් ඉවත් කර දැමීමට නොහැකි විය.

චෙරෝකි ආත්ම සැමවිටම චංචලය. ඔවුන් නිතරම මරණයේ භූමියට යන මාර්ගය වරද්දා ගනිති. එසේ නැතහොත්, මුරණ්ඩු ලෙස, ජීවත් වන්නවුන් සමඟ රැඳී සිටිති. සමහරවිටෙක තමන් මියගොස් ඇති බව පවා ඔවුන්ට අවබෝධ වන්නේ නැත.

පිපර් උපදෙවිවරුන් ගැන වැඩියෙන් ඉගෙන ගනිද්දී, චෙරෝකි පුරාවෘත්ත සහ ග්‍රීක මිත්‍යා කථා අතර එතරම් වෙනසක් නැති බවද ඇය තේරුම් ගත්තාය. මේ අරක්ගත් ආත්ම ද ක්‍රියාකරන්නේ බොහෝ සෙයින්ම ඇගේ පියාගේ කතාන්දර වල සිටි ආත්මයන් සේය.

කිසිවෙකු ඔවුන්ට ඉවත්ව යන ලෙස නොපැවසූ බැවින්, ඔවුන් තවමත් එහි සිටින බවට තදබල හැඟීමක් පිපර් තුළ පැවතුණාය.

ඇය පැහැදිලි කරන විට, අනෙක් පිරිස අපහසුවෙන් ඇය
දෙස බලාගෙන සිටියහ. නැව් තට්ටුවට ඉහළින්, හෙජ් "In The Navy"
වැනි හඬක් නැගෙන ගීතයක් ගයමින් සිටි අතර, එයට විරෝධ
පළ කිරීමට මෙන් බ්ලැක්ජැක් තම කුරවලින් නැව් තට්ටුවට අනිමින්
සිටියේය.

අවසානයේ හේසාල් කටහඬ අවදි කළාය. "පිපර් කියනු
හරි."

"කොහොමද ඔයා හරියටම කියන්නේ?" ඇනබෙත් පැවසුවාය.

"මට අරක්ගත් ආත්ම මුණගැහිලා තියෙනවා," හේසාල්
පැවසුවාය. "පාතාල ලෝකයේදී, මම ඉන්නකොට... ඔයාල
දන්නවනේ."

මැරිලා.

හේසාල් යනු දෙවැනි අවස්ථාවක් ලද අයෙකු බව පිපර්ට
අමතකව තිබිණි. හේසාල්ද ඥානාත්මක නැවත ඉපදීමක් විය.

"ඉතිං..." යම් භූතයෙකු තම හිස ආක්‍රමණය කරතැයි සිතා
දෝ ෆ්‍රෑන්ක් තම දැත්වලින් හිසකෙස් පිරිමැද්දේය. "ඔයා හිතන්නේ
මේ දේවල් නැවේ රැකල ඉන්නවා කියලද, එහෙම නැත්නම්..."

"අපේ සිරුරු ඇතුළේ වෙන්නත් පුළුවන්," පිපර් පැවසුවාය.
"අපි දන්නේ නෑ."

ජේසන් අත මිට මෙළවීය. "ඒක ඇත්තක් නම්..."

"අපි පියවරක් ඉදිරියට තියන්න ඕනේ," පිපර් පැවසුවාය.

"මම හිතනවා මට මේක කරන්න පුළුවන් කියලා."

"මොකක් කරන්නද?" පර්සි විමසුවේය.

"අහගෙන විතරක් ඉන්න, හරිද?" පිපර් ගැඹුරු හුස්මක්
ගත්තාය.

"හැමෝම අහගන්න..."

පිපර් වරකට එකකුගේ බැගින්, ඔවුන්ගේ දෑස් දෙස බැලුවාය.

"එයිඩෝලන්ස්," තම වශී කතා විලාසය යොදා ගනිමින් ඇය
පැවසුවාය, "ඔබේ අත් ඔසවන්න."

නිහඬතාවයක් පැතිරිණි.



ලියෝ අපහසුවෙන් සිනාසුණේය. "ඔයා ඇත්තටම හිතනවාද
ඒක..." ඔහුගේ හඬ වියැකී ගියේය. මුහුණ ලිහිල් විය. ඔහු තම අත
එසවූයේය.

ජේසන් සහ පර්සි ද එයම කළහ. ඔවුන්ගේ ඇස් මලානික වී
රන් පැහැයට හැරුණි. හේසාල් හුස්ම නොහෙලුවාය. ලියෝ අසල සිටි
ෆ්‍රෑන්ක්, තම අසුනින් නැගිට, බිත්තියට හේත්තු විය.

"ඔහ්, දෙවියනි," ඇනබෙත් ආයාචනාත්මකව පිපර් දෙස
බැලුවාය. "ඔයාට පුළුවන්ද එයාලට ප්‍රතිකාර කරන්න?"

ඉකි ගසමින් මේසය යට සැඟවීමට පිපර්ට වුවමනා වූ නමුත්,
ඇය ජේසන්ට උදව් විය යුතුව තිබිණි. ඇය අත් අල්ලාගෙන සිටියේ
කාගේදැයි... නැත, ඇය ඒ ගැන සිතීම ඉවතට දැමුවාය. ඇගේ අවධානය
ලියෝ වෙතට යොමු විය. අඩුවෙන්ම නැතිගෙන සිටියේ ඔහු වීම එවට
හේතුවයි.

"ඔබලාගෙන් තවත් අය මේ නැවේ සිටිනවද?" ඇය විමසුවාය.

"නෑ," ලියෝ බොල් හඬකින් පිළිතුරු දුන්නේය. "පොළෝ
මාතාව එව්වේ තුන්දෙනයි. ශක්තිමත්, හොඳම අය. අපිට ආයෙත්
ජීවය ලැබුණා."

"මෙහිදී නම් නෙමෙයි, ඔබට බැහැ," පිපර් තර්ජනය කළාය.

"ඔබලා තුන්දෙනාම ප්‍රවේසමෙන් අහන්න."

පර්සි සහ ජේසන් ඇය දෙසට හැරුණේය. ඒ රන් පැහැති
දෑස්වල නොරිස්සුම් ස්වභාවයක් දක්නට ලැබුණත්, කොල්ලන්
තිදෙනාම ඇගේ කෝපයෙන් සලිත වූ බව පෙනුණි.

"ඔබලා මේ සිරුරුවලින් පිටවිය යුතුයි," ඇය නියෝග කළාය.

"නෑ," පර්සි පැවසුවේය.

ලියෝ තරමක් සෙමින් පිම්බේය."අපි ජීවත් විය යුතුයි."

ෆ්‍රෑන්ක් තම දුන්නට අත පෙව්වේය. "සර්වබලධාරී දෙවිඳුනි,
ඒක භයානකයි! මෙහෙත් පිටවෙනු, අපේ මිතුරන් හැර දමනු!"

ලියෝ ඔහු දෙසට හැරුණේය. "අපට නියෝග කරන්න
නුඹට බැහැ, යුද්ධයේ පුත්‍රයාණෙනි. ඔබගේ ජීවිතයත් දුර්වලයි. ඔබගේ
ආත්මය ඕනෑම මොහොතක දැවී යන්න පුළුවන්."

එහි අදහස කුමක්දැයි පිපර්ට නිසැකව කිව හැකි නොවූ
බඩට පහරක් වැදුණු කලෙක මෙන් ෆ්‍රෑන්ක් පසුපසට විසිවිය. වෙව්ලා
අතින් ඔහු ඊතලයක් ගත්තේය. "ම.... මම උඹලට වඩා නරක දේවල්
බිම දාලා තියෙනවා. උඹලට සටන් කරන්න ඕනේ නම්..."

"ෆ්‍රෑන්ක් එපා," හේසාල් පැවසුවාය.

ඇය අසල සිටි ජේසන් ඔහුගේ අසිපත ඇද්දේය.

"නවත්තන්න!" පිපර් නියෝග කළාය. එහෙත් ඇගේ හඬ
වෙව්ලමින් තිබිණි. තම සැලසුම පිළිබඳ වූ විශ්වාසය වේගයෙන්
ඇය වෙතින් ගිලිහී යමින් තිබිණි. අරක්ගත් ආත්ම පෙන්නුම් කිරීමට
ඇය සමත් වී තිබිණි. එහෙත් දැන් කුමක් කරන්නද? ඔවුන්ට පිටව
යාමට ඒත්තු ගැන්වීමට ඇය අසමත් වුවහොත් සිදුවන ඕනෑම දේ
වැඟිරීමක් ඇයගේ වරද නිසා සිදුවන්නක් විය හැකිය. ඇගේ මනස
සම්පූර්ණයෙන්ම ගයියාගේ සිනාවෙන් පිරී තිබිණි.

"පිපර් කියන දේ අහන්න." ජේසන්ගේ අසිපත තුඩ ඉදිරියේ
සිටගනිමින් හේසාල් පැවසුවාය. ඔහුගේ අතේ රැඳී තිබෙන විට රන්
පැහැති තලය තදින් දිදුලන බව පෙනිණි. එය මේසය මත දැමූ ජේසන්
නැවත ඔහුගේ අසුනේ හිඳ ගත්තේය.

පර්සි බෙහෙවින් අසාමාන්‍ය ආකාරයට ගොරවන්නට වූයේය.

"ප්ලූටෝගේ දියණිය, ඔබ මැණික් සහ ලෝහ පාලනය
කරනවා විය හැකියි. ඔබට මරණය පාලනය කළ නොහැකියි."

ඔහුව වැක්වීමට මෙන් ඇනබෙත් ඔහු දෙසට පැමිණියාය.
එහෙත් හේසාල් අත වනා ඇයව නැවැත්තුවාය.

"අරක්ගත් ආත්මයනි, අසන්න," හේසාල් දැඩි හඬකින්
පැවසුවාය.

"ඔබලා මෙහාට අයිති නැහැ. මම ඔබලාට නියෝග කරන්නේ
නැහැ, එහෙත් පිපර් එසේ කරනවා. ඇයට අවනත වෙන්න."

ඇය පිපර් දෙසට හැරුණාය, ඇගේ ඉරියව් පැහැදිලි විය.
*ආයේ උත්සාහ කරන්න, ඔයාට ඒක පුළුවන්.*

පිපර් ඇගේ සියලු ධෛර්යය එක්තැන් කර ගත්තාය. ඇය
කෙළින්ම ජේසන්ගේ දෑස් දෙස බැලුවාය. ඔහුව පාලනය කළේ ඒවා
මඟිනි. "ඔබලා මේ සිරුරු හැර දැමිය යුතුයි," පිපර් නැවත, වඩාත්
ප්‍රබල ලෙස, පැවසුවාය.



ජේසන්ගේ මුහුණ දැඩි විය. ඔහුගේ නළලකින් දහදිය
වැගිරෙන්නට විය. "අපි- අපි මේ සිරුරු අතහරින්නම්."

"මේ නැවට නැවත නොඑන බවට ඔබලා ස්ටික්ස් ගංගාවේ
නාමයෙන් පොරොන්දු විය යුතුයි." පිපර් දිගටම කියාගෙන ගියාය. "ඒ
වගේම මේ පිරිසට අයිති කිසිම සිරුරකට ආයේ අරක් ගන්න බැහැ."

ලියෝ සහ පර්සි දෙදෙනාම පිඹිමින් විරෝධය පළ කළහ.

"ඔබලා ස්ටික්ස් ගංගාව මත දිවුරීම කළ යුතුයි." පිපර්
පැවසුවාය.

අවිනිශ්චිත මොහොතක- ඔවුන් ඇයව එරෙහිව සටන් වදිනු
ඇතැයි ඇයට සිතිණි. ඉන්පසු අරක්ගත් ආත්මයන් තුනම එකවිට කතා
කරන්නට වූහ. "අපි ස්ටික්ස් ගංගාවේ නාමයෙන් පොරොන්දු වෙමු."

"ඔබලා මැරිලා." පිපර් පැවසුවාය.

"අපි මැරිලා," ඔවුහු එකඟ වූහ.

"දැන්, පිටවෙනු."

කොල්ලන් තිදෙනාම ඉදිරියට නැවිණි. පර්සිගේ මුහුණ පීටසා
කැබැල්ල මත වැටුණේය.

"පර්සි!" ඇනබෙත් ඔහුව අල්ලා ගත්තේය.

අසුනින් ලිස්සා වැටීමට ආසන්නව සිටි ජේසන්ව, පිපර් සහ
හේසාල් විසින් අල්ලා ගත්හ.

ලියෝ එතරම් වාසනාවන්තයෙකු වූයේ නැත. ඔහු ෆ්‍රෑන්ක්
දෙසට වාරුවත්ම ෆ්‍රෑන්ක් ඔහුව අල්ලා ගැනීමට උත්සාහ කළත්, ඊට
පෙර ලියෝ පොළොව මත ඇද වැටුණේය.

"ආව්." ඔහු කෙඳිරුවේය.

"ඔයා හොඳින් නේද?" හේසාල් විමසුවාය.

ලියෝ තනිව නැගිට්ටේය. "ඒක හරි ගියාද?"

"ඒක වැඩ කළා." තමා නිවැරදි බවට තරමක් විශ්වාසයකින්
සිටි පිපර් පැවසුවාය. "මම හිතන්නේ නෑ එයාලා ආපසු එයි කියලා."

ජේසන් ඇසිපිය ගැසුවේය. "එහෙමනම් ඒකේ තේරුම, ආයේ
මගේ ඔලුව තුවාල වෙන්න නෑ කියන එකද?"

තම සියලු කම්පනයන් පළවා හරිමින් පිපර් සිනා නැඟුවාය. "එන්න අකුණු කොල්ලෝ. අපි නැවුම් වාතය ටිකක් ගනිමු."

පිපර් සහ ජේසන් නැව් තට්ටුවේ ඉදිරියටත් පිටුපසටත් ඇවිද්දාහ. ජේසන් තවමත් අප්‍රාණිකව සිටි බැවින් පිපර් ඔහුගේ අත තමා වටා දවටා ගැනීමට ඉඩ දුන්නාය.

ලියෝ සුක්කානම අසල සිටගෙන, අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය හරහා ෆෙස්ටස් සමඟ සාකච්ජාවක නිරත විය. ජේසන්ට සහ පිපර්ට යම් අවකාශයක් ලබාදිය යුතු බව ඔහු අත්දැකීමෙන් දැන සිටියේය. චන්ද්‍රකා රූපවාහිනිය නැවත ක්‍රියාත්මක වීමෙන් පසු කෝච් හෙජ් සතුටින් තම කුටියට වැදී ආත්මාරක්ෂක සටන් පුහුණු විය. පර්සිගේ පියාපත් සහිත අශ්වයා වූ බ්ලැක්ජැක් කොහේ හෝ පියාඹා ගොස් තිබිණි. අනෙක් උපදෙව්වරු රාත්‍රී නින්දට සූදානම් වූහ.

පොළොවට අඩි සිය ගණනක් ඉහළින්, ආගෝ II නැගෙනහිර දෙසට ඇදී ගියේය. අඳුරු මුහුදු මත වූ දීප්තිමත් දූපත් ලෙසින් ඔවුන්ට පහළින් ආලෝකමත් වූ කුඩා නගර පසු වී ගියේය.

ගෙවුණු සිසිරයේදී, ෆෙස්ටස් මකරා ක්විබෙක් වලට ඉහළින් පියාසර කළ අයුරු පිපර්ගේ මතකයේ තිබිණි. එවැනි ලස්සනක් ඇය කිසිවිටෙක දැක නොතිබිණි. ජේසන්ගේ අත ඇය වටා දවටී තිබීම සතුටුදායක හැඟීමක් ඇති කළත්, මෙය ඊටත් වඩා අපූරු විය.

රාත්‍රිය උණුසුම් විය. නෞකාව, මකරාට වඩා බෙහෙවින් සුමට ලෙස යාත්‍රා කළේය. සියල්ලටම වඩා යහපත් දෙය වූයේ, ඔවුන්ට හැකි ඉක්මනින්, ජුපිටර් කඳවුරෙන් ඉවතට ගමන් කිරීමට හැකි වීමයි. පැරණි භූමින් කොතරම් භයංකාර වුවත් ප්‍රශ්නයක් නැත. පිපර් එහි යන තෙක් නොඉවසිලිමත් වූවාය. අත්ලාන්තික් හරහා යන ගමනේදී රෝමවරු ඔවුන් හඹා නොඑතැයි ජේසන් පැවසූ දෙය සත්‍යයක් වනු ඇතැයි ඇය බලාපොරොත්තු වූවාය.

අතරමඟ නැවතුණු ජේසන් අත්වැටෙන් පහළට එබුණේය. සඳ එළියෙන් ඔහුගේ කෙස්වැටිය රිදී පැහැ ගැන්වී තිබිණි.

"ස්තුතියි, පිපර්," ඔහු පැවසුවේය. "ඔයා ආයෙත් මාව බේරගත්තා."

ඔහු තම අත ඇගේ ඉණවටා දැමුවේය. පිපර් ඔවුන් දෙදෙනා ග්‍රෑන්ඩ් කැනියමෙන් පහළට වැටුණු දිනය ගැන සිතුවාය- ජේසන්ට වාතය පාලනය කළ හැකි බව පළමු වතාවට ඇය දැන ගත්තේ එදිනය.



ඔහුගේ හෘද ස්පන්දනය දැනෙන තරම් තදින් ඔහු ඇයව තුරුලු කරගෙන සිටියේය. ඉන්පසු ඔවුන් ඇද වැටීම නැවතී, වාතයේ පාවෙන්නට විය. හොඳම පෙම්වතා- සදාකාලයටම.

ඇයට දැන් ඔහුව සිප ගැනීමට අවැසි වූ නමුත්, යම් දෙයක් ඇයව වළක්වාලීය.

"මම දන්නේ නෑ පර්සි මාව තවදුරටත් විශ්වාස කරයිද කියලා." ඇය පැවසුවාය. "මම එයාගේ අශ්වයාට එයාට පහර දෙන්න ඉඩ දීපු නිසා."

ජේසන් සිනාසුණේය. "ඒ ගැන කරදර වෙන්න එපා. පර්සි අපූරු හාදයෙක්. ඒත් මට හිතෙනවා සැරින් සැරේට එයාගේ ඔලුවට ගහන්න ඕනේ ඇති කියලා."

"ඔයා එයාව මරන්න හදනවද?"

ජේසන්ගේ සිනාව වියැකිණි. "ඒ මම නෙමෙයි."

"ඒත් මම සම්පූර්ණයෙන්ම ඔයාට ඉඩ දුන්නා," පිපර් පැවසුවාය.

"මම තෝරාගත යුතුයි කියලා ගයියා කිව්වාම, මම පැකිළුණා. ඒ වගේම."

ඇය ඇසිපිය සැලුවාය. ඇයව හැඟුම්බරව සිටියාය.

"ඔච්චර දුඩි විදිහට ඔයා ගැන හිතන්න එපා," ජේසන් පැවසුවේය. "ඔයා අපි දෙන්නවම බේර ගත්තා."

"ඒත් අපේ පිරිසෙන් දෙන්නෙක් ඇත්තටම මැරෙන්න ඉන්නේ, පිරිමියෙකුයි, ගැහැනු කෙනෙකුයි..."

"මම ඒක පිළිගන්නේ නැහැ. අපි ගයියාව නවත්තන්නයි හදන්නේ. අපි හත් දෙනාටම ආපසු ජීවය ලැබෙන්න යන්නේ. මම පොරොන්දු වෙනවා."

ඔහු පොරොන්දුව නොදුන්නානම් යැයි පිපර් සිතුවාය. එම වචනයෙන් ඇයට සිහිපත් වූයේ සත්දෙනාගේ අනාවැකියයි. අවසන් සුසුම තෙක් රැඳීමේ ප්‍රතිඥාව.

කරුණාකරලා, ඇය සිතුවාය. ඇගේ මවට, ආදරයේ දෙවඟනට ඇසුණානම්, එය ජේසන්ගේ අවසන් සුසුම වීමට ඉඩ නොදෙන්න. ආදරය යනු ඕනෑම දෙයක් නම්, ඔහුව ඉවත ගෙන නොයන්න.

ඇය ප්‍රාර්ථනය කළ විගස ඇයට වරදකාරී හැඟීමක් ඇති විය. පර්සි මියගියහොත් ඇනබෙත් එවැනි වේදනාවක් උසුලනු ඇය බලා සිටින්නේ කෙසේද? උප දෙව්වරුන් සත් දෙනාගෙන් කවුරු හෝ මියගිය හොත් ඇය ජීවත් වන්නේ කෙසේද? දැනටමත් ඔවුන් එකිනෙකා බොහෝ දේ දරා සිටියහ. අලුත් රෝම දරුවන් දෙදෙනා හේසාල් සහ ෆ්‍රෑන්ක් පවා, - පිපර් ඔවුන් ගැන දැනසිටියේ ස්වල්ප ප්‍රමාණයක් වුවත්,- ඇයට ඔවුන් තම නෑදෑයන් සේ හැඟිණි.

ජුපිටර් කඳවුරේදී, පර්සි ඔවුන්ගේ ඇලස්කා සංචාරය ගැන පැවසුවේය. එයින් පිපර් තමාට අත්දැකිමක් විය හැකි සියල්ල වැහැගත්තාය. එසේම අරක්ගත් ආත්ම පලවා හැරීමේදී හේසාල් සහ ෆ්‍රෑන්ක් උදව් කිරීමට දරූ උත්සාහය අනුව ඔවුන් නිර්භීත, යහපත් අය බව ඇයට පැවසිය හැකි විය.

"ඇනබෙත් කියපු පුරාවෘත්තය," ඇය පැවසුවාය. "ඇතීනාගේ සලකුණ ගැන... ඇයි ඔයාට ඒ ගැන කථා කරන්න ඕනේකමක් නැත්තේ?"

ජේසන් ඇයව වැළැක්වීම ගැන ඇය කනගාටු වූවාය. එහෙත් ඔහු එම ප්‍රශ්නය අපේක්ෂාවෙන් සිටියාක් මෙන් හිස පහත් කරගෙන සිටියේය. "පිපර් මම දන්නේ නෑ ඇත්ත නැත්ත මොකක්ද කියලා. ඒ පුරාවෘත්තය... ඒක ඇත්තටම භයානක එකක් වෙන්න පුළුවන්."

"කාටද?"

"අපි හැමෝටම," ඔහු පැවසුවේය. "කතාවෙන් කියවෙන්නේ අතීතයේදී රෝමවරු, ග්‍රීකයන්ගෙන් වැදගත් දෙයක් හොරකම් කළ බවයි. ඒ රෝමවරු ග්‍රීක නගර ආක්‍රමණය කරද්දී."

පිපර් බලා සිටියාය. එහෙත් ජේසන් කල්පනාවක ගැලී සිටියේය.

"මොනවද එයාලා හොරකම් කළේ?" ඇය විමසුවාය.

"මම දන්නේ නෑ," ඔහු පැවසුවේය. "ලෙජියන් එකවත් ඒක දන්නවද කියලා මට සැකයි. ඒත්, කතාවට අනුව, මේ දෙය රෝමෙට ගෙනත් එහෙ හංගලා තියෙනවා. එදා ඉඳන් ඇතීනාගේ දරුවෝ, ග්‍රීක උපදෙව්වරු, අපිට වෛර කරනවා. එදා ඉඳන් ඔවුන් හැමවිටම රෝමයට එරෙහිව එයාලගේ සහෝදරයන්ව උසි ගන්වනවා. මම කිව්වා වගේ, මේකෙ ඇත්ත නැත්ත මම වැඩිය දන්නේ නැහැ."



ඔහු බැරෑරුම් මුහුණකින් ඇය දෙස බැලුවේය. "මම හිතනවා නැහැ කියලා. ඒත් පුරාවෘත්තයෙන් කියවෙන විදිහට ඇතීනාගේ දරුවෝ අවුරුදු දහස් ගණන් ඉඳලා මේක හොයනවා. හැම පරම්පරාවකින්ම, දෙවඟන විසින් ඒක හොයන්න සිප දෙනෙක්ව තෝරගන්නා. ජේන විදිහට එයාලව රෝමය වෙතට යොමු කරන යම් සලකුණක් තියෙනවා... ඒ ඇතීනාගේ සලකුණ."

"ඇනබෙත් කියන්නේ තෝරගත්ත අයගෙන් කෙනෙක් නම්... අපි එයාට උදව් කරන්න ඕනේ."

ජේසන් පැකිලුනේය. "වෙන්න පුළුවන්. අපි රෝමයට කිට්ටු වුණාම, මම දන්න ටික එයාට කියන්නම්. ඒත් කතාවේ විදිහට- අඩුගානේ මම අහල තියෙන විදිහට- ඒකේ සඳහන් වෙනවා, හොරකම් කරපු දේ ග්‍රීකයෝ කවදාහරි හොයාගත්තොත් එයාල අපිට කවදාවත් සමාව දෙන එකක් නෑ කියලා. එයාලා ලෙජියන් එකයි, රෝමයයි සදහටම විනාශ කරයි. නෙම්සිස් ලියෝට කිව්වෙත් දවස් පහකදී රෝමය විනාශවෙන කතාවක් නේද?"

පිපර් ජේසන්ගේ මුහුණ අධ්‍යයනය කළාය. සැකයක් නොමැතිවම, ඇය මෙතෙක් දැනසිටි නිර්භීතම පුද්ගලයා ඔහුය. එහෙත් ඔහු බියපත්ව සිටින බව ඇයට අවබෝධ විය. මේ පුරාවෘත්තය - එහි සඳහන්වන ඔවුන්ගේ කණ්ඩායම විසුරුවා දැමීම සහ නගරය සමතලා කිරීම- ඔහුව සම්පූර්ණයෙන්ම බියට පත් කර තිබිණි.

ග්‍රීකයන්ගෙන් සොරකම් කර තිබූ මෙතරම් වැදගත් දෙය කුමක්දැයි පිපර් පුදුමයට පත්වූවාය. ඇනබෙත් එක්විටම මෙතරම් පළිගන්නා අයකු බවට පත්වීමට හේතුවූ කිසිවක් පිළිබඳ ඇයට සිතාගත නොහැකි විය.

එසේම ඊළඟට, එක් උපදෙවියකුගේ ජීවිතය, තවත් අයෙකු විසින් තෝරාගැනීමද පිපර්ට සිතාගත නොහැකි දෙයක් විය. අද පාළු මාර්ගයේදී, මොහොතකට, ගයියා ඇයව මුළුමනින්ම පරීක්ෂා කළාය.

"ඒක නෙමෙයි මට සමාවෙන්න," ජේසන් පැවසුවේය.

පිපර් ඇගේ වතෙහි වූ අවසන් කඳුළු බිඳුවද පිස දමාගත්තාය.

"මොකටද සමාවෙන්නේ? ඒ පහර දුන්නේ අරක් ගත් ආත්ම..."

"ඒක ගැන නෙමෙයි මම කිව්වේ," ජේසන්ගේ උඩු තොලෙහි වූ කුඩා කැළල සඳ එළියේ සුදු පැහැයෙන් දිලිසෙනු පෙණිනි. ඇය

සැමවිටම ඒ කැළලට ප්‍රිය කළාය. ඒ අඩුව ඔහුගේ මුහුණ වඩ
ප්‍රියමනාප කළේය.

"මම මෝඩයෙක් වගේ ඔයාට රෙයිනව සම්බන්ධ කරගෙන
කිව්වට." ඔහු පැවසුවේය. "මම ඒච්චර හිතුවේ නෑ."

"ආහ්," පිපර් ඉහළින් පෙනෙන වළාකුළු දෙස බැලුවාය. ඇගේ
මව ඇෆ්‍රොඩයිට් යම් ආකාරයකින් ඔහුට බලපෑමක් ඇති කරන්නේදැ
ඇය පුදුම වූවාය. ඔහුගේ සමාව ඉල්ලීම සත්‍යයට වඩා බෙහෙවි
යහපත් දෙයක් සේ පෙණිනි.

ඒත් නවතින්න එපා, ඇය සිතුවාය. "ඇත්තට, ඒකට කමක්
නැහැ."

"ඒක නිකම්... මට රෙයිනාගෙ පැත්තෙන් කවදාවත් එහෙම
හිතිලා නැහැ." ජේසන් පැවසුවේය. "ඉතිං මම හිතුවේ නෑ, ඒකෙන්
ඔයා අපහසුතාවයට පත්වෙයි කියලා. ඔයාට කරදර වෙන්න දෙයක්
නෑ, පිපර්."

"මට එයාට වෛර කරන්න ඕනේ වුණා." පිපර් පැවසුවාය.
"ආපසු ජුපිටර් කඳවුරට යයි කියලා මම ගොඩක් භයවුණා."

ජේසන් පුදුමයට පත්විය. "ඒක කොහෙත්ම වෙන එකක්
නැහැ. ඔයා මාත් එක්ක එනකම්. මම පොරොන්දු වෙනවා."

පිපර් ඔහුගේ අත අල්ල ගත්තාය. සිනාවක් මුවට නගා ගත්තත්
ඇය යමක් සිතන බව පෙණිනි. තවත් පොරොන්දුවක්. අවසන් සුසුම
තෙක් රකින ප්‍රතිඥාවක්.

ඇය ඒ සිතුවිලි සිතෙන් පහවා හැරීමට උත්සාහ කළාය. මේ
කෙටි මොහොත ජේසන් සමඟ සතුටින් ගත කළ යුතු බව ඇය දැන
සිටියත්, ඇය නෞකාවේ පහළ බලද්දී, හරියටම ඇය පිහි තලයෙන්
දුටු ගිලී මියයන කාමරය මෙන් තණබිම රාත්‍රියට කාලවර්ණ ජලය
මෙන් කොතරම් අඳුරුව දිස්වන්නේ දැයි ඇයගේ මතකයට නැගුණාය.